

සන්න සහිත

# කාව්‍යාදර්ශය

THE

# KAVYADARSA.

*(Rhetoric)*

BY

## MAHAMAHOPADDHYAYA SRI DANDIN.

WITH A

SINHALESE TRANSLATION

BY

## PUNDIT DHARMASENA

OF

**DODANDUWA.**

PUBLISHED

BY

**W. A. DE SILVA, U. D. CORNELIS, & K. VINCENT PERERA.**

PRINTED AT THE

LANKABHINAWA VISSRUTA PRESS, PETTAH,

COLOMBO.

**A. B. 2449.**

1905.

# සංඥාපනය.

## කාව්‍යාදර්ශය.

මෙය මහාමහොපාධ්‍යාය ශ්‍රීදණ්ඩීනම් මහා කවිහු විසින් විරචිතයි. මේ මහා කවිතෙමේ විදර්භදෙශජයයි ජම්බුද්වීපවාසී පණ්ඩිතයන්ගේ මතයි. කවරකලක විසූ උතුමෙක්ද යනු අවිනිශ්චිතයි.

ජාතෙජගති වාල්මීකෞ කවිරිත්‍යභිධා භවත්
කවිඉතිතතොව්‍යාසෙ කවයස්ත්වයිදණ්ඩිනි.

යන මේ ශ්ලොකය සාක්ෂිකොට මේ කවිවරයාගේ අතිපුරාතනත්වය මාලිත්‍ය ප්‍රොඤ්ජිනිකාරයෝ ස්ථිරකරති. ඒ කෙසේ වෙතත් මෙහි තුන්වෙනි පරිච්ඡෙදයෙහි–

සත්‍යමෙවාහසුගතඃ සංස්කාරානවිනශ්වරාන්
තථාහිසා චකොරාක්ෂී ස්ථිතෛවාද්‍යාපිමෙහෘදි

යන 174 වෙනි ශ්ලොකයෙන් මේ ග්‍රන්ථරචනාව සර්වඥයන්වහන්සේගේ ලොව්පහළවීමට පසුව බැව් හැඟේ. මේ කාව්‍යාදර්ශනම් අලඞ්කාර ශාස්ත්‍රය පඨන පාඨන ග්‍රහණ ධාරණයන්හි අතිශය යොග්‍ය පරිද්දෙන් රචනාකරණලද අද්විතීය ග්‍රන්ථරත්නයක් බැව් සියලු ආලඞ්කාරිකයන් විසින් එකහෙළා පිළිගන්නාලදි.

පුරාතන ලාඞ්කීකාචාර්‍ය්‍යවරයන්ද අලඞ්කාර ශාස්ත්‍රයෙහි ප්‍රවීනර බුද්ධිලාභය පිණිස මේ ප්‍රකරණය පරිශීලනය කළබව්ට සියබස් ලකර නම් සෛංහලීය අලඞ්කාර ශාස්ත්‍රය සාක්ෂිවේ. වර්තමාන කාලයෙහි විද්‍යාස්ථානත්වයෙන් ප්‍රසිද්ධියට පැමිණි කොළඹ විද්‍යොදය පිරිවෙන පෑලියගොඩ විද්‍යාලඞ්කාර පිරිවෙන දෙඩන්දූවේ ශෛලබිම්බාරාමය ආදි ස්ථානවලද ආචාර්‍ය්‍යවරයෝ ශිෂ්‍යයන්ට අලඞ්කාර ශාස්ත්‍රය ප්‍රගුණවීම පිණිස මේ ප්‍රකරණය උගන්වති. එසේ නමුදු මේ ශාස්ත්‍රය ඉගෙන ප්‍රවීණයට පැමිණියාහු ලක්දිව බෙහෙවින්ම දුර්ලභවෙති. මේ පොතට යම් කිසිවකු විසින් ලියනලද පරණ සන්නයක්ද දක්නාලැබේ. ඒ සන්නය ලියනලද ආචාර්‍ය්‍යවරයාගේ අබහුශ්‍රැත භාවය හෙතුකොටගෙන සමහර තැන්වල දක්වා තිබෙන අර්ථ ශාස්ත්‍ර යුක්ති අනුගතනුවූ බැව් පෙණේ. බෙහෙවින්ම භාවය දක්වන තැන්වලදී ටීකාවලට නොගැලපෙනසේ දොෂාකීර්ණකරයි. විශෙෂයෙන්ම දුෂ්කරබන්ධන ප්‍රකාශක තෘතීය පරිච්ඡෙදයට ලියූ අර්ථ අතුරෙන් වැඩි කොටස උගතුන්ගේ සිත් කම්පාවන තරම් දොෂාකීර්ණය. මේ කාරණය මෙනෙහිකරන්නාවූ අපගේ ආචාර්‍ය්‍යොත්තමවූ දෙඩන්දූවේ ශෛලබිම්බාරාමයෙහි සරස්වතීමණ්ඩපාධිපති **පූජ්‍යාචාර්‍ය්‍ය ශීලස්කන්ධාභිධාන මහාස්ථවිර ශ්‍රෙෂ්ඨයන්වහන්සේ** විසින් කාව්‍යාදර්ශයට ව්‍යාඛ්‍යානයක් ලියන්ටයයි නියොගකරනු ලැබූ අපි මේ ව්‍යාඛ්‍යානය ලියාසමාප්තකෙළෙමු. අපගේ භ්‍රමාශ්‍රිතවූද දෘෂ්ටිවිකාරයෙන්වූද දොෂයක් මෙහි විද්‍යමානනම් ඒ ගුණ සුධීහු සමාධි භජනයකරත්වා.

එක් ශුද්ධියකින් දතහැකි එබඳුවූ අනික් පද ශුද්ධිපත්‍රයට නොගන්නාලදි. එසේම ශ්ලොකය අනුව ශුද්ධිය දතහැකි සන්නයේ සමහර අශුද්ධ පදද ශුද්ධිපත්‍රයට නොගන්නාලදි.

K. P. W. Dharmasena.

### කාව්‍යාදර්ශයෙහි ප්‍රථම පරිච්ඡේදය සම්බන්ධ

# සූචි පත්‍රය.


| | | ශ්ලෝකාඞ්ක |
|---|---|---|
| 1 | මඞ්ගලාචරණය | 1 |
| 2 | වාක්‍යප්‍රශංසා | 3 |
| 3 | කාව්‍ය ප්‍රශංසා | 5 |
| 4 | කාව්‍ය ලක්ෂණ | 10 |
| 5 | කාව්‍යභෙද | 11 |
| 6 | මහා කාව්‍යලක්ෂණ | 14 |
| 7 | ගද්‍යකාව්‍යභෙද | 23 |
| 8 | මිශ්‍රකාව්‍ය භෙද | 31 |
| 9 | කාව්‍යසම්බන්ධ සංස්කෘතාදිභෙදාන්තර | 32 |
| 10 | කථාබෘහත්කථා සම්බන්ධ භෙදය | 38 |
| 11 | රීති විවෙකය | 40 |
| 12 | ශ්ලෙෂාදි ගුණ | 41 |
| 13 | ශ්ලෙෂ ලක්ෂණ | 43 |
| 14 | ප්‍රසාද ලක්ෂණ | 45 |
| 15 | සමතා ලක්ෂණ | 47 |
| 16 | මාධුර්‍ය්‍ය ලක්ෂණ | 51 |
| 17 | ප්‍රසඞ්ගයෙන් අනුප්‍රාසනිරූපණය | 55 |
| 18 | යමක ලක්ෂණ | 59 |
| 19 | ග්‍රාම්‍යත්වය සම්බන්ධ මාධුර්‍ය්‍ය ප්‍රතිබන්ධකත්වය | 62 |
| 20 | සෞකුමාර්‍ය්‍ය ලක්ෂණ | 69 |
| 21 | අර්ථව්‍යක්ති ලක්ෂණ | 73 |
| 22 | උදාරත්ව ලක්ෂණ | 76 |
| 23 | ඔජොගුණ ලක්ෂණ | 80 |
| 24 | කාන්ති ලක්ෂණ | 85 |
| 25 | සමාධි ලක්ෂණ | 93 |
| 26 | කාව්‍ය සම්බන්ධ කාරණ | 103 |


### ද්විතීය පරිච්ඡේදය සම්බන්ධ සූචි පත්‍රය.


| | | |
|---|---|---|
| 27 | අලඞ්කාරයන්ගේ සාමාන්‍ය ලක්ෂණ | 1 |
| 28 | අර්ථාලඞ්කාර විභාගය | 4 |
| 29 | ස්වභාවොක්ති | 8 |
| 30 | උපමා ලක්ෂණ | 14 |
| 31 | ධර්මොපමා | 15 |
| 32 | වස්තූපමා | 16 |
| 33 | විපර්‍ය්‍යාසොපමා | 17 |
| 34 | අන්‍යොන්‍යොපමා | 18 |
| 35 | නියමොපමා | 19 |
| 36 | අනියමොපමා | 20 |
| 37 | සමුච්චයොපමා | 21 |
| 38 | අතිශයොපමා | 22 |
| 39 | උත්ප්‍රෙක්ෂිතොපමා | 23 |
| 40 | අද්භුතොපමා | 24 |
| 41 | මොහොපමා | 25 |
| 42 | සංශයොපමා | 26 |
| 43 | නිර්ණයොපමා | 27 |
| 44 | ශ්ලෙෂොපමා | 28 |
| 45 | සමානොපමා | 29 |
| 46 | නින්දොපමා | 30 |
| 47 | ප්‍රශංසොපමා | 31 |
| 48 | ආචිඛ්‍යාසොපමා | 32 |
| 49 | විරොධොපමා | 33 |
| 50 | ප්‍රතිෂෙධොපමා | 34 |
| 51 | චටූපමා | 35 |
| 52 | තත්වාඛ්‍යානොපමා | 36 |
| 53 | අසාධාරණොපමා | 37 |

| | | ශ්ලෝකාඞ්ක |
| --- | --- | --- |
| 54 | අභූතොපමා | 38 |
| 55 | අසම්භාවිතොපමා | 39 |
| 56 | බහූපමා | 40 |
| 57 | වික්‍රියොපමා | 41 |
| 58 | මාලොපමා | 42 |
| 59 | වාක්‍යාර්ථොපමා | 43 |
| 60 | ප්‍රතිවස්තූපමා | 46 |
| 61 | තුල්‍යයොගොපමා | 48 |
| 62 | හෙතූපමා | 50 |
| 63 | උපමාදොෂ විචාර | 51 |
| 64 | උපමාබොධක ශබ්ද | 57 |
| 65 | රූපක සාමාන්‍ය ලක්ෂණ හා සමස්ත රූපක | 66 |
| 66 | ව්‍යස්තරූපක | 67 |
| 67 | සමස්තව්‍යස්ත රූපක | 68 |
| 68 | සකලරූපක | 70 |
| 69 | අවයවරූපක | 72 |
| 70 | අවයවිරූපක | 73 |
| 71 | එකාඞ්ගාදිරූපක | 75 |
| 72 | යුක්තරූපක | 77 |
| 73 | අයුක්තරූපක | 78 |
| 74 | විෂමරූපක | 79 |
| 75 | සවිශෙෂණරූපක | 81 |
| 76 | විරුද්ධරූපක | 83 |
| 77 | හෙතුරූපක | 85 |
| 78 | ශ්ලිෂ්ටරූපක | 87 |
| 79 | උපමාරූපක හා අතිරෙක රූපක | 88 |
| 80 | ආක්ෂෙපරූපක | 91 |
| 81 | සමාධානරූපක | 92 |
| 82 | රූපක රූපක | 93 |
| 83 | තත්ත්වාපහ්නවරූපක | 94 |
| 84 | දීපක | 97 |
| 85 | මාලාදීපක | 107 |
| 86 | විරුද්ධාර්ථදීපක | 109 |
| 87 | එකාර්ථදීපක | 111 |

| | | ශ්ලෝකාඞ්ක |
| --- | --- | --- |
| 88 | ශ්ලිෂ්ටාර්ථදීපක | 113 |
| 89 | ආවෘත්ති හා එහි භෙද | 116 |
| 90 | ආක්ෂෙප හා එහි භෙද | 120 |
| 91 | ධර්මාක්ෂෙප | 127 |
| 92 | ධර්ම්‍යාක්ෂෙප | 129 |
| 93 | කාරණාක්ෂෙප | 131 |
| 94 | කාර්යාක්ෂෙප | 134 |
| 95 | අනුඥාක්ෂෙප | 135 |
| 96 | ප්‍රභුත්වාක්ෂෙප | 137 |
| 97 | අනාදරාක්ෂෙප | 139 |
| 98 | ආශීර්වචනාක්ෂෙප | 141 |
| 99 | පරුෂාක්ෂෙප | 143 |
| 100 | සාචිව්‍යාක්ෂෙප | 145 |
| 101 | යත්නාක්ෂෙප | 147 |
| 102 | පරවශාක්ෂෙප | 149 |
| 103 | උපායාක්ෂෙප | 151 |
| 104 | රොෂාක්ෂෙප | 153 |
| 105 | මූර්ච්ඡාක්ෂෙප | 157 |
| 106 | අනුක්‍රොශාක්ෂෙප | 157 |
| 107 | ශ්ලිෂ්ටාක්ෂෙප | 159 |
| 108 | අනුශයාක්ෂෙප | 161 |
| 109 | සංශයාක්ෂෙප | 163 |
| 110 | අර්ථාන්තරන්‍යාස | 165 |
| 111 | අර්ථාන්තරන්‍යාසභෙද | 170 |
| 112 | ව්‍යතිරෙක | 180 |
| 113 | එකව්‍යතිරෙක | 181 |
| 114 | උභයව්‍යතිරෙක | 183 |
| 115 | සශ්ලෙෂව්‍යතිරෙක | 185 |
| 116 | සාක්ෂෙපහෙතුක ව්‍යතිරෙක දෙක | 186 |
| 117 | ප්‍රතීයමාන සාදෘශ්‍ය ව්‍යතිරෙක | 189 |
| 118 | සදෘශ්‍ය ව්‍යතිරෙක භෙදාන්තර | 192 |
| 119 | විභාවනා | 199 |
| 120 | සමාසොක්ති | 205 |
| 121 | සමාසොක්තිභෙද | 208 |

| | | ශ්ලෝකාඞ්ක |
|---|---|---|
| 122 | අපූර්වසමාසෝක්ති | 212 |
| 123 | අතිශයෝක්ති | 214 |
| 124 | අතිශයෝක්ති ප්‍රශංසා | 220 |
| 125 | උත්ප්‍රේක්ෂා | 221 |
| 126 | උත්ප්‍රේක්ෂාව්‍යඤ්ජකශබ්ද | 234 |
| 127 | හේතු හා එහි භේද | 235 |
| 128 | සූක්ෂ්ම | 260 |
| 129 | ලේශ | 265 |
| 130 | ක්‍රම | 273 |
| 131 | ප්‍රේයෝරස හා ඌර්ජස්වී ලක්ෂණ | 275 |
| 132 | පර්‍යායෝක්ති | 295 |
| 133 | සමාහිත | 298 |
| 134 | උදාත්ත | 300 |
| 135 | අපහ්නුති | 304 |
| 136 | ශ්ලේෂ | 310 |
| 137 | ශ්ලේෂභේද | 314 |
| 138 | විශේෂෝක්ති | 323 |
| 139 | තුල්‍යයෝගිතා | 330 |
| 140 | විරෝධ | 333 |
| 141 | අප්‍රස්තුත ප්‍රශංසා | 340 |
| 142 | ව්‍යාජස්තුති | 343 |
| 143 | නිදර්ශන | 348 |
| 144 | සහෝක්ති හා පරිවෘත්ති | 351 |
| 145 | ආශීර් | 357 |
| 146 | සඞ්කීර්ණ | 359 |
| 147 | සඞ්කීර්ණභේද දෙක | 360 |
| 148 | භාවික | 364 |
| 149 | භාවිකභේද | 365 |
| 150 | ද්විතීයපරිච්ඡේද සමාප්තිය | — |


## තෘතීය පරිච්ඡේදය සම්බන්ධ සූචි පත්‍රය.


| | | |
|---|---|---|
| 151 | යමක | 1 |
| 152 | ගෝමූත්‍රිකා | 78 |
| 153 | අර්ධභ්‍රම, සර්වතෝභද්‍රදෙක | 80 |
| 154 | ස්වරස්ථාන වර්ණනියම | 83 |
| 155 | ප්‍රහේලිකා | 96 |
| 156 | ප්‍රහේලිකාස්ථාන | 97 |
| 157 | සමාගතා ප්‍රහේලිකා වඤ්චිතා ප්‍රහේලිකා | 98 |
| 158 | ව්‍යුත්ක්‍රාන්තා, ප්‍රමුෂිතා | 99 |
| 159 | සමානරූපා, පරුෂා | 100 |
| 160 | සංඛ්‍යාතා, ප්‍රකල්පිතා | 101 |
| 161 | නාමාන්තරිතා, නිභෘතා | 102 |
| 162 | සමානශබ්දා, සංමූඪා | 103 |
| 163 | පරිහාරිකා, ඒකච්ඡන්නා | 104 |
| 164 | උභයච්ඡන්නා, සංකීර්ණා | 105 |
| 165 | දෝෂවිභාග | 125 |
| 166 | අපාර්ථත්ව | 128 |
| 167 | ව්‍යර්ථත්ව | 131 |
| 168 | ඒකාර්ථත්ව | 135 |
| 169 | සසංශයත්ව | 139 |
| 170 | අපක්‍රම | 144 |
| 171 | ශබ්දහීනත්ව | 148 |
| 172 | යතිභ්‍රංශ | 152 |
| 173 | වෘත්තභඞ්ග | 156 |
| 174 | විසන්ධිත්ව | 159 |
| 175 | දේශකාලකලා ලෝක න්‍යායාගම විරෝධ | 162 |
| 176 | දේශවිරෝධ | 165–166 |
| 177 | කාලවිරෝධ | 167–168 |
| 178 | කලාවිරෝධ | 170 |
| 179 | ලෝකවිරෝධ | 172 |
| 180 | න්‍යායවිරෝධ | 174–175 |
| 181 | ආගමවිරෝධ | 177-178 |
| 182 | දේශවිරෝධයෙහිගුණ | 180 |
| 183 | කාලවිරෝධයෙහිගුණ | 181 |
| 184 | කලාවිරෝධයෙහිගුණ | 182 |
| 185 | ලෝකවිරෝධයෙහිගුණ | 183 |
| 186 | න්‍යායවිරෝධයෙහිගුණ | 184 |
| 187 | ආගම විරෝධයෙහිගුණ | 185 |

# ශුද්ධිපත්‍රය.

| පිට | පෙල | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 9 | 10 | තදෙනාඃවාඞ්මයං | තදෙතද්වාඞ්මයං |
| ,, | 14 | අපභ්‍රඃශශව | අපභ්‍රංශශව |
| 12 | 22 | ලාංඡනය | ලාඤ්ඡනය |
| ,, | 26 | ගෞඩීයෛයෙනා | ගෞඩීයෛයෙර්නා |
| ,, | ,, | මපිශ්‍යතෙ | මපීෂ්‍යතෙ |
| ,, | 30 | සූත්‍රපී | සූත්‍රාපී |
| ,, | ,, | ර්ශ්‍යතෙ | ඉෂ්‍යතෙ |
| 13 | 14 | වින්‍යාශ | වින්‍යාස |
| ,, | 24 | උච්ඡලවශ්‍රී | උච්ඡලැවශ්‍රී |
| 14 | 11 | අපෙක්‍ෂ්‍යමානා | අපෙක්‍ෂ්‍යමාණා |
| 15 | 2 | සානුප්‍රසා | සානුප්‍රාසා |
| ,, | ,, | අනුප්‍රසාසහිත | අනුප්‍රාසසහිත |
| ,, | 9 | ලොකෙ, ලොකයෙගි; | අස්මින්ලොකෙ, මේලොකයෙහි |
| ,, | 20 | පාදෙසුවපදෙසුව | පාදෙෂුව පදෙෂුව |
| ,, | 31 | ශරදාකාශයට | ශරත් රාත්‍රියට |
| ,, | 34 | චන්‍ද්‍ර | චන්‍ද්‍රෙ |
| 16 | 4 | ශෘත්‍ය | ශ්‍රැත්‍ය |
| ,, | 9 | චාන්‍ද්‍රමසං<br>චන්‍ද්‍රමණ්ඩලය | එතත්චාන්‍ද්‍රමසං<br>මේ චන්‍ද්‍රමණ්ඩලය |
| ,, | 15 | වෘත්‍යනුප්‍රාශ | වෘත්‍යනුප්‍රාස |
| ,, | 24 | අනුප්‍රාශ | අනුප්‍රාස |
| ,, | 36 | ශ්ලෙක | ශ්ලොක |
| 17 | 36 | චණ්ඩාලො | චාණ්ඩාලො |
| 18 | 25 | ශෘති | ශ්‍රැති |
| 19 | 34 | එතම් | එතත් |
| 21 | 22 | විශෙෂණෛණයුක්ත | විශෙෂණෛණයුක්ත |
| ,, | 29 | ලිලිම්බුජ | ලීලාම්බුජ |
| 22 | 24 | ඝඨන | ඝනන |
| 23 | 11 | වණීනාසු | වණිනාසු |
| ,, | 12 | නිරූපණ<br>වණීවත් | නිරූපණ<br>වණිනාවත් |
| 23 | 13 | වනීං | වානීං |
| 24 | 11 | ආලෞකික | අලෞකික |
| ,, | 24 | රජ | රජඃ |

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 24 | 25 | අරාධ්‍ය | ආරාධ්‍ය |
| ,, | 29 | භවත්‍ය | භවත්‍යාඃ |
| 25 | 7 | ප්‍රකෘෂ්ඨ | ප්‍රකෘෂ්ට |
| ,, | 16 | යත්‍ර, ඉදින් | සත්‍ර, යම්හෙයකින් |
| ,, | 17 | සවෘතම් | සවෘතඃ |
| ,, | 18 | සනාත්‍යනෙතා | සනාත්‍යනෙත්‍යා |
| ,, | 21 | ගභීහාර | ගභීභාර |
| 27 | 6 | සමාධිණීම | සමාධිර්නාම |
| ,, | 28 | කාරණාම් | කාරණාං |
| 28 | 10 | අනුග්‍රම් | අනුග්‍රහම් |
| ,, | 24 | ඊසතෙ | ඊශතෙ |
| 29 | 21 | පයස්කායොකතම් | පයස්කායොකතං |
| ,, | 34 | අශිස් | ආශිස් |
| 31 | 7 | පාධා | ප්‍රාධා |
| ,, | 12 | තෙමෝ | තොමෝ |
| ,, | 19 | අතාම්‍රම් | ආතාම්‍රම් |
| 32 | 36 | මයිඑව | මයිඑවඉති |
| 33 | 7 | ධත්තාම් | ධත්තාම්ඉති |
| ,, | 21 | අයම් | ඉයම් |
| 34 | 3 | මාලෙය | මාලෙයං |
| ,, | 19 | බ්‍රහෙමණො | බ්‍රහ්මණො |
| 36 | 6 | උපමා | උපමෙය |
| 39 | 10 | කල්කිරීව | කලකිරීම |
| 42 | 25 | පුෂ්‍යයන් | පුෂ්පයෙන් |
| 45 | 25 | ආරොප්‍යමාන | ආරොප්‍යමාණ |
| 48 | 31 | ගන්ධවගඃ | ගන්ධවහඃ |
| 49 | 10 | ගසන්‍රම් | අසන්‍රම් |
| ,, | 16 | රත්නූනසවඃ | රත්නූනසව |
| 51 | 27 | අවෘත්ති | ආවෘත්ති |
| 57 | 37 | චක්ෂුසා | චක්ෂුෂා |
| 53 | 6 | වල්ලභා | වල්ලභයා |
| 53 | 28 | තරලංගි | තරලං |
| ,, | 34 | ප්‍රභාවහ | ප්‍රභාහව |
| 54 | 12 | නිෂිධඃ, වලකනලද්දේද | පටීයසා, ඉතා දක්‍ෂවූ; ප්‍රියෙණ, වල්ලභයා විසින්; නිෂිධඃ, වළකනලද්දේද |
| ,, | 26 | ප්‍රොත | ත්‍රාතෙ |

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 54 | 37 | අනුඥක්ෂෙපනම් | අනුඥක්ෂෙපනමැයි; උච්‍යතෙ කියනු ලැබෙ |
| 55 | 15 | සව | සවා |
| ,, | 21 | ප්‍රියප්‍රායාණිං | ප්‍රියප්‍රයාණිං |
| 56 | 4 | සත්‍යම්, සැබෑනම් | සත්‍යෙව, සැබෑමනම් |
| 61 | 12 | නිදශ්‍යතෙ | නිදර්ශ්‍යතෙ |
| ,, | 18 | යත්නේමය | යත්නාග්‍රය |
| 62 | 15 | නනුජ්‍යතෙ | නනුයුජ්‍යතෙ |
| ,, | 18 | සවා | සව |
| 63 | 5 | ස්‍යදෘශ | සදෘශ |
| ,, | 24 | කාෂණ්‍යං | කාෂ්ණ්‍යං |
| 64 | 32 | නගයන් | නාගයන් |
| 67 | 24 | අනඤ්ජිතඃ අඤ්ජනය | අරඤ්ජිතඃ, රඤ්ජනය |
| 68 | 30 | පෙඟළුවූ සතී | ප්‍රෙඟළුවූ සත්‍රී |
| ,, | 32 | සතී | සත්‍රී |
| ,, | 38 | සමාසොක්තියක් | අසෞ, මේ සමාසොක්තිය |
| 69 | 7 | අසත | අසති |
| ,, | 12 | දෘමඃ | දෑමඃ |
| 70 | 37 | සතිවිඃ | සවිතිඃ |
| ,, | ,, | අශ්‍රිත | ආශ්‍රිත |
| 71 | 33 | පදමානුඩ | පදමානුඩත්‍රී |
| 73 | 16 | ස්‍යාත් | ස්‍යාත් |
| 74 | 4 | ලැබේ | ලැබේවා |
| ,, | 5 | ධාවං | ධ්‍රැවං |
| 75 | 6 | උත්ප්‍රක්ෂා | උත්ප්‍රෙක්ෂා |
| | | ආතුරෙ, ආතුරයා කෙරෙහි | ආතුරෙ, ආතුරවූ; ජනෙ, ජනයා කෙරෙහි |
| ,, | 18 | උදාහරණාවම්, | උදාහරණවය |
| ,, | 29 | වෙමිත්‍ර | වෛචිත්‍ර්‍ය |
| 79 | 22 | ශිතගොෂට්‍යා | ශීතගොෂ්ඨ්‍යා |
| 80 | 13 | අයතු | ආයතු |
| 81 | 22 | දෙෂාභාෂ | දෙෂාභාස |
| 83 | 34 | නිෂටත් | නිෂ්ඨිත් |
| 93 | 25 | විභතීති | විභ්‍රාති |
| 95 | 15 | කණේ | කණ්ඨා |
| 96 | ,, | ව්‍යාජසතු | ව්‍යාජස්තුති |
| 97 | 25 | පදෙමසව | පදෙමෂව |
| 99 | 15 | වඃ, අප | වඃ, නොප |
| ,, | 29 | උත්ප්‍රක්ෂා | උත්ප්‍රෙක්ෂා |

| පිට | පෙල | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 102 | 10 | කිමෙක්ද | කිමෙක්ද; වද, කියව |
| 102 | 31 | භවත්හු | භවත්හු කරා |
| 104 | 24 | තාගේ | තීගේ |
| ,, | 30 | මත්ප්‍රයෙ | මත්ප්‍රියෙ |
| 105 | 38 | වශීං | මේ වශීං |
| 106 | 40 | වඃ, අප | වඃ, නොප |
| 111 | 15 | නයා, සීජනයා | නයා සීජනයා |
| ,, | 32 | වෙඃ, පක්ෂිහුගේ; | වීර, වීරවූ; වෙඃ, පක්ෂීහුගේ |
| 114 | 34 | අබලාඃ | අබලාඃ සත්‍රින්, විහාරයන්; අභිරමනයකරමින්; භාසුරාණාම්බබලත්නාවූ; පුරාම්, පුරයන් |
| 117 | 10 | පාදසෞත්‍යයං | පාදසෞත්‍යවං |
| 120 | 12 | මදෙනඃ, මාගේපාපය | මදෙනඃ මාගේ පාපය; තත්, එකල්හි. |
| 125 | 22 | ලක්ෂණාක්ෂි | ලක්ෂණාක්ෂී |
| ,, | 33 | නානාවිං | නානාවී |
| 126 | 13 | ශඞ්කාරඃ | සඞ්කාරඃ |
| 127 | 8 | කුබ්ජ | කුබ්ජා |
| 129 | 12 | රජා | රාජා |
| 130 | 13 | අපොපසර්ති | අපොපසර්ගි |
| 131 | 36 | සාධිෂ්වාතා | සාධිෂ්ඨාතා |
| 134 | 12 | ප්‍රයෙකතා | ප්‍රයොක්තා |

පොතේ අනතිම පිටේ—

**ශ්‍රීමදාචාර්‍ය්‍යදණ්ඩිනඃ කෘතෞ කාව්‍යාදශෙ ශබ්දාලඞ්කාර දොෂවිභාගො නාම තෘතීයඃ පරිච්ඡේදඃ.**

**ආචාර්‍ය්‍යදණ්ඩීන්ගේ කෘතිවූ කාව්‍යාදශීයෙහි ශබ්දාලඞ්කාර දොෂවිභාග නම්වූ තෘතීය පරිච්ඡේදය මෙසේයි.**

යන්න අඩුවී තිබේ.

නමස්තස්මෛ භගවතෙ අර්හතෙ සම්‍යක් සම්බුද්ධාය.

---

## සන්න සහිත

# කාව්‍යාදර්ශය.

1 චතුර්මුඛ මුඛාම්භොජ වනහංස වධූ ර්මම
මානසෙ රමතාං නිත්‍යං * සර්වශුක්ලා සරස්වතී.

චතුර්මුඛ, බ්‍රහ්මයාගේ; මුඛ, මුඛනැමති; අම්භොජවන, පියුම් වෙනෙහි; හංසවධූඃ, හංසියක බඳුවූ; සර්වශුක්ලා, සර්වප්‍රකාරයෙන් නිර්මලවූ; සරස්වතී, කාව්‍යස්වරූප සරස්වතීතොමෝ; මම, මාගේ; මානසෙ, සිත්හි; නොහොත් සිත් නැමති මානස නම් විල්හි; නිත්‍යම්, හැමකල්හි; රමතාම්, ඇලේවා. මෙයින් මේ දණ්ඩ්‍යාචාර්යයෝ සදාචාර සංරක්ෂණය පිණිස විෂ්ණු මූර්තිස්මරණය කළහයි දතයුතුයි. † කාව්‍යලක්ෂණ ග්‍රන්ථාරම්භ ප්‍රස්තාවහෙයින් විෂ්ණු මූර්තිවූ කාව්‍යස්වරූප සරස්වතියගේ ගැන්ම යෙදේමය.

2 පූර්වශාස්ත්‍රාණි සංහෘත්‍ය ප්‍රයොගානුපලභ්‍ය ච
යථාසාමර්ථ්‍යමස්මාභිඃ ක්‍රියතෙ කාව්‍යලක්ෂණම්.

පූර්වශාස්ත්‍රාණි, පුරාතනයන්ගේ ශාස්ත්‍රයන්; සංහෘත්‍ය, හකුළුවා; ප්‍රයොගාන්, කවිප්‍රයොගයන්; උපලභ්‍යච, මොනවට බලාද; යථාසාමර්ථ්‍යම්, ශක්තිපරිද්දෙන්; අස්මාභිඃ, අප විසින්; කාව්‍යලක්ෂණම්, කාව්‍යලක්ෂණය; ක්‍රියතෙ, කරනුලැබේ.

---

* නිත්‍යම් යනතැන දීර්ඝම් ක්‍රියාත් පාඨඇති බොහෝ කාලයක් මුළුල්ලෙහි යනු එහි අර්ථයි, මාගේ සරස්වතීතොමෝ ශිෂ්‍යයන්ගේ සිත්නැමති විලෙහි ඇලේවායි අර්ථකිම ඇතැම් ආචාර්ය මතබව මාලින්‍යප්‍රොඤ්ඡිනීකාරයෝ කියත්.

† කාව්‍යාලාපාශ්ච යෙකෙචිද් ගීතකාන්‍යඛිලානිච
ශබ්දමූර්තිධරස්‍යෛතෙ විෂ්ණොරංශා මහාත්මනඃ.

යනු විෂ්ණු පුරාණයි.

බ්‍රහ්මයාගේ මුඛපද්මයන්හි සතතයෙන් වාසයකරන්නාවූ සර්වප්‍රකාරයෙන් දොෂවිරහිතවූ වෙදස්වරූප සරස්වතිදෙවිය මෙහිදී අභිමතය යනු ඇතැම් ආචාර්යවරයන්ගේ අභිප්‍රායවේ.

3 ඉහ ශිෂ්ටානුශිෂ්ටානාං ශිෂ්ටානාමපි සර්වථා
වාචාමෙව ප්‍රසාදෙන ලොකයාත්‍රා ප්‍රවර්තතෙ.

ඉහ, මේ ලොකයෙහි; ශිෂ්ට, ශිෂ්ටයන් විසින්; අනුශිෂ්ටානාම්, අනුශාසනාකරණලද්දාවූද; (පාණිත්‍යාදි ශිෂ්ටයන් විසින් ප්‍රකෘති ප්‍රත්‍යය විභාගාදීන් ව්‍යුත්පාදිතවූදැයිසේයි) ශිෂ්ටානාම්, ඉතිරිවූද; හෙවත් ප්‍රකෘතිප්‍රත්‍යය විභාගාදි කල්පනාවෙන් තොරවූද; වාචාම්එව, වචනයන්ගේම; ප්‍රසාදෙන, පහන්බව හෙතුකොටගෙන; ලොකයාත්‍රා, ලොකව්‍යවහාරය; ප්‍රවර්තතෙ, පවතී.

4 ඉදමන්ධංතමඃ කෘත්ස්නං ජායෙත භුවනත්‍රයම්
යදි ශබ්දාහ්වයං ජ්‍යොතිරාසංසාරං න දීප්‍යතෙ.

යදි, ඉදින්; ශබ්දාහ්වයම්, ශබ්දනැමති; ජ්‍යොතිඃ, ආලොකය; ආසංසාරම්, මුළුලොව පැතිරගෙන; නදීප්‍යතෙ, නොබබලානම්; කෘත්ස්නම්, සියලු; ඉදං භුවනත්‍රයම්, මේ තුන්ලොව; අන්ධංතමඃ, ඝනාන්ධකාරවූයේ; ජායෙත, වෙයි.

5 ආදිරාජ යශොබිම්බ මාදර්ශං ප්‍රාප්‍ය වාඞ්මයම්
තෙෂාමසන්නිධානෙපි න ස්වයං පශ්‍ය නශ්‍යති.

ආදිරාජ, ආදිකාලයෙහිවූ රජදරුවන්ගේ; යශොබිම්බම්, කීර්ති නැමති ප්‍රතිබිම්බය; වාඞ්මයම්, කාව්‍යශාස්ත්‍රමයවූ; ආදර්ශම්, කැටපතට; ප්‍රාප්‍ය, පැමිණ; තෙෂාම්, ඒ රජදරුවන්ගේ; අසන්නිධානෙපි, නැතිකලත්; නන්ශ්‍යති, නොනැසේ; ස්වයම්, තෙමේ; පශ්‍ය, බල.

6 ගෞර්ගෞඃ කාමදුඝා සම්‍යක් ප්‍රයුක්තා ස්මර්‍ය්‍යතෙ බුධෛඃ
දුෂ්ප්‍රයුක්තා පුනර්ගොත්වං ප්‍රයොක්තුඃ සෛව ශංසති.

ගෞඃ, කාව්‍ය ස්වරූපවාක්‍යනොමෝ; සම්‍යක්, මොනවට; ප්‍රයුක්තා, යොදනලද්දී; කාමදුඝා, කැමතිවස්තූන් දෙහනයකරන්නාවූ; ගෞඃ (ධෙනුඃ), සුරභිධෙනුව මෙනැයි; බුධෛඃ, පණ්ඩිතයන් විසින් ස්මර්‍ය්‍යතෙ, සිහිකරනු ලැබේ; පුනඃ, නැවත; සාඑව, හොම; දුෂ්ප්‍රයුක්තා, (ශාස්ත්‍රරීති වරදවා) නපුරුකොට යොදනලද්දී; ප්‍රයොක්තුඃ, (හේනොමනාවාක්) ප්‍රයොගකරන්නහුගේ; ගොත්වම්, ගොන්බව; හෙවත් අඥබව; ශංසති, ප්‍රකාශකෙරේ.

7 තදල්පමපි නොපෙක්ෂ්‍යං කාව්‍යෙ දුෂ්ටං කථඤ්චන
ස්‍යාද්වපුඃ සුන්දරමපි ශ්විත්‍රෙණෛකෙන දුර්භගම්.

තත්, එහෙයින්; කාව්‍යෙ, කාව්‍යයෙහි; අල්පම්පි, ස්වල්පවූද; දුෂ්ටම්, දෝෂය; නඋපෙක්ෂ්‍යම්, උපෙක්ෂා නොකටයුතුයි; (සර්වප්‍රකාර යෙන් දෝෂපරිහාරයට උත්සාහ වැඩියයුතුයිසේයි) වපුඃ, ශරීරය; සුන්ද රමපි, සෞන්දර්‍ය්‍යගුණ යුක්තවූයේද; එකෙනශ්විත්‍රෙණ, එක් කබරය කින්; දුර්භගම් ස්‍යාත්, කාලකන්නිවෙයි.

8 ගුණදෝෂා නශාස්ත්‍රඥඃ කථං විභජතෙ ජනඃ
කිමන්ධස්‍යාධිකාරොස්ති රූපභෙදපලබ්ධිෂු.

අශාස්ත්‍රඥඃ ශාස්ත්‍රනොදත්; ජනඃ, ජනතෙම; ගුණදෝෂාන්, නොහළයුතු ශ්ලෙෂප්‍රසාදාදි ගුණයන් හා හළයුතු ශ්‍රුතිකටුත්වාදි දෝ ෂයන්; කථම්, කෙසේ; විභජතෙ, විභාගකරයිද; (විශෙෂයෙන් දනී දැයිසේයි). මෙහි භජධාතුඥනාර්ථයෙහි වැටේ, මිට දෘෂ්ටාන්ත කියත්; අන්ධස්‍ය, අන්ධයාහට; රූපභෙදෙපලබ්ධිෂු, රූපවිශෙෂ බැලීමෙහි; අධිකාරඃ, බලයෙක්; කිංඅස්ති, කුමැයි ඇත්ද (නැත්මැයිසේයි).

9 අතඃ ප්‍රජානාං ව්‍යුත්පත්තිමභිසන්ධාය සූරයඃ
වාචාං විචිත්‍රමාර්ගාණාං නිබබන්ධුඃ ක්‍රියාවිධිම්.

අතඃ, මේ හෙතුවින්; සූරයඃ, පණ්ඩිතයෝ; ප්‍රජානාම්, ජනයන් ගේ; ව්‍යුත්පත්තිම්, වාග්ව්‍යවහාරයෙහි දක්ෂබව; අභිසන්ධාය, සඳහා; විචිත්‍රමාර්ගාණාම්, විසිතුරුවූ මාර්ගඇති; හෙවත් වෛදර්භගෞඩාදි නානාප්‍රකාරරීතිඇති; වාචාම්, කාව්‍යස්වරූප වචනයන්ගේ; ක්‍රියාවි ධිම්, රචනාපිණිස වූ විධිය; නිබබන්ධුඃ, බැන්දෝ.

10 තෛඃ ශරීරඤ්ච කාව්‍යානා මලඞ්කාරාශ්ච දර්ශිතාඃ
ශරීරං තාවදිෂ්ටාර්ථ ව්‍යවච්ඡින්නා පදාවලී.

තෛඃ, ඒ පූර්වාචාර්‍ය්‍යයන් විසින්; කාව්‍යානාම්, කාව්‍යයන්ගේ; ශරීරඤ්ච, ශරීරයද; අලඞ්කාරාශ්ච, අලඞ්කාරයෝද; දර්ශිතාඃ, දක්වන ලදහ; ශරීරංතාවත්, ශරිරයනම්; (මෙහි තාවත් යනු වාක්‍යාලඞ්කා රයෙහියි); ඉෂ්ටාර්ථ, පණ්ඩිත ජනහලාදජනකවූ අර්ථයෙන්; ව්‍යවච්ඡින්නා, නුසුන්වූ; පදාවලී, පදසමූහයවේ.

11 පද්‍යං ගද්‍යඤ්ච මිශ්‍රඤ්ච තත්ත්‍රිධෛව ව්‍යවස්ථිතම්
පද්‍යං චතුෂ්පදී තච්ච වෘත්තං ජාතිරිති විධා.

තත්, ඒ කාව්‍යය; පද්‍යම්, පද්‍යය; ගද්‍යම්, ගද්‍යය; මිශ්‍රඤ්ච, මිශ්‍රයදැයි ත්‍රිධාඑව, තුන්පරිද්දකින්ම; ව්‍යවස්ථිතම්, ආචාර්‍ය්‍යයන් විසින් නියමි තයි; පද්‍යම්, පද්‍යනම්; චතුෂ්පදී, සතරපද ඇත්තේවේ; තච්ච, හෙද; වෘත්තම්, වෘත්තය; ජාතිඃඉති, ජාතියයි; විධා, දෙවැදෑරුම්වේ.

12 ඡන්දෝවිචිත්‍යාං සකලස්තත්ප්‍රපඤ්චෝ නිදර්ශිතඃ
සා විද්‍යානෞස්තිතීර්ෂූණාං ගම්භීරං කාව්‍යසාගරම්.

ඡන්දෝවිචිත්‍යාම්, පිඞ්ගලාදීන් විසින් කළ ඡන්දශ්ශාස්ත්‍රයෙහි; නොහොත් මත්කෘතඡන්දෝ විචිතිනම් ග්‍රන්ථයෙහි; තත්, ඒ වෘත්ත ජාති දෙදෙනා සම්බන්ධවූ; සකලඃ ප්‍රපඤ්චඃ, සියලු විස්තරය; නිදර්ශිතඃ, දක්වනලදී; සාවිද්‍යා, ඒ ඡන්දස්විද්‍යාතොමෝ; ගම්භීරම්, ගැඹුරුවූ; කාව්‍යසාගරම්, කාව්‍යනැමති සාගරය; තිතීර්ෂූණාම්, තරණයකරනු කැමැත්තන්ට; නෞඃ, නැවෙකි.

13 මුක්තකං කුලකං කෝෂඃ සඞ්ඝාත ඉති තාදෘශඃ
සර්ගබන්ධාඞ්ග රූපත්වාදනුක්තඃ පද්‍යවිස්තරඃ.

මුක්තකම්, මුක්තකය; කුලකම්, කුලකය; කෝෂඃ, කෝෂය; සඞ්ඝාතඃ, සඞ්ඝාතය; (ඉතිශබ්දය එවමර්ථයෙහිවේ) ඉති, මෙසේවූ; තාදෘශඃ පද්‍යවිස්තරඃ, තත්සජාතීයවූ (මෙයින් පිටත් යුග්මකාදිවූද) පද්‍ය විස්තරය; සර්ගබන්ධාඞ්ග රූපත්වාත්, සර්ගබන්ධ මහා කාව්‍යයාගේ අවයව රූපහෙයින් (හෙවත් මතු දක්වනු ලබන මහාකාව්‍ය රූපවූ ප්‍රධානභේදයාගේ ඒකදේශස්වරූපහෙයින්; අනුක්තඃ,* නොකියන ලදී. මුක්තකාදී පද්‍යවිස්තර අන්‍යයන් විසින් කියනලද නුමුත් ඒ මුක්තකාදිය මහා කාව්‍යයාගේ අවයව බැවින් ග්‍රන්ථබාහුල්‍යභීතීන් අප විසින් මෙහිදී නොකියනලදී, ග්‍රන්ථාන්තරබලා දත යුතුයිසේයි).

(එහි මුක්තකනම් අන්‍යශ්ලෝක සම්බන්ධයෙන් තොරවූ එක පද්‍ය යක්ම ආත්මකොට ඇති බන්ධයයි එහෙයින් කියනලදමැයි අග්නිපුරාණයෙහි "මුක්තකඃ ශ්ලෝකඑවෛකශ්චමත්කාරක්ෂමඃ සතාම්"යි කුලකනම් පඤ්චශ්ලෝකාත්මක බන්ධයයි හෙද කියනලදමැයි"

"ද්වාභ්‍යාන්තු යුග්මකං ඥෙයං ත්‍රිභිස්තු විශේෂකම්
චතුර්භිස්තු කලාපංස්‍යාත් පඤ්චභිඃ කුලකංමතම්"

කෝෂනම් අන්‍යොන්‍ය නිරපේක්ෂකවූ පද්‍යසමූහයකි. කියනලද මැයි "කෝෂඃ ශ්ලෝක සමූහස්තුස්‍යාදන්‍යොන්‍යානපේක්ෂකඃ" යි සඞ්ඝාතනම් වෙන වෙනම පරිසමාප්තවූ අර්ථඇති පද්‍යයන්ගෙන් කථා සමාප්තියයි හෙද කියනලදී.

---

* එනෙහාප්‍රතිෂේධනඤ්කල්පං තත්පුරුෂඉති වෝද්ධ්‍යස්‍යනාවසරඃ අධ්‍යාහෘතස්‍ය ග්‍රන්ථාන්තරවෛදිතව්‍යත්වස්‍ය විධෙයත්වේනනස්‍ය පස්ප්‍රිද සත්වාත්, අන්‍යතුසාදෘශ්‍යාර්ථක පර්‍යුදාසනඤ් අනුක්ත උක්තප්‍රාය එවෙත්‍යර්ථඉත්‍යාහුඃ යත්තු මාලින්‍ය ප්‍රෝඤ්ජිනී ටීකායි.

"යත්‍රකවිරේකමර්ථං ව්‍යත්තනෙකෙන වර්ණයතිකාව්‍ය
සඞ්ඝාතඃ සනිගදිතො ව්‍යාඤ්ජනමෙඤ්ජනාදිඃ" යි.

අන්‍යයෝ කුලකයට වාණාවලියයිද නම් කෙරෙති. ඒ මෙසේයි–

"ඒකඃ ශ්ලොකොමුක්තකං ස්‍යාත්වාභ්‍යාංයුගලකංසම්‍යතම්
ත්‍රිභිඃ ගුණවතී ප්‍රොක්තා චතුර්භිස්තු ප්‍රභද්‍රකම්
වාණාවලිපඤ්චභිඃ ස්‍යාත් ෂඩ්භිස්තුකරහාටකඃ" යි.

14 සර්ගබන්ධො මහාකාව්‍ය මුච්‍යතෙ තස්‍ය ලක්ෂණම්
ආශීර්නමස්ක්‍රියාවස්තු නිර්දේශොවාපි තන්මුඛම්.

සර්ගබන්ධඃ, සර්ගබන්ධනම්; මහාකාව්‍යම්, මහාකාව්‍යයයි; තස්‍ය, ඒ මහාකාව්‍යයාගේ; ලක්ෂණම්, ස්වරූපය; උච්‍යතෙ, කියනු ලැබේ; ආශීඃවා, ඉෂ්ටප්‍රාර්ථනාව හෝ; නමස්ක්‍රියාවා, නමස්කාරය හෝ; අපි, යළි; වස්තුනිර්දේශොවා, වස්තුදක්වීම හෝ; තත්, ඒ මහාකාව්‍යයාගේ; මුඛම්, ආදිභාගයවේ.

15 ඉතිහාසකථොද්භූත මිතරද්වා සදාශ්‍රයම්
චතුර්වර්ගඵලොපෙතං චතුරොදාත්ත නායකම්.

ඉතිහාසකථා, රාමායණභාරතාදිවූ ඉතිහාස කථාවකින් ගෙන; උද්භූතංවා, බඳනාලද්දේ හෝ; ඉතරත්, මෙයින් අන්‍යවූ; සදාශ්‍රයංවා, සත්‍යවූ මූලාශ්‍රයක් හෝ ඇති; (මෙයින් ස්වකල්පිත අමූලික වෘත්තාන්ත මහාකාව්‍යයෙහිලා වර්ණනානොකළ යුතු බැව් හැඟවූහු) චතුර්වර්ග ඵල, චතුර්වර්ගසම්පත් ඵලයෙන්; උපෙතම්, යුක්තවූ; චතුර, ධීරවූ; උදාත්ත, උසස්වූ; නායකම්, කාව්‍යනායකයා ඇති.

16 නගරාර්ණවශෛලර්තු චන්ද්‍රාර්කෝදයවර්ණනෛඃ
උද්‍යානසලිලක්‍රීඩා මධුපානරතොත්සවෛඃ.

නගර, නුවර; අර්ණව, සයුර; ශෛල, පර්වත; ඍතු, ඍතුය; චන්ද්‍රාර්කෝදය, සඳහිරු දෙදෙනාගේ උදය යන මොවුන් සම්බන්ධවූ; වර්ණනෛඃ, වර්ණනායෙන්ද; උද්‍යානසලිලක්‍රීඩා, උයන්කෙළි හා දියකෙළිය; මධුපාන, මීබීම; රතොත්සවෛඃ, රතික්‍රීඩා යන මෙයින්ද; (මෙහි සඳහිරු දෙදෙනාගේ උදයයි කීම උපලක්ෂණහෙයිනි. එහෙයින් අස්තමයද ගතයුතුයි).

17 විප්‍රලම්භෛ ර්විවාහෛශ්ච කුමාරෝදයවර්ණනෛඃ
මන්ත්‍රද්‍රූතප්‍රයාණාජි නායකාභ්‍යුදයෛරපි.

විප්‍රලම්භෛඃ, විරහයෙන්ද; විවාහෛශ්ච, විවාහයෙන්ද; (මෙ දෙතන්හි බහුවචන විප්‍රලම්භ විවාහයන්ගේ අනෙකත්වය හඟවන

පිණිසයි); කුමාරෝදය වර්ණනෛඃ, කුමරුන්ගේ ඉපැද්ම හා වර්ණනය යන මෙයින්ද; (කුමාරෝදය වර්ණනෛඃ යන පාඨාන්තරයෙහි කුමාරෝදය වර්ණනායෙන්දැයි අර්ථයි); මන්ත්‍ර, මන්ත්‍රණය; දූත, දූතය; ප්‍රයාණ, යුද්ධාභිගමනය; ආජි, යුද්ධය; නායකාභ්‍යුදයෛඃ අපි, කාව්‍ය නායකයාගේ අභ්‍යුදය සංඛ්‍යාත සතුරන් පැරදවීම යන මෙයින්ද.

18 අලඞ්කෘත මසංක්ෂිප්තං රසභාවනිරන්තරම්
සර්ගෛ රනතිවිස්තීර්ණෛඃ ශ්‍රව්‍යවෘත්තෛඃ සුසන්ධිභිඃ.

අලඞ්කෘතම්, සරසනලද; අසංක්ෂිප්තම්, සංක්ෂේපනොකරණලද; හෙවත් පලලවිත වෘත්තාන්තඇති; රසභාව, ශෘඞ්ගාරාදිරසයෙන් හා භාවසඞ්ඛ්‍යාත විලාසාදියෙන්ද; නිරන්තරම්, අභිව්‍යාප්තවූ; අනතිවිස්තීර්ණෛඃ, අතිශයින් විස්තීර්ණනුවූ; සර්ගෛඃ, සර්ගයන්ගෙන්ද; ශ්‍රව්‍ය වෘත්තෛඃ කණට මිහිරිවූවෘත්තයන්ගෙන්ද; සුසන්ධිභිඃ, ශොභනවූ සන්ධියෙන්ද; (මතු එන සර්ග අපෙක්ෂාකොටඇති සර්ගාන්තයන්ගෙන් දැයිසේයි.

19 සර්වත්‍රභින්නවෘත්තාන්තෛ රුපෙතං * ලොකරඤ්ජකම්
කාව්‍යං කල්පාන්තරස්ථායි ජායෙත සදලඞ්කෘති.

සර්වත්‍ර, සියලු තන්හි; භින්නවෘත්තාන්තෛඃ, භින්නවෘත්ත ඇති සර්ගාන්තයන්ගෙන්ද; උපෙතම්, යුක්තවූ; ලොකරඤ්ජකම්, ලොකයාගේ සිත් ඇලවීම කරන්නාවූ; සදලඞ්කෘති, ශොභනවූ අලඞ්කාර ඇති; කාව්‍යම්, කාව්‍යය; කල්පාන්තරස්ථායි, කල්පාන්තයදක්වා සිටිනේ; ජායෙත, වෙයි. මෙහි අන්තර ශබ්දය අන්තශබ්දාර්ථයි).

20 න්‍යූනමප්‍යත්‍ර යෛඃ කෛශ්චිදඞ්ගෛඃ කාව්‍යං නදුෂ්‍යති
යද්‍යුපාත්තෙෂු සම්පත්ති රාරාධයති තද්විදඃ.

අත්‍ර, මෙහි; යෛඃ කෛශ්චිදඞ්ගෛඃ, යම් කිසි අඞ්ගයකින්; න්‍යූනම්අපි, අඩුවූයේද; කාව්‍යම්, කාව්‍යය; නදුෂ්‍යති, දූෂ්‍යනොවේ; යදි ඉදින්; උපාත්තෙෂු, ගන්නාලද විෂයන්හි; සම්පත්තිඃ, රචනාමාධුර්‍ය්‍යයවේ නම්; තද්විදඃ, ඒදන්නන්; ආරාධයති, සතුටුකරයි. (කාව්‍යයෙහි නගරවර්ණනාදින් අතුරෙන් කිසිවක් අඩුවුනත් වර්ණිතවූ පදාර්ථ සම්පත් පණ්ඩිතයන්ගේ සිත් සතුටුකරයිසේයි).

21 ගුණතඃ ප්‍රාගුපන්‍යස්‍ය නායකං තෙන විද්විෂාම්
නිරාකරණ මිත්‍යෙෂ මාර්ගඃ ප්‍රකෘතිසුන්දරඃ.

ගුණතඃ, ගුණවශයෙන්; ප්‍රාක්, පළමුකොට; නායකම්, කාව්‍ය නායකයා; උපන්‍යස්‍ය, වර්ණනාකොට; තෙන, ඔහු විසින්; විද්විෂාම්,

* “ලොකරඤ්ජනම්” යනුද ඇතැම්.

සතුරන්ගේ; නිරාකරණම්ඉති, පැරදවීම් සඞ්ඛ්‍යාත නිරාකරණය යන එෂඃමාර්ගඃ, මේ මාර්ගය; ප්‍රකෘතිසුන්දරඃ, ප්‍රකෘතියෙන් මනොහරයි.

22 වංශවීර්‍ය්‍යශ්‍රුතාදීනි වර්ණයිත්වා රිපොරපි
තජ්ජයාන්නායකොත්කර්ෂ වර්ණනඤ්ච ධිනොති නඃ.

රිපොඃඅපි, සතුරාගේද; වංශ, සත්කුලතාය; වීර්‍ය්‍ය, ශක්තිය; ශ්‍රැත, ශාස්ත්‍රය යන; ආදීනි, මේ ආදිය; වර්ණයිත්වා, වර්ණනාකොට; තත්, ඒ සතුරාගේ; ජයාත්, දිනීමෙන්; නායකොත්කර්ෂවර්ණනඤ්ච, කව්‍යනායකයාගේ උත්කර්ෂවර්ණනයද; නඃ, අප; ධිනොති, සතුටු කරයි.

23 අපාදඃ පදසන්තානො ගද්‍යමාඛ්‍යායිකා කථා
ඉති තස්‍ය ප්‍රභෙදෞ ද්වෞ තයොරාඛ්‍යායිකා කිල.

අපාදඃ, මාත්‍රාක්ෂරනියමිත ස්වරූපවූ පාදනැති; පදසන්තානඃ, පද සමූහය; ගද්‍යම්, ගද්‍යනම; (ශ්ලොකබන්ධනයට නොනැගු කාව්‍යය ගද්‍යනමැයිසේයි); තස්‍ය, ඒ ගද්‍යය සම්බන්ධවූ; ආඛ්‍යායිකා, අඛ්‍යායිකාය; කථාඉති, කථායයි; ද්වෞප්‍රභෙදෞ, ප්‍රභෙද දෙකෙකි; තයොඃ, උන්දෙන්නා අතුරෙන්; ආඛ්‍යායිකාකිල, අඛ්‍යායිකාවචනාති

24 නායකෙනෛව වාච්‍යාන්‍යා නායකෙනෙතරෙණ වා
ස්වගුණාවිෂ්ක්‍රියා දෙෂො නාත්‍රභූතාර්ථශංසිනඃ.

නායකෙනඑව, කාව්‍යනායකයා විසින්ම; වාච්‍යා, කියයුත්තීය; අන්‍යා, අනික් කථාතොමෝ; නායකෙනවා, නායකයා විසින් හෝ; ඉතරෙණවා, අනිකකු විසින් හෝ; වාච්‍යා, කියයුත්තීය; අත්‍ර, මෙහිලා; ස්වගුණආවිෂ්ක්‍රියා, තමන්ගුණ පහළකිරිම; භූතාර්ථ ශංසිනඃ, යථාර්ථය ප්‍රකාශකරන්නාහට; නදෙෂඃ, දෙෂනැති.

25 අපිත්වනියමොදෘෂ්ටස්තත්‍රාප්‍යන්‍යෛ රුදීරණාත්
අන්‍යො වක්තා ස්වයං වෙති කීදෘග්වාභෙදලක්ෂණම්.

(මෙයින් ප්‍රාචීනමතය දූෂණයකෙරේ) අපිතු, එකෙක්වනු; තත්‍ර අපි, ඒආඛ්‍යායිකායෙහිදු; අන්‍යෛඃ, අන්‍යයන් විසින්; උදීරණාත්, කියනහෙයින්; අනියමඃ, පූර්වමතය හා විරුඬවූ අනියමය; දෘෂ්ටඃ, දක්නාලදී; වක්තා, වක්තෘතෙම; අන්‍යොවා, අනිකෙක්හෝ; ස්වයම් වාඉති, තෙමේ හෝ යන; භෙදලක්ෂණම්, විශෙෂ ලක්ෂණය; කීදෘක්, කෙබඳුද. (කථායෙහි තෙමේ හෝ අනිකෙක් හෝ වක්තෘයි ආඛ්‍යායිකායෙහිද මෙය පෙණෙයි. එසේහෙයින් මුන් දෙන්නාගේ භෙදයෙක් නැතැයිසේයි).

26 වක්ත්‍රඤ්චාපරවක්ත්‍රඤ්ච සොච්ඡ්වාසත්වඤ්ච භෙදකම්
චිහ්නමාඛ්‍යායිකායාශ්චෙත් ප්‍රසඞ්ගෙන කථාස්වපි.

27 ආර්‍ය්‍යාදිවත් ප්‍රවේශඃ කිං න වක්ත්‍රාපරවක්ත්‍රයෝඃ
භේදශ්ච දෘෂ්ටෝ ලම්භාදි රුච්ඡ්වාසෝ වාස්තු කිං තතඃ.

චෙත්, ඉදින්; ආඛ්‍යායිකායාඃ, ආඛ්‍යායිකාවගේ; භේදකංචිහ්නම් භේදකර ලක්ෂණය; වක්ත්‍රංච, වක්ත්‍රනම් ඡන්දස්ඇතිබවද; අපරවක්ත්‍රංච, අපර වක්ත්‍රඡන්දස් ඇතිබවද; සොච්ඡ්වාසත්වංච, උච්ඡ්වාසනම් කථාංග ව්‍යවච්ඡේද ඇතිබවදවේනම්; කථාසුඅපි, කථාවන්හිද; ප්‍රසඞ්ගේන, ප්‍රසඞ්ගයෙන්; ආර්‍ය්‍යාදිවත්, ආර්‍ය්‍යාදියමෙන්; වක්ත්‍රාපරවක්ත්‍රයෝඃ, වක්ත්‍ර අපරවක්ත්‍ර දෙදෙනාගේ; ප්‍රවේශඃ, ප්‍රවේශය; කිංන, කුමැයි නොවේද වේමැයි; දෘෂ්ටඃ, දක්නාලද; භේදශ්ච, භේදයද; ලම්භාදිඃ වා, ලම්භාදියහෝ; උච්ඡ්වාසඃවා, උච්ඡ්වාසයහෝ; අස්තු; වේවා; තතඃ, එයින්; කිං, කිම?

28 තත්කථාඛ්‍යායිකෙත්‍යෙකා ජාතිඃ සංඥාද්වයාඞ්කිතා
අත්‍රෛවාන්තර්භවිෂ්‍යන්ති ශේෂාශ්චාඛ්‍යානජාතයඃ.

තත්, එහෙයින්; කථා ආඛ්‍යායිකා ඉති, කථාය ආඛ්‍යායයි; සංඥාද්වයාඞ්කිතා, නාමද්වයකින් ලකුණුකරණලද්දී; එකාජාතිඃ, එක්ජාතියෙක (ගද්‍යාත්මකහෙයිනි); ශේෂාශ්ච, ඉතිරිවූද; ආඛ්‍යානජාතයඃ, ආඛ්‍යානජාතිහු; අත්‍රඑව, මෙහිම; අන්තර්භවිෂ්‍යන්ති, ඇතුළත්වෙති.

29 කන්‍යාහරණ සඞ්ග්‍රාම විප්‍රලම්භෝදයාදයඃ
සර්ගබන්ධසමාඑව නෛතේ වෛශේෂිකා ගුණාඃ.

කන්‍යාහරණ, කන්‍යාවන් පැහැරගැන්මය (යුද්ධාදියෙන් බලාත්කාරයෙන් ගැන්මයි රාක්ෂසෝද්වාහයයිසේයි); සඞ්ග්‍රාම, යුද්ධය; විප්‍රලම්භ, සම්භොග ශෘඞ්ගාරපූර්වභාගය; මෙය පූර්වරාගය මානය විප්‍රවාසය කරුණාත්මකයයි සිව් වැදෑරුම්වේ; * උදයාදයඃ, උදයාදීහුය යන මොහු; සර්ගබන්ධසමාඃඑව, මහාකාව්‍ය හා සදෘශවෙත්මය; එතෙ, මොහු; වෛශේෂිකාඃ, විශේෂකරවූ; ගුණාඃ, ගුණයෝ; න, නොවෙති

30 කවිභාවකෘතං චිහ්න මන්‍යත්‍රාපි න දුෂ්‍යති
මුඛමිෂ්ටාර්ථසංසිද්ධ්‍යෛ කිංහි න ස්‍යාත් කෘතාත්මනාම්.

කවිභාව, කවිහුගේ අභිප්‍රායෙන්; කෘතම්, කරණලද; චිහ්නම්, ලක්ෂණය; අන්‍යත්‍රාපි, කථාවෙන් අනික් තන්හිදු; නදුෂ්‍යති, දූෂ්‍ය නොවේ; කෘතාත්මනාම්, පණ්ඩිතයන්ගේ; කිංහි, කවරක්නම්; ඉෂ්ටාර්ථසංසිද්ධ්‍යෛ, අභිප්‍රේතාර්ථ සිද්ධිය පිණිස; මුඛං නස්‍යාත්, මුඛය නොවේද?

---

* අභිලාෂවිරහේර්ෂ්‍යාප්‍රවාසශාපහෙතුකඉතිපඤ්චවිධඃ යනු කාව්‍යප්‍රකාශයි.

31 මිශ්‍රාණිනාටකාදීනි තෙෂාමන්‍යත්‍ර විස්තරඃ
ගද්‍යපද්‍ය මයීකාචිච්චම්පූරිත්‍ය භි ධීයතෙ.

නාටකාදීනි, නාටකාදි දෘශ්‍යකාව්‍යයෝ; මිශ්‍රාණි, මිශ්‍රයෝයි; (ගද්‍යපද්‍යසංඛ්‍යාත, උභය කාව්‍යාත්මකහෙයිනි); තෙෂාම්, ඔවුන්ගේ; විස්තරඃ, විස්තරය; අන්‍යත්‍ර, භාරතාදි අන්‍යග්‍රන්ථයන්හිවේ; ගද්‍යපද්‍යමයී, ගද්‍යපද්‍යමයවූ; කාචිත්, කිසිවක්; චම්පූඃ ඉති, චම්පූයයි; අභිධීයතෙ, කියනුලැබේ. චම්පූකාව්‍යයෙහි වනාහි ගද්‍යපද්‍ය යන මොවුන් දෙදෙනාගේම අධිකබව වෙයි. අධ්‍යායිකායෙහි මදනැතොක දක්නාලැබෙන පද්‍ය සඳහා එය චම්පූයයි නොකියනුලැබෙයියේයි.

32 තදෙතද්වාඞ්මයං භූයඃ සංස්කෘතං ප්‍රාකෘතංතථා
අප භ්‍රංශශ්චමිශ්‍රඤ්චෙත්‍යාහුරාර්‍ය්‍යාශ්චතුර්විධම්.

තත්, එහෙයින්; එතත්වාඞ්මයම්, මේ කාව්‍යශාස්ත්‍රය; භූයඃ, බොහෝසෙයින්; සංස්කෘතම්, සංස්කෘතය; ප්‍රාකෘතම්, ප්‍රාකෘතය; අපභ්‍රංශශ්ච, අපභ්‍රංශය; මිශ්‍රඤ්චඉති, මිශ්‍රදැයි; චතුර්විධම්, සතරවැදෑරුම්කොට; ආර්‍ය්‍යාඃ, පණ්ඩිතයෝ; ආහුඃ, කියත්.

33 සංස්කෘතංනාම දෛවීවාගන්වාඛ්‍යාතා මහර්ෂිභිඃ
තද්භවස්තත්සමො දෙශීත්‍යනෙකඃ ප්‍රාකෘත ක්‍රමඃ.

සංස්කෘතංනාම, සංස්කෘතනම්; මහර්ෂිභිඃ, මහර්ෂීන් විසින්; අන්වාඛ්‍යාතා, අන්වාඛ්‍යාන කරණලද හෙවත් ප්‍රකෘතිප්‍රත්‍යය විභාගකල්පනාදීන් ප්‍රකාශකරණලද; දෛවීවාග්, දෛවීභාෂාවයි; තද්භවඃ, තද්භවය; තත්සමඃ, තත්සමය; දෙශී ඉති, දෙශීයයි හෙවත් තත්තත්දෙශ ප්‍රචලිතයයි; ප්‍රාකෘතක්‍රමඃ, ප්‍රාකෘතක්‍රමය; අනෙකඃ, බොහෝ ප්‍රකාරවෙයි. දෛවීවාක්, දෙවියන් විසින් ව්‍යවහාරකටයුතුවූ භාෂාතොමෝ; මහර්ෂිභිඃ, මහර්ෂීන් විසින්; සංස්කෘතංනාම, සංස්කෘතනමැයි; අන්වාඛ්‍යාතා, ප්‍රකාශකරණලදු; මෙහි ප්‍රථමාර්ථයට මෙසේද අර්ථකියත්.

34 මහාරාෂ්ට්‍රාශ්‍රයාංභාෂාං ප්‍රකෘෂ්ටං ප්‍රාකෘතංවිදුඃ
සාගරඃ සූක්තිරත්නානාං සෙතුබන්ධාදි යන්මයම්.

සූක්තිරත්නානාම්, යහපත් වචන නැමතිරත්නයන්ට; සාගරඃ, සාගරවූ; සෙතු බන්ධාදි, සෙතු බන්ධාදිය; යන්මයම්, යම්භාෂාවකින් කරණලදද; මහාරාෂ්ට්‍රා ශ්‍රයාම්, මහරට ඇසුරුකළාවූ; භාෂාම්, ඒ භාෂාව; ප්‍රකෘෂ්ටම්, උත්කෘෂ්ටවූ; ප්‍රාකෘතම්, ප්‍රාකෘතයයි; විදුඃ, දනිති; සෙතුබන්ධනම් කාව්‍යයකි. මෙහි ආදි ශබ්දයෙන් දශමුඛබධාදි කාව්‍යයන්ගේ ගැන්මයි. මහාරාෂ්ට්‍රනම් දක්ෂිණා පථවර්තීහිදෙශ විශෙෂයකි.

35 ශෞරසෙනීච ගෞඩීච ලාටීචාන්‍යාචතාදෘශී
යාතිප්‍රාකෘතම්ත්‍යෙවං ව්‍යවහාරෙෂු සන්නිධිම්.

ශෞරසේනීච, ශෞරසේනීභාෂාවද; ගෞඩීච, ගෞඩීභාෂාවද; ලාටීච. ලාටීභාෂාවද; තාදෘශී, එබඳුවූ; අන්‍යාච, අන්‍යවූදේශීය භාෂා තොමෝද; ප්‍රාකෘතමිත්‍යෙව, ප්‍රාකෘතයයි; එවම්, මෙසේ; ව්‍යවහාරෙෂු, ව්‍යවහාරයන්හි; සන්නිධිංයාති, ප්‍රයොගයටයේ.

36 ආභිරාදිගිරඃකාව්‍යෙෂ්ව පභ්‍රංශඉතිස්මෘතාඃ
ශාස්ත්‍රෙෂු සංස්කෘතා දන්‍යදපභ්‍රංශතයොදිතම්.

කාව්‍යෙෂු, නාටකාදි කාව්‍යයන්හි; ආභිරාදි, ගොපලුසැඩොලු ආදීන් ගේ; ගිරඃ, වචනයෝ; අපභ්‍රංශඉති, අප භ්‍රංශයයි; ස්මෘතාඃ, දන්නාලද්දාහ; ශාස්ත්‍රෙෂු, වෛද්‍යශාස්ත්‍රයන්හි; සංස්කෘතාත්, සංස්කෘතභාෂාව හැර; අන්‍යත්, සෙස්ස; (අනික් ප්‍රාකෘතාදී භාෂා); අපභ්‍රංශතයා, අප භ්‍රංශභාවයෙන්; උදිතම්, කියනලදී.

37 සංස්කෘතං සර්ගබන්ධාදි ප්‍රාකෘතං ස්කන්ධකාදිකම්
ආසාරාදීන්‍යපභ්‍රංශො නාටකාදිතු මිශ්‍රකම්.

සර්ගබන්ධාදි, සර්ගබන්ධාදිය හෙවත් මහාකාව්‍යාදිය; සංස්කෘතම්, සංස්කෘත භාෂාමයයෙවයි; ස්කන්ධකාදිකම්, ස්කන්ධකාදී ඡන්දසින් බඳනාලද කාව්‍යය; ප්‍රාකෘතම්, ප්‍රාකෘතභාෂාමය වෙයි; ආසාරාදීනි, ආසාරාදි ඡන්ද සින් බඳනාලදකාව්‍ය; අපභ්‍රංශඃ, අප භ්‍රංශභාෂාමයයෙති; නාටකාදිතු, නාටකාදිය වනාහි; මිශ්‍රකම්, නානාභාෂාත්මක හෙයින් මිශ්‍රකනම්වේ.

38 කථාහිසර්වභාෂාභිඃ සංස්කෘතෙනච බධ්‍යතෙ
භූතභාෂාමයීං ප්‍රාහුරද්භුතාර්ථාං බෘහත්කථාම්.

කථා, පූර්වොක්ත ලක්ෂණ කථාතොමෝ; සර්වභාෂාභිඃ, සියලු භාෂාවලින්ද; සංස්කෘතෙනච, සංස්කෘත භාෂාවෙන්ද; බධ්‍යතෙහි, බඳනා ලැබේමය; අද්භුතාර්ථාම්, අද්භුතවූ අර්ථරසඇති; බෘහත්කථාම්, බෘහත් කථාව; භූතභාෂාමයීං, පෛශාචීභාෂාවෙන් රචනාකරණලදැයි; ප්‍රාහුඃ, කියත්. මෙහි හිශබ්දය අවධාරණයෙහි වැටේ.

39 ලාස්‍යච්ඡලිතශල්‍යාදි ප්‍රෙක්ෂාර්ථමිතරත්පුනඃ
ශ්‍රව්‍යමෙවෙති සෛෂාපි ද්වයීගතිරුදාහෘතා.

ලාස්‍ය, ලාස්‍යය; ඡලිත, ඡලිතය; ශල්‍යාදි, ශල්‍යයයනමෙ ආදිය; ප්‍රෙක්ෂාර්ථම්, දක්නායුතුවූ; වස්තු ඇත්තේවෙයි; පුනඃ, නැවත; ඉතරත්, මෙහින් අන්‍යවූ කාව්‍යය; ශ්‍රව්‍යමෙව, ශ්‍රව්‍යමැයි; ඉති, මෙසේ; සාඑෂා, ඒ මේ; ද්වයීගතිඃඅපි, ගතිදෙකතුද; උදාහෘතා, දක්වනලදු; මෙහි ලාස්‍ය නම්, ශෘඞ්ගාරරසාම්‍රිතවූ ස්ත්‍රීන්ගේ නෘත්‍යයවේ; ඡලිතනම්, පිරිමි නැටුම්යි; ශල්‍යනම්, කම්මුලෙහි අනතැබීම් පූර්වකොටඇති නෘත්‍යයකි ආදිශබ්දයෙන් තාණ්ඩවාදීන්ගේ ගැනීමයි. එහෙයින් මේ ලාස්‍යාදියෙන් සම්බන්ධවූ කාව්‍යය දෘශ්‍යාර්ථයාගේ ප්‍රතිපාදනායෙන් දෘශ්‍යකාව්‍යනම්වේ. මෙයින් භින්නවූ මුක්තකාදිකාව්‍ය ශ්‍රවණමාත්‍ර විෂයහෙයින් ශ්‍රව්‍යකාව්‍ය නම්වේ.

40 අස්ත්‍යනෙකො ගිරාංමාර්ගඃ සූක්ෂ්මභෙදඃ පරස්පරම්
තත්‍රවෛදර්භගෞඩීයෞ වර්ණ්‍යෙතෙ ප්‍රස්ඵුටාන්තරෞ.

අනෙකඃ, අනෙකප්‍රකාරවූ; ගිරාංමාර්ගඃ, වචනයන් සම්බන්ධවූ රචනා මාර්ගය; අස්ති, ඇත; භෙද, පරස්පරං, ඔවුනොවුන්හා; සූක්ෂ්මභෙදඃ, සියුම්වූ ප්‍රභෙද ඇත්තේවෙයි. තත්‍ර, ඔවුන් අතුරෙන්; ප්‍රස්ඵුටාන්තරෞ අතිශයින් ස්ඵුටවූ ප්‍රභෙදඇති; වෛදර්භගෞඩීයෞ, වෛදර්භගෞඩීය මාර්ගයෝ දෙදෙන; වර්ණ්‍යෙතෙ, වර්ණනාකරනු ලැබෙත්; වෛදර්භි ගෞඩී, පාඤ්චාලි, ආවන්තිකා, ලාටී, මාගධ්‍යසි රචනාමාර්ගයාගේ අනෙක විධත්වය ඇතද ඔවුන් අතුරෙන් සමහර දෙනෙකුන්ගේ මහත්වූ භෙද යෙක් නැත. වෛදර්භිගෞඩී දෙදෙනාගේ භෙදය මහත්බැවින් උනු දෙදෙන අප විසින් මෙහි වර්ණනාකරනු ලැබෙයිසේයි.

41 ශ්ලෙෂඃ ප්‍රසාදඃ සමතාමාධුර්‍ය්‍යං සුකුමාරතා
අර්ථව්‍යක්තිරුදාරත්ව මොජඃකාන්තිසමාධයඃ.

ශ්ලෙෂඃ, ශ්ලෙෂය; ප්‍රසාදඃ, ප්‍රසාදය; සමතා, සමතාය; මාධුර්‍ය්‍යම්, මාධුර්‍ය්‍යය; සුකුමාරතා, සුකුමාරතාය; අර්ථව්‍යක්ති, අර්ථව්‍යක්තිය; උදාරත්වම්, උදාරත්වය; ඔජඃ; ඔජස; කාන්ති, කාන්තිය; සමාධයඃ, සමාධිය යනු.

42 ඉතිවෛදර්භමාර්ගස්‍ය ප්‍රාණා දශගුණාඃසමෘතාඃ
එෂාංවිපර්‍ය්‍යයඃ ප්‍රායො දෘශ්‍යතෙ ගෞඩවර්ත්මනි.

ඉති, මේ; දශගුණාඃ, ශබ්දාර්ථයන්ගේ උත්කර්ෂවිධායක ධර්ම විශෙෂ සංඛ්‍යාතවූ දශගුණයෝ; වෛදර්භමාර්ගස්‍ය, වෛදර්භමාර්ගයාගේ; ප්‍රාණාඃ, ප්‍රාණයහයි; සමෘතාඃ, දත්තාලද්දාහුයි; එෂාම්, මොවුන් සම්බන්ධවූ; විපර්‍ය්‍යයඃ, විපර්‍ය්‍යාසය; ප්‍රායඃ, බොහෝසෙයින්; ගෞඩවර්ත්මනි, ගෞඩරීති යෙහි; දෘශ්‍යතෙ, දක්නාලැබේ.

43 ශ්ලිෂ්ටමස්පෘෂ්ට ශෛථිල්‍යමල්ප ප්‍රාණාක්ෂරොත්තරම්
ශිථිලංමාලතී මාලා ලොලාලිකලිලා යථා.

අල්පප්‍රාණාක්ෂරොත්තරම්, අල්පප්‍රාණාක්ෂර බහුලවූ; ශිථිලං, සිථිලවූ බන්ධනයද; අස්පෘෂ්ටශෛථිල්‍යම්, ස්පර්ශනොකරණලද සිථිලබැව් ඇත්තේ; ශ්ලිෂ්ටම්, ශ්ලිෂ්ටනම්වේ-මිට දෘෂ්ටාන්ත කියත්; යථා, ඒ මෙසේයි; මාලතීමාලා, දෑසමන් මාලාතොමෝ; ලොල, ඔබිමොබ හෙනා හෙයින් චපලවූ; අලි, භෘඞ්ගයන් විසින්; කලිලා, ව්‍යාප්තයි. ගෞඩීයයෝ අනුප්‍රාස ප්‍රියහෙයින් මාලතීමාලා යනාදි බන්ධ වෛහෙවිත්ම කැමතිවෙති. මෙසේ අල්පප්‍රාණාක්ෂර සම්බන්ධය වර්ණ්‍යනාශය වශයෙන් ගාඪත්ව යෙන් වැටහේනම් ඒ ශ්ලෙෂගුණ යුක්තයයිසේයි. මාලතීමාලාලොලාලි කලිලා යන මේ වාක්‍යයෙහි මකාර ලකාර [illegible]කාර කකාර යන මොහු අල්පප්‍රාණාක්ෂරයෝය අල්පප්‍රාණාක්ෂරත්ව උච්චාරණ ප්‍රයත්නහෙයින්

දතයුතුයි අල්පප්‍රාණාක්ෂර සහිතවූ මේ වාක්‍යය අනුප්‍රාස සහිත විනාශ මන්‍ථමය හෙතුකොටගෙණ මදක් ගාඪවූ බන්ධයක්මෙන් වැටහේ යනු ගෞඩීය මතයි.

44 අනුප්‍රාසධියා ගෞඩෛස්තදිෂ්ටං බන්ධගෞරවාත්
වෛදර්භෛර්මාලතීදාම ලඞ්ඝිතංභ්‍රමරෛරිති.

ගෞඩෛඃ, ගෞඩීය කවීන් විසින්; අනුප්‍රාසධියා, අනුප්‍රාස බුද්ධියෙන්; බන්ධගෞරවාත්, බන්ධයාගේ ගාඪත්වය හෙතුකොටගෙණ; තත්, ඒ මාලතී මාලා යනාදී උදාහරණය; ඉෂ්ටම්, කැමතිවනලදී; අනුප්‍රාසනම් වර්‍ණයන්ගේ ආවෘත්තිරූපවූ ශබ්දගත අලඞ්කාරයයි; වෛදර්භෛඃ, විදර්භ දෙශවාසි කවීන් විසින්; මාලතීදාමලඞ්ඝිතං භ්‍රමරෛරිති, මාලතීදාම ලඞ්ඝිතං භ්‍රමරෛඃ යන මේ උදාහරණය (ශ්ලෙෂගුණ සහිතබවයෙන්;) ඉෂ්ටම්, කැමතිවනලදී; මාලතීදාම, දෑසමන් මල්දම; භ්‍රමරෛඃඉව, බමරුන් විසින්මෙන්; ලඞ්ඝිතං, ඇක්මෙනලදී. මෙහි ඉව ශබ්දය අධ්‍යාහෘතයි. මේ ශබ්දගුණශ්ලෙෂයි. අර්ථගුණ ශ්ලෙෂය ව්‍යාඛ්‍යා දර්පණකාරාදීන් විසින් ඒ ඒ තැන දක්වනලදී. තදර්ථීන් විසින් ඒ තැන්බලා දතයුතුයි.

45 ප්‍රසාදවත් ප්‍රසිද්ධාර්ථ මින්දෝරින්දීවරද්‍යුති
ලක්ෂ්මලක්ෂ්මීං තනොතීති ප්‍රතීතිසුභගංවචඃ.

ප්‍රසිද්ධාර්ථම්, ප්‍රකටවු අර්ථඇති; ප්‍රතීතිසුභගම්, අර්ථප්‍රතීතියෙහි හෙවත් අර්ථපරිඥානයෙහිලා මනොහරවූ; වචඃ, වචනය; ප්‍රසාදවත්, ප්‍රසාදගුණ ඇත්තේවෙයි; ඉන්දොඃ, චන්ද්‍රයාගේ; ඉන්දීවරද්‍යුති, නිලුපුල් හා සදෘශශොභාඇති ලක්ෂ්ම, ලාංඡනය; ලක්ෂ්මීම්, ශ්‍රිය; තනොතීති, පතුරුවයි යනුයි- මේ උදාහරණයෙහි අප්‍රසිද්ධාර්ථ පදයන්ගේ අප්‍රයොගයෙන් අර්ථාවබොධය මනාව වනහෙයින් මෙය ප්‍රසාදගුණයුක්ත බන්ධයයි දතයුතුයි. මේ වෛදර්භී මතයි.

46 ව්‍යුත්පන්නමිති ගෞඩීයෛර්නාතිරූඪමපීෂ්‍යතෙ
යථානත්‍යර්ජුනාබ්ජන්ම සදෘක්ෂාඞ්කො බලක්ෂගුඃ.

ගෞඩීයෛඃ, ගෞඩදෙශවාසී කවීන්විසින්; නාතිරූඪම්අපි, අතිප්‍රසිද්ධ නුවූයේද; ව්‍යුත්පන්නමිති, ව්‍යුත්පන්නනුයි හෙවත් ව්‍යාකරණ සූත්‍රාර්ථ හා අවිරුද්ධනුයි; ප්‍රසාදවත්, ප්‍රසාදගුණ ඇත්තේයයි; ඊෂ්‍යතෙ, කැමතිවනු ලැබේ; යථා, ඊට උදාහරණ මෙසේයි-බලක්ෂගුඃ, චන්ද්‍රතෙම; අනත්‍යර්ජුනාබ්ජන්ම, නිලොත්පලයක් හා; සදෘක්ෂ, සමානවූ; අඞ්කඃ, චින්නඇත්තේය.

මෙහි අර්ජුනශබ්දය කාර්තවීර්‍ය්‍ය අර්ජුන පාණ්ඩවදෙදෙනා කෙරෙහි ප්‍රසිද්ධය ශ්වෙතවර්ණයෙහි අප්‍රසිද්ධය, එබැවින් නිහතාර්ථතාදොෂයෙන් දුෂ්ටය අබ්ජන්ම ශබ්දයද පද්මයෙහි අප්‍රයුක්තය සදෘක්ෂශබ්දයද උපමාවෙහිකොට ඇත් බහුව්‍රීහිසමාසයෙන් අර්ථනයුතු හෙයින් අධිකය, ශ්‍රුතිකටුකදවේ

බලක්‍ෂ ශබ්දයද පණ්ඩිතයන් විසින් බෙහෙවින් ප්‍රයොග නොකළහෙයින් අප්‍රයුක්තත්‍ව ශ්‍රැතිකටුකදවේ, ගොශබ්දයද ගවයා කෙරෙහි ප්‍රසිද්ධ රශ්මි යෙහි අප්‍රසිද්ධය, මෙසේ බොහෝ දොෂඇති පදන්‍යාසද විත්‍යාශයාගේ ප්‍රෞඪ ත්‍වය හෙතුකොටගෙණ ගෞඩීයයෝ කාව්‍යත්‍වයෙන් ආදරකරනු ලැබෙති, මේ ප්‍රසාදගුණය අවිගතමැයි ශබ්දගතවූ ප්‍රසාදගුණය ඔජොගුණ මිශ්‍රවූ ශිථිලත්‍වය ආත්මකොට ඇත්තේයයි දණ්ඩිකාරයෝකියත්. මේ ගෞඩීයමතය කියනලද ප්‍රසාදගුණයාගේ අභාවයෙන් වෛදර්භීරීතියෙන් භින්නනමැයි මෙහි ප්‍රතීතිසුභගංවචඃ යන ලක්‍ෂණනැති.

47 සමංබන්ධෙෂ්වවිෂමං තෙමෘදුස්ඵුට මධ්‍යමාඃ
බන්ධාමෘදුස්ඵුටොන්මිශ්‍ර වර්ණවින්‍යාස යොනයඃ.

බන්ධෙෂු, රචනාවන් කෙරෙහිලා අවිෂමං, විෂමනුවූබව හෙවත් සදෘශ ලක්‍ෂණඇතිබව; සමං, සමතාගුණ නම්වේ; මෘදුස්ඵුට මධ්‍යමාඃ, මෘදුය ස්ඵුටය මධ්‍යමයයි ත්‍රිවිධවූ; තෙබන්ධාඃ, ඒ බන්ධයෝ; මෘදුස්ඵුටො න්මිශ්‍ර, මෘදුය ස්ඵුටය උන්මිශ්‍රය හෙවත් උභයාත්මකය යන; වර්ණවින්‍යාස යොනයඃ, වර්ණවින්‍යාසය උත්පත්තිස්ථාන හෝ කාරණකොට ඇත්තාහුයි. පද්‍යශෙක්හි යම් බඳුවූ රචනාවකින් පටන්ගැන්මවේද එබඳුවූ රචනායෙන් සමාප්තියත් වේනම් එය සමතාගුණ යුක්තයයි දතයුතුයි. ඒ සම්බන්ධයද මෘදුය ස්ඵුටය මධ්‍යමයයි ත්‍රිවිධවේ. මෙහි වර්ණශබ්දය අසමාස මධ්‍යමසමාස දීර්ඝ සමාසයන්ට උපලක්‍ෂකයයි මාලින්‍ය ප්‍රොඥජීවිකාකාරයෝ කියත්.

ත්‍රිවිධ සමතාවට උදාහරණ කියත්.

48 කොකිලාලාපවාචාලො මාමෙති මලයානිලඃ
උච්ඡලච්ඡීකරාච්ඡාච්ඡ නිර්ඣරාම්භඃ කණොක්‍ෂිතඃ.

කොකිල, කොවුලන්ගේ; ආලාප, නෙපුලින්; වාචාලඃ, වාචාල හෝ මුඛරවූ; මලයානිලඃ, මලය පවන; මාම්, මාකරා; එති, (පිඩාකිරීමට) එයි; උච්ඡලත්, උස්ව නගින්නාවූ; ශීකර, පොදපනරඇති; අච්ඡාච්ඡ, අතිශයින් නිර්මලවූ; නිර්ඣරාම්භඃකණ, හැලිදිය බින්දුන්ගෙන්; උක්‍ෂිතඃ, ඉසිනලද; (එහෙයින් මගිතලවූ) මේ මුල දෙපදයට විශෙෂණයි.

49 චන්දනප්‍රණයොද්ගන්ධි මන්දෙමලයමාරුතඃ
ස්පර්ධතෙරුද්ධම ද්ධෛර්‍ය්‍යොවරරාමා මුඛානිලෛඃ.

චන්දනප්‍රණය, චන්දනවන සංසර්ගයෙන්; උද්ගන්ධි, අධිකවූ සුගන්ධඇති; මන්දඃ, මඳවූ; මලයමාරුතඃ, මලයපවන; රුද්ධමද්ධෛර්‍ය්‍යඃ, වළකනලද මාගේ ධෛර්‍ය්‍ය ඇත්තේ; වරරාමා මුඛානිලෛඃ, උත්තම ස්ත්‍රීන්ගේ මුව පවන්හා; ස්පර්ධතෙ, සදෘශවෙයි.

කොකිලාලාපවාචාලො, මාමෙතිමලයානිලඃ; මෙහි මෘදු බන්ධයෙන් පටන්ගෙණ, මෘදුබන්ධයෙන් සමාප්තියකළේ; එහෙයින් මේමෘදු බන්ධගත සමතාවට උදාහරණයි.

උච්ඡලච්ඡීකරච්ඡාච්ඡ නිර්ඣරාම්භඃ කණොක්ෂිතඃ, මෙහි ස්ඵුට බන්ධයෙන් පටන්ගෙණ ස්ඵුට බන්ධයෙන් සමාප්තියකොළේ එහෙයින්මේ ස්ඵුට බන්ධගත සමතාවට උදාහරණයි, වසන්තප්‍රණයොද්ගන්ධි මන්දමලය මාරුතඃ මෙහි මධ්‍යම බන්ධයෙන් පටන්ගෙණ මධ්‍යම බන්ධයෙන් සමාප්තිය කෙළේ, එහෙයින් මේ මධ්‍යම බන්ධගතසමතාවට උදාහරණයි.

ස්පර්ධතෙරුද්ධමද්ධෛර්‍ය්‍යො වරරාමා මුඛානිලෛඃ, යන මෙයින් ගෞඩීයමත දක්වත්. මෙහි දක්ෂිණාත්‍යයෝ සමතා ලක්ෂණ නැතැයි කියති.

50 ඉත්‍යනාලොච්‍ය වෛෂම්‍ය මර්ථාලඞ්කාරඩම්බරෞ
අපෙක්ෂ්‍යමාණා වවෘධෙ පෞරස්ත්‍යාකාව්‍යපද්ධතිඃ.

ඉති, මෙසේ; වෛෂම්‍යම්, විසමබව; අනාලොච්‍ය, නොබලා; අර්ථාලඞ්කාර ඩම්බරෞ, අර්ථාලඞ්කාරයන් සම්බන්ධවූ උත්කර්ෂදෙදෙනා; අපෙක්ෂ්‍යමාණා බලන්නී; පෞරස්ත්‍යා කාව්‍යපද්ධතිඃ, ගෞඩීය කාව්‍යරීතිතොමෝ; වවෘධෙ, වැඩුනේය; වවෘතෙ යන පාඨයෙහි පැවැත්තේය යන අර්ථයි. කාව්‍ය බන්ධයෝනම් අර්ථානුසාරීහුමය, අර්ථයෝනම් මෘදුය, මධ්‍යමය, විකටය යන මොවුන් ආත්මකොට ඇත්තාහ. ඉදින් ප්‍රථම පදයෙහි මෘදුවූ අර්ථයක් කියයුතු නම් බන්ධයද මෘදුවියයුතුය. විකටවූ අර්ථයක් කියයුතුනම් බන්ධයද විකට වියයුතුය. සෙසු පදවලද මෙසේමය. ස්පර්ධතෙරුද්ධමද්ධෛර්‍ය්‍යඃ යන මෙහි තමන් ධෛර්‍ය්‍ය වළකනහෙයින් වාතය කෙරෙහි කිපියක්හු මෙන් හැගවූහෙයින් එහි විකට බන්ධයගුණය එය වරරාමාමුඛානිලෛඃ යන මෙහි මුඛශ්වාසරූපාර්ථය මෘදුහෙයින් එහි මෘදුබන්ධයද ගුණමය. එහෙයින් අර්ථයන්ගේ මෘදු විකටත්වය පරිද්දෙන් අක්ෂරයන්ගේද මෘදු විකටත්වය අලඞ්කාරත්වයෙන් ගතයුතුය යනු ගෞඩයන්ගේ අභිප්‍රායවේ.

51 මධුරං රසවද් වාචිවස්තුන්‍යපිරසඃ ස්ථිතඃ
යෙනමාද්‍යන්ති ධීමන්තො මධුනෙවමධුව්‍රතාඃ.

රසවත්, රසවත්වූ වාක්‍යය; මධුරම්, මධුරනම්වේ–මාධුර්‍ය්‍යගුණ යුක්තයයිසේයි; මධුනා, මීයෙන්; මධුව්‍රතාඃ ඉව, භෘඟයන්මෙන්; ධීමන්තඃ, පණ්ඩිතයෝ; යෙන, යම්වාක්‍යයකින්; මාද්‍යන්ති, මත්වෙද්ද; වාචි, වාක්‍ය යෙහිද; වස්තුන්‍යපි, ප්‍රතිපාද්‍යවස්තු සම්බන්ධ අර්ථයෙහිද; රසඃ, (ඒ)රසය; ස්ථිතඃ, සිටියේය; රසස්ථිතිඃ, යන පාඨයෙහි; එබඳුවූ රසයාගේ සිටීමයි යන අර්ථයි.

52 යයා කයාචිත්ශ්‍රුත්‍යායත් සමානමනුභූයතෙ
තද්රූපාහිපදාසත්තිඃ සානුප්‍රාසාරසාවහා.

යයාකයාචිත්, යම්කිසි; ශ්‍රුත්‍යා, ශ්‍රුතියකින් නොහොත් ශ්‍රවණ සාධනි වූ උච්චාරණයකින්; සමානම්, සමානබවක්; යත්, යම්පරිද්දකින්; අනුභූයතෙ, විඳගන්නාලැබේද; තද්රූපාහි, එබඳුවූම; පදාසත්තිඃ, පදයන්

ගේ අසන්නතාව; සානුප්‍රාසා, අනුප්‍රාසසහිතවූවා රසාවහා, රසඵලවත් නිය, මෙයින් ශ්‍රුත්‍යනුප්‍රාසයයිනවූ වර්ණයන්ගේ රසව්‍යඤ්ජකතා ඇති බැව් කියත්.

53 එෂරාජායදාලක්ෂ්මීං ප්‍රාප්තවාන්බ්‍රාහ්මණ ප්‍රියඃ
තතඃ ප්‍රභෘතිධර්මස්‍ය ලොකෙස්මින්නුත්සවොභවත්.

බ්‍රාහ්මණප්‍රියඃ, බ්‍රාහ්මණයන්ට ප්‍රියවූ; එෂරාජා, මේ රජතෙම; යදා, යම් කලෙක්හි; ලක්ෂ්මීම්, රාජ්‍යශ්‍රියට; ප්‍රාප්තවාන්, පැමිණියේද; තතඃ ප්‍රභෘති, එතැන්පටන්; ලොකෙ, ලොකයෙහි; ධර්මස්‍ය, ධර්මයාගේ උත්සවොභවත්, උත්සවයවී.

මෙහි මූර්ධජවූ ෂකාර රකාරයන්ද තාලුජවූ ජකාර යකාරයන්ද දන්තජවූ දකාර ලකාරයන්ද ආසන්නව යෙදූහෙයින් සම්බව ඇත්තුයි– මේ ශ්‍රුත්‍යනුප්‍රාසයුක්තනම්වේ, මේ වෛදර්භීරීතියි.

54 ඉතීදංනාදෘතං ගෞඩෛ රනුප්‍රාසස්තු තත්ප්‍රියඃ
අනුප්‍රාසාදපි ප්‍රායො වෛදර්භෛරිද මිෂ්‍යතෙ.

ඉතිඉදං, යන මේ එෂරාජාදිපද්‍යය, ගෞඩෛඃ,ගෞඩයන් විසින්;න ආදෘතම්, අදරනොකරණලදී; අනුප්‍රාසාත් අපි,(අනතුරුව කියනලද වර්ණ වෘත්තිරූපවූ) අනුප්‍රාසයටත්වඩා; ඉදම්, මෙය; වෛදර්භෛඃ, වෛදර්භයන් විසින්; ප්‍රායඃ, බොහෝසෙයින්; ඉෂ්‍යතෙ, කැමතිවනු ලැබේ.

55 වර්ණාවෘත්තිරනුප්‍රාසඃ පාදෙසුව පදෙසුව
පූර්වානුභවසංස්කාර බොධිනීයද්‍යදූරතා.

යදි, ඉදින්; පූර්ව, පළමුකොට කියනලද වර්ණයන්ගේ; අනුභව සංස්කාර බොධිනී, ශ්‍රොත්‍රෙන්ද්‍රිය ග්‍රහණයෙන් හටගත් සංස්කාරයන් අවබොධකරන්නාවූ; අදූරතා, අදූරබවක්වේනම්; පාදෙසුව, ශ්ලොකපාදයන්හිද; පදෙසුව, සුබන්තතිඞන්ත පදයන්හිද; වර්ණාවෘත්තිඃ, වර්ණයන්ගේ පුනරුච්චාරණය; අනුප්‍රාසඃ, අනුප්‍රාසනම්වේ, වර්ණයන්ගේ පුනරුච්චාරණය හෙතුකොටගෙණවන්නාවූ සදෘශතාප්‍රතීතිය අනුප්‍රාසනමැයි දතයුතුයි.

56 චන්ද්‍රෙශරන්නිශොත්තංසෙ කුන්දස්තවකවිභ්‍රමෙ
ඉන්ද්‍රනීලනිභං ලක්ෂ්ම සන්දධාත්‍යලිනඃ ශ්‍රියම්.

ශරන්නිශොත්තංසෙ, ශරදෘකාශයට මුදුන්මල් සැඩක්බඳුවූ; කුන්දස්තවක විභ්‍රමෙ, කොඳමල් සැනක් බඳුවූ; චන්ද්‍රෙ, චන්ද්‍රයාකෙරෙහිවූ; ඉන්ද්‍රනීල නිභං, ඉන්ද්‍රනීලමණිසදෘශවූ හෙවත් නිල්වූ; ලක්ෂ්ම, ලාංඡනය; අලිනඃ, භෘඞ්ගයන්ගේ; ශ්‍රියම්, ශ්‍රීය; සන්දධාති, උසුලයි.

මෙහි පළමුවෙනි දෙවෙනි තුන්වෙනි පාදයන්හි ශකාර කකාර නකාර ලකාර යන මේ වර්ණයන්ගේ පුනරාවෘත්තිය ඇතිහෙයින් සමත්ව

ප්‍රතීතියනුයි මේ වෘත්‍යනු ප්‍රාසනම්වේ, මෙහි සතරවන පාදය ඒකස්ථාන යෙනි යෙදුනු දකාර ධකාර තකාර නකාරයන්ගේ දන්තජත්වය කරණ කොටගෙණ වෛදර්භීයන්ට ප්‍රියවූ ශ්‍රුත්‍යනුප්‍රාසයයි.

57 චාරුචාන්ද්‍රමසං භීරු විම්බං පශ්‍යෛතදම්බරෙ
මන්මනොමන්මථාක්‍රාන්තං නිර්දයං හන්තු මුද්‍යතම්.

භීරු, එම්බා බියසුලු තැනැත්තිය; මන්මථාක්‍රාන්තම්, අනඞ්ගයා විසින් මඩනාලද; මන්මනඃ, මාගේ සිත; නිර්දයම්, දයාරහිතව; හන්තුම්, නසන්ට; අම්බරෙ, අහසෙහි; උද්‍යතම්, නැගාවූ; චාරු, මනොඥවූ; චාන්ද්‍රමසං විම්බං, චන්ද්‍රමණ්ඩලය; පශ්‍ය, බල.

මෙහි ප්‍රථම පාදයෙහිචාකාර දෙදෙනාගේද රුකාර දෙදෙනාගේද සම්බන්ධය ඇතිහෙයින් වෘත්‍යනුප්‍රාසයයි. දෙවෙන තුන්වන පාදයන්හිම්කාර දෙදෙනාගේද නකාර දෙදෙනාගේද සකෘදවෘත්තිය හෙයින් ඡේකානුප්‍රාසයයි. සතරවන පාදයෙහි දකාර දෙදෙනාගේද තකාර දෙදෙනාගේද ස්වරවෛෂම්‍යය හෙතුකොටගෙණ අන්‍යවිධවූ වෘත්‍යනුප්‍රාශයකි. මෙය ශබ්දගත මාධුර්‍ය්‍යයෙන් හා අර්ථගත මාධුර්‍ය්‍යයෙන්ද යුක්තවිය.

58 ඉත්‍යනුප්‍රාසමිච්ඡන්ති නාතිදූරාන්තරශ්‍රුතිම්
නතුරාමාමුඛාම්භොජ සදෘශඃ චන්ද්‍රමාඉති.

ඉති, මෙසේ; නාතිදූරාන්තරශ්‍රුතිම්, අනතිදූරාන්තර ශ්‍රුතිය හෙවත් ඉතා දුරනොවූ අතරඇති වර්ණාවෘත්ති ශ්‍රවණය; අනුප්‍රාසම්, අනුප්‍රාසයයි; ඉච්ඡන්ති, කැමතිවෙති; චන්ද්‍රමා, සඳ; රාමා, කාන්තාවගේ; මුඛාම්භොජ සදෘශඃ ඉති, මුවපියුමට සමානය යනමෙය, නතු, අනුප්‍රාශත්වයෙන් කැමති නොවෙති මෙහි මාකාරයන්ගේ අතිදූරත්වය හෙතුකොටගෙණ අනුප්‍රාශත්වයෙන් කැමතිනොවෙති යනු භාවයි.

59 සමරඃ බරඃ බලඃ කාන්තඃ කායඃ කොපශමන්නඃකෘශඃ
චත්‍යුතොමානො ධිකොරාගො මොහොජාතොසවොගතාඃ

සමරඃ, අනඞ්ගතෙම; බරඃ, ඉතාගියුණුය; කාන්තඃ, වල්ලභතෙම්; බලඃ, දුර්ජනය; නඃ, අපගේ; කායඃ, ශරීරයද; කොපශම, කොපයද; කෘශඃ, කෘශය; මානඃ, මානය; චත්‍යුතඃ, ගිලිහින; රාගඃ, රාගය; අධිකඃ, අධිකය; මොහඃ, මොහය; ජාතඃ, වූයේය; අසවඃ, ප්‍රාණයෝ; ගතාඃ, ඩෙහෙවින්ම ගියාහ.

60 ඉත්‍යාදිබන්ධපාරුෂ්‍යං ශෛථිල්‍යඤ්ච නියච්ඡති
අතොනෛනම නුප්‍රාසංදාක්ෂිණාත්‍යාඃ ප්‍රයුඤ්ජතෙ

ඉත්‍යාදි, මේආදිය; බන්ධපාරුෂ්‍යම්, බන්ධයාගේ පරුෂ බවද; ශෛථිල්‍යම්, සිථිල බව හෙවත් බන්ධයාගේ ප්‍රකම්නාගිත බවද; නියච්ඡති, හඟවයි; අතඃ, මේ හේතුවින්; එවං, මෙබඳුවූ; (පූර්වශ්ලොකය බඳුවූ) අනුප්‍රාසම්, අනුප්‍රාසය; දාක්ෂිණාත්‍යාඃ, වෛදර්භයෝ; නප්‍රයුඤ්ජතෙ, නොයොදත්.

සමරඃ බරඃ යනාදි ශ්ලොකය. වෘත්ත්‍යනු ප්‍රාස ශ්‍රුත්‍යනු ප්‍රාසයුක්තවූ වද පළමුවන දෙවන පාදයන්හි බන්ධයාගේ පරුෂතාද; තෘතීය චතුර්ථ පාදයන්හි ශෛථිල්‍යයද ඇති හෙයින් පතිතවූ ප්‍රකර්ෂතා ඇත්තුයි. එබඳුවූ බන්ධය සන්දෂ්ටයයි වෛදර්භයෝ ව්‍යවහාරයට නොගනිති-යනු භාවයි.

61 ආවෘත්තිං වර්ණසඞ්ඝාත ගොචරාං යමකංවිදුඃ,
තත්තු නෛකාන්තමධුර මතඃ පශ්චාද්විධාස්‍යතෙ.

වර්ණසඞ්ඝාත ගොචරාම්, වර්ණසමූහයක් ගොචරකොට ඇති; ආවෘත්තිම්, පුනරුච්චාරණය; යමකං, යමකයි; විදුඃ, දනිති; තත්තු; එය වනාහි; නඑකාන්තමධුරම්, එකාන්තයෙන් මධුර නොවෙයි; අතඃ, මේ හෙතුවින්; පශ්චාත් පසුව (හෙවත් තුන්වන පරිච්ඡෙදයෙහි අලඞ්කාර ප්‍රස්තාවෙහි) විධාස්‍යතෙ, කියනු ලැබේ.

62 කාමං සර්වෝප්‍යලඞ්කාරො රසමර්ථෙ නිෂිඤ්චති,
තථාප්‍යග්‍රාම්‍යතෛවෛතං භාරං වහති භූයසා.

කාමම්, එකාන්තයෙන්;සර්වඃ අපි අලඞ්කාරඃ, සියලුම අලඞ්කාරය තෙම; අර්ථෙ, අර්ථයෙහි; රසම්, රසය; නිෂිඤ්චති, ඉසී; තථාපි, එසේවූවද; අග්‍රාම්‍යතා එව, ග්‍රාම්‍යනොවනබවම; එතංභාරම්, මේරසනිෂෙකරූපභාරය; භූයසා, බෙහෙවින්; වහති, උසුලයි.

63 කන්‍යෙකාමයමානං මාං න ත්වං කාමයසෙකථම්,
ඉති ග්‍රාම්‍යොයමර්ථාත්මා වෛරස්‍යාය ප්‍රකල්පතෙ.

කන්‍යෙ, එම්බා කන්‍යාව; කාමයමානම්, කැමතිවනුලබන්නාවූ; මාම්, මා; ත්වම්, තී; කථම්, කවරහෙයකින්; නකාමයසෙ, නොකමැතිවන්නෙහිද; ඉති, මෙබඳුවූ; ග්‍රාම්‍යඃ, ග්‍රාම්‍යවූ; අර්ථාත්මා, ප්‍රතිපාද්‍යවස්තුව; වෛරස්‍යාය, විරසබවපිණිස, ප්‍රකල්පතෙ, පොහොසත්වේ·

මෙහි කන්‍යෙ යන සම්බොධනය දුහිතෘස්ථානියවූවත් විෂයෙහිමයෙදේ නායිකාසම්බොධනයෙහිනොයෙදේ; නායිකාසම්බොධනයෙහි වනාහි ප්‍රියෙ සුන්දරීයනාදීන් යෙදීම සුදුසුවේයි-එසේහෙයින් කන්‍යා ශබ්දය ග්‍රාම්‍යනොවතුදු අර්ථය ග්‍රාම්‍යමැයි; කාමයනම් කාමීන්ගේ මෙවුන්දම්සෙවීමෙහි ඇති ආසාවයි, කාමිනීන්ගේ පයොධරයන් ගුඪකල්හි චමත්කාරජනකවන පරිද්දෙන් එයද ගූඪවූකලම කවිජන හ්ලාදජනකවේ මේ පද්‍යයෙහි එසේනුවූයෙන් මාධුර්‍යසද්භාවයක්නැති මෙහි නායකයාගේ කාමරූපකාරණ ඇතද නායිකාවගේ කාමරූපකාර්‍ය්‍යය නැති හෙයින් මේ විශෙෂොක්තියි.

64 කාමං කන්දර්ප චණ්ඩාලො මයි වාමාක්ෂි නිර්දයඃ,
ත්වයි නිර්මත්සරො දිෂ්ට්‍යෙ ත්‍යග්‍රාම්‍යොර්ථො රසාවහඃ.

මේ අග්‍රාම්‍යතාවට උදාහරණයි. වාමාක්ෂි, එම්බා කාන්තාව; කන්දර්ප චණ්ඩාලඃ, කාමනැමති චණ්ඩාලතෙම; මයි, මාකෙරෙහි; කාමම්, ඒකාන්තයෙන්; නිර්දයඃ, දයාරහිතය; දිෂ්ට්‍යා, භාග්‍යයකරණකොටගෙන; ත්වයි, තීකෙරෙහි; නිර්මත්සරඃ, මත්සුරු නුවූයේය; (ඊර්ෂ්‍යානැත්තේයයි,) ඉති මෙබඳුවූ; අග්‍රාම්‍යඃ, ග්‍රාම්‍යනුවූ; අර්ථඃ, අර්ථය; රසාවහඃ, රසඑලවන්නේය.

65 ශබ්දෙපි ග්‍රාම්‍යතාස්ත්‍යෙව සාසභ්‍යෙ තරකීර්තනාත්
යථා යකාරාදිපදං රත්‍යුත්සව නිරූපණෙ.

අර්ථයෙහි පමණක් නොව ශබ්දයෙහිද ග්‍රාම්‍යතා ඇතිබැව්කියත්. ශබ්දෙපි, ප්‍රයුජ්‍යමානශබ්දයෙහිද; ග්‍රාම්‍යතා, ග්‍රාම්‍යබව; අස්ති, ඇත්මැයි; සා, ඒග්‍රාම්‍යතාතොමෝ; සභ්‍යෙතර, අසභ්‍යවචනයාගේ; කීර්තනාත්, කීර්තනයකිරීමෙන්වේ; රත්‍යුත්සවනිරූපණෙ, ස්ත්‍රීසම්භෝගය ප්‍රකාශකිරීමෙහි; යකාරාදිපදංයථා, යකාරාදිපදයමෙනි; රතික්‍රීඩාප්‍රකාශය පිණිසයභමෛථුනෙ යන ධාතුවෙන් සිද්ධවූ යභනයනාදි පදයෙදීම ග්‍රාම්‍යදොෂයවේයනු මෙහි නිෂ්කර්ෂයි.

66 පදසන්ධාන වෘත්ත්‍යාවා වාක්‍යාර්ථෙනවා පුනඃ,
දුෂ්ප්‍රතීතිකරං ග්‍රාම්‍යං යථායා භවතඃ ප්‍රියා.

අන්කිසිපදයොගයක්ද ග්‍රාම්‍යතායෙහි ඇතුළත්වනබැව් කියත්. පදසන්ධානවෘත්ත්‍යා වා; පදයන්ගෙසන්ධානවෘත්තියෙන්හෝ (පදයන්ගේ සන්ධාන වෘත්තිනම් පදඑක්වයෙදී පැවැත්මයි) පුනඃ, නැවත; වාක්‍යාර්ථෙන, වාක්‍යයාගේ අර්ථයෙන්හෝ; දුෂ්ප්‍රතීතිකරං, දුෂ්ප්‍රතීතිය ඇතිකරන්නාවූයෙදීම; ග්‍රාම්‍යං, ග්‍රාම්‍යනම්වේ; යථා, ඒමෙසේයි; යා, භවතඃප්‍රියා, යා භවතඃ ප්‍රියා යනුයි—මේපද සන්ධානවෘත්තියට උදාහරණයි මෙහි යා යන පදය භවතඃ යන පදයහා එක්ව යෙදීමෙන් යභ ධාතුවෙන් සිද්ධවූ පදයක්මෙන් ශෘතියෙන් සාමාජිකජනජුගුප්සා ජනකයයි යේයි.

67 ඛරං ප්‍රහෘත්‍ය විශ්‍රාන්තඃ පුරුෂො වීර්‍ය්‍යවානිති,
එවමාදි න ශංසන්ති මාර්ගයොරුභයො රපි.

ඛරං ප්‍රහෘත්‍ය විශ්‍රාන්තඃ පුරුෂොවීර්‍ය්‍යවානිති—ඛරං—පෙ—වීර්‍ය්‍යවාන් යන, එවමාදි, මේආදිය; උභයොඃ මාර්ගයොඃ අපි මාර්ගදෙක්හිම; නශංසන්ති, ප්‍රශංසානොකරත්; වීර්‍ය්‍යවාන්, පරාක්‍රමඇති; පුරුෂඃ, යම්කිසි පුරුෂයෙක්; ඛරම්, කුරවූසතුරා; ප්‍රහෘත්‍ය, නසා; විශ්‍රාන්තඃ, නැවැත්තේයයනු කාව්‍යකර්තෘහට අභිප්‍රෙතවූ අර්ථයවූයේනමුත්; වීර්‍ය්‍යවාන්, ශුක්‍ර ධාතුඇති; පුරුෂඃ, පුරුෂයෙක්; ඛරම්, දැසිව; ප්‍රහෘත්‍ය, මෛථුන්දම්සෙව නයකොට; විශ්‍රාන්තඃ, එයින් වැළැක්කේයයන; අමඞ්ගලාර්ථ, ප්‍රතීතියක්ද වනහෙයින් උභයරීතියෙහිම ලා මෙබඳුයෙදුම් නොපසසත්—යනුභාවයි. මේ වාක්‍යාර්ථගතවූ අශ්ලීලතාවට උදාහරණයි.

68 භගිනී භගවත්‍යාදි සර්වත්‍රෛවානුමන්‍යතෙ
විභක්තමිති මාධුර්‍ය්‍යී මුච්‍යතෙ සුකුමාරතා.

භගිනී භගවත්‍යාදි, භගිනී භගවතීයනාදිය; සර්වත්‍රෛව, හැමතන්හිම; අනුමන්‍යතෙ, අනුදන්නාලැබේ; ඉති, මෙසේ; මාධුර්‍ය්‍යම්, මාධුර්‍ය්‍යය; විභක්තාම්, විශෙෂයෙන් දක්වනලද්දේය; සුකුමාරතා, සුකුමාරතාව; උච්‍යතෙ, කියනුලැබේ; භගශබ්දය යො නිලිඞ්ගාදිවාචකවුවද භගිනියනාදි ශබ්දප්‍රයොග ලොකයාවිසින් සියලු ව්‍යවහාරයන්හි අදෝෂවශයෙන් පිළිගන්නාලදී එබඳුවූ හැමදෙනාගේම සියලු ව්‍යවහාරයන්හි දොෂකල්පනා විරහයෙන් පිළිගන්නාලද පදයන්ගේ යෙදීම මාධුර්‍ය්‍යගුණ බාධක නොවෙයි–දතයුතුයි.

69 අනිෂ්ඨුරාක්‍ෂරප්‍රායං සුකුමාර මිහෙෂ්‍යතෙ,
බන්ධ ශෛථිල්‍ය දෙෂස්තු දර්ශිතඃ සර්වකොමලෙ.

ඉහ, මේශාස්ත්‍රයෙහිලා; අනිෂ්ඨුරාක්‍ෂරප්‍රායම්, අපරුෂාක්‍ෂරයන් බොහෝකොටඇතිපද්‍යය; සුකුමාරං, සුකුමාරයයි; ඉෂ්‍යතෙ, කැමතිවනුලැබේ; සර්වකොමලෙ, සර්වකොමලාක්‍ෂර යුක්තපද්‍යයෙහි; බන්ධශෛථිල්‍යදෙෂස්තු, බන්ධයාගේ සිථිලතාදෝෂය; දර්ශිතඃ, (මා විසින්) දක්වනලද්දේය; මෙහිදු ප්‍රායශබ්දයෙන් අතරතුර පරුෂාක්‍ෂරයෙදියයුතුබැව් හැඟවූනු, සර්වකොමලබන්ධයෙහි ශිථිලතාදෝෂය නමා විසින්ම කියනලදබැව් අපරාර්ධයෙන් දැක්වූනු.

මිට උදාහරණකියත්

70 මණ්ඩලීකෘත්‍ය බර්හාණි කණ්ඨෛර්මධුරගීතිභිඃ,
කලාපිනඃ ප්‍රනෘත්‍යන්ති කාලෙ ජීමූත මාලිනි.

ජීමූතමාලිනි, මෙඝමාලාඇති; කාලෙ, කාලයෙහි; (හෙවත් වරුසාකාලයෙහි;)කලාපිනඃ, මයුරයෝ; බර්හාණි, පිළි; මණ්ඩලීකෘත්‍ය, මණ්ඩලකොට; මධුරගීතිභිඃ, මධුරගීතිකාබඳුවූ ධ්වනිඇති; කණ්ඨෛඃ, කණ්ඨයෙන් උපලක්‍ෂිතවූවාහු; ප්‍රනෘත්‍යන්ති, නටත්; මෙහිමකාරාදි කොමලාක්‍ෂරයන්ගේ අතරතුරෙහි ඨකාර රකාරාදී පරුෂාක්‍ෂරයන්ගේ යොගයෙන්ම මෙය සුකුමාරගුණ යුක්තවිය.

71 ඉත්‍යනූර්ජිත එවාර්ථො නාලඞ්කාරොපි තාදෘශඃ,
සුකුමාරතයෛවෛත ද්‍රෙෂ හති සතාං මනඃ.

ඉති, මණ්ඩලීකෘත්‍යයනාදි අනන්තරොක්තපද්‍යයෙහි; අර්ථඃ, අර්ථය; අනූර්ජිතඃ එව, දීප්තනොවේමැයි; තාදෘශඃ, එබඳුවූ; අලඞ්කාරඃ අපි, අලඞ්කාරයක්ද; න, නැත්තේය; එතම්, මේපද්‍යය; සුකුමාරතයාඑව, සුකුමාරත්වයෙන්ම; සතාම්, සාමාජිකයන්ගේ; මනඃ, සිතට; ආරොහති, නගී; මෙහි මධුරනෘත්‍යරූපවූ අර්ථයද මනොරම්‍යනොවේ එසේම මෙහි සෙද්‍ර සමාසොක්තිරූප අලඞ්කාරයද චමත්කාරජනකනොවෙයි එසේ නමුදු මේපද්‍යය සුකුමාරගුණය කරණකොටගෙනම පණ්ඩිතයන් සතුටුකරයි–යනු භාවයි.

ඉක්බිති සුකුමාරගුණය පිළිනොගන්නන්ගේ මතයක් දක්වති.

72 දීප්තමිත්‍යපරෛර්භූම්නා කෘච්ඡ්‍රොද්‍යමපි බධ්‍යතෙ
න්‍යක්ෂෙණ ක්ෂයිතඃ පක්ෂඃ ක්ෂත්‍රියාණාං ක්ෂණාදිති.

අපරෛඃ, අන්‍යවූ ගෞඩදේශියකවීන් විසින්; කෘච්ඡ්‍රොද්‍යම්අපි, දුක සේ උච්චාරණකටයුතුවූ පද්‍යද; දීප්තමිති, දීප්තනුයි; භූම්නා, බොහෝ සෙයින්; බධ්‍යතෙ, බඳනාලැබේ; ක්ෂත්‍රියාණාම්, ක්ෂත්‍රියයන්ගේ; පක්ෂඃ, පක්ෂය; න්‍යක්ෂෙණ, අඬවූබෘනරාෂට්‍රයාවිසින්; ක්ෂණාත්, ක්ෂණයකින්; ක්ෂයිතඃ, නසනලදී; ඉති, මෙබඳුයි; මේවීරරසවර්ණනාබැවින් මෙහිශෘති කටුකවූ පරුෂාක්ෂර යොගයෙන් සුකුමාරත්වයහැරදූමීම ගුණමයයි ගෞඩීයයන්ගේ මතයි–වෛදර්භීයෝ රෞද්‍රරසවර්ණනාවූවද කඨොරාක්ෂරයන් ගේම යෙදීම කැමතිනොවෙත්.

73 අර්ථව්‍යක්තිරනෙයත්ව මර්ථස්‍ය හරිණොද්ධෘතා,
භූඃ ක්ෂුරක්ෂුණ්ණනාගාසෘග් ලොහිතාදුදධෙරිති.

අර්ථස්‍ය, අර්ථයාගේ; අනෙයත්වම්, නොඑළවියයුතුබව; (හෙවත් අධ්‍යාහාරාදි කණ්ටකල්පනාවිරහයෙන් යොදනලද පදයන්ගෙන්ම අර්ථයාගේ එළඹසිටීම) අර්ථව්‍යක්තිඃ, අර්ථව්‍යක්තිනම් ගුණයවේ; හරිණා වරාහරූපිවූ විෂ්ණුහුවිසින්; ක්ෂුරෛඃ, කුරයෙන්; ක්ෂුණ්ණ, සුණුකරණලද; නාගාසෘක්, නාගයන්ගේලෙයින්; ලොහිතාත්, රතුවූ; උදධෙඃ, සාගරයෙන්; භූඃ, පෘථිවිනොමෝ; උද්ධෘතා, ඉති නගනලදුය යනමෙනි.

74 මහී මහාවරාහෙණ ලොහිතාදුද්ධෘතොදධෙඃ,
ඉතීයත්‍යෙවනිර්දිෂ්ටෙ නෙයත්ව මුරගාසෘජඃ.

මහාවරාහෙණ, මහාවරාහරූපිවූවිෂ්ණුහු විසින්; ලොහිතාත්, රතුවූ; උදධෙඃ, සාගරයෙන්; මහී, පෘථිවීනොමෝ; උද්ධෘතා, නගනලදුයි; ඉතියත්‍යෙව, මෙපමණක්ම; නිර්දිෂ්ටෙ, දක්වූකල්හි; උරගාසෘජඃ, නාගරුධිරයාගේ; නෙයත්වම්, එළවියයුතුබවයි; මේ අර්ථව්‍යක්තිගුණයට ප්‍රත්‍යුදාහරණයි. මෙහි කුරයෙන් සුණුකරණලද නාගයන්ගේ ලෙයින් යයි අධ්‍යාහාර කොට අර්ථ සම්පූර්ණකටයුතුවෙයි එබැවින් මෙය අර්ථව්‍යක්තිගුණ රහිතයයිසේයි.

75 නෙදෘශං බහු මන්‍යන්තෙ මාර්ගයොරුභයොරපි,
නහි ප්‍රතීතිඃ සුභගා ශබ්දන්‍යායවිලඞ්ඝිනී.

ඊදෘශම්, මෙබඳුවූනෙයාර්ථකවාක්‍යය; උභයොඃ මාර්ගයොඃ අපි, වෛදර්භීය ගෞඩීයමාර්ගදෙක්හිම; න බහුමන්‍යන්තෙ, බහුමත්නොකරති; හි, යම්හෙයකින්; ශබ්දන්‍යායවිලඞ්ඝිනී, ශබ්දනියමයපැනයන්නාවූ; ප්‍රතීතිඃ, අර්ථාවබොධය; නසුභගා, යහපත්නොවන්නීද; එහෙයිනි. අධ්‍යාහාරාදිකණ්ටකල්පනායෙන් අර්ථාවබොධය කටයුතුයේ පද්‍යරචනායකිරීම නුසුදුසුයැයනු මෙහි නිශ්කර්ෂයි.

76 උත්කර්ෂවාන් ගුණඃ කශ්චින් යස්මින්නුක්තෙ ප්‍රතීයතෙ,
තදුදාරාහ්වයං තෙන සනාථා කාව්‍ය පද්ධතිඃ.

යස්මින්, යම්වාක්‍යයක්; උක්තෙ, කීකල්හි; උත්කර්ෂවාන්, උත්කර්ෂවත්වූ; කශ්චිත්ගුණඃ, කිසිගුණයක්; ප්‍රතීයතෙ, හැගේද; තත්, එය; උදාරාහ්වයම්, උදාරනම්වේ; හෙවත් ඖදාර්‍ය්‍යගුණයුක්තයි; තෙන ඒ ඖදාර්‍ය්‍යගුණය කරණකොටගෙන; කාව්‍යපද්ධතිඃ, කාව්‍යරීතිතොමෝ; සනාථා. පිහිටසහිතවූවා උත්කර්ෂසහිතවූවායිසේයි.

77 අර්ථිනාං කෘපණා දෘෂ්ටිඃ ත්වන්මුඛෙ පතිතා සකෘත්,
තදවස්ථා පුනර්දේව නාන්‍යස්‍යමුඛ මීක්ෂතෙ.

78 ඉතිත්‍යාගස්‍යවාක්‍යෙස්මින් නුත්කර්ෂඃ සාධු ලක්ෂ්‍යතෙ
අනෙනෙව පථා න්‍යත්‍ර සමානන්‍යාය මූහ්‍යතාම්.

දෙව, දෙවයන්වහන්ස; අර්ථිනාම්, යාචකයන්ගේ; කෘපණා, දීනවූ; දෘෂ්ටිඃ, දෘෂ්ටිය; ත්වන්මුඛෙ, නුඹවහන්සේගේ මුඛයෙහි; පතිතා, හුනුවාද; තදවස්ථා, ඒදීනාවස්ථාතොමෝ; පුනඃ, නැවත; අන්‍යස්‍ය, අනිකෙකුගේ; මුඛම්, මුහුන; නඊක්ෂතෙ, නොබලයි·

ඉති, මෙබඳුවූ; අස්මින්වාක්‍යෙ, මේවාක්‍යයෙහි; ත්‍යාගස්‍ය, ත්‍යාගයාගේ හෙවත් රාජකීයදානයාගේ; උත්කර්ෂඃ, උත්කර්ෂය; සාධු, මනාකොට; ලක්ෂ්‍යතෙ, හැගෙනුලැබේ; අනෙනෛවපථා, මේමාගීයෙන්ම; අන්‍යත්‍ර, අනික්තන්හි; සමානන්‍යායම්, සමානවූනියමය; ඌහ්‍යතාම්, කල්පනාකරනු ලැබේවා.

79 ශ්ලාඝ්‍යෛර්විශෙෂණෛර්යුක්ත මුදාරං කෛශ්චි දිෂ්‍යතෙ,
යථා ලීලාම්බුජක්‍රීඩා සරො හෙමාඞ්ගදාදයඃ.

ශ්ලාඝ්‍යෛඃ ශ්ලාඝ්‍යවූහෙවත් විශෙෂ්‍යයාගේ උත්කර්ෂාධායකවූහෙයින් සාමාජිකජනමනොරම්‍යවූ; විශෙෂණෛඃ, විශෙෂණයන්ගෙන්; යුක්තම්, යුක්තවූවාක්‍යය; උදාරම්, උදාරයයි; කෛශ්චිත්, කිසිකෙනෙකුන් විසින්; ඊෂ්‍යතෙ, කැමතිවනුලැබේ; මෙහි විශෙෂණෛඃ යන බහුවචන නිර්දේශයෙන් විශෙෂණයාගේ බහුත්වප්‍රයෝජනය අවිද්‍යමාන නම් ඒ ගුණ නොවේයයි සූචිතයි; යථා, ඒමෙසේයි; ලීලාම්බුජක්‍රීඩාසරඃ, ලීලොපභොගපද්මයෙන් යුක්තවූක්‍රීඩා තඩාගය; හෙමාඞ්ගදාදයඃ, ස්වර්ණමයවූ අඟුපලඳනාආදියයනුයි. මෙහි ලීලාම්බුජයයි කීමෙන්පද්මයාගේ වර්ණසංස්ථාන සුගන්ධාතිශය ප්‍රකාශවේ. ක්‍රීඩාසරඃයි කීමෙන්තඩාගයාගේ ක්‍රීඩොපයොගිත්වයෙන් කමල කුමුදජලචර විහඞ්ගාදීන් ශොභිතබැව්හා නිර්මල මධුර ජලත්වාදියද ප්‍රකාශවේ එසේම හෙමාඞ්ගදයයිකීමෙන් දක්සපුතු බැව් බොහෝවූ මිලඇතිබැව් ආදිය ප්‍රකාශවේ.

90 ඔජඃ සමාසභූයස්ත්ව මෙතද්ගද්‍යස්‍යජීවිතම්,
පද්‍යෙප්‍යදාක්ෂිණාත්‍යානා මිදමෙකං පරායණම්.

සමාසභූයස්ත්වම්, සමාසබාහුල්‍යය; ඔජඃ, ඔජොගුණනම්වේ; එතද්, මෙය; ගද්‍යස්‍ය, ගද්‍යකාව්‍යයාගේ; ජීවිතම්, ප්‍රාණයවේ; අදාක්ෂිණාත්‍යානාම්, ගෞඩයන්ට; පද්‍යෙපි, පද්‍යයෙහිත්; ඉදම්, මේසමාසභූයස්ත්වලක්ෂණ ඔජොගුණය; එකංපරායණම්, අවිතීයවූපිහිටයි. ගද්‍යකාව්‍යයෙහිලා සමාසභූයස්ත්වය වෛදර්භීයන්ටහා ගෞඩයන්ටත් සමානමැයි ගෞඩයන්ට පද්‍යයෙහිත් ඕජොගුණය පරමප්‍රතිෂ්ඨායයි කීමෙන් ඔවුන්ගේ භෙදමතය පහලකෙරේ.

81 තද්ගුරූණාං ලඝූනාඤ්ච බාහුල්‍යාල්පත්ව මිශ්‍රණෛඃ,
උච්චා වචප්‍රකාරං තද් දෘශ්‍යමාඛ්‍යායිකාදිෂු.

තද්, ඒඔජොගුණය; ගුරූණාම්, ගුරුඅක්ෂරයන්ගේද; ලඝූනාඤ්ච, ලඝු අක්ෂරයන්ගේද; බාහුල්‍ය, බොහෝබවය; අල්පත්ව, ස්වල්පබවය; මිශ්‍රණෛඃ, මිශ්‍රයයනමොවුන්ගේ වශයෙන්; උච්චාවචප්‍රකාරම්, උස්පාත් ප්‍රකාරවේ; හෙවත්නානාප්‍රකාරවේ; තත්, එය; ආඛ්‍යායිකාදිෂු, ආඛ්‍යායිකාදියෙහි; දෘශ්‍යම්, දක්කයුතුයි. මේවෛදර්භීරීතියි ගෞඩයන්ට මෙය පද්‍යයෙහිද ඇතිවනබැවින් සූර්‍ය්‍යශතකාදියෙහි දීර්ඝසමාස යොදනලද්දේය.

82 අස්ත මස්තක පර්‍ය්‍යස්ත සමස්තාර්කාංශුසංස්තරා,
පීනස්තනස්ථිතාතාම්‍ර කම්‍රවස්ත්‍රෙව වාරුණී.

අස්තමස්තක, අස්තපර්වතමස්තකයෙහි; පර්‍ය්‍යස්ත, හාත්පසවැටුනාවූ; සමස්තාර්කාංශුසංස්තරා, සියලු සූර්‍ය්‍යරශ්මියෙන් ආවෘතවූ; වාරුණී, පශ්චිමදිශාතොමෝ; පීන, පිරුණාවූ; ස්තන, පයොධරයෙහි; ස්ථිත, සිටියාවූ; ආතාම්‍ර, මදක්රතුවූ; කම්‍රවස්ත්‍රාඉව, මනොඥවස්ත්‍රඇත්තියක් මෙනි; මේ ගෞඩයන්ට අභිමතවූ පද්‍යාත්මක ඔජොගුණයට උදාහරණයි.

83 ඉතිපද්‍යෙපි පෞරස්ත්‍යා බධ්නන්ත්‍යොජස්විනී ගිරඃ,
අන්‍යෙත්වනාකුලං හෘද්‍ය මිච්ඡන්ත්‍යොජො ගිරාං යථා.

84 පයොධරතටොත්සඞ්ග ලග්න සන්ධ්‍යාතපාංශුකා,
කස්‍යකාමාතුරං චෙතො වාරුණී න කරිෂ්‍යති.

පෞරස්ත්‍යා, ගෞඩයෝ; ඉති, මෙසේ; පද්‍යෙපි, පද්‍යයෙහිද; ඔජස්විනී, ඔජොගුණයුක්තවූ; ගිරඃ, වචනයන්; බධ්නන්ති, බඳිත්; අන්‍යෙතු, අන්‍යයෝ; ගිරාම්, වචනයන්සම්බන්ධවූ; අනාකුලං වහාඅවිප්‍රතීතිකරවූ අනාකුලත්වය; හෘද්‍යම්, මනොඥවූ; ඔජඃ, ඔජොගුණයයි; ඉච්ඡන්ති, කැමතිවෙති; යථා, ඒමෙසේයි; පයොධරතට, මේඝනැමති ස්තනස්ථලයාගේ; උත්සඞ්ග ලග්න; ප්‍රාන්තභාගයෙහි ආසක්තවූ; සන්ධ්‍යාතපාංශුකා,

සන්ධ්‍යාකාලයෙහිවූ සූර්‍ය්‍යරශ්මිනැමැති වස්ත්‍රඇති; වාරුණී, පශ්චිමදිශා නමැති කාන්තාතොමෝ; කස්‍ය, කවරක්හුගේ; චෙතඃ, සිත; කාමාතුරම් නකරිස්‍යති, කාමාතුරනොකරන්නේද?.

85 කාන්තං සර්‍වජගත්කාන්තං ලෞකිකාර්‍ථා නතික්‍රමාත්,
තච්චවාර්‍තාභිධානෙෂු වර්‍ණනාස්වපි දෘශ්‍යතෙ.

ලෞකිකාර්‍ථ, ලොකප්‍රසිද්ධඅර්‍ථයාගේ; අනතික්‍රමාත්, අපරිත්‍යාගයෙන්; හෙවත්, ලොකසිද්ධ අර්‍ථමාත්‍රයක්හුගේම වර්‍ණනායෙන්; සර්‍වජගත් කාන්තම්, සියලුලෝවැස්සන්ටකාන්තවූයේ; හෙවත් සියලුලෝවැස්සන් විසින් කැමතිවියයුතුවූයේ; කාන්තම්, කාන්තිගුණයුක්තයෙව්; තච්ච, හෙද; වාර්‍තාභිධානෙෂු, අනාමයප්‍රියාලාපකථනයෙහිද; වර්‍ණනාසු, වස්තුස්වරූපනිරූපණ සංඛ්‍යාතවර්‍ණනාවන්හිද දෘශ්‍යතෙ, දක්නාලැබේ; වාර්‍තාභිධානවර්‍ණනා යන දෙතන්හිම ලොකප්‍රසිද්ධ වස්තුකථනයම උචිත හෙයින් මෙසේකීයත්. ඇතැම්කෙනෙක් වාර්‍තාභිධානෙෂු යන පදයට ඉතිහාසවර්‍ණනාවන්හි කියාත් අර්‍ථගනිති, හේ ඉතිහාසකථනයෙහිද අසත්‍යපහලකිරීමෙන් විනෙයජනයන්ගේ ප්‍රවෘත්ති විරහයවනහෙයින් ලොකසිද්ධිය කියයුතුහෙයිනි.

86 ගෘහාණිනාමතාන්‍යෙව තපොරාශිඃ භවාදෘශඃ
සම්භාවයතියාන්‍යෙව පාවනෛඃ පාදපාංශුභිඃ.

තපොරාශිඃ, තපොරාශිවූ; හෙවත් පතස්බහුලවූ; භවාදෘශඃ, පින්වතුන්වැන්නෙක්; යානි, යම්ගෘහකෙනෙක්; පාවනෛඃ, පවිත්‍රවූ; පාදපාංශුභිඃ, පාදරජසින්; සම්භාවයති, පිරිසිදුකෙරේද; තාන්‍යෙව, ඒගෘහයෝම; ගෘහාණිනාම, ගෘහයෝනම්වෙති; ප්‍රශස්තගෘහවෙති යනුභාවයි. මේවාර්‍තාභිධාන විෂයෙහි කාන්තගුණ යුක්තපද්‍යයට උදාහරණයි.

87 අනයොරනවද්‍යාඞ්ගි ස්තනයොර්ජෘම්භමාණයොඃ,
අවකාශො නපර්‍ය්‍යාප්තා ස්තවබාහුලතාන්තරෙ.

අනවද්‍යාඞ්ගි, නිර්දොෂවූශරීරාවයවඇත්තියඃ; ජෘම්භමාණයොඃ, වර්‍ධනයවන්නාවූ; ස්තනයොඃ, පයොධරමණ්ඩලයට; තව, තීගේ; බාහුලතාන්තරෙ, බාහුලතාවයාන්තරයෙහි හෙවත් ලයෙහි; අවකාශඃ, අවකාශය; නපර්‍ය්‍යාප්තං, නොමහති; මේ පයොධරවර්‍ණනායෙහි සම්පූර්‍ණපයොධරයන්ගේ සම්බාධස්ථිතිය ලොකප්‍රසිද්ධවර්‍ණනාහෙයින් මේ වර්‍ණනාවිෂයෙහිවූ කාන්තගුණයට උදාහරණයි.

88 ඉතිසම්භාව්‍ය මෙවෛතද් විශෙෂාඛ්‍යාත සංස්කෘතම්,
කාන්තංභවති සර්‍වස්‍ය ලොකයාත්‍රානුවර්‍තිනඃ.

ඉති, මෙබඳුවූයේ; හෙවත් වාර්‍තාවර්‍ණනා විෂයකොටඇති ශ්ලොකවයෙන් ප්‍රතිපාදනවූයේ; සම්භාව්‍යම්ඒව, සම්භාවනාකටයුතුමැයි; අනාඛ්‍ය

නතිකල්පනා මෙහි නැතැයිසේයි; විශෙෂාඛ්‍යානසංඥකානම්, උත්කර්ෂ කථනයෙන් ශොභිතවූ; එතත්, මෙය; ලොකයාත්‍රානුවර්තිනඃ, ලොක චරිත්‍රානුවර්තීවූ, සර්වස්‍ය හැමදෙනාහට; කාන්තම්භවති, කාන්තවෙයි; උත්කර්ෂාවබොධකවූ විශෙෂණයොගයෙන් වෛචිත්‍ර්‍යජනකවූ වාක්‍යයම කාන්තිගුණ යුක්තවෙයි සුයෙසිංසකංයාති ගෘහෙශතොයනාදි හුදෙක් ලොකප්‍රසිද්ධ වාක්‍යකථනයෙහිලා උත්කර්ෂාවබොධක විශෙෂණ විරහය හෙතුකොටගෙණ කාන්තිගුණ නැතැයි දතයුතුයි.

89 ලොකාතිත ඉවාත්‍යර්ථ මධ්‍යාරොප්‍ය විවක්‍ෂිතඃ,
යොර්ථස්තෙනාති තුෂ්‍යන්ති විදග්ධානෙතරෙජනාඃ.

යඃඅර්ථඃ, යම්අර්ථයක්; අත්‍යර්ථම්, අත්‍යර්ථයෙන්; ලොකාතීතඃඉව, ආලෞකිකවූයේද; (මෙහි ඉවශබ්දය අපිශබ්දාර්ථයි) අධ්‍යාරොප්‍ය, අධ්‍යාරොපණය කොට; (කල්පනාකොට) විවක්‍ෂිතඃ, කියනුකැමතිවූයේද; තෙන, ඒ අර්ථයහෙතුකොටගෙණ; විදග්ධාඃ, පණ්ඩිතයෝ; තුෂ්‍යන්ති, සතුටුවෙති; ඉතරෙජනාඃ, අන්‍යවූවෛදර්භීයො; න, සතුටුනොවෙති; මේ ගෞඩමතාශ්‍රිතවචනයි. කාන්තං සර්වජගත්කාන්තං යනාදීන් කියනලද කාන්තිගුණය ගෞඩයන් විසින් අනාදරීකෘතයනුමෙහිඑලිතාර්ථයි.

90 දෙවධිෂ්ණ්‍යම්වාරාධ්‍ය මද්‍යප්‍රභෘතිනොගෘහම්
යුෂ්මත්පාදරජඃ පාත ධෞතනිඃ ශෙෂකිල්විෂම්.

යුෂ්මත්, නුඹවහන්සේගේ; පාදරජඃපාත, පාද රජස්පතනයෙන්; ධෞත, පරිශුද්ධවූ; නිඃ ශෙෂ කිල්විෂම්, සකල පාපඇති; නොගෘහම්, අපගේ ගෘහය; අද්‍යප්‍රභෘති, අදපටන්; දෙවධිෂ්ණ්‍යම් ඉව, දේවස්ථානයක් මෙන්; ආරාධ්‍යම්, සෙවනයකට යුතුවෙයි. මේ ගෞඩීයයන්ගේ උදාහරණයි. මෙහි උත්තමයන්ගේ චරණ රජස්පර්ශයෙන් ගෘහයාගේ පිරිසිදුවීම ලොකසිද්ධ නමුදු දෙවාලයකමෙන් අරාධ්‍යත්වකීර්තනය ආරොපිතනුයි වෛදර්භීරීතිගත වාර්තාභිධාන විෂයක කාන්තිගුණ විපයයියි දතයුතුයි.

91 අල්පංනිර්මිතමාකාශ මනාලොච්‍යෛවවෙධසා,
ඉදමෙවංවිධංභාවි භවත්‍යස්තනජෘම්භනම්.

භවත්‍යාඃ, පින්වතියගේ; ස්තනජෘම්භනම්, පයොධරවර්ධනය; එවංවිධං, මෙබඳුව; භාවි වන්නේයයන, ඉදම්; මෙය අනාලොච්‍යඑව, නොබලාම; වෙධසා, මහාබ්‍රහ්මයාවිසින්; අකාශම්, ආකාශය; අල්පම්, ස්වල්ප කොට; නිර්මිතම්, මවනලද්දේය මේවර්ණනාවිෂයෙහි කාන්තිගුණ; විප යඝිසනයට උදාහරණයි, මෙහි මහාබ්‍රහ්මයාගේ අනාලොචනයෙන් ස්වල්ප කොට ආකාශනිර්මාණය වර්ණනාකිරීමෙන් පයොධරයන්ගේ පීනොත්තුඞ්ගතා ප්‍රතිපාදනය චාටුකාරයකුගේ අත්‍යුක්තිවෙයි ඒ එසේමැයි. ඉතා මහත්වූ ආකාශයාගේ ස්වල්පත්වයද මහාබ්‍රහ්මයාගේ අනාලොචනපූර්වකවූ මැවීමද මෙරුමන්දර හිමාලයාදි මහාපර්වතයන්ගෙන් පිරවිය නොහැකිවූ ඉතාමහත්වූ ආකාශයාගේ සම්බාධස්ථිතියද යනමේ සියල්ල ලොකස්ථිතිය ඉක්මසිටියේය එබැවින් මෙසේනිම කාන්තිගුණ වාක්‍යයට කිසිසේත් උදාහරණ නොවෙයි දතයුතුය.

92 ඉදමත්‍යුක්තිරිත්‍යුක්ත මෙතද්ගෞඩෛඃපලාලිතම්,
ප්‍රස්ථානංප්‍රාක්ප්‍රණීතනතු සාරමන්‍යස්‍යවර්ත්මනඃ.

ඉදම්, මෙයමහෝ, මෙබඳුකාව්‍යය; අනුක්තිඃ ඉති, අනුක්තිඃයයි; උක්තම්, කවීන්විසින්කියනලදී; එතද්, මෙය; ගෞඩොපලාලිතම්, ගෞඩයන්විසින් උපලාලනායකරණලද්දේය; මනොහරබවයෙන් ගන්නා ලදුයියේයි ප්‍රාක්, පළමුකොට; ප්‍රණීතම්, කියනලද; ප්‍රස්ථානනතු, ප්‍රස්ථානයහෙවත් ශලාකයිඩිවණීනාරූපකානහිගුණ යුක්තව්‍යාක්‍යය; අන්‍යස්‍යවර්ත්මනඃ, අනික්මාගියාගේ හෙවත් වෛදර්භීරීතියගේ; සාරම්, හරයි.

93 අන්‍යධර්මස්තතොන්‍යත්‍ර ලොකසීමානුරොධිනා,
සම්‍යගාධීයතෙ යත්‍ර සසමාධිඃ සමෘතො යථා.

අන්‍යධර්මඃ, අන්‍යයක්හුගේ ධර්මයක්; හෙවත් අනිකක්හුගේ ගුණ ක්‍රියා රූපවූධර්මයක්; තතඃ, ඔහුකෙරෙන්; අන්‍යත්‍ර, අනිකක්හුකෙරෙහි; ලොකසීමානුරොධිනා ලොකසම්හියට අවිරුඬවූ යම්කියි වත්‍යාකෙනෙකුවිසින් යත්‍ර, ඉදින්; සම්‍යක්, මනාකොට; ආධීයතෙ, පිහිටුවනුලැබේද; සඃ, ඒ පිහිටුවීම; සමාධිඃ, සමාධියයි; සමෘතඃ, දන්නාලදී; යථා, ඊටඋදාහරණ මෙසේයි.

94 කුමුදනිනිමීලන්ති කමලාන්‍යුන්මිෂන්තිච
ඉතිනෙත්‍ර ක්‍රියාධ්‍යාසාලලබ්ධා තද්වාචිනිශ්‍රැතිඃ.

කුමුදනි, කුමුදයෝ; නිමීලන්ති, නිමීලනයවෙති; කමලානි, පද්මයෝ; උන්මිෂන්ති, උන්මීලනයවෙති; ඉති මෙසේ (කුමුදපද්මයන මොවුන්කෙරෙහි) නෙත්‍රක්‍රියාධ්‍යාසාත්, නෙත්‍රක්‍රියා පිහිටුවීමෙන්; තද්වාචිනී ඒ නෙත්‍රක්‍රියාවාචිවූ; ශ්‍රැතිඃ, ශ්‍රැතිය; ලබ්ධා(කුමුද පද්මයන්විසින්) ලබනලදුයි.

65 පද්මාන්‍යකීංශුනිෂ්ඨ්‍යූතාඃ පීත්වාපාවකවිප්‍රුෂඃ
භූයොවමන්තිවමුඛෛ රුද්ගිණීරුණරෙණුභිඃ.

පද්මානි, පද්මයෝ; අකීංශුනිෂ්ඨ්‍යූතාඃ, හිරුරැසින් නගනලද; පාවකවිප්‍රුෂඃ, ගිනි පුපුරු; පීත්වා, පානයකොට; භූයඃ, නැවත; උද්ගීණීරුණරෙණුභිඃ, උද්ගිරණය කරණලද අරුණුවන් රජස්කරණකොටගෙන මුඛෛඃ, මුඛවලින්; වමන්තිඉව, වමාරන්නවුන් වැන්නෝයි.

96 නිෂ්ඨ්‍යූතොද්ගීණීවාන්තාදි ගෞණවෘත්තිව්‍යපාශ්‍රයම්,
අතිසුන්දරමන්‍යත්‍ර ග්‍රාම්‍යකක්ෂාං විගාහතෙ.

නිෂ්ඨ්‍යූතොද්ගීර්ණවාන්තාදි, නිෂ්ඨ්‍යූතඋද්ගීර්ණවාන්තයනාදිය; ගෞණවෘත්තිව්‍යපාශ්‍රයම්, අමුඛ්‍යවෘත්තියෙහි විශෙෂයෙන් ආශ්‍රිතවූයේ හෙවත් මුඛ්‍යාර්ථසදෘශවූ අමුඛ්‍යාර්ථයෙහි පැවැත්තේ; අතිසුන්දරම්, අතිශයින්ම මනොරම්‍යයි; සමාධිගුණයුක්තයයිසේයි; අන්‍යත්‍ර, මෙයින් අන්‍යවූමුඛ්‍යාර්ථයෙහි වූයේනම්; ග්‍රාම්‍යකක්ෂාම්, ග්‍රාම්‍යකක්ෂයට; විගාහතෙ, පැමිණේ; නිෂ්ඨ්‍යූතය උද්ගීර්ණයවාන්තයයනාදි ශබ්ද අමුඛ්‍යාර්ථයෙහි උපමාවශයෙන් යෙදීම සමාධිගුණ ජනකය මුඛ්‍යාර්ථයෙහි යෙදුවහොත් ග්‍රාම්‍යදොෂ දුෂ්ට යයනු මෙහි නිෂ්කර්ෂයි.

97 ඉතිහෘද්‍යමහෘද්‍යන්තු නිෂ්ඨීවතිවධූරිති
යුගපන්නෛකධර්මාණාමධ්‍යාසශ්ච ස්මෘතො යථා.

ඉති, මේ නිෂ්ඨ්‍යූතපදය හෙවත් ගෞණලක්ෂණ යෝගයෙන් සමාධිගුණ යුක්තපදය; හෘද්‍යම්, මනොරම්‍යයි; වධූ, කාන්තාතොමෝ; නිෂ්ඨීවති ඉති, කාරයි යන මෙය; මුඛ්‍යාර්ථවර්තීහෙයින් අහෘද්‍යන්තු, අමනොඥයි; ග්‍රාම්‍යදොෂයෙන් දූෂිතහෙයින් පණ්ඩිතයන්ට අප්‍රියයිසේයි. නෛකධර්මාණාම්, බොහෝවූ අන්‍යධර්මයන්ගේ; අධ්‍යාසශ්ච, සමාරොපණයද; ස්මෘතම්, කවීන් විසින් දන්නාලදී; යථා, ඊට උදාහරණ මෙසේයි.

98 ගුරුගර්භභරක්ලාන්තාඃ ස්තනන්ත්‍යො මෙඝපඞ්ක්තයඃ
අචලාධිත්‍යකොත්සඞ්ග මිමාඃසමධිශෙරතෙ.

ගුරු, මහත්වූ; ගර්භභර, ගර්භභාරයෙන්; ක්ලාන්තාඃ, ක්ලාන්තවූ; ස්තනන්ත්‍යඃ, ශබ්දකරන්නාවූ; ඉමාඃ මෙඝපඞ්ක්තයඃ, මේ මෙඝපඞ්ක්තීහු; අචල, පර්වතයන්ගේ; අධිත්‍යක, උර්ධ්වාසන්න ප්‍රදෙශනැමති උත්සඞ්ග මධ්‍යප්‍රදෙශයෙහි; සමධිශෙරතෙ, ශයනය කෙරෙත්; ටීකාකාරයෝ ස්ත්‍රී පක්ෂාපිදගෙණ අපිපක්ෂදෙකක් දක්වති.

මෙහි මෙඝපන්ක්තීන් කෙරෙහි බොහෝවූ ගර්භිණී ධර්මයන් එකවට අධ්‍යාරොපණය කිරීමෙන් අතිශය මනොහරත්වය ඇතිවේ; මේ හෙතුකොටගෙණම මේ අතිශයොක්ති මූලකවූ සමාසොක්ත්‍යලඞ්කාරයි.

99 උත්සඞ්ගශයනං සඛ්‍යාඃ ස්තනනං ගෞරවංක්ලමඃ,
ඉතීමෙ ගර්භිණීධර්මාබහවොප්‍යත්‍රදර්ශිතාඃ

සඛ්‍යාඃ, සඛීන්ගේ; උත්සඞ්ගශයනම්, ඇකයෙහි ශයනය කිරීමය; ස්තනනම්, ශබ්දකිරීමය; ගෞරවම්, බරබවය; ක්ලමඃ ඉති, ක්ලාන්තය යන; බහවඃ, බොහෝවූ; ගර්භිණීධර්මාඃ අපි, ගර්භිණීධර්මයෝද; අත්‍ර, මේ අනන්තරොක්තශ්ලොකයෙහි; දර්ශිතාඃ, දක්වන ලද්දූහ; ස්තනිතං ගර්ජිතං" මෙඝනිර්ඝොෂෙ යනු අමරකොෂහෙයින් ස්තනන ශබ්දයෙන් මෙඝගර්ජනාවම දන්නාලැබේ. එනමුදුවුවත් ශබ්දමාත්‍රයක්ම අර්ථකොට ඇති ස්තන යන ධාතුවෙන් නිෂ්පන්නවූයෙන් ගැබිණියගේ ක්ලාන්ත

ජනිත ශබ්ද සඳහාද ස්තනන ශබ්දය විරුද්ධනොවේ. තවද ස්තනිත මණිතාදි සුරතෙ මෙඝාදි අගර්ජිත ප්‍රමුඛවී යන කොෂාන්තරගත වචනයෙන් ස්තනිත ශබ්දයාගේ සුරතවාචකත්වයද සිද්ධයි. එහෙයින් භුදෙක් ස්තන ධාතුහුගේ අර්ථය මෙඝගර්ජනාවම වේයයි නොසිතිය යුතුයි.

100 තදෙතත්කාව්‍යසර්වස්වං සමාධිර්නාමයොගුණඃ
කවිසාර්ථඃ සමග්‍රොපි තමෙනමනුගච්ඡති.

තත්, එහෙයින් පළමුකොට දක්වනලද කාව්‍යයාගේ චාරුත්වාතිශය ජනකහෙයින්; සමාධිර්නාම, සමාධිනම්වූ; යොගුණඃ, යම් ගුණයෙක් වේද; එතත්, මෙය; කාව්‍යසර්වස්වම්, කාව්‍යයාගේ සාරයයි; සමග්‍රඃ අපි, සියලුම; කවිසාර්ථඃ, කවිසාර්ථතෙමේ; තමෙනම්, ඒ මේ කාව්‍යසාරය; අනුගච්ඡති, අනුවයේ.

101 ඉති මාර්ගද්වයංභින්නං තත්ස්වරූපනිරූපණාත්,
තද්භෙදාස්තු නශක්‍යන්තෙවක්තුං ප්‍රතිකවිස්ථිතාඃ.

ඉති, මෙසේ පූර්වොක්තප්‍රකාරයෙන්; තත්, ඒ ගෞඩ වෛදර්භිමාර්ගද්වයාගේ; ස්වරූප නිරූපණාත්, ලක්ෂණ කිරීමෙයෙන්; මාර්ගද්වයම්, රීතිද්වය; භින්නම්, භින්නය; තද්භෙදාස්තු, එයින් අන්‍යවූ භෙදයෝ; ප්‍රතිකවිස්ථිතාඃ, කවීන් පාසාසිටියාහු; හෙවත් තත්තත්දෙශවාසී කවීන් කෙරෙහි සිටියාහු; වක්තුම්, කියන්ට; නශක්‍යන්තෙ, නොහැකිවෙති.

102 ඉක්ෂුක්ෂීරගුඩාදීනාං මාධුර්‍ය්‍යස්‍යාන්තරංමහත්,
තථාපිනතදාඛ්‍යාතුං සරස්වත්‍යාපි ශක්‍යතෙ.

ඉක්ෂුක්ෂීරගුඩාදීනාම්, උක්ය, කිරිය, ගුළය, යනාදීන්ගේ; මාධුර්‍ය්‍යස්‍ය, මධුරත්වය සම්බන්ධවූ; අන්තරම්, අතර; මහත්, මහත්වෙයි; ස්ඵුටය සිසේයි; තථාපි, එසේවූවද; තත්, එය; ආඛ්‍යාතුම්, කියන්ට; හෙවත් නාමොල්ලෙඛනයෙන් නිර්දේශකරන්ට; සරස්වත්‍යාපි, සරස්වතියටත් නශක්‍යතෙ, නොහැකිවේ.

103 නෛසර්ගිකීචප්‍රතිභා ශ්‍රුතඤ්ච බහුනිර්මලම්,
අමන්දශ්චාභියොගොස්‍යාඃ කාරණම් කාව්‍යසම්පදඃ.

නෛසර්ගිකී, ස්වභාවසිද්ධවූ; ප්‍රතිභාව, වැටහීමද; බහු, බොහෝවූ; නිර්මලම්, පරිශුද්ධවූ හෙවත් නිඃසන්දෙහත්වයෙන් හදුරා මනාව පරිශීලනයකරණලද; ශ්‍රුතම්, ශාස්ත්‍රඥනයද; අමන්දඃ, අනල්පවූ; අභියොගශ්ච, අභ්‍යාසයද (යනමේ තුන) අස්‍යාඃ කාව්‍යසම්පදඃ, මේ කාව්‍යස්වරූප සම්පත්තියට; කාරණම්, හෙතුය; මෙහි කාරණම් යන ඒකවචනයෙන් මේ තුණ සමුදිතවූයේම කාව්‍යසම්පත්තියෙහි හෙතුවෙයි–ව්‍යස්තවූයේ හෙතු නොවේය යනු සූචිතයි.

104 නවිද්‍යතෙ යද්‍යපි පූර්වවාසනා
ගුණානුබන්ධිප්‍රතිභානමද්භුතම්
ශ්‍රැතෙන යත්නෙන ච වාගුපාසිතා
ධ්‍රැවං කරොත්‍යෙව කමප්‍යනුග්‍රහම්.

යදි, ඉදින්; පූර්වවාසනා, පූර්වවාසනාවද; අද්භුතම්, ආශ්චර්ය්‍යවූ; ගුණානුබන්ධි, ගුණ ලුහුබඳනාවූ හෙවත් වෛචිත්‍ර්‍යාවහවූ; ප්‍රතිභානම්, වැටහීමද; නවිද්‍යතෙ අපි, විද්‍යමාන නොවේ නමුදු; ශ්‍රැතෙන, ශාස්ත්‍රානු ශීලනයෙන්ද; යත්නෙන ච, උත්සාහයෙන්ද; උපාසිතා, සෙවනය කරණලද වාක්, සරස්වතී තොමෝ; ධ්‍රැවම්, ඒකාන්තයෙන්; කමපි අනුග්‍රම්, කිසි අනුග්‍රහයක්; කරොති එව, කෙරේමය.

105 තදස්තතන්ද්‍රෛරනිශං සරස්වතී
ශ්‍රමාදුපාස්‍යා බලුකීර්ත්තිමිප්සුභිඃ
කෘශෙකවිත්වෙපිජනාඃ කෘතශ්‍රමාඃ
විදග්ධගොෂ්ඨීෂු විහර්තුමීශතෙ.

**ඉති ආචාර්ය්‍ය දණ්ඩිනඃ, කෘතෞ කාව්‍යාදර්ශෙ මාර්ගවිභාගො නාම ප්‍රථමඃ පරිච්ඡෙදඃ.**

තත්, එහෙයින්; අස්තතන්ද්‍රෛඃ, අස්තවූ තන්ද්‍රා ඇති හෙවත් අනලස්වූ කීර්ත්තිමිප්සුභිඃ, කීර්ත්ති කැමැත්තන් විසින්; බලු, ඒකාන්තයෙන් අනිශම්, නිරන්තරයෙන්; ශ්‍රමාත්, ශ්‍රමයෙන්; සරස්වතී, සරස්වතිය; උපාස්‍යා, සෙවනය කටයුතුයි; කෘතශ්‍රමාඃ, කරණලද ශාස්ත්‍රපරිශීලන ප්‍රයාස ඇති; ජනාඃ, ජනයෝ; කවිත්වෙ, කවිත්වය; කෘශෙ අපි, කෘශකල්හිද; හෙවත් ස්වල්පකල්හිද; විදග්ධගොෂ්ඨීෂු, පණ්ඩිත සභාවන්හි; විහර්තුම්, විහරණයට; ඊශතෙ, සමර්ථවෙති.

**ආචාර්ය්‍ය දණ්ඩීන්ගේ කෘතිවූ කාව්‍යාදර්ශයෙහි මාර්ගවිභාගනම්වූ ප්‍රථම පරිච්ඡෙදය සමාප්තයි.**

## ද්විතීයඃ පරිච්ඡෙදඃ.

1 කාව්‍යශොභාකරාන් ධර්මානලඞ්කාරාන් ප්‍රචක්ෂතෙ
තෙ චාද්‍යාපි විකල්ප්‍යන්තෙ කස්තාන් කාර්ත්ස්න්‍යෙන වක්ෂ්‍යති.

කාව්‍යශොභාකරාන්, කාව්‍යශොභනය කරන්නාවූ; ධර්මාන්, ධර්මයන්; හෙවත් කාව්‍යශොභනයට අතිශය හෙතුවූ ධර්මයන්; අලඞ්කාරාන්, අලඞ්කාරයනැයි; ප්‍රචක්ෂතෙ, කියති; තෙච, ඒ අලඞ්කාරයෝද; අද්‍යාපි, අද දක්වාත්; විකල්ප්‍යන්තෙ, විවිධරූපත්වයෙන් කල්පනාකරනු ලැබෙත්; කඃ, කවරෙක්; තාන්, ඒ අලඞ්කාරයන්; කාර්ත්ස්න්‍යෙන, සාකල්‍යයෙන්; වක්ෂ්‍යති, කියන්නේද? කියනොහැක්කේයි යේයි.

2 කින්තු බීජං විකල්පානාං පූර්වාචාර්යෛඃ ප්‍රදර්ශිතම්
තදෙව පරිසංස්කර්තු මයමස්මත් පරිශ්‍රමඃ

කින්තු, වැලි; විකල්පානාම්, විවිධරූපකල්පනාවන්ගේ; බීජම්, බීජය හෙවත් මූලහෙතුව; පූර්වාචාර්යෛඃ, පූර්වාචාර්යයන් විසින්; ප්‍රදර්ශිතම්, දක්වන ලද්දේය; තදෙව, එයම; පරිසංස්කර්තුම්, ය්‍රුටශබ්දනිධානාදීයෙන් විසදී කරණයට; අස්මත්, අපගේ; අයං පරිශ්‍රමඃ, මේ ප්‍රයාසයවේ.

3 කාශ්චින්මාර්ගවිභාගාර්ථ මුක්තාඃ ප්‍රාගප්‍යලඞ්ක්‍රියාඃ,
සාධාරණමලඞ්කාර ජාතමන්‍යත්ප්‍රදර්ශ්‍යතෙ.

කාශ්චිත් අලඞ්ක්‍රියාඃ, කිසි අලඞ්කාරකෙනෙක්; මාර්ගවිභාගාර්ථම්, රීතිභෙද දර්ශනය පිණිස; ප්‍රාගපි, පළමුකොටම; උක්තාඃ, කියනලද්දාහ; (දැන්) සාධාරණම්, සාමාන්‍යවූ; අන්‍යත් අලඞ්කාරජාතම්, අන්‍යවූ අලඞ්කාරජාතය; ප්‍රදර්ශ්‍යතෙ, දක්වනුලැබේ.

4 ස්වභාවාඛ්‍යානමුපමා රූපකං දීපකාවෘතී,
ආක්ෂෙපොර්ථාන්තරන්‍යාසො ව්‍යතිරෙකො විභාවනා.

ස්වභාවාඛ්‍යානම්, ස්වභාවෝක්තිය; උපමා, උපමාය; රූපකම්, රූපකය; දීපකාවෘති,දීපකආවෘති දෙකය; ආක්ෂෙපඃ, ආක්ෂෙපය; අර්ථාන්තරන්‍යාසඃ, අර්ථාන්තරන්‍යාසය; ව්‍යතිරෙකඃ, ව්‍යතිරෙකය; විභාවනා, විභාවනාය.

5 සමාසාතිශයොත්ප්‍රෙක්ෂා හෙතුඃ සූක්ෂ්මොලවඃක්‍රමඃ
ප්‍රෙයොරසවදූර්ජස්වි පර්‍ය්‍යායොක්තම් සමාහිතම්.

සමාස, සමාසෝක්තිය; අතිශය, අතිශයෝක්තිය; උත්ප්‍රෙක්ෂා, උත්ප්‍රෙක්ෂාය; යනමොහුය; හෙතුඃ, හෙතුය; සූක්ෂ්මඃ, සූක්ෂ්මය; ලවඃ, ලවය; ක්‍රමඃ, ක්‍රමය; ප්‍රෙයඃ, ප්‍රෙයය; රසවත්, රසවත්ය; ඌර්ජස්වි, ඌර්ජස්විය; පර්‍ය්‍යායොක්තම්, පර්‍ය්‍යායොක්තිය; සමාහිතම්, සමාධිය.

6 උදාත්තාපහ්නුතිශ්ලෙෂ විශෙෂාස්තුල්‍යයොගිතා,
විරොධාප්‍රස්තුතස්තොත්‍රෙ ව්‍යාජස්තුතිනිදර්ශනෙ.

උදාත්ත, උදාත්තය; අපහ්නුති, අපහ්නුතිය; ශ්ලෙෂ,ශ්ලෙෂය; විශෙෂාඃ, විශෙෂෝක්තිය යන මොහුය; තුල්‍යයොගිතා, තුල්‍යයොගිතාය; විරොධාප්‍රස්තුතස්තොත්‍රෙ, විරොධය අප්‍රස්තුත ප්‍රශංසා යන දෙකය; ව්‍යාජස්තුතිනිදර්ශනෙ, ව්‍යාජස්තුතිය නිදර්ශනය යන දෙකය.

7 සහොක්තිඃ පරිවෘත්‍යාශීඃ සඞ්කීර්ණමථභාවිකම්,
ඉතිවාචාමලඞ්කාරා දර්ශිතාඃ පූර්වසූරිභිඃ.

සහොක්තිඃ, සහොක්තිය; පරිවෘත්‍යාශීඃ, පරිවෘත්ති අශිස් යනදෙකය; සඞ්කීර්ණම්, සඞ්කීර්ණය; අථ, ඉක්බිති; භාවිකම් ඉති, භාවිකයයි; වාචාම්, කාව්‍ය වාක්‍යයන් සම්බන්ධිවූ; අලඞ්කාරාඃ, අලඞ්කාරයෝ; පූර්වසූරිභිඃ, පූර්

පණ්ඩිතයන් විසින්; දර්ශිතාඃ, දක්වනලද්දාහුය; සමයඥෛනත පූර්වසූරිභිඃ, යන පාඨයෙහි; සමයඥෛනත, දන්නාලැබෙන් යන අර්ථයි.

8 නානාවස්ථං පදාර්ථානාං රූපංසාක්‍ෂාත් විවෘණ්වතී,
ස්වභාවෝක්තිශ්චජාතිශ්චෙත්‍යාද්‍යා සාලඞ්කෘතිර්යථා.

පදාර්ථානාම්, ජාතිගුණ ක්‍රියාද්‍රව්‍ය යන පදාර්ථයන්ගේ; නානාවස්ථම්, නොයෙක් අවස්ථාඇති; රූපම්, රූපය; සාක්ෂාත්, ඉන්ද්‍රිය හමුයෙහිමෙන්; විවෘණ්වතී, ප්‍රකාශකරන්නාවූ; ස්වභාවෝක්තිශ්ච, ස්වභාවෝක්තිනම්වූද; ජාතිශ්ච ඉති, ජාතිනම්වූදයි; ආද්‍යා, පළමුවෙනිවූ; හෙවත් සියල්ලන්ට අග්‍රවූ; සා, ප්‍රසිද්ධවූ; අලඞ්කෘතිඃ, අලඞ්කාරය; යථා, මෙසේයි.

9 තුණ්ඩෛරාතාම්‍රකුටිලෛඃ පක්‍ෂෛර්හරිතකෝමලෛඃ,
ත්‍රිවර්ණරාජිභිඃකණ්ඨෛ රේතෙමඤ්ජුගිරඃ ශුකාඃ.

ආතාම්‍රකුටිලෛඃ, රතුවවක්වූ; තුණ්ඩෛඃ, තුඩින්ද; හරිතකෝමලෛඃ පලාවින්වූ මෙලෙක්වූ; පක්‍ෂෛඃ, පියාපතින්ද; ත්‍රිවර්ණරාජිභිඃ, වර්ණත්‍රයාත්මකවූ තිරිඇති; කණ්ඨෛඃ, ග්‍රීවයෙන්ද උපලක්ෂිතවූ; එතෙශුකාඃ, මේ ගිරව්; මඤ්ජුගිරඃ, මනොඥ ස්වරඇත්තාහුයි. මේ ජාතිගත ස්වභාවෝක්තියි.

10 කලක්වණිතගර්භේණ කණ්ඨේනාඝූර්ණිතේක්‍ෂණඃ,
පාරාවතඃ පරිභ්‍රම්‍යරිරංසුශ්චුම්බති ප්‍රියාම්.

රිරංසුඃ, රමනය කටැව්වූ; පාරාවතඃ, පරෙවිතෙම; කලක්වණිත ගර්භේණ, මධුරස්වර ගර්භකොටඇති; කණ්ඨේන, බොටුවෙන් යුක්තව; ආඝූර්ණිතේක්‍ෂණඃ, බමනලද ඇස්ඇත්තේ; ප්‍රියාම්, ප්‍රියාව; පරිභ්‍රම්‍ය, සිසාරා; චුම්බති, සිඹී. මේ ක්‍රියාගත ස්වභාවෝක්තියි.

11 බධ්නන්නඞ්ගෙෂුරෝමාඤ්චං කුර්වන්මනසි නිර්වෘතිම්,
නෙත්‍රෙචාමීලයන්නෙෂප්‍රියාස්පර්ශඃ ප්‍රවර්තතෙ.

අඞ්ගෙෂු, ශරීරාවයවයන්හි; රෝමාඤ්චම්, රෝමහර්ෂය; බධ්නන්, බන්ධනය කරමින්; මනසි, චිත්තයෙහි; නිර්වෘතිම්, නිර්වෘතිය හෙවත් සන්තොෂාතිශය; කුර්වන්, කරමින්; නෙත්‍රෙච, ඇස්ද; ආමීලයන්, නිමීලනය කරමින්; එෂඃ ප්‍රියාස්පර්ශඃ, මේ ප්‍රියාස්පර්ශය; ප්‍රවර්තතෙ, පවතී.

මෙහි ස්පර්ශය ගුණහෙයින් මේගුණ ස්වභාවෝක්තියි.

12 කණ්ඨේකාලඃකරස්ථේන කපාලේනෙන්දුශෙඛරඃ,
ජටාභිඃ ස්නිග්ධතාම්‍රාභිරාවිරාසීද්වෘෂධ්වජඃ.

කණ්ඨේකාලඃ, බොටුවෙහි කාලවර්ණවූ; කරස්ථෙන, අතෙහිසිටි; කපාලෙන, කබලින් උපලක්ෂිතවූ; ස්නිග්ධතාම්‍රාභිඃ, සිනිඳු තඹවන්; ජටාභිඃ, ජටාවෙන් උපලක්ෂිතවූ; ඉන්දුශෙඛරඃ, චන්ද්‍රමණ්ඩලය ශෙඛර කොටඇති; වෘෂධ්වජඃ, මහෙශ්වරතෙමේ; අවිඃආසීත්, පහලවූයේය; මේ ද්‍රව්‍යගත ස්වභාවෝක්තියි.

13 ජාතික්‍රියාගුණද්‍රව්‍ය ස්වභාවාඛ්‍යානමීදෘශම්,
ශාස්ත්‍රෂ්වස්‍යෛවසාම්‍රාජ්‍යං කාව්‍යෂ්වප්‍යේතදීප්සිතම්.

ජාතික්‍රියාගුණ ද්‍රව්‍යස්වභාවාඛ්‍යානම්, ජාතිය, ක්‍රියාය, ගුණය, ද්‍රව්‍යය යන මොවුන්ගේ; ස්වභාවොක්තිය; ඊදෘශම්, මෙබඳුවේ; ශාස්ත්‍රෂු, ආත් විඤ්ඤ්කී විඥාදිශාස්ත්‍රයන්හි; අස්‍යෙව, මේ ස්වභාවාඛ්‍යානයාගේම; සාම්‍රාජ්‍යම්, ප්‍රාධාන්‍යයවේ; කාව්‍යෂු අපි, කාව්‍යයන්හිලාත්; එතත්, මෙය; ඊප්සිතම්, ඊප්සිතයි.

14 යථා කථඤ්චිත් සාදෘශ්‍යං යත්‍රොද්භූතං ප්‍රතීයතෙ,
උපමානාමසාතස්‍යාඃ ප්‍රපඤ්චොයං නිදර්ශ්‍යතෙ.

යථා කථඤ්චිත්, යම්කිසි ප්‍රකාරයකින්; යත්‍ර, යම් තැනෙක්හි; උද්භූතම්, පහළවූ; සාදෘශ්‍යම්, සමානබව; ප්‍රතීයතෙ, හැඟේද; සා, ඕතෙමෝ; උපමානාම, උපමානම්වේ; තස්‍යාඃ, ඒ උපමාවගේ; අයං ප්‍රපඤ්චඃ, මේ විස්තරය; නිදර්ශ්‍යතෙ, දක්වනුලැබේ.

15 අම්භොරුහමිවාතාම්‍රං මුග්ධෙකරතලංතව
ඉතිධර්මොපමාසාක්ෂාත්තුල්‍ය ධර්මප්‍රදර්ශනාත්.

මුග්ධෙ, එම්බාකාන්තාව; තව, තීගේ; කරතලම්, හස්තතලය; අම්භොරුහම් ඉව, රක්තපද්මයක්මෙන්; ආතාම්‍රම්, රතුයි; ඉති, මෙබඳුවූවා; සාක්ෂාත්, ඇස් හමුයෙහිමෙන්; තුල්‍යධර්ම ප්‍රදර්ශනාත්, සමාන ධර්මයන්ගේ ප්‍රදර්ශනය හෙතුකොටගෙණ; ධර්මොපමා, ධර්මොපමානම.

16 රාජීවමිවතෙවක්ත්‍රං නෙත්‍රෙනීලොත්පලෙ ඉව
ඉයං ප්‍රතීයමානෛක ධර්මාවස්තූපමෛවසා.

තෙ, තීගේ; වක්ත්‍රම්, මුඛය; රාජීවංඉව, පද්මයක් වැන්න; නෙත්‍රෙ, නෙත්‍රවය; නීලොත්පලෙ ඉව, නීලොත්පල වයක් වැන්න; සා ඉයම්, ඒමේ; ප්‍රතීයමාන එකධර්මා, හැඟෙනුලබන්නාවූ සමාන්‍ය ධර්මඇත්තී; වස්තූපමා එව, වස්තූපමාමැයි.

17 තවානනමිවොන්නිද්‍රමරවින්ද මභූදිති
සාප්‍රසිද්ධිවිපර්‍ය්‍යාසාද් විපර්‍ය්‍යාසොපමෙෂ්‍යතෙ.

උන්නිද්‍රම්, ප්‍රබුද්ධවූ; අරවින්දම්, පද්මය; තව, හීගේ; ආනනම් ඉව, මුඛයමෙන්; අභූත් ඉති, වූයේය යන; සා, ඒ උපමානොමෝ; ප්‍රසිද්ධි විපර්‍ය්‍යාසාත්, ප්‍රසිද්ධියගේ විපර්‍ය්‍යාසහෙයින්; විපර්‍ය්‍යාසොපමා, විපර්‍ය්‍යාසොපමායයි ඉෂ්‍යතෙ, කැමතිවනු ලැබේ. ප්‍රස්තුතවූ මුඛාදීන්ගේ උපමෙයත්වය හා අප්‍රස්තුතවූ පද්මාදීන්ගේ උපමානත්වය ලොකප්‍රසිද්ධය එය විපර්‍ය්‍යාසකොට ප්‍රස්තුතවූ මුඛයාගේ අත්‍යන්තොත්කර්ෂ ප්‍රතිපාදනයට එය උපමානත්වයෙන්ද අප්‍රස්තුතවූ පද්මය උපමෙයත්වයෙන්ද යෙදූහෙයින් මේ විපර්‍ය්‍යාසොපමා නම්විය.

18 තවානනමිවාම්භොජ මම්භොජමිවතෙමුඛම්
ඉත්‍යන්‍යොන්‍යොපමාසෙය මන්‍යොන්‍යොත්කර්ෂශංසිනී.

අම්භෝජම්, පද්මය; තව, තිගේ; ආනනම් ඉව, මුඛයවැන්න; තෙ, තීගේ; මුඛම්, මුඛය; අම්භෝජම් ඉව, පද්මය වැනිය; ඉති, මෙසේ; අන්‍යෝන්‍ය උත්කර්ෂශංසිනී, උනුනුන්ගේ උත්කර්ෂ ප්‍රකාශකවූ; සාඉයම්, ඒ මේ උපමාතොමෝ; අන්‍යෝන්‍යෝපමා අන්‍යෝන්‍යෝපමා නම්වේ.

19 ත්වන්මුඛංකමලෙනෛවතුල්‍යං නාන්‍යෙනකෙනචිත්
ඉත්‍යන්‍යසාම්‍යව්‍යාවෘත්තෙ රියංසානියමොපමා.

ත්වන්මුඛම්, තිගේ මුඛය; කමලෙන එව, පද්මය සමගම; තුල්‍යම්, සදෘශය; අන්‍යෙන කෙනචිත්, අන්කිසිවක් හා; න, සදෘශනොවෙයි; ඉති, මෙසේ; අන්‍යසාම්‍යව්‍යාවෘත්තෙඃ, අන්‍යයකු හා සදෘශත්වය වැළැක්වූ හෙයින්; සා ඉයම්, ඒ මේ උපමාතොමෝ, නියමොපමා, නියමොපමා නම්වේ.

20 පද්මංතාවත්තවාන්වෙති මුඛමන්‍යච්චතාදෘශම්
අස්තිචෙද්වස්තුතත් කාරී ත්‍යසාවනියමොපමා.

තවමුඛම්, තිගේ මුඛය; තාවත්, හුදෙක්; පද්මම්, පද්මය; අන්වෙති, අනුවයේ; තාදෘශම්, එබඳුවූ; තත්කාරි, තිගේ මුඛානුකාරිවූ: අන්‍යච්ච, අතිකකුත්; චෙත්, ඉදින්; අස්ති, ඇත්තේනම්; අස්තු, වේවා; ඉති, මෙබඳුවූ; අසෞ, මෝතොමෝ; අනියමොපමා, අනියමොපමා නම්වේ.

21 සමුච්චයොපමාප්‍යස්ති නකාන්ත්‍යෛවමුඛංතව
හලාදනාඛ්‍යෙනචාන්වෙති කර්මණෙන්දුමිතීදෘශී

තව, තීගේ; මුඛම්, මුහුණ; කාන්ත්‍යාඑව න, හුදෙක් කාන්තියෙන් පමණක් නොවෙයි; හලාදනාඛ්‍යෙන, හලාදන නම්වූ කර්මණාච ක්‍රියාවෙන්ද හෙවත් සන්තොෂ ජනකත්වයෙන්ද; ඉන්දුම්, චන්ද්‍රමණ්ඩලය; අන්වෙති, (අනුකරෙහි) අනුව ක්‍රියාකෙරේ; ඉති, මෙසේ; ඊදෘශී, මෙබඳුවූ; සමුච්චයොපමා අපි, සමුච්චයොපමාවක්ද; අස්ති, ඇති චකාරය සමුච්චයද්‍යොතකයි.

22 ත්වය්‍යෙවත්වන්මුඛං දෘෂ්ටං දෘශ්‍යතෙදිවිචන්ද්‍රමාඃ
ඉයත්‍යෙවභිදානාන්‍යා ත්‍යසාවතිශයොපමා.

ත්වන්මුඛම්, තීගේ මුඛය; ත්වයිඑව, තී කෙරෙහිම; දෘෂ්ටම්, දක්නා ලදී; චන්ද්‍රමාඃ, චන්ද්‍රමණ්ඩලය; දිවි, ආකාශයෙහි; දෘශ්‍යතෙ, දක්නාලැබේ ඉයත්‍යෙව, මෙපමණක්ම; භිදා, විශෙෂයි; අන්‍යා, අන්‍යවූ විශෙෂයක්; නාස්ති, නැත්තේය යන; අසෞ, මෝතොමෝ; අතිශයොපමා, අතිශයොපමා නම්වේ. ඖපම්‍යයාගේ භින්නාශ්‍රයත්වයෙන් සාතිශය චමත්කාරජන කනුයි මේ අතිශයොපමායයි කියත්.

23 මය්‍යෙවාස්‍යාමුඛශ්‍රීරිත්‍ය ලමින්දොර්විකත්ථනෛඃ
පද්මෙපිසායදස්ත්‍යෙවෙත්‍ය සාවුත්ප්‍රෙක්ෂිතොපමා.

අස්‍යාඃ, මෑගේ; මුඛශ්‍රී, මුඛශොභාව; මයිඑව, මා කෙරෙහිමැයි; ඉන්දොඃ, චන්ද්‍රයාගේ; විකත්ථනෛඃ, ශ්ලාඝවචනයෙන්; අලං, පමණී; යත්, යම්හෙයකින්; පද්මෙපි, පද්මයෙහිද; සා, ඒ ශෝභාතොමෝ; අස්ති, එව ඉති, ඇත්තේමය යන; අසෞ, මෝතොමෝ; උත්ප්‍රෙක්ෂිතොපමා, උත්ප්‍රෙක්ෂිතොපමා නම්වේ.

24 යදිකිංචිද්භවෙත් පද්මං සුභ්‍රූවිභ්‍රාන්තලොචනම්
තත්තෙමුඛශ්‍රියංධත්තා මිත්‍යසාවද්භුතොපමා.

හෙසුභ්‍රූ, පිඹත්වූ යහපත් භ්‍රූ ඇත්තිය; යදි, ඉදින්; විභ්‍රාන්ත ලොචනම්, චඤ්චලවන්නාවූ ඇස්ඇති; කිංචිත්පද්මම්, කිසි පද්මයක්; භවෙත්, වන්නේනම්; තත්, ඒ පද්මය; තෙ, තීගේ; මුඛශ්‍රියම්, මුඛ ශොභාව; ධත්තාම්, උසුලාවයි යන; අසෞ, මේතොමෝ; අද්භුතො පමා, අද්භුතොපමා නම්වේ.

25 ශශීත්‍යුපෙක්ෂ්‍යතන්වඞ්ගී ත්වන්මුඛංත්වන්මුඛාශයා
ඉන්දුමප්‍යනුධාවාමීත්‍යෙෂාමොහොපමාස්මෘතා.

තන්වඞ්ගී, පිඹත්වූ කෘශාඞ්ගිය; ත්වන්මුඛම්, තීගේ මුහුණ; ශශී ඉති, චන්ද්‍රයායයි; උපෙක්ෂ්‍ය, සලකා; ත්වන්මුඛාශයා, තීගේ මුහුණට ආශාවෙන්; ඉන්දුම්පිඅනුධාවාමි, චන්ද්‍රයා අනුව්ද ධාවනයකරමි; ඉති, මෙබඳුවූ; එෂා, මේතොමෝ; මොහොපමා, මොහොපමායි; ස්මෘතා, දන්නාලදු.

26 කිංපද්මමන්තර්භ්‍රාන්තාලිකිංතෙලොලෙක්ෂණං මුඛම්
මම දෙලායතෙචිත්ත මිතීයංසංශයොපමා.

අන්තර්භ්‍රාන්තාලි, ඇතුලත භ්‍රමණයකරන්නාවූ භෘඞ්ගයන්ඇති; පද්මම්, පද්මය; කිම්, කුමක්ද, ලොලෙක්ෂණම්, චඤ්චලවූ ඇස් ඇති; තෙමුඛම්, තීගේ මුඛය; කිම්, කුමක්ද; මම, මාගේ; චිත්තම්, සිත; දෙලායතෙ, උන්සිල්ලාවක්මෙන් ඔබමොබයේ; ඉති, මෙබඳුවූ; අයම් මේතොමෝ; සංශයොපමා, සංශයොපමා නම්වේ.

27 නපද්මස්‍යෙන්දුනිග්‍රාහ්‍යස්‍යෙන්දුලජ්ජාකරීද්‍යුතිඃ
අතස්ත්වන්මුඛමෙවෙද මිත්‍යසෞනිර්ණයොපමා.

ඉන්දුනිග්‍රාහ්‍යස්‍ය, චන්ද්‍රයා විසින් නිග්‍රහකටයුතුවූ; පද්මස්‍ය, පද්ම යට; ඉන්දුලජ්ජාකරී, චන්ද්‍රයාට ලජ්ජා කරන්නාවූ; ද්‍යුතිඃ, ශොභා වෙක්; න, නැත්තේය; අතඃ, මේ හෙතුවෙන්; ඉදම්, මෙය; ත්වන්මු ඛම්එවඉති, තීගේ මුඛයමැයි යන; අසෞ, මේතොමෝ; නිර්ණයො පමා, නිර්ණයොපමා නම්වන්නේය; මෙහි හෙතුදැක්මෙන් ශංසයදුරලා නිශ්චයාවගතබැව් ප්‍රකාශකිරීමෙන් මේ නිර්ණයොපමානම්විය.

28 ශිශිරාංශුප්‍රතිස්පර්ධී ශ්‍රීමත්සුරභිගන්ධිච
අම්භොජමිවතෙවක්ත්‍ර මිතිශ්ලෙෂොපමාස්මෘතා

ශිශිරාංශු, චන්ද්‍රයාහට; ප්‍රතිස්පර්ධී, විරොධිවූ; ශ්‍රීමත්, ශ්‍රීදෙවතාව ඇති; සුරභිගන්ධිච, මනොඥවූ ගන්ධඇති; මේ පද්මපක්ෂයෙහියි, වක්ත්‍ර පක්ෂයෙහි; ශිශිරාංශු, චන්ද්‍රයාහට; ප්‍රතිස්පර්ධී, ස්පර්ධාකරන්නාවූ; ශ්‍රී මත්, ශොභාඇති; සුරභිගන්ධිච, සුගන්ධඇති; තෙවක්ත්‍රම්, තීගේ වක්ත්‍රය; අම්භොජම්ඉව, පද්මයක්මෙන්; ඉති, මෙබඳුවූවා; ශ්ලෙෂො පමාස්මෘතා, ශ්ලෙෂොපමානමැයි දන්නාලදු.

මෙහි යෙදූ විශෙෂණත්‍රයම උභයපක්ෂයට සාධාරණහෙයින් ශ්ලෙෂොපමායයි කියත්.

29 සරූපශබ්දවාච්‍යත්වාත් සාසමානොපමායථා
බාලෙවොද්‍යානමාලෙය සාලකානනශොභිනී.

සරූපශබ්දවාච්‍යත්වාත්, සමානරූපවූ ශබ්දයන්ගේ; වාච්‍යත්වයෙන්; සා, ප්‍රසිද්ධවූ ඕතොමෝ; සමානොපමා, සමානොපමා නම්වේ; යථා, ඒ මෙසේය; ඉයම් උද්‍යානමාලා, මේ උද්‍යානමාලා තොමෝ; බාලාඉව, බාලස්ත්‍රීයකමෙන්; සාලකානන, සල්වනයෙන්; දෙහෝ, නොහොත්; කියඹුවැල්සහිතවූ මුඛයෙන්; ශොභිනී, හොබනීය.

30 පද්මම්බහුරජශ්චන්ද්‍රඃ ක්ෂයීතාභ්‍යාංතවානනම්
සමානමපිසොත්සෙක මිතිනින්දොපමාස්මෘතා.

පද්මම්, පද්මය; බහුරජඃ, බොහෝවූ රේණුසංඛ්‍යාත රජස් ඇත්තේය; නොහොත් රජෝගුණ බහුලය; චන්ද්‍රඃ, චන්ද්‍රතෙමේ; ක්ෂයී, ක්ෂයවන සුලුය; නොහොත් ක්ෂයරොගඇත්තේය; තවානනම්, තීගේ මුඛය; තාභ්‍යාම්, ඔවුන් හා; සමානමපි, සාධර්ම්‍යයෙන් සමානවූවද; සොත්සෙකම්; අතිශයොත්කර්ෂශාලිය; ඉති, මෙබඳුවූවා; නින්දොපමා නින්දෝපමායයි; ස්මෘතා, දන්නාලදී.

31 බ්‍රහ්මණොප්‍යුද්භවඃ පද්මශ්චන්ද්‍රඃ ශම්භුශිරොධෘතඃ
තෞතුල්‍යෞත්වන්මුඛෙනෙතිසාප්‍රශංසොපමොච්‍යතෙ.

පද්මඃ, පද්මය; බ්‍රහ්මණොපි, බ්‍රහ්මයාගේද; උද්භවඃ, උත්පත්ති ස්ථානයි; විෂ්ණුහුගේ නාභිපද්මයෙන් සඤ්ජාතහෙයින් මෙසේ කියත්; චන්ද්‍රඃ, චන්ද්‍රයා; ශම්භු, මෙහෙසුරු විසින්; ශිරොධෘතඃ, හිසින් උසුලනලද්දේය; තෞ, ඔහු දෙදෙන; ත්වත්, තීගේ; මුඛෙන, මුහුණහා; තුල්‍යෞඉති, තුල්‍යහයන; සා, ඒ උපමාතොමෝ; ප්‍රශංසොපමා, ප්‍රශංසොපමායී; උච්‍යතෙ, කියනු ලැබේ.

32 චන්ද්‍රෙණත්වන්මුඛංතුල්‍ය මිත්‍යාචිඛ්‍යාසුමෙමනඃ
සගුණොවාස්තු දොෂොවෙත්‍යාචිඛ්‍යාසොපමාංවිදුඃ.

ත්වත්, තීගේ; මුඛම්, මුහුණ; චන්ද්‍රෙණ, චන්ද්‍රයා හා; තුල්‍යම් ඉති, තුල්‍යයයි; මෙමනඃ, මාගේ සිත; ආචිඛ්‍යාසු, කියටිවෙයි; සඃ, එය; ගුණොවාඅස්තු, ගුණයක්හෝ වේවා; දොෂඃවා, දොෂයෙක් හෝ වේවා; ඉති, මෙබඳුවූවා; ආචිඛ්‍යාසොපමාං, ආචිඛ්‍යාසොපමායයි; විදුඃ, දනිති.

33 ශතපත්‍රංශරච්චන්ද්‍රඃ ත්වදානනමිතිත්‍රයම්
පරස්පරවිරොධීති සා විරොධොපමාමතා.

ශතපත්‍රම්, පද්මය; ශරච්චන්ද්‍රඃ, ශරත්චන්ද්‍රයාය, ත්වදානනම් ඉති, තීගේ මුඛය යන; ත්‍රයම්, තුන; පරස්පරවිරොධීඉති, අන්‍යොන්‍ය විරුද්ධය යන; සා, ඒ උපමාතොමෝ; විරොධොපමා විරොධොපමායයි; මතා, දන්නාලදී.

34 නජාතු ශක්තිරින්දෝස්තෙ මුඛෙන ප්‍රතිගර්ජිතුම්
කලඞ්කිනොජඩස්‍යෙති ප්‍රතිෂෙධොපමෙවසා.

කලඞ්කිනඃ, කැලැල්ඇති; ජඩස්‍ය, ජඩවූ; හෙවත් ශීතලවූ; ඉන්දොඃ, චන්ද්‍රයාට; තෙමුඛෙන, තීගේ මුහුණහා; ප්‍රතිගර්ජිතුම්, ප්‍රතිගර්ජනාකරන්ට; හෙවත් සමානවන්ට; ජාතු, කිසිකලෙකත්; ශක්තිඃ නඉති, ශක්තියක් නැත්තේය යන; සා, ප්‍රසිද්ධවූ; උපමාතොමෝ; ප්‍රත්ෂෙධොපමා, ප්‍රතිෂෙධොපමා නම්වේ.

35 මෘගෙක්ෂණාඞ්කං තෙවක්ත්‍රං මෘගෙණෛවාඞ්කිතඃ ශශී
තථාපිසමඑවාසෞ නොත්කර්ෂීති චටූපමා.

තෙවක්ත්‍රම්, තීගේමුඛය; මෘගෙක්ෂණාඞ්කම්, මෘගයාගේ අවයව විශෙෂයක්වූ නෙත්‍රයෙන් ලකුණුකරණලද්දේය; ශශී, චන්ද්‍රතෙම, මෘගෙණෛව, සම්පූර්ණ මෘගශරීරයෙන්ම; අඞ්කිතඃ, ලකුණුකරණලද්දේය; තථාපි, එසේවුවද; සමඃඑව, සමමැයි; ආහ්ලාදජනකත්වය සදෘශයනුභාවයි; නොත්කර්ෂී, අතිශයොත්කර්ෂී ඇත්තේනොවෙයි; අසෞ, මේතොමෝ; චටූපමා, චටූපමානම්වේ; මෙහි උත්කර්ෂහෙතු ඇතද ඒ නැතැයි කීහෙයින් විශෙෂොක්ති ගර්භයි.

36 නපද්මං මුඛමෙවෙදං නභෘඞ්ගෞචක්ෂුෂී ඉමෙ,
ඉතිවිස්පෂ්ටසාදෘශ්‍යාත්තත්වාඛ්‍යානොපමෙවසා.

ඉදම්, මෙය; නපද්මම්, පද්මයනොවේ; මුඛම්එව, මුඛයමැයි; ඉමෙ, මොහුදෙදෙන; නභෘඞ්ගෞ, භෘඞ්ගයන්දෙදෙනෙක් නොවෙති, චක්ෂුෂී, නෙත්‍රවයකි; ඉති, මෙසේ; විස්පෂ්ටසාදෘශ්‍යාත්, සුව්‍යක්තවූ සදෘශබවඇතිහෙයින්: සා, ඒ උපමාතොමෝ; තත්වාඛ්‍යානොපමා, තත්වාඛ්‍යානොපමානම්වේ.

37 චන්ද්‍රාරවින්දයොඃ කාන්තිමතික්‍රම්‍යමුඛං තව,
ආත්මනෛවාභවත්තුල්‍ය මිත්‍යසාධාරණො පමා.

තව, තීගේ; මුඛම්, මුහුණ, චන්ද්‍රාරවින්දයොඃ, චන්ද්‍රපද්මදෙදෙනාගේ; කාන්තිම්, ශොභාව; අතික්‍රම්‍ය, ඉක්මවා, ආත්මනාඑව; තමාහාම; තුල්‍යම්අභවත්, සදෘශවූයේය; ඉති, මෙබඳුවූවා; අසාධාරණොපමා, අසාධාරණො පමා නම්වෙයි.

38 සර්වපද්මප්‍රභාසාරඃ සමාහෘත ඉවක්වචිත්,
ත්වදානනං විභාතීති තාමභූතො පමාංවිදුඃ.

ක්වචිත්, කිසිතැනක; සර්වපද්මප්‍රභාසාරඃ, සියලු පද්මයන්ගේ ප්‍රභාසාරය; සමාහෘතඃඉව; කැටිකරණ ලද්දක්මෙන්; ත්වදානනම්, තීගේමුහුණ; විභාතිඉති, බබලන්නේය යන; තාම්, ඒ උපමාව; අභූතොපමාම්, අභූතොපමායයි, විදුඃ, දනිති.

39 චන්ද්‍රබිම්බාදිවවිෂං චන්දනාදිව පාවකඃ,
පරුෂාවාගිතොවක්ත්‍රා දිත්‍යසම්භාවිතොපමා.

චන්ද්‍රබිම්බාත්, චන්ද්‍රබිම්බයෙන්; විෂම්ඉව, විෂයක්මෙන්ද; චන්ද්‍රාත්, සඳුනින්; පවකඃඉව, ගින්නක්මෙන්ද; ඉතොවක්ත්‍රාත්, මේ මුඛයෙන්; පරුෂාවාක්, පරුෂවචනය; නිෂ්ක්‍රාන්තාවුයේය; ඉති, මෙබඳුවූවා; අසම්භාවිතොපමා, අසම්භාවිතොපමානම්වේ; මෙහි උපමාවස්තූන්ගෙන්; විෂාගනි නිඃසරණයමෙන් උපමාවස්තුයෙන්ද පරුෂවාගනිඃසරණය අසම්භාවිතහෙයින් මේ අසම්භාවිතොපමායි.

40 චන්දනොදක චන්ද්‍රාංශු චන්ද්‍රකාන්තාදිශීතලඃ,
සපර්ශතාවෙත්‍යතිශයං බොධයන්ති බහූපමා.

තව, තිගේ; සපර්ශඃ, සපර්ශය; චන්දන, සඳුනක්මෙන්ද; උදක, දියමෙන්ද; චන්ද්‍රාංශු, සඳරැස්මෙන්ද; චන්ද්‍රකාන්තාදි, චන්ද්‍රකාන්ත පාෂාණාදියක්මෙන්ද; ශීතලඃ, ශීතලය; මෙහි ආදිශබ්දයෙන් එවංවිධවූවස්තූන්ගේ ග්‍රහණයයි; ඉති, මෙබඳුවූ; අතිශයම් බොධයන්තී, අතිශයවෛචිත්‍ර්‍යය අවබොධකරන්නී, බහූපමා, බහූපමානම.

41 චන්ද්‍රබිම්බාදිවොත්කීර්ණං පද්මගර්භාදිවොද්ධෘතම්
තවතන්වඞ්ගිවදන මිත්‍යසෞවික්‍රියොපමා.

තන්වඞ්ගි, එම්බාකෘශාඞ්ගිය; තව, තීගේ; වදනම්, මුහුණ; චන්ද්‍රබිම්බාත් චන්ද්‍රබිම්බයෙන්; උත්කීර්ණම් ඉව, නගාගන්නා ලද්දක් වැන්න; පද්මගර්භාත්, පියුම්ගැබකින්; උද්ධෘතම්ඉව, උද්ධරණය කරණ ලද්දක්වැන්න; ඉති, මෙබඳුවූ; අසෞ, මේ උපමාතොමෝ; වික්‍රියොපමා, වික්‍රියොපමානම්වේ; චන්ද්‍රබිම්බපද්ම ගර්භයෝ ප්‍රකෘතීහුයි මෙහි ප්‍රස්තුතවූ මුඛය එයින් උත්කීර්ණඋද්ධෘතත්වය ප්‍රකාශකිරීමෙන් විකෘතිත්වය ප්‍රතිපාදිතයි; එහෙයින් මේ වික්‍රියොපමානම්වියයි දතයුතුයි.

42 පූෂණ්‍යාතපඉවාහනීව පූෂාව්‍යොම්නිවාසරඃ
වික්‍රමස්ත්වය්‍යධාල්ලක්ෂ්මීමිතිමාලොපමාමතා

පූෂණි, සූර්‍ය්‍යයාකෙරෙහි; ආතපඃඉව, අව්වමෙන්ද; අහනි, දහවල්හි; පූෂාඉව, සූර්‍ය්‍යාමෙන්ද; ව්‍යොම්නි ආකාශයෙහි; වාසරඃඉව, දිනයමෙන්ද; ත්වයි, තා කෙරෙහි; වික්‍රමඃ, වික්‍රමය; ලක්ෂ්මීම්, ශ්‍රිය; අධාත්, පිහිටවී; ඉති, මෙබඳුවූවා; මාලොපමා, මාලොපමානම්. මෙසේ පළමුවන උපමාව දෙවෙනි උපමාව හාද දෙවෙනි උපමාව තුන්වෙනි උපමාවහාද තුන්වෙනි උපමාව සතරවැන්නහාද මාලාවක් සේ ගැළපීම හෙතුකොටගෙණ මේ මාලොපමානම්විය.

43 වාක්‍යාර්ථෙනෛවවාක්‍යාර්ථඃ කොපියද්‍යුපමීයතෙ
එකානෙකෙව ශබ්දත්වාත්සාවාක්‍යාර්ථොපමාද්විධා.

කොපිවාක්‍යාර්ථඃ, කිසි වාක්‍යාර්ථයක්; වාක්‍යාර්ථෙනඑව, වාක්‍යාර්ථය කින්ම; අනුමීයතෙ, අනුමනකරනු ලැබේද; සා, ඕතොමෝ; වාක්‍යාර්ථොපමා, වාක්‍යාර්ථොපමානම; එකානෙකෙවශබ්දත්වාත්, එක අනෙකඉව ශබ්දයන්ගේ අස්තිත්වයෙන්; ද්විධා, දෙවැදෑරුම්වේ.

44 ත්වදානනමධීරාක්‍ෂ මාවිර්දශනදීධිති
භ්‍රමත්භෘඞ්ගමිවාලක්‍ෂ්‍ය කෙශරංභාතිපඞ්කජම්

අධීරාක්‍ෂං, චංචලවූනෙත්‍රඇති; ආවිර්දශනදීධිති, පහළවූ දන්තමරිචි ඇති; ත්වදානනම්, තීගේ මුඛය; භ්‍රමත්, බමන්නාවූ; භෘඞ්ගම්, භෘඞ්ග යන් ඇති; ආලක්‍ෂ්‍ය, මදක් දක්කයුතුවූ; කෙශරම්, කෙසුරුඇති; පඞ්කජම්ඉව, පද්මයක්මෙන්; භාති, බබලයි; මේඑක ඉව් ශබ්ද සම්බන්ධයට උදාහරණයි. මෙහි පූර්වාර්ධවාක්‍යය, එකඉව ශබ්දයකින් ඝටිතවූ අපරාර්ධ වාක්‍යයෙන් අනුමිතයි.

45 නලින්‍යාඉවතන්වඞ්ග්‍යා ස්තස්‍යාඃ පද්මමිවානනම්
මයාමධුව්‍රතෙනෙව පායංපායමරම්‍යත

නලින්‍යාඃඉව, පද්මිනියක් බඳුවූ; තස්‍යාඃ තන්වඞ්ග්‍යාඃ, ඒ තුනු වඟගේ; පද්මමිව, පද්මයක් බඳුවූ; ආනනම්, මුඛය; මධුව්‍රතෙනඉව, භෘඞ්ගයකු වැනිවූ; මයා, මා විසින්; පායංපායම්, බිබී; අරම්‍යත, රමනය කරණලද්දේය; මෙහි නලින්‍යාඃ පද්මමිව යන වාක්‍යයෙන් තන්වඞ්ග්‍යාඃආනනමිව යන අනික් වාක්‍යාර්ථයක් උපමිතහෙයින්ද ඉවශබ්ද කිහිපයකින් ඝටිතහෙයින්ද මේ නොයෙක් ඉවශබ්දඇති වාක්‍යාර්ථෝපමායි දතයුතුයි.

46 වස්තුකිඤ්චිදුපන්‍යස්‍ය න්‍යසනාත්තත්සධර්මණඃ
සාම්‍යප්‍රතීතිරස්තීති ප්‍රතිවස්තූපමායථා

කිඤ්චිත්වස්තු, කිසිවස්තුවක්; උපන්‍යස්‍ය, උපන්‍යාසකොට; තත්සධර්මණඃ, ඊට සමාන වස්තුවක්හුගේ; න්‍යසනාත්, උපාදානය කිරීමෙන්; සාම්‍යප්‍රතීතිඃ, සාදෘශ්‍යාවබොධයක්; අස්ති, ඇත්තේනම්; ඉති, මෙබඳුවූවා; ප්‍රතිවස්තූපමා, ප්‍රතිවස්තූපමානම; යථා, ඊට උදාහරණ මෙසේයි.

47 නෛකොපිත්වාදෘශොද්‍යාපි ජායමානෙෂුරාජසු
නනුද්විතීයො නාස්ත්‍යෙව පාරිජාතස්‍යපාදපඃ.

ජායමානෙෂු, උපදිනු ලබන්නාවූ; රාජසු, රජුන් අතුරෙහි; අද්‍යාපි, අද දක්වාත්; ත්වාදෘශඃ, ඔබබඳුවූ; එකඃඅපි, එක් රජෙකුදු; න, නැත්තේය; ඒ එසේමැයි; පාරිජාතස්‍ය, පාරිජාත වෘක්‍ෂයට; ද්විතීයඃ, දෙවෙනිවූ; පාදපඃ වෘක්‍ෂයෙක් නනුඅස්ත්‍යෙව, නැත්තේම නොවේද?

48 අධිකෙනසමීකෘත්‍ය හීනමෙකක්‍රියාවිධෞ
යද්බ්‍රුවන්ති ස්මෘතාසෙයං තුල්‍යයොගොපමායථා.

එකක්‍රියාවිධෞ, එකජාතීය ක්‍රියාවිධානයෙක්හි; හීනම්, හීනයකු; අධිකෙන, අධිකයකු හා; සමීකෘත්‍ය, සමකොට; යත්, යම්වෛචිත්‍ර්‍යකථනයකලා; බ්‍රුවන්ති, කියත්ද; සාඉයම්, එමේ උපමාතොමෝ; තුල්‍යයොගොපමා, තුල්‍යයොගොපමානම; යථා, ඊට උදාහරණ මෙසේයි.

49 දිවොජාගර්ති රක්‍ෂායෛ පුලොමාරිහිවාන්භුවඃ
අසුරාස්තෙන හන්‍යන්තෙ සාවලෙපාස්ත්වයා නෘපාඃ.

පුලොමාරිඃ, ශක්‍රතෙම; දිවඃ, ස්වර්ගයාගේ රක්‍ෂායෛ, ආරක්‍ෂාව පිණිස; ජාගර්ති, ජාගරණයකෙරේ; භවාන්, පින්වත්තෙමේ; භුවඃ, පෘථිවියගේ; රක්‍ෂායෛජාගර්තියි සම්බන්ධයි; තෙන, ඒ ශක්‍රයා විසින්; අසුරාඃ, අසුරයෝ; හන්‍යන්තෙ, නසනු ලැබෙති; ත්වයා, තා විසින්; සාවලෙපාඃ, දර්පසහිතවූ; නෘපාඃ, නරේන්ද්‍රයෝ; හන්‍යන්තෙ, නසනුලැබෙත්.

50 කාන්ත්‍යාචන්ද්‍රමසංධාම්නා සූර්‍ය්‍යංධෛර්‍ය්‍යෙණචාර්ණවම්
රාජන්නනුකරොෂීති සෛෂාහෙතූපමාමතා.

රාජන්, මහරජ; (ත්වම්, නුඹ); කාන්ත්‍යා, කාන්තියෙන්; චන්ද්‍රම සම්, චන්ද්‍රයාටද; ධාම්නා, රශ්මියෙන්; සූර්‍ය්‍යම්, සූර්‍ය්‍යයාටද; ධෛ ර්‍ය්‍යෙණ, ධෛර්‍ය්‍යයෙන්; අර්ණවම්, සාගරයටද; අනුකරොෂි, සදෘශව ක්‍රියාකරන්නෙහිය යන; සා එෂා, එමේ උපමාතොමෝ; හෙතූපමා හෙතූපමායයි; මතා, දන්නාලදු. මෙහි රජහුගේ චන්ද්‍රාදීන් හා සදෘශබව කාන්ත්‍යාදිය හෙතුකොටගෙණවූයේනුයි. මෙය හෙතූපමා නම්විය.

51 නලිඞ්ගවචනෙභින්නෙ නහීනාධිකතාපිවා
උපමාදූෂණායාලං යත්‍රොද්වෙගොනධීමතාම්.

යත්‍ර, යම්තැනෙක්හි; ධීමතාම්, පණ්ඩිතයන්ට; උද්වේගඃ, කල කිරීමක්; න, නොවේද; එබදුතන්හි; භින්නෙ, භින්නවූ; ලිඞ්ගවච නෙ, ලිඞ්ගවචන යනදෙක, හෙවත් ස්ත්‍රීලිඞ්ගාදි ලිඞ්ගයද; එකවච නාදි වචනයද; උපමාදූෂණාය, උපමාදූෂණය පිණිස; නාලම්, සමර්ථ නොවේ; හීනාධිකතාපිවා, පදයන්ගේ හීනාධිකබව හෝ උපමාදූෂ ණායනාලම්යි සම්බන්ධයි.

52 ස්ත්‍රීවගච්ඡතිෂණ්ඩොයං වක්ත්‍යෙෂාස්ත්‍රීපුමානිව
ප්‍රාණාඉවප්‍රියොයංමෙ විද්‍යාධනමිවාර්ජිතා.

අයම්ෂණ්ඩඃ, මේ නපුංසකතෙම; ස්ත්‍රීව, ස්ත්‍රියකුමෙන්; ගච්ඡති, යේ; එෂාස්ත්‍රී, මේ ස්ත්‍රීතොමෝ; පුමාන්ඉව, පුරුෂයකුමෙන්; වක්ති, කියයි; මෙ, මට; අයම්, මේතෙමේ; ප්‍රාණාඃ, ඉව, ප්‍රාණයන්මෙන්; ප්‍රියඃ, ප්‍රියය.

53 භවානිවමහිපාල දෙවරාජො විරාජතෙ,
අලමංශුමතඃකක්‍ෂා මාරොඪුංතෙජසානෘපඃ.

මහිපාල, පෘථිවීපාලය; දෙවරාජඃ, ශක්‍රතෙම; භවාන්ඉව, පින් වත්හුමෙන්; විරාජතෙ, බබලයි; නෘපඃ, රජතෙමේ; තෙජසා, තෙ ජස්කරණකොටගෙණ; අංශුමතඃකක්‍ෂාම්, සූර්‍ය්‍යයාගේකක්‍ෂයට; ආරො ඪුම්, නැගෙන්ට; අලම්, සමර්ථයි; මෙහි උපමානවූ රජහු මනුෂ්‍යයකු

බැවින් උපමෙයවූ ශක්‍රාපෙක්‍ෂායෙන් රජහුගේ හීනත්‍වය ස්වභාව සිඬයි; එසේවූවද රජහු ලොකපාලාංශ සම්භූත හෙයින් අත්‍යන්ත යෙන් විරුඬවනු පදවයි; එහෙයින්මෙය දෙෂාවහනොවේ. අපරාඞී යෙහිද භාවය මේ නයින්ම සැලකිය යුතුයි.

54 * ඉත්‍යෙවමාදිසෞභාග්‍යං නජහාත්‍යෙවජාතුචිත්
අසෞන්‍යවඬචි ද්‍රුදෙවගඃ ප්‍රයොගෙවාගවිදංයථා.

ඉත්‍යෙවමාදි, මේ ආදිය; ජාතුචිත්, කිසිකලෙකත්; සෞභාග්‍යම්, සුභගබව; නජහාතිඑව, නොහරිමිය; ඍචිත් ප්‍රයොගෙ, කිසිප්‍රයොග යෙක්හි; වාග්විදම්, ශාස්ත්‍රඥයන්ට; උද්වෙගඃ, කල්කිරීම; අසනිඑව, ඇත්මැයි; යථා, ඊට උදාහරණමෙසේයි.

55 හංසීවධවලශ්චන්ද්‍රඃ සරාංසිවාමලංනභඃ,
භත්‍රීභක්තොභවඃසෙවව්බ්දෙ‍්‍යාතො භානිභානුවත්.

චන්ද්‍රඃ, චන්ද්‍රයා; හංසීව, හංසියකමෙන්; ධවලඃ, ශ්වෙතවර්ණය; නභඃ, ආකාශය; සරාංසිඉව, විල්මෙන්; අමලම්, නිර්මලය; භවඃ, භව තෙමේ; ස්වාඉව, සුනඛයකුමෙන්; භත්‍රීභක්තඃ, ස්වාමි භක්තය; ඛද්‍යොතඃ, කණමැදිරිතෙමේ; භානුවත්, හිරුමෙන්; භාති, හොබී.

56 ඊදෘශංවර්‍ජ්‍යතෙසද්භිඃ කාරණංතත්‍රචින්ත්‍යතාම්
ගුණදොෂවිචාරාය ස්වයමෙවමණීෂිභිඃ.

සද්භිඃ, සුධීන් විසින්; ඊදෘශම්, මෙබඳු කාව්‍යය; වර්ජ්‍යතෙ, දුරු කරනු ලැබේ; ආදරකරනු නොලැබෙයිසේයි. මණීෂිභිඃ, පණ්ඩිත යන් විසින්; ස්වයමෙව, තෙමේම; තත්‍ර, ඒ වර්ජනයෙහි; කාරණම්, කාරණය; ගුණදොෂ විචාරාය, ගුණදොෂවිචාරණය පිණිස; චින්ත්‍ය තාම්, සිතනු ලැබේවා.

57 ඉවවද්වායථාශබ්දාඃ සමානනිභසන්නිභාඃ
තුල්‍යසංකාශනීකාශ ප්‍රකාශප්‍රතිරූපකාඃ.

ඉවවද්වායථාශබ්දාඃ, ඉවය, වත්ය, වාය, යථාය යන ශබ්දයෝය; සමානනිභසන්නිභාඃ, සමානය, නිභය, සන්නිභය යන ශබ්දයෝය; තුල්‍යසංකාශනීකාශ ප්‍රකාශප්‍රතිරූපකාඃ, තුල්‍යය, සංකාශය, නීකාශය, ප්‍රකාශය, ප්‍රතිරූපකය, යන ශබ්දයෝය. නිභශබ්දාදිහු කිසි කෙ නෙක් සමාසමධ්‍යගතවූවාහුම ප්‍රයොගකරති.

58 ප්‍රතිපක්ෂප්‍රතිවන්ද්‍රි ප්‍රත්‍යනීකවිරොධිනඃ
සදෘක් සදෘශසංවාදිසජාතීයානුවාදිනඃ.

ප්‍රතිපක්ෂ, ප්‍රතිපක්ෂය; ප්‍රතිවන්ද්‍රි, ප්‍රතිවන්ද්‍රීය; ප්‍රත්‍යනීක, ප්‍රත්‍යනී කය; විරොධිනඃ, විරොධීය යන ශබ්දයෝද; සදෘක්, සදෘක්ය; සදෘශ, සදෘශය; සංවාදි, සංවාදිය; සජාතීය, සජාතියය; අනුවාදිනඃ, අනුවා දීය යන ශබ්දයෝද.

* ඉත්‍යෙවමාදෞ යනු කලිකාතා පාඨයි.

59 ප්‍රතිබිම්බප්‍රතිච්ඡන්ද සරූපසමසම්මිතාඃ
සලක්ෂණසදෘක්ෂාභසපක්ෂෝපමිතෝපමාඃ.

ප්‍රතිබිම්බ, ප්‍රතිබිම්බය; ප්‍රතිච්ඡන්ද, ප්‍රතිච්ඡන්දය; සරූප, සරූපය; සම, සමය; සම්මිත, සම්මිතය යන ශබ්දයෝය; සලක්ෂණ, සලක්ෂණය; සදෘක්ෂ, සදෘක්ෂය; ආභ, ආභය; සපක්ෂ, සපක්ෂය; උපමිත, උපමිතය; උපමාඃ, උපමාය යන ශබ්දයෝද.

60 කල්පදෙශියදෙශ්‍යාදි ප්‍රඛ්‍යාප්‍රතින්ධීඅපි
සවර්ණතුලිතෞශබ්දෞ යෙචාන්‍යූනාර්ථවාදිනඃ.

කල්පදෙශියදෙශ්‍යාදි ප්‍රඛ්‍යාප්‍රතිනිධීඅපි, කල්පය, දෙශීයය, දෙශ්‍යාදිය, ප්‍රඛ්‍යාය, ප්‍රතිනිධිය යන ශබ්දයෝද; සවර්ණතුලිතෞ, සවර්ණතුලිත යන; ශබ්දෞ, ශබ්දදෙකද; යෙචාන්‍යූනාර්ථවාදිනඃ, අහිනාර්ථවාදී යම් ශබ්දකෙනෙක් වෙත්ද ඒ ශබ්දයෝද.

61 සමාසශ්චබහුව්‍රීහිඃ ශශාඞ්කවදනාදිෂු
සපර්ධතෙජයතිවෙෂ්ටි දෘහ්‍යතිප්‍රතිගර්ජති

ශශාඞ්කවදනාදිෂු, ශශාඞ්කවදන ශබ්දාදියෙහිවූ; බහුව්‍රීහිඃසමාසඃ, බහුව්‍රීහිසමාසයද; පුරුෂව්‍යාඝ්‍ර ශබ්දාදියෙහිවූ කර්මධාරසමාසයද මිට උපලක්ෂකයි; සපර්ධතෙ, සපර්ධාකරයි; ජයති, දිනයි; වෙෂ්ටි, වෙෂකරයි; දෘහ්‍යති, ද්‍රොහකරයි; ප්‍රතිගර්ජති, ප්‍රතිගර්ජනාකරයි යනමේද.

62 ආක්‍රොශත්‍යවජානාති කදර්ථයතිනින්දති
විඩම්බයතිසන්ධත්තෙ හසතීර්ෂ්‍යත්‍යසූයති.

ආක්‍රොශති, ආක්‍රොශකරයි; අවජානාති, අවමන්කරයි; කදර්ථයති, ගරහයි; නින්දති, නින්දකරයි; විඩම්බයති, විඩම්බනාකරයි; සන්ධත්තෙ, සන්ධාරණයකරයි; හසති, සිනාසෙයි; ඊර්ෂ්‍යති, ඊර්ෂ්‍යාකරයි; අසූයති, නොඉවසයි යනමේද.

63 තස්‍යමුෂ්ණාතිසෞභාග්‍යං තස්‍යකාන්තිං විලුම්පති,
තෙනසාර්ධං විගෘහ්ණාති තුලාං තෙනාධිරොහති.

තස්‍ය, ඔහුගේ; සෞභාග්‍යම්, සුභගබව; මුෂ්ණාති, සොරකම් කරයි; තස්‍ය, ඔහුගේ; කාන්තිම්, කාන්තිය; විලුම්පති, විලුම්පනය කෙරේ; තෙනසාර්ධම්, ඔහුහා; විගෘහ්ණාති, කලහකරයි; තෙන, ඔහු සමඟ; තුලාම්, තුලාවට; අධිරොහති, නගියි.

64 තත්පදව්‍යාපදංධත්තෙ තස්‍යකක්ෂාං විගාහතෙ,
තමන්වෙත්‍යනුබධ්නාති තච්ඡීලංතන්නිෂෙධතෙ.

තත්පදව්‍යාම්, ඔහුගේ පදවියෙහි; පදම්, පාදය; ධත්තෙ, පිහිටුවයි; තස්‍ය, ඔහුගේ; කක්ෂාම්, කක්ෂයට; විගාහතෙ, පැමිණේ; තම් අන්වෙති, ඔහු අනුවයයි; තච්ඡීලම්, ඔහුගේ ස්වභාව; අනුබධ්නාති, ලුහුබඳී, තන්නිෂෙධතෙ, ඔහුවළකයි; යනමේද.

65 තස්‍යචානුකරොතීති ශබ්දඃසාදෘශ්‍යසූචකාඃ
උපමායාම්මෙප්‍රොක්තා කවීනාංබුද්ධිසෞඛ්‍යදාඃ.

තස්‍ය, ඕහට; අනුකරොති, අනුකරයි ඉති, මේ; ශබ්දාඃ, ශබ්දයෝ; සාදෘශ්‍ය සූචකාඃ, සදෘශබව සූචනයකරන්; කවීනාම්, කවීන්ගේ බුද්ධිසෞඛ්‍යදාඃ බුද්ධිසුඛදායකවූ; ඉමෙ, මේ ශබ්දයෝ උපමායාම්, උපමාවෙහිලා; ප්‍රොක්තාඃ, කියනලද්දූහුය.

57 වෙනි ශ්ලොකයෙහි වා ශබ්දය ච ශබ්දයට උපලක්‍ෂණවේ, කුමක්හෙයින්ද ච ශබ්දයත් උපමාවාචකහෙයිනි, මෙහි ඉවාදිහු වාචකවෙති, සපක්‍ෂතෙ යන පදය පටන් අසූයති යන පදය දක්වා ඇති පදයෝ උපමාලක්‍ෂකවෙති, මුෂ්ණාති යන පදය පටන් නිෂෙධතෙ යන පදය දක්වා ඇති පදයෝ උපමාව්‍යඤ්ජකහයි දතයුතුයි.

**මේ උපමාචක්‍රයයි.**

---

66 උපමෛවතිරොභූත භෙදාරූපකමුච්‍යතෙ
යථාබාහුලතාපාණි පද්මංචරණපල්ලවඃ.

තිරොභූතභෙදා, අන්තර්භූතවූ භෙදඇති; උපමාඑව, උපමාවම; රූපකම්, රූපකයයි; උච්‍යතෙ, කියනුලැබේ; යථා, ඒ මෙසේයි; බාහුලතා පාණිපද්මම්, චරණපල්ලවඃ යනුවේ; බාහුලතා, භුජනමැති ලතාවයි; පාණිපද්මම්, හස්තතලනැමති පද්මයි; චරණපල්ලවඃ, පාද නැමතිපල්ලවයි; උපමා උපමෙය දෙදෙනාගේ අභෙදප්‍රතිපත්තිපූර්වකවූ සදෘශබව රූපකයවේ, උපමාලඞ්කාරයෙහි වනාහි අභෙද ප්‍රතීතියක් නැත.

67 අඞ්ගුල්‍යඃ පල්ලවාන්‍යාසන්කුසුමානිනඛාර්චිෂඃ
බාහුලතෙ වසන්තශ්‍රීස්ත්වංනඃ ප්‍රත්‍යක්‍ෂචාරිණී.

අඞ්ගුල්‍යඃ, අඞ්ගුලීහු; පල්ලවානිආසන්, පල්ලවවූහ; කුසුමානි, කුසුමයෝ නඛාර්චිෂඃ, නඛරශ්මිහුවූහ; බාහූ, භුජවය; ලතෙ ලතාව යක්වූයේය; ත්වම්, තී; නඃ, අපට; ප්‍රත්‍යක්‍ෂචාරිණී, ප්‍රත්‍යක්‍ෂචාරීවූ; වසන්තශ්‍රීඃ, වසන්තකාලිකශොභායි; මෙහි ලිඞ්ගභෙදක පදයන් ගේ ප්‍රයොගයෙන් රූපකයෙහිලා ලිඞ්ගභෙදය දොෂාවහ නොවෙයි දතයුතුයි.

68 ඉත්‍යෙතදසමස්තාඛ්‍යං සමස්තං පූර්වරූපකම්.
ස්මිතං මුඛෙන්දොර්ජ්‍යොත්ස්නෙති සමස්තව්‍යස්තරූපකම්.

ඉති, මෙබඳුවූ; එතත්, මෙය; අසමස්තාඛ්‍යම්, අසමස්තරූපක නම; පූර්වරූපකම්, පූර්වයෙහි කී බාහුලතා යනාදිරූපකය; සමස්තම්, සමස්ත රූපකනම; මුඛෙන්දොඃ, මුඛනැමති චන්ද්‍රයාගේ; ස්මිතම්, සිනානැමති; ජ්‍යොත්ස්නා, චන්ද්‍රරශ්මිය; ඉති, මෙබඳුවූයේ; සමස්ත ව්‍යස්තරූපකම්, සමස්ත ව්‍යස්තරූපකනම.

69 තාම්‍රාඞ්ගුලිදලශ්‍රෙණි නඛදීධිතිකෙශරම්
ධ්‍රියතෙමූර්ධ්නි භූපාලෛර්භවච්චරණ පඞ්කජම්.

තාම්‍රාඞ්ගුලි, රක්තවර්ණඅඞ්ගුලි නැමති; දලශ්‍රේණී, පත්‍රපඞ්ක්ති ඇති; නඛදීධිති, නඛරශ්මි නැමති; කේශරම්, කිඤ්ජල්කඇති; භවත් චරණපඞ්කජම්, ඔබගේ පාදනැමති පද්මය; භූපාලෛඃ, පෘථිවිපාල යන්විසින්; මූර්ධ්නි, මස්තකයෙහිලා; ධ්‍රියතෙ, දරනුලැබේ.

70 අඞ්ගුල්‍යාදෞදලාදිත්වං පාදෙචාරෝප්‍ය පද්මතාම්
තද්යෝග්‍යස්ථානවින්‍යාසාදෙතත් සකලරූපකම්.

අඞ්ගුල්‍යාදෞ, ඇඟිලි ආදියෙහි; දලාදිත්වම්, පත්‍රාදිභාවයද; පාදෙ, පාදයෙහි; පද්මතාම්, පද්මත්වයද; අරෝප්‍ය, නගා; තත්, එය; යෝග්‍යස්ථාන, යෝග්‍යවූ ස්ථානයෙහි; වින්‍යාසාත්, පිහිටුවීමෙන්; එතත්, මේ අනන්තරෝක්තපද්‍යය; සකලරූපකම්, සකල රූපකනම් වේ; මෙහි සාවයව පද්මයාගේ රූපණය කළහෙයින් සම්පූර්ණනුයි සකල රූපකනම්විය.

71 අකස්මාදෙවතෙචණ්ඩි ස්ඵුරිතාධරපල්ලවම්
මුඛංමුක්තාරුචොධත්තෙ ඝර්මාම්භඃ කණමඤ්ජරීඃ.

චණ්ඩි, අත්‍යන්තකෝප ඇතිනැනතිය; අකස්මාත්, නිකරුණෙන්; තේ, තීගේ; ස්ඵුරිත, වෙව්ලන්නාවූ; අධර පල්ලවම්, අධරෝෂ්ඨනැමති පල්ලවඇති; මුඛම්, මුහුණ; මුක්තාරුචඃ, මුක්තාඵලශෝභා ඇති; ඝර්මාම්භඃ කණමඤ්ජරීඃ, ස්වේදබිඳුත්නැමති මල්කැන්; ධත්තෙ, දරයි

72 මඤ්ජරීකෘත්‍යඝර්මාම්භඃ පල්ලවීකෘත්‍යචාධරම්
නාන්‍යථාකෘතමත්‍රාස්‍ය මතෝවයවරූපකම්.

අත්‍ර, මෙහි; ඝර්මාම්භඃ, ඝර්මජලය; මඤ්ජරීකෘත්‍ය, පුෂ්පස්තබක කොට; අධරම්, අධරය; පල්ලවීකෘත්‍ය, පල්ලවකොට; ආස්‍යම්, මුඛය; අන්‍යථා, අන්පරිද්දකින්; නකෘතම්, නොකරණලදී; අතඃ, මේ හෙතුවින්; අවයවරූපකම්, (අනන්තරෝක්තපද්‍යය) අවයවරූපකනම්වේ, මෙහි මුඛය පද්මත්වයෙන් අරෝපණයකළ යුතුනමුදු එසේනොකළ හෙයින් අවයව රූපකනම්වියයි දතයුතුයි.

73 වල්ගිතභ්‍රූගලද්ඝර්මජල මාලෝහිතෙක්ෂණම්
විවෘණොතිමදාවස්ථාමිදං වදනපඞ්කජම්.

වල්ගිත, චපලවූ; භ්‍රූ, බැමසහළක්ඇති; ගලත්, වැගිරෙන්නාවූ; ඝර්මජලම්, ස්වේදඇති; ආලෝහිත, රතුවූ; ඊක්ෂණම්, ඇස්ඇති; ඉදම් වදනපඞ්කජම්, මේ මුඛනැමති පද්මය; මදාවස්ථාම්, මදාවස්ථාව; හෙවත් මත්වූ අවස්ථාව; විවෘණොති, ප්‍රකාශකරයි.

74 අවිකෘත්‍යමුඛාඞ්ගානි මුඛමේවාරවින්දතාම්
ආසීද්ගමිතමත්‍රෙද මතෝවයවිරූපකම්.

අත්‍ර, මේ අනන්තරෝක්තපද්‍යයෙහි; මුඛාඞ්ගානි, බැමආදිවූ මුඛාඞ්ගයන්; අවිකෘත්‍ය, විකාරනොකොට; හෙවත් උපමාන්තරයකින් හෙදයකටනොපමුණුවා; මුඛමෙව, මුහුණම; අරවින්දතාම්, පද්මභාව

ගම්නම්, පමුණුවනලද්දේය; අතඃ, මේ හෙතුවින්; ඉදං, මේය (අනන්තරෝක්තපද්‍යය) අවයවිරූපකම්ආසිත්, අවයවී රූපකනම්වූයේය; මෙහි භ්‍රූආදිය පඞ්කජාඞ්ගත්වයෙන් ආරෝපණයනොකොට අවයවිවූ මුඛය පමණක් රූපණයකළහෙයින් අවයවිරූපක නම්වූයේයයි දතයුතුයි.

75 මදපාටලගණ්ඩෙන රක්තනෙත්‍රොත්පලෙනතෙ
මුඛෙන මුග්ධඃ සොප්‍යෙෂ ජනොරාගමයඃ කෘතඃ.

මද, මදයෙන්; පාටල, රක්තවර්ණවූ; ගණ්ඩෙන, ගණ්ඩඵලඇති; රක්ත, රතුවූ; නෙත්‍රොත්පලෙන, නෙතුපුල්ඇති; තෙ, තීගේ; මුඛෙන, මුහුණින්; මුග්ධඃ, මුළාවූ; සඃ එෂඃ අපිජනඃ, ඒ මේ ජනතෙමේත්; රාගමයඃ, රාගමයවූයේ; හෙවත් රාගබහුලවූයේ; කෘතඃ, කරණලදි.

76 එකාඞ්ගරූපකඤ්චෙතදෙවං ද්විප්‍රභෘතීන්‍යපි
අඞ්ගානිරූප්‍යන්තෙත්‍රයොගා යොගෞභිදාකරෞ.

එතත්, මේ අනන්තරෝක්තපද්‍යය; එකාඞ්ගරූපකම්, එකාඞ්ගරූපකනම්වේ; ද්විප්‍රභෘතීනි, දෙකආදිවූ; අඞ්ගානිඅපි, අවයවයන්ද; රූප්‍යන්ති, රූපණයකරති; අත්‍ර, මෙහි; යොගායොගෞ, රූපකත්වයෙන් යෙදීම් නොයෙදීම් දෙක; භිදාකරෞ, භෙදකරවේ, අනන්තරෝක්ත පද්‍යයෙහි එක අවයවයක්වූ නෙත්‍රය උත්පලත්වයෙන් රූපණයකළ හෙයින් එකාඞ්ග රූපකනම්විය, අවයවවයක් රූපකත්වයෙන් ආරෝපණය කෙළේනම් ඒ ද්ව්‍යඞ්ගරූපකනම්, ත්‍ර්‍යඞ්ගරූපකාදියද මෙසේමැයි දතයුතුයි.

77 ස්මිතපුෂ්පොජ්වලං ලොලනෙත්‍රභෘඞ්ගම්දං මුඛම්
ඉතිපුෂ්පද්විරෙඵාණාං සඞ්ගත්‍යායුක්තරූපකම්.

ස්මිත, සිනහනැමති; පුෂ්ප, පුෂ්පයන්; උජ්වලම්, බබලන්නාවූ; ලොල, චපලවූ; නෙත්‍රභෘඞ්ගම්, නෙත්‍රනමැති භෘඞ්ගයන්ඇති; ඉදම්, මෙය; මුඛම්, මුහුණයි; ඉති, මෙසේ; පුෂ්පද්විරෙඵාණාම්, පුෂ්පයන්ගේ හා භෘඞ්ගයන්ගේ; සඞ්ගත්‍යා, සඞ්ගතිහෙයින් හෙවත් යොග්‍යතාහෙයින්; යුක්තරූපකම්, යුක්තරූපකනම්වේ.

78 ඉදමාර්ද්‍රස්මිතජ්‍යොත්ස්නං ස්නිග්ධනෙත්‍රොත්පලං මුඛම්
ඉතිජ්‍යොත්ස්නොත්පලායොගාදයුක්තං නාමරූපකම්.

ආර්ද්‍ර, රසසහිතවූ; ස්මිත, සිනහනැමති; ජ්‍යොත්ස්නම්, සඳරැස් ඇති; ස්නිග්ධ සිනිඳුවූ; නෙත්‍රොත්පලම්, නෙත්‍රනැමති උපුල්ඇති; මුඛම්, මුහුණයි; ඉති, මෙසේ; ජ්‍යොත්ස්නොත්පල, ජ්‍යොත්ස්නාඋත්පල දෙදෙනාගේ; අයොගාත්, නොයෙදීමෙන්; අයුක්තං නාමරූපකම්, අයුක්තරූපකනම්වේ; ජ්‍යොත්ස්නාඋත්පල දෙදෙනාගේ අන්‍යොන්‍යඝටනානැතිහෙයින් මේ අයුක්තරූපකයයි දතයුතුයි.

79 රූපණාදඞ්ගිනොඞ්ගානං රූපණාරූපණාශ්‍රයාත්
රූපකංවිෂමංනාමලලිතං ජායතෙයථා.

අඞ්ගිනඃ, අවයවීහුගේ රූපණාත්, රූපණයකිරීමෙන්ද; අඞ්ගා නාම්, අවයවයන්ගේ; රූපණාරූපණාශ්‍රයාත්, රූපණ අරූපණයන් ආශ්‍රයකිරීමෙන්ද; හෙවත් කිසි අවයවයක් රූපණයකිරීමෙන්ද කිසි අවයවයක් රූපණයනොකිරීමෙන්ද; ලලිතම්, මනොඥවූ; විෂමං නාමරූපකම්, විෂමනම් රූපකය; ජායතෙ, වෙයි; යථා, ඊට උදාහරණ මෙසේයි.

80 මදරක්තකපොලෙන මනමථසාවනාමුඛෙන්දුනා
නතීතිතභ්‍රැලතෙනාලං මදීතුම්භුවනත්‍රයම්.

මදරක්ත, මදයෙන් රතුවූ; කපොලෙන, කම්මුල්ඇති; නතීතිත නටවනලද; භ්‍රැලතෙන, භ්‍රැලතාඇති; තවන්මුඛෙන්දුනා, තීගේ මුඛ චන්ද්‍රයා කාරණකොටගෙන; මනාමථඃ, අනඞ්ගතෙමේ; භුවනත්‍රයම්, ලොකත්‍රය; මදීතුම්, මඩනට; අලම්, සමර්ථයි.

81 හරිපාදඃශිරොලගන ජහ්නුකන්‍යාජලාංශුකඃ
ජයත්‍යසුරනිඃශඞ්කාසුරානන්දොත්සවධ්වජඃ.

ශිරොලගන, අග්‍රභාගයෙහි ලගනවූ; ජහ්නුකන්‍යා, අංකාශගඞ්ගාවගේ; ජලාංශුකඃ, ජලනැමති වස්ත්‍රඇති; අසුර, අසුරයන් කෙරෙන්; නිශශඞ්ක, ශඞ්කාරහිතවූ; සුර, දෙවියන්ගේ; ආනන්දොත්සව, ආනන්දොත්සවයට; ධ්වජඃ, කෙතුවක්බඳුවූ; හරිපාදඃ විෂ්ණුපාදය; ජයති, දිනයි.

82 විශෙෂණසමග්‍රස්‍යරූපං කෙතොර්යදීදෘශම්
පාදෙතදර්පිණාදෙනත් සවිශෙෂණ රූපකම්.

විශෙෂණ සමග්‍රස්‍ය,විශෙෂණ විශිෂ්ටවූ; කෙතොඃ, ධවජයාගේ; ඊදෘශම්, මෙබඳුවූ; යත්රූපම්, යම්රූපයක්වේද; තත්, ඒ ස්වරූපය; පාදෙ, පාදයෙහි; අර්පිණාත්, ආරොපණයකිරීමෙන්; එතත්, මේ පද්‍යය සවිශෙෂණ රූපකම්, සවිශෙෂණ රූපකනම්වේ.

83 නම්ලයතිපද්මානි නනහොප්‍යවගාහතෙ
ත්වනමුඛෙන්දුර්මමාසූනාං හරණායෙවකල්පතෙ.

ත්වන්මුඛෙන්දුඃ, තීගේ මුඛනමැති චන්ද්‍රතෙම; පද්මානි, පද්මයන්; නම්ලයති, නොහකුළුවයි; නභඃඅපි, අහසටද; නඅවගාහතෙ, නොනැගේ; (හුදෙක්) මම, මාගේ; අසූනාම්, ප්‍රාණයන්; හරණායඑව, හැරගනු පිණිසම; කල්පතෙ, උත්සාහකෙරේ.

84 අක්‍රියාචන්ද්‍රකායර්‍ය්‍යාණාමන්‍ය කායර්‍ය්‍යස්‍යචක්‍රියා
අත්‍රසන්දර්ශ්‍යතෙයස්මාත් විරුඬනාමරූපකම්.

අත්‍ර, මෙහි; චන්ද්‍රකායර්‍ය්‍යාණාම්, චන්ද්‍රකාර්‍ය්‍යයන්ගේ; අක්‍රියාච, නොකිරීමද; අන්‍යකායර්‍ය්‍යස්‍යච, අන්‍යවූ යමාදීන් සම්බන්ධ කාර්‍ය්‍යයාගේ; ක්‍රියාච, කිරීමද; යස්මාත්, යම්හෙයකින්; සන්දර්ශ්‍යතෙ, දක්වනු ලැබේද; (එහෙයින්) විරුඬංනාමරූපකම්, මේ විරුඬරූපකනම්වේ.

85 ගාම්භීර්‍ය්‍යෙණසමුද්‍රොසි ගෞරවෙණාසිපර්‍වතඃ
කාමදත්වාච්චලොකානාමසිත්වං කල්පපාදපඃ.

ගාම්භීර්‍ය්‍යෙණ, ගම්භීරත්වයෙන්; ත්වම්, ඔබ; සමුද්‍රොඅසි, සාගරය වූයෙහි; ගෞරවෙණ, ගාරත්වයෙන්; පර්‍වතඃඅසි, පර්‍වතයවූයෙහි; ලොකානාම්, ලෝවැස්සන්ට; කාමදත්වාත්ච, කැමති වස්තුදෙනහෙයින් කල්පපාදපඃඅසි, කල්ප වෘක්ෂයවූයෙහි.

86 ගාම්භීර්‍ය්‍යප්‍රමුඛෛරත්‍ර හෙතුභිඃ සාගරොගිරිඃ
කල්පද්‍රුමශ්චක්‍රියතෙ තදිදංහෙතුරූපකම්.

අත්‍ර, මෙහිලා; ගාම්භීර්‍ය්‍යප්‍රමුඛෛඃ, ගම්භීරත්වයප්‍රමුඛවූ; හෙතුභිඃ, හෙතුයෙන්; කශ්චිත්, කිසිවෙක්; සාගරඃ, සාගරයද; ගිරිඃ, පර්‍වතයද; කල්පද්‍රුමශ්ච, කල්පවෘක්ෂයද; ක්‍රියතෙ, කරනුලැබේ; තදිදම්, ඒ මේ අලඞ්කාරය; හෙතුරූපකම්, හෙතුරූපකනම්වේ.

87 රාජහංසොපභොගාර්හං භ්‍රමරප්‍රාර්ථ්‍යසෞරභම්
සඛිවක්ත්‍රාම්බුජමිදං තවෙතිශ්ලිෂ්ටරූපකම්.

සඛි, යෙහෙලිය; තව, තීගේ; ඉදංවක්ත්‍රාම්බුජම්, මේ මුඛනම්වැනි පද්මය; රාජහංස, රාජොත්තමයකුට නොහොත් හංසරාජයක්හට; උපභොගාර්හම්, සම්භොගයටසුදුසුය; භ්‍රමර, කාමුකයන්විසින්; ප්‍රාර්ථ්‍ය, පැතියයුතුවූ; සෞරභම්, සුගන්ධ ඇත්තේය; නොහොත් භ්‍රමර, භෘඞ්ගයන් විසින්; ප්‍රාර්ථ්‍ය, ස්පෘහණීයවූ; සෞරභම්, සුගන්ධඇත්තේය; ඉති, මෙබඳුවූයේ; ශ්ලිෂ්ටරූපකම්, ශ්ලිෂ්ටරූපකනමි.

88 ඉෂ්ටංසාධර්ම්‍ය වෛධර්ම්‍යදර්ශනාද්ගෞණමුඛ්‍යයොඃ
උපමාව්‍යතිරෙකාඛ්‍යං රූපකද්විතයංයථා.

ගෞණමුඛ්‍යයොඃ, ගෞණමුඛ්‍යදෙදෙනාගේ (මෙහි ගෞණනම් මුඛාදියෙහි ආරොප්‍යමානවූ චන්ද්‍රාදිහුය, මුඛ්‍යනම් ආරොපවිෂයවූ මුඛාදිහුයි); සාධර්ම්‍යවෛධර්ම්‍යදර්ශනාත්, සාධාරණධර්ම අසාධාරණධර්ම යන්ගේ දර්ශනයෙන්; උපමාව්‍යතිරෙකාඛ්‍යම්, උපමාව්‍යතිරෙකනම්වූ හෙවත් උපමාරූපකව්‍යතිරෙක රූපකනම්වූ); රූපකද්විතයම්, රූපකද්වය; ඉෂ්ටම්, කැමතිවනලදී; යථා, ඊට උදාහරණ මෙසේයි.

89 අයමාලොහිතච්ඡායො මදෙනමුඛචන්ද්‍රමාඃ
සන්නද්ධොදය රාගස්‍යචන්ද්‍රස්‍යප්‍රතිගර්ජති.

මදෙන, මදයෙන්; ආලොහිතච්ඡායඃ, මදක් රතුවූ කාන්තිඇති; අයංමුඛචන්ද්‍රමාඃ, මේ මුඛනැමතිචන්ද්‍රතෙම; සන්නද්ධ, බබලන්නාවූ; උදයරාගස්‍ය, උදයකාලයෙහිවූ; රන්පැහැඇති; චන්ද්‍රස්‍ය, චන්ද්‍රයාහට; ප්‍රතිගර්ජති, ස්පර්ධාකරයි; මෙහි සාධාරණ ධර්මය ඇතිහෙයින් මේ උපමාරූපකයට උදාහරණයි.

90 චන්ද්‍රමාඃපීයතෙදෙවෛර්මයාත්වන්මුඛචන්ද්‍රමාඃ
අසමග්‍රොප්‍යසෞ ශශ්වදයමාපූර්ණමණ්ඩලඃ.

අසමග්‍රඃඅපි, අසම්පූර්ණවූද; අසෞචන්ද්‍රමාඃ, මේ චන්ද්‍රතෙමේ; දෙවෛඃ, දෙවියන් විසින්; ශශ්වත්, නිතර; පීයතෙ, බොනුලැබේ; ආපූර්ණමණ්ඩලඃ, සම්පූර්ණමණ්ඩලඇති; අයංමුඛචන්ද්‍රමාඃ, මේ මුඛනැමති චන්ද්‍රතෙම; මයා, මා විසින්; පීයතෙ, බොනුලැබේ; මෙහි මුඛ්‍යගෞණසංඛ්‍යාතවූ මුඛචන්ද්‍ර දෙදෙනාගේ සම්පූර්ණ අසම්පූර්ණත්වරූපවූ වෛධර්ම්‍යය ඇතිහෙයින් මේ ව්‍යතිරෙකරූපකනම්වේ.

91 මුඛචන්ද්‍රස්‍යචන්ද්‍රත්ව මිත්ථමන්‍යොපතාපිනඃ
නතෙසුන්දරිසංවාදීත්‍යෙතදාක්ෂෙපරූපකම්.

සුන්දරි, එම්බා කාන්තාව; ඉත්ථම්, මෙසේ; අන්‍යොපතාපිනඃ, අනුන් තවන්නාවූ; (චන්ද්‍රස්‍යයනුශෙෂයි චන්ද්‍රස්‍ය, චන්ද්‍රයාගේ;) චන්ද්‍රත්වම්, චන්ද්‍රත්වය; තෙ, තීගේ; මුඛචන්ද්‍රස්‍ය, මුඛචන්ද්‍රයාහට; නසංවාදි, සදෘශනොවෙයි; ඉති, මෙබඳුවූ; එතත්, මෙය; ආක්ෂෙපරූපකම්, ආක්ෂෙපරූපකනම්වේ; මෙහි උපමානභූතවූ චන්ද්‍රයාහට පරපීඩකත්වයෙන් නින්දප්‍රකාශවනහෙයින් මේ ආක්ෂෙපරූපකනම්විය.

92 මුඛෙන්දුරපිතෙචණ්ඩි මාංනිර්දහතිනිර්දයම්
භාග්‍යදොෂානමමෛවෙති තත්සමාධානරූපකම්.

චණ්ඩි, කොපවූ තැනැත්තිය; මම එව, මාගේම; භාග්‍යදොෂාත්, භාග්‍යදොෂයෙන්; තෙ, තීගේ; මුඛෙන්දුඃ අපි, මුඛචන්ද්‍රයාද; නිර්දයම්, දයාරහිතව; මාම්, මා; නිර්දහති, තවයි; තත්, එය; සමාධානරූපකම්, සමාධානරූපකනම්වේ; මෙහි මගේම භාග්‍ය දොෂයෙන් යයි සමාධානයම පහළකළහෙයින් මේ සමාධානරූපකනම්විය.

93 මුඛපඞ්කජරඞ්ගෙස්මින් භ්‍රැලතානර්තකීතව
ලීලානෘත්‍යං කරොතීතිරම්‍යං රූපකරූපකම්.

අස්මින්මුඛපඞ්කජරඞ්ගෙ, මේ මුඛපද්මයනැමති නෘත්‍යමණ්ඩලයෙහි; තව, තීගේ; භ්‍රැලතා, භ්‍රැලතානැමති; නර්තකී, නාටකිය; ලීලානෘත්‍යම්, ලීලානෘත්‍යය; කරොති, කෙරේ; ඉති, මෙබඳුවූ; රම්‍යම්, රම්‍යවූ රූපකය; රූපකරූපකම්, රූපකරූපකයනම.

94 නෛතන්මුඛමිදං පද්මං නනෙත්‍රෙභ්‍රමරාවිමෞ
එතානිකෙශරාණ්‍යෙව නෛතාදන්තර්චිෂස්තව.

තව, තීගේ; එතත්, මෙය; මුඛංන, මුඛයනොවෙයි; ඉදම්, මෙය පද්මම්, පද්මයකි; ඉමෞ, මොවුහුදෙන්නා; නනෙත්‍රෙ, නෙත්‍රවය නොවෙයි; භ්‍රමරෞ, භෘඞ්ගයන් දෙදෙනෙකි; එතානි, මොවුහු; දන්තාර්චිෂඃන, දන්තරශ්මිහුනොවෙත්; එතානි, මොවුහු; කෙශරානිඑව, කිඤ්ජල්කමැයි.

95 මුඛාදිත්වංනිවර්ත්‍යෙව පද්මාදිත්වෙනරූපණාත්
උද්භාවිතගුණොත්කර්ෂං තත්ත්වාපහ්නවරූපකම්.

මුඛාදිත්වම්, මුඛාදිත්වය; නිවර්ත්‍යඑව, නවතාම; පද්මාදිත්වෙන, පද්මාදිත්වයෙන්; රූපණාත්, රූපණයකළහෙයින්; උද්භාවිත, පහළ

කරණලද; ගුණොත්කර්ෂම්, ගුණාතිශයඇති; (මෙය) තත්‍වාපහනව රූකම්, තත්‍වාපහනවරූපකනම; මේ මුඛ්‍යාදිප්‍රකෘතිතත්‍වයව ලකා පද්මාදිත්‍වයෙන්; රූපණයකෙළේනුයි තත්‍වාපහනවරූපකනම්විය.

96 නපයඝ්‍නෙනාවිකල්පානාං රූපකොපමයොරතඃ
දිඞ්මාත්‍රංදර්ශිතං ධීරෛරනුක්‍තමනුමීයතාම්.

රූපකොපමයොඃ, රූපකඋපමාදෙන්නා සම්බන්ධවූ; විකල්පා නාම්, විවිධ කල්පනාවන්ගේ පයඝ්නතඃ කෙළවරෙක්; න, නැත් තේය; දිඞ්මාත්‍රම්, දිශාමාත්‍රයක්; දර්ශිතම්, දක්වනලදි; ධීරෛඃ, පණ්ඩිතයන් විසින්; අනුක්‍තම්, නොකියනලද්ද; අනුමීයතම්, අනු මාන ඥනයෙන් දන්නාලැබේවා.

**රූපකචක්‍රම්, මේ රූපකචක්‍රයයි.**

---

97 ජාතික්‍රියාගුණද්‍රව්‍යවාචි නෛකත්‍රවර්ත්තිනා
සර්වාකෙ‍්‍යාපචාරශෙචත් තමාහුර්දීපකම්යථා.

එකත්‍රවර්ත්තිනා, (අදිමධ්‍යාන්තයන් අතුරෙන්) එක්තැනකසිටි; ජාතික්‍රියාගුණ ද්‍රව්‍යවාචිනා, ජාතික්‍රියාගුණද්‍රව්‍යවාචකවූ පදයකින්; සර්වාක්‍යොපචාරඃ, සියලු වාක්‍යයාගේ උපචාරය; චෙත්, ඉදින්වේ නම්; තම්, එය; දිපකම්, දිපකයයි; අහුඃ, කියති; යථා, ඊට උදාහ රණ මෙසේයි.

98 පවනොදක්‍ෂිණඃපර්ණං ජීර්ණංහරතිවීරුධාම්
සඑවාවනතාඞ්ගීනාං මානභඞ්ගායකල්පතෙ.

දක්‍ෂිණඃපවනඃ, දක්‍ෂිණමාරුතය; වීරුධාම්, ලතාවන්ගේ; ජීර්ණං පර්ණම්, දිරාගියපත්‍රය; හරති, දුරුකරයි; සඃඑව, ඒ වාතයම; අවන තාඞ්ගිනාම්, අවනතාඞ්ගින්ගේ; මානභඞ්ගාය, මානභඞ්ගය පිණිස, කල්පතෙ, සමර්ථවේ; මෙහි පූර්වාක්‍යයෙහි උපාත්තවූ වාතය උත්තර වාක්‍යයෙහි සඃ යන මෙයින් පරාමර්ශිතයි, එයින් මතදර්සම්බන්ධයා ගේ එළවීමවේනුයි, සර්වාක්‍යොපචාරය මෙහි විද්‍යමානබැව් දතයු තුයි, පවනශබ්දයජාති වාචකහෙයින් මේජාති දීපකයි.

99 චරන්තිචතුරම්භොධි වෙලොද්‍යානෙෂුදන්තිනඃ
චක්‍රවාලාද්‍රිකුඤ්ජෙෂු කුන්දභාසොගුණාශචතෙ.

චතුරම්භොධි, චතුස්සාගරයාගේ; වෙලොද්‍යානෙෂු, වෙරළ නැමති උයන්හි; දන්තිනඃ, දිග්ගජයෝද; චක්‍රවලාද්‍රිකුඤ්ජෙෂු, චක්‍ර වාටපර්වතකුඤ්ජයන්හි; තෙ, තාගේ; කුන්දභාසඃ, කොදපැහැඇති හෙවත් ධවලවූ; ගුණාශව, ගුණයෝද;; චරන්ති, හැසිරෙති; මෙහි චරන්ති යන එක ක්‍රියාපදයෙන් චකාර බලය කරණකොටගෙණ උභ යාර්ථයෙහිම වාක්‍ය සම්බන්ධයාගේ ඉපැදීමවේ, එහෙයින් මේ ක්‍රියා දීප කයට උදාහරණයි.

100 ශ්‍යාමලාඃ ප්‍රවෘෂෙණ්‍යාභිර්දිශොජීමූත පඞ්ක්තිභිඃ
භුවශච සුකුමාරාභිර්නවශාද්වලරාජිභිඃ

ප්‍රාවෘෂේණ්‍යාභිඃ, වර්ෂාකාලයෙහිවූ; ජීමූතපඞ්ක්තිභිඃ, මෙඝපඞ්ක්තීන් කරණකොටගෙන; දිශාඃ, දිශාවෝද; සුකුමාරාභිඃ, සුකුමාරවූ; නවශාද්වලරාජිභිඃ, අභිනවතෘණ රේඛායෙන්; භූවශ්ච, භූමිහුද; ශ්‍යාමලාඃ, නීලවර්ණවූහ; මෙහි ශ්‍යාමලාඃ යන ගුණවාචක පදය උභයවාක්‍යයෙහිම සම්බන්ධවූයෙන් මේ ගුණදීපකයි.

101 විෂ්ණුනාවික්‍රමස්ථෙන දානවානාංවිභූතයඃ
ක්වාපිනීතාඃකුතොප්‍යාසන්නානීතා දෛවතර්ධයඃ.

වික්‍රමස්ථෙන, වික්‍රමයෙහි සිටියාවූ; විෂ්ණුනා, විෂ්ණුහු විසින්; දානවානාම්, අසුරයන්ගේ; විභූතයඃ, සම්පත්තීහු; ක්වාපි, කොහේදෝ; නීතාඃ, ගෙනයනලද්දාහ; දෛවතර්ධයඃ, දෙවියන් සම්බන්ධ සෘද්ධීහු; කුතොපි, කොතැනින්දෝ; ආනීතාඃ ආසන්, ගෙන එනලද්දාහුය; මෙහි විෂ්ණුනා යන ද්‍රව්‍යවාචකපදය පූර්වවාක්‍යයෙහි සම්බන්ධවූයේද නැවත අපරවාක්‍යයෙහිත් සම්බන්ධවූයෙන් මේ ද්‍රව්‍යදීපකයි.

102 ඉත්‍යාදිදීපකාන්‍යුක්තා න්‍යෙවංමධ්‍යාන්තයොරපි
වාක්‍යයොර්දර්ශයිෂ්‍යාමඃ කානිචිත්තානිතද්‍යථා.

ඉති, මෙසේ; ආදිදීපකානි, ආදිදීපකයෝ; උක්තානි, කියනලද්දාහුය; එවම්, මෙසේ; වාක්‍යයොඃ, වාක්‍යයන්ගේ; මධ්‍යාන්තයොඃ, මධ්‍යාන්ත සම්බන්ධවූ; කානිචිත්තානි, ඒ කිසි දීපකකෙනෙකුන්; දර්ශයිෂ්‍යාමඃ, දක්වන්නෙමු; තද්‍යථා, ඒ මෙසේයි.

103 නෘත්‍යන්තිනිචුලොත්සඞ්ගෙ ගායන්තිචකලාපිනඃ
බධ්නන්තිචපයොදෙෂු දෘශොහර්ෂාශ්‍රුගර්භිණීඃ.

නිචුලොත්සඞ්ගෙ, මිදෙල්ලවෘක්ෂයාගේ අධොභාගයෙහි; කලාපිනඃ, මයූරයෝ; නෘත්‍යන්ති, නටති ගායන්ති, ගායනාකරත්; හෙවත් කෙකාරවනගත්; හර්ෂාශ්‍රුගර්භිණීඃ, සතුටු කඳුළුගැබ්කොටඇති; දෘශඃ, ඇසින්; පයොදෙෂු, මෙඝයන්හි; බධ්නන්තිච, බඳිති; මෙහි වාක්‍ය මධ්‍යගතවූ ද්‍රව්‍යවාචකවූ කලාපිනඃ යන පදය චකාරබලයෙන් අන්‍ය වාක්‍යයන්හාද සම්බන්ධවූහෙයින් මෙ වාක්‍ය මධ්‍යගතජාතිදීපකයි.

104 මන්දොගන්ධවහඃ ක්ෂාරොවහ්නිරින්දුශ්චජායතෙ
චර්චාචන්දනපාතශ්ච ශස්ත්‍රපාතඃ ප්‍රවාසිනාම්.

ප්‍රවාසිනාම්, විරහීන්ට; මන්දඃ, මන්දවූ; ගන්ධවහඃ, වාතයද; ක්ෂාරඃ, තීක්ෂ්ණවෙයි; ඉවසිය නොහෙයිසේයි; ඉන්දුශ්ච, චන්ද්‍රයාද; වහ්නිඃජායතෙ, ගින්නක්වෙයි; චර්චා, ශීතක්‍රියාවූ; චන්දනපාතශ්ච, චන්දනලෙපයද; ශස්ත්‍රපාතඃ, ශස්ත්‍රහෙළීමක්වෙයි; මෙහි වාක්‍යමධ්‍ය ගතවූ ජායතෙයන ක්‍රියාපදය පෙරගත සර්වවාක්‍යයන්හා සම්බන්ධවන හෙයින් මේ වාක්‍ය මධ්‍යගත ක්‍රියාදීපකයි.

105 ජලංජලධරොද්ගීර්ණං කුලංගෘහශිඛණ්ඩිනාම්
චලච්චතඩිතාංදාමබලං කුසුමධන්වනඃ.

ජලධරොද්ගීර්ණම්, මෙඝයෙන් වැගිරුනාවූ; ජලම්, ජලයද; ගෘහශිඛණ්ඩිනාං කුලම්, ගෘහමයූර සමූහයාද; චලම්, චචලවූ; තඩිතාං දාමච, විද්‍යුද්දාමයද; කුසුමධන්වනඃ, අනඞ්ගයාගේ; බලම්, සෙනාබලයි; මෙහි බල යන අන්තවාක්‍යස්ථ පදය සියලු වාක්‍යයන් හා සම්බන්ධ ඇතිහෙයින් ජාතිගත අන්තදීපකයි.

106 ත්වයානීලොත්පලංකණේ ස්මරෙණාස්ත්‍රංශරාසනෙ
මයාපිමරණෙ චෙතස්ත්‍රයමෙතත්සමංකෘතම්.

ත්වයා, තිවිසින්; කණේ, කණෙහි; නීලොත්පලම්, නිලොත්පලයද; ස්මරෙණ, අනඞ්ගයාවිසින්; ශරාසනෙ, දුන්නෙහි; ශස්ත්‍රම්, ශස්ත්‍රයද; මයා, මාවිසින්; මරණෙ, මරණයෙහි; චෙතඃඅපි, සිතද යන; එතත්ත්‍රයම්, මේ තුන, සමම්, එකවිට; කෘතම්, කරණලදි. මෙහි අන්තවාක්‍යස්ථවූ කෘතම් යන ක්‍රියාපදය පද්‍යගත සර්වවාක්‍යයන් හා සම්බන්ධවන හෙයින් මේ ක්‍රියාගත අන්තදීපකයි.

107 ශුක්ලඃශ්වෙතාර්චිෂොවෘද්ධ්‍යෛපක්ෂඃ පඤ්චශරස්‍යසඃ
සචරාගස්‍යරාගොපි යූනාංරත්‍යුත්සවශ්‍රියඃ.

ශුක්ලඃපක්ෂඃ, ශුක්ලපක්ෂය, ශ්වෙතාර්චිෂඃ, චන්ද්‍රයාගේ; වෘද්ධ්‍යෛ වර්ධනය පිණිසවේ; සඃ, ඒ චන්ද්‍රතෙම; පඤ්චශරස්‍ය, අනඞ්ගයාගේ; වෘද්ධ්‍යෛ, වර්ධනය පිණිසවේ; සච, ඒ අනඞ්ගයාද; රාගස්‍ය, රාගයාගේ; වෘද්ධ්‍යෛ, වර්ධනය පිණිසවේ; රාගඃ, අපි, රාගයද; යූනාම්, තරුණයන්ගේ; රත්‍යුත්සවශ්‍රියඃ, රත්‍යුත්සවශ්‍රියගේ; වෘද්ධ්‍යෛ, වර්ධනය පිණිසවේ.

108 ඉත්‍යාදිදීපකත්වෙපි පූර්වපූර්වව්‍යපෙක්ෂිණී
වාක්‍යමාලාප්‍රයුක්තෙති තන්මාලාදීපකංමතම්.

ඉති, මෙහි; ආදිදීපකත්වෙපි, ආදිදීපකත්වය ඇතිකල්හිත්; පූර්වපූර්වව්‍යපෙක්ෂිණී, පූර්වපූර්වවූ වාක්‍යයන් අපෙක්ෂාකරන්නාවූ; වාක්‍යමාලා, වාක්‍යමාලාව; ප්‍රයුක්තාඉති, යොදනලදුයි. තත්, එහෙයින්; (අනන්තරොක්තපද්‍යය;) මාලාදීපකම්, මාලාදීපකයයි, මතම්, දන්නාලදී.

109 අවලෙපමනඞ්ගස්‍ය වර්ධයන්තිවලාහකාඃ
කර්ශයන්තිතුඝර්මස්‍ය මාරුතොද්ධූතශීකරාඃ.

මාරුතොද්ධූතශීකරාඃ, මාරුතයෙන් කම්පාකරණලද පොදඇති; වලාහකාඃ, වලාවෝ; අනඞ්ගස්‍ය, අනඞ්ගයාගේ; අවලෙපම්, දර්පය; වර්ධයන්ති, වඩති; ඝර්මස්‍ය, ග්‍රීෂ්මයාගේ (අවලෙපම්, දර්පය) කර්ශයන්ති, කෘශකරත්.

1!0 අවලෙපපදෙනාත්‍ර වලාහකපදෙනච
ක්‍රියාවිරුද්ධෙ සංයුක්තෙ තද්විරුද්ධාර්ථදීපකම්.

අත්‍ර, මෙහි; අවලෙපපදෙන, කර්මභූතවූ අවලෙපපදයහාද, වලාහකපදෙනච; කර්තෘභූතවූ වලාහක පදයාහාද; ක්‍රියාවිරුද්ධෙ, විරුද්ධක්‍රියාවෝ දෙදෙන, සංයුක්තෙ, යොදනලදහ. තත්, එහෙයින්; විරුද්ධාර්ථදීපකම්, විරුද්ධාර්ථදීපකනම්වේ.

111 හරන්ත්‍යාභොගමාශානාං ගෘහණාන් ජ්‍යොතිෂාංගණම්
ආදත්තෙචාද්‍යමෙප්‍රාණා නසෞජලධරාවලී.

අසෞජලධරාවලී, මේ මෙඝ පඞ්ක්තිතොමෝ; ආශානාම්, දිශාවන්ගේ; ආභොගම්, විස්තාරය; හරන්ති, පැහැරගනී; ජ්‍යොතිෂාංගණම් තාරකාසමූහය; ගෘහණාන්, ග්‍රහණයකරයි; අද්‍ය, අද; මෙ, මාගේ; ප්‍රාණාන්, ප්‍රාණයන්; ආදත්තෙච, ග්‍රහණයදකරයි;

112 අනෙකශබ්දෞපාදනාත් ක්‍රියෛකෛවාත්‍රදීප්‍යතෙ
යතොජලධරාවල්‍යාතස්මාදෙකාර්ථදීපකම්.

යතඃ, යම්හෙයකින්; ජලධරාවල්‍යා, මෙඝපඞ්ක්තිය විසින්; අනෙකශබ්දොපාදනාත්, නොයෙක් ශබ්දයන්ගේ උපාදනයෙන්, එකාඑවක්‍රියා, එකමක්‍රියාවක්; දිප්‍යතෙ, දිපනයකරනු ලැබේ; තස්මාත්, එහෙයින්; (අනන්තරොක්තපද්‍යය) එකාර්ථදීපකම්, එකාර්ථ දීපකනම්වේ.

113 හෘද්‍යගන්ධවහාස්තුඞ්ගා ස්තමාලශ්‍යාමලත්විෂඃ
දිවිභ්‍රමන්තිජීමූතාභුවි චෛතෙමතඞ්ගජාඃ.

හෘද්‍යගන්ධවහාඃ, මනොරම්‍යවූවාතඇති; නොහොත්, හස්තිපක්ෂයෙහි; හෘද්‍යගන්ධවහාඃ, මනොරම්‍යවූ මදගන්ධවහවූ; තුඞ්ගාඃ, උස්වූ; තමාල, තමාලලතාසේ; ශ්‍යාමලත්විෂඃ නිලවර්ණශොභාඇති; ජීමූතාඃ, මෙඝයෝ; දිවි, ආකාශයෙහිද; එතෙමතඞ්ගජාඃ, මේහස්තීහු; භුවිච, පෘථිවියෙහිද; භ්‍රමන්ති, භ්‍රමණයකරත්.

114 අත්‍රධර්මෛරභින්නා නාමභ්‍රාණාං දන්තිනාංතථා
භ්‍රමණෙනෛවසම්බන්ධ ඉතිශ්ලිෂ්ටාර්ථදීපකම්.

අත්‍ර, මෙහි; ධර්මෛඃ, සාධාරණවූධර්මයෙන්හෙවත් හෘද්‍යගන්ධවහාදිවූ විශෙෂණයෙන්; අභින්නානාම්; අභින්නවූ; අභ්‍රාණාම්, මෙඝයන්ගේද; තථා, එසේම; දන්තිනාම්, හස්තීන්ගේද; භ්‍රමණෙනෛව, එකම් භ්‍රමණක්‍රියාවහා; සම්බන්ධඃඉති, සම්බන්ධනුයි; ශ්ලිෂ්ටාර්ථදීපකම්, ශ්ලිෂ්ටාර්ථදීපකනම.

115 අනෙනෛවප්‍රකාරෙණ ශෙෂාණාමපිදීපකෙ
විකල්පානාමවගතිර්විධාතව්‍යා විචක්ෂණෛඃ.

දිපකෙ, දිපකයෙහිලා, ශෙෂාණාම්, ඉතිරිවූ; විකල්පානාම්, අපි, හෙදයන්ගේද; අවගතිඃ, අවබොධය; අනෙනෛව ප්‍රකාරෙණ, මේ ප්‍රකාරයෙන්ම විධාතව්‍යා, කටයුත්තීය.

**ඉතිදිපකචක්‍රම්, මේ දීපකචක්‍රයයි.**

---

116 අර්ථාවෘත්තිඃපදාවෘත්ති රුභයාවෘත්තිරෙවච
දිපකස්ථානඑවෙෂ්ට මලඞ්කාරත්‍රයංයථා.

අර්ථාවෘත්තිඃ, අර්ථාවෘත්තිය, පදාවෘත්තිඃ, පදාවෘත්තිය; උභයාවෘත්තිඃඑවච, උභයාවෘත්තියදැයියන; අලඞ්කාරත්‍රයම්, අලඞ්කාරතුන, දිපකස්ථානෙඑව, දිපකස්ථානයෙහිම; ඉෂ්ටම්, කැමතිවනලදී; යථා, ඊට උදාහරණ මෙසේයි.

117 විකසන්තිකදම්බානි සඵුටන්තිකුටජද්‍රැමාඃ
උන්මිලන්තිචකන්දල්‍යො දලන්තිකකුභානිච.

කදම්බානි, බක්මිකැකුලු; විකසන්ති, විකසිතවෙති; කුටජ ද්‍රැමාඃ, කෙලිඳවෘක්‍ෂයෝ; සඵුටන්ති, පිපෙති; කන්දල්‍යඃ, කන්දල්ලතා වෝ; උන්මිලන්ති, ප්‍රබොධවෙත්, කකුභානිච, කකුභවෘක්‍ෂයෝ හෙවත්කුඹුක් වෘක්‍ෂයෝ; දලන්ති, පිපෙති, මෙහිවිකසන්ති යනාදි ක්‍රියා පදහිනානාප්‍රකෘති නිෂ්පන්නාවූවාහුද එකාර්ථමතුයි අර්ථයාගේ පුනරාවර්තනයහෙතුකොටගෙන මේ අර්ථාවෘත්ති අලඞ්කාරයි.

118 උත්කණ්ඨයතිමෙඝානාං මාලාවෘන්දංකලාපිනාම්
යූනාංචෛවොත්කණ්ඨයත්‍යෙෂ මානසංමකරධ්වජඃ.

මෙඝානාංමාලා, මෙඝමාලානොමෝ; කලාපිනාංවෘන්දම්, මයූර සමූහයා; උත්කණ්ඨයති, උද්ගතග්‍රිව ඇත්තවූන්කරයි; මකරධ්වජඃ, අනඞ්ගතෙම; යූනාංචමානසම්, තරුණයන්ගේ සිතද; උත්කණ්ඨයති, උකටලිකරයි. මෙහි උත්කණ්ඨයති යන ක්‍රියාපදමාත්‍රයාගේම පුනරාවර්තනය කළහෙයින් මේ පදවෘත්තිඅලඞ්කාරයි. අර්ථවයති න්නාහෙයින් මෙහි අර්ථාවෘත්තියක් නැතැයි දතයුතුයි.

119 ජිත්වාවිශ්වංභවානත්‍ර විහරත්‍යවරොධනෛඃ
විහරත්‍යප්සරාභිස්තෙ රිපුවර්ගොදිවංගතඃ.

අත්‍ර, මේ භූලොකයෙහි; භවාන්, පින්වත්තෙමේ; විශ්වම්, සියල්ල; ජිත්වා, දිනා, අවරොධනෛඃ, අන්තඃපුරිකාවන් සමග; හෙවත් අන්තඃපුරයෙහි ස්ත්‍රින්සමග; විහරති, වාසයකෙරේ; තෙ, තාගේ; රිපුවර්ගඃ, ශත්‍රැවර්ගයා; දිවංගතඃ, ස්වර්ගයටගියේ; අප්සරාභිඃ, දිව්‍ය ස්ත්‍රින් සමග; විහරති, වාසයකරයි යුඩයෙහි මළාහු ස්වර්ගස්ථවෙති යනු ස්වසමය හෙයින් මෙසේ කියත්. මෙහිවිහරති යනපදයද තදර්ථයද පුනරාවර්තනය කළහෙයින් මේ උභයාවෘත්තිනම.

**ඉත්‍යාවෘත්තිගණඃ, මේ අවෘත්තිගණයයි.**

---

120 ප්‍රතිෂෙධොක්තිරාක්‍ෂෙපස්ත්‍රෛකාල්‍යාපෙක්‍ෂයාත්‍රිධා
අථාස්‍යපුනරාක්‍ෂෙප්‍ය භෙදානන්ත්‍යාදනන්තතා.

ප්‍රතිෂෙධොක්තිඃ, ප්‍රතිෂෙධයසම්බන්ධවූ වචනය; ආක්‍ෂෙපඃ, ආක්‍ෂෙපනම; (මේ ප්‍රතිෂෙධය ඇත්තෙන්නොවෙයි, ඇතිසැටිවූ ප්‍රතිෂෙධය වෛචිත්‍ර්‍යාවහනොවන හෙයින් ඒ අලඞ්කාරත්වයෙහි ඇතුළත්නොවේ) හෙද; ත්‍රෛකාල්‍යාපෙක්‍ෂයා ත්‍රිකාලිකාපෙක්‍ෂාවෙන්; ත්‍රිධා, තුන් වැදෑරුම්වේ; අථ, ඉක්බිති, ආක්‍ෂෙප්‍ය භෙදානන්ත්‍යා, ආක්‍ෂෙප්‍යභෙදයන්ගේ අනන්තතාහෙයින්; පුනඃ, නැවත; අස්‍ය, මේ ආක්‍ෂෙපාලඞ්කාරයාගේ; අනන්තතා, අනන්තබවවේ.

121 අනඞ්ගඃපඤ්චභිඃ පුෂ්පෛර්විශ්වංව්‍යජයතෙෂුභිඃ
ඉත්‍යසම්භාව්‍යමථවා විචිත්‍රාවස්තුශක්තයඃ.

අනඞ්ගඃ, අනඞ්ගතෙම; පුෂ්පෛඃ, පුෂ්පමයවූ; පඤ්චභිඃ ඉෂුභිඃ, ඊපසින්; විශ්වම්, සියල්ල; ව්‍යජයත ඉති, දිනුයේයයනු; අසම්භාව්‍යම් සම්භාවනා නොකටයුතුයි; අථවා, එසේවුවද, වස්තුශක්තයඃ, වස්තුශක්තීහු; විචිත්‍රා, විචිත්‍රයහ; “අරවින්දමශොකඤ්චචූතඤ්ච නවමල්ලිකා නීලොත්පලඤ්චපඤ්චෛතෙ පඤ්චබාණස්‍යසායකා” අනඞ්ගයාගේ ඊපස මෙයින් දතයුතුයි; මෙහිකර්තෘහුගේ අශරීරත්වයද ශරයන්ගේ පඤ්චකත්වයද එසේමමෘදුවූ පුෂ්පශරත්වයද දිනිය යුත්තගේ සකලත්වයද කල්පනාකළ කලමේ සියල්ලම නොඇදහිය යුතුවේ. එසේනමුදු වස්තූන්ගේ ශක්තිය අචින්ත්‍යහෙයින් මේ සියල්ලම සම්භාවනා කටයුතුමය යනු තාත්පර්‍ය්‍යයි.

122 ඉත්‍යනඞ්ගජයායොග බුද්ධිර්හේතුබලාදිහ
ප්‍රවෘත්තෛවයදාක්ෂිප්තා වෘත්තාක්ෂෙපඃසඊදෘශඃ.

ඉහ, මෙහි; ඉති, මෙසේ; හෙතුබලාත්, හෙතුබලයෙන්; ප්‍රවෘත්තාඑව, පැවැත්තාමවූ; අනඞ්ගජයායොගබුද්ධිඃ, අනඞ්ගජයයාගේ අසම්භාවනාබුද්ධිතොමෝ; යත්, යම්හෙයකින්, ආක්ෂිප්තා; දුරුකරණලද්දීද; එහෙයින්; ඊදෘශඃ, මෙබඳුවූ; සඃ, එය, වෘත්තාක්ෂෙපඃ, වෘත්තාක්ෂෙපනම, අතීතවෘත්තාන්තකථනහෙයින් අතීතාක්ෂෙපනමැයිසේයි

123 කුතඃකුවලයංකර්ණෙ කරොෂිකලභාෂිණි
කිමපාඞ්ගමපර්‍ය්‍යාප්ත මස්මින්කර්මණිමන්‍යසෙ.

කලභාෂිණී, මනොඥකොට බණන්නිය; කර්ණෙ, කර්ණයෙහි; කුවලයම්, නීලොත්පලය; කුතඃ, කවරහෙයකින්; කරොෂි, කරන්නෙහිද; අස්මින්කර්මණි, මේකර්ණාලඞ්කාරකරණයෙහි; කිං, කිමෙක් අපාඞ්ගම්, නෙත්‍රාන්තය; අපර්‍ය්‍යාප්තංමන්‍යසෙ; අක්ෂමයයි සිතන්නෙහිද.

124 සවර්තමානාක්ෂෙපොයං කුර්වත්‍යෙවාසිතොත්පලම්
කර්ණෙකාචිත්ප්‍රියෙණෛවං චාටුකාරෙණරුධ්‍යතෙ.

සඃඅයංවර්තමානාක්ෂෙපඃ, ඒ මේවර්තමානාක්ෂෙපනම්, කාචිත්, කිසිස්ත්‍රියක්; කර්ණෙ, කර්ණයෙහි; අසිතොත්පලම්, අසිතොත්පලය; කුර්වතී එව, කෙරේමැයි; යම්හෙයකින්, එවම්, මෙසේ; චාටුකාරෙණ, චාටුකාරවූ; ප්‍රියෙණ, වල්ලභයා විසින්; රුධ්‍යතෙ, වළකනු ලැබේද; එහෙයිනි; මේ වාර්තමානකාලික ක්‍රියායෙදූහෙයින් වර්තමානාක්ෂෙපනම්විය.

125 සත්‍යංබ්‍රවීමිනත්වංමාං ද්‍රෂ්ටුංවල්ලභලප්ස්‍යසෙ
අන්‍යචුම්බනසඞ්ක්‍රාන්ත ලාක්ෂාරක්තෙනචක්ෂුෂා.

වල්ලභ, ස්වාමිය; සත්‍යම්, සැබවක්; බ්‍රවීමි, කියමි; ත්වම්, තෝ; අන්‍යචුම්බන අන්‍යනායිකාචුම්බනයෙන්; සඞ්ක්‍රාන්ත, පැමිණියාවූ; ලාක්ෂාරක්තෙන, ලාක්ෂාරසයෙන්රතුවූ; චක්ෂුෂා, ඇසින්, මාම්, මා; ද්‍රෂ්ටුම්, දක්නට; නලප්ස්‍යසෙ, නොලබන්නෙහිය.

126 සොයංභවිෂ්‍යදාක්ෂෙපඃ ප්‍රාගෙවාත්මනස්විනී
කදාචිදපරාධොස්‍ය භාවීත්‍යෙවමරුන්ධයත්.

සොයංභවිෂ්‍යදාක්ෂෙපඃ, ඒ මේ භවිෂ්‍යත් ආක්ෂෙපකනම; (යත්, යම්හෙයකින්) අභිමනස්විනී, අභිශයින් මානිනිවූ ස්ත්‍රියක්තොමෝ; කදාචිත්, කිසිකලෙක; අස්‍ය, මේ වල්ලභාගේ; අපරාධඃ, අපරාධයෙක් භාවීඉති, වන්නේයයි; ප්‍රාක්එව, පළමුකොටම; අරුන්ධයත්, වැළැක් වූයේද (එහෙයිනි) ලපස්‍යසෙයන අනාගතක්‍රියා යොගයෙන් අනන්තරොක්තපද්‍යය අනාගතාක්ෂෙපකනමැයි දතයුතුයි.

127 තවතන්වඞ්ගිමිථ්‍යෛව රූඪමඞ්ගෙෂුමාර්දවම්
යදිසත්‍යංමෘදූන්‍යෙව කිමකාණ්ඩෙරුජන්තිමාම්.

තන්වඞ්ගි, කෘශාඞ්ගිය; තව, තීගේ; අඞ්ගෙෂු, අවයවයන්හි; මාර්දවම්, මෘදුබව; රූඪම්, පිහිටියේ; මිථ්‍යාඑව, බොරුමැයි; යදි, ඉදින්; මෘදූනි, මෘදුවූවාහු; සත්‍යම්එව, සැබෑමනම්; කිම්, කවරහෙයකින්; අකාණ්ඩෙ, නිකරුණේ; මාම්, මා; රුජන්ති, පෙළත්ද.

128 ධර්මාක්ෂෙපොයමාක්ෂිප්ත මඞ්ගනාගාත්‍රමාර්දවම්
කාමුකෙනයදත්‍රෛවං කර්මණාතද්විරොධිනා.

අත්‍ර, මෙහි; යත්, යම්හෙයකින්; කාමුකෙන, කාමුකයා විසින්; අඞ්ගනාගාත්‍ර මාර්දවම්, අඞ්ගනාවගේ ශරීරමෘදුබවය; තත්විරොධිනා, ඒ මාර්දවයට විරුද්ධවූ; කර්මණා, රුජනක්‍රියාවෙන්; එවම්, මෙසේ; ආක්ෂිප්තම්, ප්‍රතිෂෙධකරණලද්දේය; එහෙයින්; අයම්, මේ; ධර්මාක්ෂෙපඃ, ධර්මාක්ෂෙපනම්, මේ මාර්දවරූපවූ ධර්මයාගේ; ප්‍රතිෂෙධහෙයින් ධර්මාක්ෂෙපනමැයිසේයි.

129 සුන්දරීසානවෙත්‍යෙෂ විවෙකඃ කෙනජායතෙ
ප්‍රභාමාත්‍රංහිතරලං දෘශ්‍යතෙනතදාශ්‍රයඃ.

සා, ඕතොමෝ; සුන්දරීවා, ලාවණ්‍යප්‍රයුක්ත ස්ත්‍රියක්දෝහෝ; නවාඉති, නොවේදෝහෝ යන; එෂඃවිවෙකඃ, මේ විවෙචනය; කෙන, කවරප්‍රකාරයකින්; ජායතෙ, වෙයිද; තරලංහි, චඤ්චලවූ; ප්‍රභාමාත්‍රංහි, ප්‍රභාමාත්‍රයක්ම; දෘශ්‍යතෙ, දක්නාලැබේ; තදාශ්‍රයඃ, ඒ සම්බන්ධවූ ආශ්‍රයක්; නදෘශ්‍යතෙ, නොදක්නා ලැබේ.

130 ධර්ම්‍යාක්ෂෙපොයමාක්ෂිප්තො ධර්මීධර්මප්‍රභාහ්වයං
අනුඥයෛවතද්රූප මනන්‍යාශ්‍රයෛෂිං විවක්ෂතා.

(යත්, යම්හෙයකින්); අනන්‍යාශ්‍රයෛෂිම්, ඉතාආශ්‍රයෛෂිවූ; රූපම්, රූපය; විවක්ෂතා, කියනුකැමැත්තහු විසින්; ප්‍රභාහ්වයඃ, ප්‍රභානම්වූ; ධර්මීධර්මම්, ධර්මිහුගේ ධර්මය; අනුඥයඑව, අනුඥනම; ආක්ෂිප්තඃ, (ශරීරසංඛ්‍යාතආශ්‍රය) වළකනලද්දේද; එහෙයින් අයම් මේ; ධර්ම්‍යාක්ෂෙපඃ, ධර්ම්‍යාක්ෂෙපනම්වේ

131 චක්ෂුෂීතවරජ්‍යෙතෙ සඵුරත්‍යධරපල්ලවම්.
භ්‍රැවෞචභුග්නෙනතථා ප්‍යදුෂ්ටස්‍යාස්තිමෙහයම්

තව, තීගේ; චක්ෂුෂී, චක්ෂුවය; රජ්‍යෙතෙ, රක්තවර්ණවෙති; අධරපල්ලවම්, අධරපල්ලවය; සඵුරති, චඤ්චලවේ; භ්‍රැවෞ, බැමයුවලද; භුග්නෞ, බිඳුනේය; තථාපි, එසේනමුදු; අදුෂ්ටස්‍ය, දොෂනොකරණලද; මෙ, මට; හයම්; හයෙක්; නඅස්ති, නැත්තේය.

132 සඑෂකාරණාක්‍ෂෙපඃ ප්‍රධානංකාරණංභියඃ
ස්වාපරාධොනිෂිද්ධොත්‍ර යත්ප්‍රියෙණපටීයසා.

සඃඑෂඃ, ඒ මේ අලඞ්කාරය; කාරණාක්‍ෂෙපඃ, කාරණාක්‍ෂෙපනම් යත්, යම්හෙයකින්; භියඃ, භියට; ප්‍රධානංකාරණම්, ප්‍රධාන කාරණයවූ; ස්වාපරාධඃ, ස්වකීයඅපරාධය; අත්‍ර, මෙහිදී; නිෂිද්ධඃ, වළකනලද්දේද; එහෙයිනි.

133 දූරෙප්‍රියතමඃසොය මාගතොජලදාගමඃ
දුෂ්ටාශ්චඵුල්ලානිචුලා නමෘතාචාස්මිකිංවිදම්.

ප්‍රියතමඃ, වල්ලභතෙමේ; දූරෙ, දූරස්ථානයෙහි සිටී; සොයංජලදාගමඃ, ඒ මේ වර්ෂාසමය; ආගතඃ, පැමිණියේය; දුෂ්ටාඃ, දුෂ්ටවූ; නිචුලාශ්ච, මිදෙල්ල වෘක්ෂයෝද; ඵුල්ලාඃ, පිපීගියාහ; නමෘතාචාස්මි, මමද නොමැරුණේවිම්, ඉදම්, මේ; කින්නු, කිමෙක්ද?

134 කාර්‍ය්‍යාක්‍ෂෙපඃසකාර්‍ය්‍යස්‍ය මරණස්‍යනිවර්තනාත්
තත්කාරණමුපන්‍යස්‍ය දාරුණංජලදාගමම්.

(අත්‍ර, මෙහි) තත්කාරණම්, ඒ මරණයට කාරණවූ; දාරුණම්, දරුණුවූ; ජලදාගමම්, මෙඝාගමය; උපන්‍යස්‍ය, උපන්‍යාසකොට; කාර්‍ය්‍යස්‍ය, කාර්‍ය්‍යවූ; මරණස්‍ය, මරණයාගේ; නිවර්තනාත්, නිවර්තනය හෙයින්; සඃකාර්‍ය්‍යාක්‍ෂෙපඃ ඒ කාර්‍ය්‍යාක්‍ෂෙපනම්

135 නචිරංමමතාපාය තවයාත්‍රාභවිෂ්‍යති
යදියාස්‍යසියාතව්‍ය මලමාශඞ්කයාත්‍රෙත.

තව, තාගේ; යාත්‍රා, ප්‍රවාසගමනය; මම, මට; චිරම්, බොහෝ කලක්; තාපාය, තැවිම පිණිස; නභවිෂ්‍යති, නොවන්නේය; යදි, ඉදින්; යාතව්‍යම්, යාසුතුනම්; යාස්‍යසි, යන්නෙහි; අත්‍ර, මෙහි; තෙ, තාගේ; ආශඞ්කයා, ආශඞ්කාවෙන්; අලම්, පමණි

136 ඉත්‍යනුඥාමුඛෙනෛව කාන්තස්‍යාක්‍ෂිප්‍යතෙගතිඃ
මරණංසූචයන්ත්‍යෛව සොනුඥාක්‍ෂෙපඋච්‍යතෙ.

මරණම්, මරණය; සූචයන්ත්‍යාඑව, ප්‍රකාශකරන්නීය විසින්ම; ඉති, මෙසේ, අනුඥාමුඛෙනඑව, අනුඥාමුඛයෙන්ම; කාන්තස්‍ය, වල්ලභයාගේ; ගතිම්, ගමන; ආක්‍ෂිප්‍යතෙ, වළකනුලැබේ; සඃ, එය; අනුඥාක්‍ෂෙපඃ, අනුඥාක්‍ෂෙපනම්.

137 ධනඤ්චබහුලභ්‍යංතෙ සුඛංක්‍ෂෙමඤ්චවර්ත්මනි
නචමෙප්‍රාණසන්දෙහ ස්තථාපිප්‍රියමාස්මගාඃ.

ප්‍රිය, එම්බා වල්ලභය; තෙ, තාගේ (විදෙශගමනයෙහි); බහුධන ලාභ, බොහෝ ධනයද; ලභ්‍යම්, ලැබියයුතුය; සුඛවසැපද; ලභ්‍යම්, යි සම්බන්ධයි; වර්ත්මනි, මාර්ගයෙහි; ක්ෂෙමඛ, නිර්භයදවේ; මෙ, මාගේ; ප්‍රාණසන්දෙහඃච, ජීවිතශඞ්කාවක්ද; න, නැත; තථාපි, එතකුදුළවත්; මාසම් ගාඃ, නොයව.

138 ඉත්‍යාවක්ෂණයාහෙතුත් ප්‍රියයාත්‍රානුබන්ධිනඃ
ප්‍රභුත්වෙනෛවරුඬසතත් ප්‍රභුත්වාක්ෂෙපඋච්‍යතෙ.

ඉති, මෙසේ; ප්‍රියයාත්‍රානුබන්ධිනඃ, වල්ලභයාගේ ගමන් පොෂකවූ; හෙතුත්, කාරණයත්; ආචක්ෂාණයා, කිහිනයකරන්නිය විසින් ප්‍රභුත්වෙනඑව, ප්‍රභුත්වයෙන්ම; රුඬඃ, වල්ලභයා වළක්වනලද්දේය; තත්, එහෙයින්; ප්‍රභුත්වාක්ෂෙපඃ, මේ ප්‍රභුත්වාක්ෂෙපයයි, උච්‍යතෙ, කියනුලැබේ.

139 ජීවිතාශාබලවතී ධනාශාදුර්බලාමම
ගච්ඡවාතිෂ්ඨවාකාන්ත ස්වවස්ථාතුනිවෙදිතා.

කාන්ත, වල්ලභය; මම, මාගේ; ජීවිතාශා, ජීවත්විමෙහි ආශාව. බලවතී, බලවත්ය; ධනාශා, ධනයෙහි ආශාව; දුර්බලා, දුර්බලය; ගච්ඡවා, යන්නේහෝවේවා; තිෂ්ඨවා, සිටින්නේහෝ වේවා; ස්වාවස්ථාතු, ස්වකිය අවස්ථාව; නිවෙදිතා, (මා විසින්) දන්වනලදුයි.

140 අසාවනාදරාක්ෂෙපො යදනාදරවද්වචඃ
ප්‍රියප්‍රායාණංරුන්ධත්‍යා ප්‍රයුක්තාම්හරක්තයා.

ඉහ, මේ අනන්තරොක්ත පද්‍යයෙහි; රක්තයා, ඇලුනාවූ; ප්‍රිය ප්‍රයාණංරුන්ධත්‍යා, වල්ලභයාගේ; ගමන් වළකන්නියක් විසින්; ප්‍රයුක්තම්, යොදනලද; වචඃ, වචනය; යත්, යම්හෙයකින්; අනාදරවත්, අනාදර වචනයක් බඳුද; එහෙයින්; අසෞ, මෙය; අනාදරාක්ෂෙපඃ, අනාදරාක්ෂෙපනම්වේ.

141 ගච්ඡගච්ඡසිචේත්කාන්ත පන්ථානඃසන්තු තෙශිවාඃ
මමාපිජන්මතත්‍රෛවභූයාද් යත්‍රගතොභවාන්.

කාන්ත, වල්ලභය; චෙත්, ඉදින්; ගච්ඡසි, යන්නෙහිනම්; ගච්ඡ, යව; තෙ, තට; පන්ථානඃ, මාර්ගයෝ; ශිවාඃසන්තු, උපද්‍රවරහිතවූවාහු වෙත්වා; භවාත්, භවත්තෙමේ; යත්‍ර, යම්තැනෙක්හි; ගතඃ, ගියේද; මම අපි, මාගේද; ජන්ම, උත්පත්තිය; තත්‍රඑව, එහිම; භූයාත්, වේවා

142 ඉත්‍යාශීර්වචනාක්ෂෙපො යදාශීර්වාදවර්ත්මනා
ස්වාවස්ථාංසූචයන්ත්‍යෙව කාන්තයාත්‍රානිෂිධ්‍යතෙ.

ඉති, මෙසේ; යත්, යම්හෙයකින්; ආශීර්වාදවර්ත්මනා, ආශිර්වාදරීතියෙන්; ස්වාවස්ථාම්, ස්වකීය අවස්ථාව; සූචයන්ත්‍යා, ප්‍රකාශකරන්නියක් විසින්; කාන්තයාත්‍රාඑව, වල්ලභයාගේ විදෙශගමනයම; නිෂිධ්‍යතෙ, වළකනුලැබේද; එහෙයින්; ආශිර්වචනාක්ෂෙපඃ, මේ ආශිර්වචනාක්ෂෙපනම.

143 යදිසත්‍යෛවයාත්‍රාතෙ කාප්‍යන්‍යාමෘග්‍යතාංත්වයා
අහමද්‍යෛවරුද්ධාස්මි රන්ධ්‍රාපෙක්‍ෂෙණමෘත්‍යුනා.

යදි, ඉදින්; තෙ, තාගේ; යාත්‍රා, විදෙශගමනය; සත්‍යම්, සැබෑ නම්; ත්වයා, තා විසින්; අන්‍යාකාපි, අන්කිසි ප්‍රියාවක්; මෘග්‍යතාම්, සොයනු ලැබේවා; අද්‍යෛව, අදම; අහම්, මම; රන්ධ්‍රාපෙක්‍ෂෙණ, සිදුරු බලන්නාවූ; මෘත්‍යුනා, මරහු විසින්; රුද්ධා, ආක්‍රාන්තාවිමි.

144 ඉත්‍යෙෂපරුෂාක්‍ෂෙපඃ පරුෂාක්‍ෂරපූර්වකම්
කාන්තස්‍යාක්‍ෂිප්‍යතෙයස්මාත් ප්‍රස්ථානංප්‍රෙමනිඝ්නයා.

ඉති, මෙසේ; ප්‍රෙමනිඝ්නයා, ප්‍රෙමයට වසඟවූ ස්ත්‍රියක් විසින්; යස්මාත්, යම්හෙයකින්; පරුෂාක්‍ෂර පූර්වකම්, පරුෂාක්‍ෂරපූර්වකව; කාන්තස්‍ය, වල්ලභයාගේ; ප්‍රස්ථානම්, විදෙශගමනය; ආක්‍ෂිප්‍යතෙ, වළකනු ලැබේද; එහෙයින්; එෂඃ, මෙය; පරුෂාක්‍ෂෙපඃ, පරුෂාක්‍ෂෙප නම්වේ.

145 ගන්තාචෙත්ගච්ඡතූර්ණංතෙ කර්ණෞයාන්තිපුරාරවාඃ
ආර්තබන්ධුමුඛොද්ගීර්ණාඃ ප්‍රයාණපරිපන්ථිනඃ.

චෙත්, ඉදින්; ගන්තා, ගමනශීලිනම්; තූර්ණම්, වහා; ගච්ඡ, යව; ආර්ත, පීඩිතවූ; බන්ධු, නෑයන්ගේ; මුඛොද්ගීර්ණාඃ, මුඛයෙන් නැගුනාවූ; ප්‍රයාණපරිපන්ථිනඃ, තාගේ විදෙශගමනයට සතුරුවූ; රවාඃ, ශබ්දයෝ; පුරා, පළමුකොට; තෙකර්ණෞ, තාගේ කන් දෙකට; යාන්ති, පැමිණෙන්නාහ.

146 සාචිව්‍යාක්‍ෂෙපඑවෛෂයදත්‍ර ප්‍රතිෂිධ්‍යතෙ
ප්‍රියප්‍රයාණංසාචිව්‍යං කුර්වත්‍යෛවානුරක්තයා.

යත්, යම්හෙයකින්; අත්‍ර, මෙහි සාචිව්‍යංකුර්වත්‍යාඑව, සහායබව කරන්නාමවූ; අනුරක්තයා, ඇලුනියකවිසින්; ප්‍රියප්‍රයාණම්, වල්ලභයාගේ විදෙශගමනය; ප්‍රතිෂිධ්‍යතෙ, වළකනුලැබේද; එහෙයින්, එෂඃ, මෙය; සාචිව්‍යාක්‍ෂෙපඃ එව, සාචිව්‍යාක්‍ෂෙපමැයි.

147 ගච්ඡෙතිවක්තුමිච්ඡාමි ත්වත්ප්‍රියංමත්ප්‍රියෛෂිණී
නිර්ගච්ඡතිමුඛාද්වාණී මාගාඉතිකරොමිකිම්

ත්වත්ප්‍රියම්, ඔබට ප්‍රියවූ; ගච්ඡඉති, යවයියන වචනය; වක්තුම්, කියන්ට; ඉච්ඡාමි, කැමතිවෙමි; මත්ප්‍රියෛෂිණී, මටප්‍රියබැව් සොයන්නාවූ; මාගාඉති, නොයවයන, වාණී, වචනය; මුඛාත්, මුඛයෙන්; නිර්ගච්ඡති, නික්මේ.

148 යත්නාක්‍ෂෙපඃසයත්නස්‍ය කෘතස්‍යානිෂ්ටවස්තුනි
විපරීතඵලොත්පත්තෙ රානර්ථක්‍යොපදර්ශනාත්.

අනිෂ්ටවස්තුනි, අනිෂ්ටවස්තුයෙහි; කෘතස්‍ය, කරණලද; යත්නස්‍ය, යත්නයාගේ; විපරීතඵලොත්පත්තෙඃ, විපරීතවූ ඵලොත්පත්තියෙන්; අනර්ථක්‍යොපදර්ශනාත්, නිරර්ථකබව දැක්වූහෙයින්; සඃ, ඒ ආක්‍ෂෙපාලඞ්කාරය; යත්නාක්‍ෂෙපඃ, යත්නාක්‍ෂෙප නම්වේ; මෙහි

තමහට අනිෂ්ටවූ යවයිකීම පිණිස කරණලද උත්සාහයාගේ නොයවයන විපරීත ඵලඉපදීමෙන් නිරර්ථකවූ බැව් ප්‍රකාශකිරීමෙන් ස්වාමියාගේ විදෙශගමන වළකනුලැබේනුයි මේ යත්නාක්ෂෙපනම්විය.

149 ක්ෂණංදර්ශන විඝ්නාය පක්ෂ්මස්පන්දාය කුප්‍යතඃ
ප්‍රෙමනඃ ප්‍රයාණං ත්වං බ්‍රෑහිමයා තස්‍යෙෂ්ටමිෂ්‍යතෙ.

ක්ෂණම්, ක්ෂණයක්; දර්ශනවිඝ්නාය, දර්ශනය වළකන්නාවූ; පක්ෂ්මස්පන්දාය, ඇසිපියසෙලවීමට; කුප්‍යතඃ, කිපෙන්නාවූ; ප්‍රෙමනඃ, ප්‍රෙමයට; ත්වම්, තෝ; ප්‍රයාණම්, තාගේ විදෙශගමනය; බ්‍රෑහි, කියව තස්‍ය, ඒ ප්‍රෙමයට, ඉෂ්ටම්, අභිමතවූවක්; මයා, මාවිසින්; ඉෂ්‍යතෙ, කැමතිවනු ලැබේ.

150 සොයංපරවශාක්ෂෙපො යත්ප්‍රෙමපරතන්ත්‍රයා
තයානිෂිධ්‍යතෙයාත්‍රා න්‍යන්‍යාර්ථස්‍යොපදර්ශනාත්.

යත්, යම්හෙයකින්; ප්‍රෙමපරතන්ත්‍රයා, ප්‍රෙමපරවශවූ; තයා, ඇවිසින්; අන්‍යාර්ථස්‍ය, අන්‍යාර්ථයක්හුගේ; උපදර්ශනාත්, දක්වීමෙන්; යාත්‍රා, වල්ලභයාගේ ගමන; නිෂිධ්‍යතෙ, වළකනුලැබේද; ඉති, එහෙයින්; සඃඅයම්, ඒමේආක්ෂෙපය; පරවශාක්ෂෙපඃ, පරවශාක්ෂෙපනම්වේ

151 සහිෂ්‍යෙවිරහංනාථ දෙහ්‍යදෘශ්‍යාඤ්ජනංයථා
යදක්තනෙත්‍රාංකන්දර්පඃ ප්‍රහර්තාමාංනපශ්‍යති.

නාථ, ස්වාමිනි; විරහම්, ඔබගේ විරහය; සහිෂ්‍යෙ, ඉවසන්නෙමි; යථා, යම්පරිද්දකින්; යදක්තනෙත්‍රාම්, යමකින් අඳනාලදනෙත්‍රඇති; මාම්, මා; කන්දර්පඃ, අනඞ්ගතෙම; ප්‍රහර්තුම්, පහරදෙන්ට; නපශ්‍යති, නොදකීද; (තථා, එබඳුවූ;) අදෘශ්‍යාඤ්ජනම්, අදෘශ්‍යාඤ්ජනයක්; දෙහි, දුනමැනව; ප්‍රහර්තා යන පාඨයෙහි එය කන්දර්පඃ යන්නට විශෙෂණයි

152 දුෂ්කරංජීවනොපාය මුපන්‍යස්‍යොපරුධ්‍යතෙ
පත්‍යුඃප්‍රස්ථානමිත්‍යාහු රුපායාක්ෂෙපමීදෘශම්.

දුෂ්කරම්, දුෂ්කරවූ; ජීවනොපායම්, ජීවනොපායක්; උපන්‍යස්‍ය, උපන්‍යාසකොට; පත්‍යුඃ, වල්ලභයාගේ; ප්‍රස්ථානම්, විදෙශයාත්‍රාව; උපරුධ්‍යතෙඉති, වළකනුලැබේනුයි; ඊදෘශම්, මෙබඳුවූයේ; උපායාක්ෂෙපම්, උපායාක්ෂෙපයයි; ආහුඃ, කියති

153 ප්‍රවෘත්තෛවප්‍රයාමීති වාණීවල්ලභතෙමුඛාත්
අයතාපිත්වයෙදානීං මන්දප්‍රෙමනාමමසත්කිම්.

වල්ලභ, වල්ලභය; තෙමුඛාත්, තාගේ මුඛයෙන්; ප්‍රයාමීති, යමියි යන; වාණී, වාක්තොමෝ; ප්‍රවෘත්තාඑව, පැවැත්තාමය; ඉදානීම්, දැන්; අයතාඅපි, නොයන්නාවූද; මන්දප්‍රෙමනා, මඳවූ ප්‍රෙමඇති; ත්වයා, තාගෙන්; මම, මට; කිම්අසත්, කවර ප්‍රයොජනයක් ඇද්ද?

154 රොෂාක්ෂෙපොයමුද්‍රික්ත ස්නෙහනිර්යන්ත්‍රිතාත්මනා.
සංරබ්ධයාප්‍රියාරබ්ධ ප්‍රයාණංයන්නිෂිධ්‍යතෙ.

උද්‍රික්ත, ඉතිරෙන්නාවූ; සොහග, සොහගයෙන්; නිර්යන්ත්‍රිත, ආක්‍රාන්තවූ; ආත්මනා, සිත්ඇති; සංරබ්ධයා, කිපුනියක විසින්; යත්, යම්හෙයකින්; ප්‍රියාරබ්ධප්‍රයාණම්, වල්ලභයා විසින් ආරබ්ධවූ විදෙශගමනය; නිෂිධ්‍යතෙ, වළකනු ලැබේද; එහෙයින්; අයම්, මේ; රොෂාක්ෂෙපඃ, රොෂාක්ෂෙප නම්.

155 මුග්ධාකාන්තස්‍යයාත්‍රොක්ති ශ්‍රවණාදෙවමූර්ඡිතා
බුද්ධ්වාවක්ති ප්‍රියංදෘෂ්ට්වා කිංචිරෙණාගතොභවාන්.

මුග්ධා, බොලඳවූ ස්ත්‍රියක්; කාන්තස්‍ය, වල්ලභයාගේ; යාත්‍රොක්ති, විදෙශයාත්‍රා සම්බන්ධවචනය; ශ්‍රවණාත්එව, ඇසීමෙන්ම; මූර්ඡිතා, මූර්ඡාවූවා; බුද්ධ්වා, (නැවත) සිහිලැබ; ප්‍රියම්, වල්ලභයා; දෘෂ්ට්වා, දැක; කිං, කිමෙක්; භවාන්, භවත්තෙමේ; චිරෙණ, බොහෝ කල්යවා; ආගතඃ, ආයේයයි; වක්ති, කියයි.

156 ඉත්‍යතත්කාලසම්භූත මූර්ඡයාක්ෂිප්‍යතෙගතිඃ
කාන්තස්‍යකාතරාක්ෂ්‍යාය න්මූර්ඡාක්ෂෙපඃසඊදෘශඃ.

ඉති, මෙසේ; තත්කාලසම්භූතමූර්ඡයා, එකල හටගත් මූර්ඡා ඇති; කාතරාක්ෂ්‍යා, බැගෑවූ ඇස්ඇති ස්ත්‍රියක් විසින්; යත්, යම්හෙයකින්; කාන්තස්‍ය, වල්ලභයාගේ; ගතිඃ, ගමන; ආක්ෂිප්‍යතෙ, වළකනු ලැබේද; එහෙයින්; ඊදෘශඃ, මෙබඳුවූ; සඃ, ඒ ආක්ෂෙපය; මූර්ච්ඡාක්ෂෙපඃ, මූර්ච්ඡාක්ෂෙප නම්වේ.

157 නාඝ්‍රාතංනකෘතං කර්ණෙස්ත්‍රීභිර්මධුනිනාර්පිතම්
ත්වද්විෂාංදීර්ඝිකාස්වෙව විශීර්ණංනීලමුත්පලම්.

ත්වත්, තාගේ; විෂාම්, සතුරන්ගේ; ස්ත්‍රීභිඃ, ස්ත්‍රීන් විසින්; නීලමුත්පලම්, නිලොත්පලය; නාඝ්‍රාතම්, නොහිඹිනාලද්දේය; කර්ණෙ, කණියෙහිද; නකෘතම්, නොකරණලදී; මධුනි, පුෂ්පරසයෙහි හෙවත් මද්‍යයෙහි; නඅර්පිතම්, නොතබනලදී; (වැලි, කුමක්චීදයත්) දීර්ඝිකාසුඑව, ගෙදිහුවිල්හිම; විශීර්ණම්, විශීර්ණවිය; වැටීපරවීගියේයිසේයි මෙහිරාජවිෂයකථවතියි.

158 අසාවනුක්‍රොශාක්ෂෙපඃ සානුක්‍රොශමිවොත්පලෙ
ව්‍යාවර්ත්‍යකර්මතද්‍යොග්‍යං ශොච්‍යාවස්ථොපදර්ශනාත්.

උත්පලෙ, උත්පලයෙහි; සානුක්‍රොශම්ඉව, කරුණාසහිතවමෙන්; තත්යොග්‍යම්, ඊටයොග්‍යවූ; කර්ම, ක්‍රියාව; ව්‍යාවර්ත්‍ය, වළකා; ශොච්‍යාවස්ථොපදර්ශනාත්, ශොකකටයුතු අවස්ථා ප්‍රදර්ශනයෙන්; අසෞ, මේ ආක්ෂෙපය; අනුක්‍රොශාක්ෂෙපඃ, අනුක්‍රොශාක්ෂෙප නම්.

159 අමෘතාත්මනිපද්මානාං වෙෂ්ටරිසන්ධිතාරකෙ
මුඛෙන්දෞනවසත්‍යස්මි න්‍යපරෙණකිමින්දුනා.

අමෘතාත්මනි, අමෘතය ස්වභාවකොටඇති; නොහොත් අමෘතමයවූ; පද්මානාම්වෙෂ්ටරි, පද්මසදෘශවූ; නොහොත් සංකොචනාව යෙන් පද්මශත්‍රුවූ; සන්ධිතාරකෙ, සන්ධිවූචක්ෂුස් කනිනිකාඇති;

නොහොත් සහිතවූ තාරකාඇති; තව, තීගේ; අස්මින්මුඛෙන්දෞ, මේ මුඛනැමති චන්ද්‍රයා; සති, විද්‍යමානකල්හි; පරේණඉන්දුනා, අන්‍ය චන්ද්‍රයක්හුගෙන්; කිම්, ප්‍රයෝජන කිම්ද.

160 ඉතිමුඛෙන්දුරාක්ෂිප්තො ගුණාන්ගෞණෙන්දුවර්තිනඃ
තත්සමාන්දර්ශයිත්වෙහ ශ්ලිෂ්ටාක්ෂෙපස්තථාවිධඃ.

තත්සමාන්, ඊට සදෘශවූ; ගෞණෙන්දුවර්තිනඃ, ගෞණවූමුඛනැමති චන්ද්‍රයාකෙරෙහි පවත්නාවූ; ගුණාන්, ගුණයන්; දර්ශයිත්වා, දක්වා; ඉහ, මෙහිදී; ඉති, මෙසේ; මුඛෙන්දුඃ, මුඛචන්ද්‍රයා; ආක්ෂිප්තඃ, චලිතකලද්දේය; තථාවිධඃ, එබඳුවූයේ; ශ්ලිෂ්ටාක්ෂෙපඃ, ශ්ලිෂ්ටාක්ෂෙප නම්වේ.

161 අර්ථොනසම්භෘතඃකශ්චිත් නවිද්‍යාකාචිදර්ජිතා
නතපඃසඤ්චිතං කිඤ්චිද් ගතඤ්චසකලංවයඃ.

කශ්චිත්අර්ථඃ, කිසිධනයක්; නසම්භෘතඃ, රැස්නොකරණලද්දේය; කශ්චිත්විද්‍යා, කිසි විද්‍යාවක්; නඅර්ජිතා, රැස්නොකරණලද්දීය; කිඤ්චිත්තපඃ, කිසිතපසක්; නසඤ්චිතම්, රැස්නොකරණලද්දේය; සකලංවයඃ, සියලු වයස; ගතඃ, ගියේය.

162 අසාවනුශයාක්ෂෙපොයස්මාදනුශයොත්තරම්
අර්ථාර්ජනාදෙර්ව්‍යාවෘත්තිර්දර්ශිතෙහගතායුෂා.

එවම්, මෙසේ; ගතායුෂා, ගතවූ වයස්ඇත්තාහු විසින්; යස්මාත්, යම්හෙයකින්; අර්ථාර්ජනාදෙඃ, ධන රැස්කිරීම් ආදියගේ; ව්‍යාවෘත්තිඃ, නිෂෙධය; අනුශයොත්තරම්, පශ්චාත්තාප බහුලව; ඉහ, මෙහි; දර්ශිතා, දක්වනලද්දීද; එහෙයින්; අසෞ, මෙය; අනුශයාක්ෂෙපඃ, අනුශයාක්ෂෙප නම්වේ.

163 කිමයංශරදම්භොදඃ කිංවාහංසකදම්බකං
රුතංනූපුරසංවාදි ශ්‍රූයතෙතන්නතොයදඃ.

අයංකිං, මේ කිමෙක්ද; ශරදම්භොදඃ, සරාවලාවෙක්දෝහෝ; කිංවාහංසකදම්බකං, කිමෙක්ද හංසසමූහයෙක්දෝහෝ; නූපුරසංවාදි, නූපුරධ්වනිසදෘශවූ; රුතම්, නාදයක්; ශ්‍රූයතෙ, අසනුලැබෙයි; තත්, එහෙයින්; තොයදඃන, මෙඝයෙක් නොවෙයි; හංසසමූහයකැයිසේයි.

164 ඉත්‍යයංශංසයාක්ෂෙපඃ ශංසයොයංනිවර්ත්‍යතෙ
ධර්මෙණහංසසුලභෙ නාස්පෘෂ්ටඝනජාතිනා

අස්පෘෂ්ටඝනජාතිනා, සපර්ශනොකරණලද මෙඝජාතිඇති; හංසසුලභෙන, හංසයන්කෙරෙහි සුලභවූ; ධර්මෙණ, නූපුරනාදබඳුවූ නාද සංඛ්‍යාත ධර්මයෙන්; යත්, යම්හෙයකින්; අයංශංසයඃ, මේ සැකය නිවර්ත්‍යතෙ, නවතනුලැබේද; එහෙයින්; ඉති, මෙබඳුවූ; අයම්, මෙය ශංසයාක්ෂෙපඃ, ශංසයාක්ෂෙප නමි.

165 චිත්‍රමාක්‍රාන්තවිශ්වොපි වික්‍රමස්තෙනශාම්‍යති
කදාවාදෘශ්‍යතෙතෘප්ති රුදීර්ණස්‍යහවිර්භුජඃ.

අක්‍රාන්තවිශ්වඃඅප්, මඩනාලද සියලු ලෝඇත්තේද; තෙ, තාගේ වික්‍රමඃ, වික්‍රමය; නශාම්‍යති, නොසංසිඳෙයි; චිත්‍රම්, මේ අද්භූතයි; වා, නොහොත්; උදීර්ණස්‍ය, නැංගාවූ; හවිර්භුජඃ, වහ්නියගේ; තෘප්තිඃ, තෘප්තියෙක්; කදා, කවරකලක; දෘශ්‍යතෙ, දක්නා ලැබේද.

166 අයමර්ථාන්තරාක්ෂෙපඃ ප්‍රක්‍රාන්තො යන්නිවර්ත්‍යතෙ
විස්මයොර්ථාන්තරස්‍යෙහ දර්ශිතාත්තත්සධර්මණඃ.

තත්සධර්මණඃ, ඊට සමානධර්මවූ අර්ථාන්තරස්‍ය (වහ්නියගේ තෘප්ති අභාවරූපවූ) අර්ථාන්තරයාගේ; දර්ශිතාත්, දක්වීමෙන්; ඉහ, මෙහි; ප්‍රක්‍රාන්තඃ විෂ්මයඃ, ප්‍රස්තුතවූ විස්මය; යත්, යම්හෙයකින්; නිවර්ත්‍යතෙ, වලකනු ලැබේද; එහෙයින්; අයම්, මේ; අර්ථාන්තරාක්ෂෙපඃ, අර්ථාන්තරාක්ෂෙපනම්වේ.

167 නස්තූයසෙනරෙන්ද්‍රත්වං දදාසීතිකදාචන
ස්වමෙවමත්වාගෘහ්ණන්ති යතස්ත්වද්ධනමර්ථිනඃ.

නරෙන්ද්‍ර, නරෙන්ද්‍රය; ත්වම්, නුඹවහන්සේ; දදාසීති, යාචකයන්ට; වස්තුදෙන්නෙහියයි; කදාචන, කිසිකලෙකත්; නස්තූයසෙ, ස්තුතිකරණු නොලබන්නෙහිය; යතඃ, යම්හෙයකින්; ත්වද්ධනම්; ඔබගේ ධනය; අර්ථිනඃ, යාචකයෝ; ස්වංඑවමත්වා, තමාගේම ධනයයි සිතා; ගෘහ්ණන්ති, ගණිත්ද; එහෙයිනි; මෙයින් රජහුගේ අධිකදාන ශීලිභාවය සූචිතයි.

168 ඉත්‍යෙවමාදිරාක්ෂෙපො හෙත්වාක්ෂෙපඃ ඉතිස්මෘතඃ
අනයෛවදිශාන්‍යොපි විකල්පඃශක්‍යඌහිතුම්.

ඉති, මෙබඳුවූ; එවමාදි, මේ ආදිවූ; ආක්ෂෙපඃ, ආක්ෂෙපය; හෙත්වාක්ෂෙපඃඉති, හෙත්වාක්ෂෙපයයි; ස්මෘතඃ, දන්නාලදී. මෙහි ස්වමෙවමත්වාගෘහ්ණන්තියි හෙතුප්‍රදර්ශනයෙන් රාජස්තුතිය ආක්ෂිප්තයි. එහෙයින් මේ හෙත්වාක්ෂෙපනම්විය. අනයාඑවදිශා, මේ රීතියෙන්ම අන්‍යඃඅපිවිකල්පඃ, අන්‍යවූත්ආක්ෂෙපභෙදය; ඌහිතුම්, කල්පනා කරන්ට; ශක්‍යඃ, හැකිවේ.

**ඉතිආක්ෂෙප චක්‍රම්, උක්තස්වරූපවූයේ ආක්ෂෙපචක්‍රයයි.**

169 ඥෙයඃසොර්ථාන්තරන්‍යාසො වස්තුප්‍රස්තුත්‍යකිඤ්චන
තත්සාධනසමර්ථස්‍යන්‍යාසො යොන්‍යස්‍යවස්තුනඃ.

කිඤ්චනවස්තු, කිසිවස්තුවක්; ප්‍රස්තුත්‍ය, උපන්‍යාසකොට හෙවත් පලමුකොට දක්වා; තත්සාධනසමර්ථස්‍ය, තත්සාධනයෙහි සමර්ථවූ; අන්‍යස්‍යවස්තුනඃ, අනික් වස්තුවක්හුගේ; යඃ න්‍යාසඃ, යම් පිහිටුවීමෙක් හෙවත් ගෙනහැරදක්වීමෙක් ඇද්ද; සඃ, එය; අර්ථාන්තරන්‍යාසඃ, අර්ථාන්තරන්‍යාසයයි; ඥෙයඃ, දතයුතුයි.

170 විශ්වව්‍යාපිවිශෙෂස්ථඃ ශ්ලෙෂාවිද්ධොවිරොධවාන්
අයුක්තකාරියුක්තාත්මා යුක්තායුක්තොවිපර්‍ය්‍යයඃ.

විශ්වව්‍යාපී, විශ්වව්‍යාපිය; විශෙෂසථඃ, විශෙෂසථය; ශ්ලෙෂාවිඬං, ශ්ලෙෂාවිඬය; විරොධවාන්, විරොධවත්ය; අයුක්තකාරී, අයුක්තකාරිය; යුක්තාත්මා, යුක්තාත්මවත්ය; යුක්තායුක්තඃ, යුක්තායුක්තය; විපයඊයඃ, යුක්තායුක්ත විපයඊසය.

171 ඉත්‍යෙවමාදයොභෙදඃ ප්‍රයොගෙෂ්වස්‍යලක්ෂිතාඃ.
උදාහරණමාලෛෂාං රූපව්‍යක්ත්‍යෛනිදර්ශ්‍යතෙ.

ඉති, මෙසේ; එවමාදයඃ, මේ ආදිවූ; අස්‍ය, මේ අර්ථාන්තරන්‍යාසයාගේ; භෙදඃ, භෙදයෝ; ප්‍රයොගෙෂු, ප්‍රයොගයන්හි; ලක්ෂිතාඃ, දන්නාලද්දූහ; එෂාම්, මොවුන් සම්බන්ධවූ; උදාහරණමාලා, උදාහරණමාලාතොමෝ; රූපව්‍යක්ත්‍යෛ, රූපයන් ස්ඵුටකිරීමෙහිලා; නිදර්ශ්‍යතෙ, දක්වනුලැබේ; රූපව්‍යක්තෙර්නිදශ්‍යතෙ, යන පාඨයෙහි; රූපව්‍යක්තෙඃ, රූපව්‍යක්තිය පිණිස යනු අර්ථයි.

172 භගවන්තෞ ජගන්නෙත්‍රෙ සූය්‍යාචන්ද්‍රමසාවපි
පශ්‍යගච්ඡත එවාස්තං නියතිඃ කෙනලඞ්ඝ්‍යතෙ.

භගවන්තෞ, ෂඩ්ඓශ්වය්‍යාශාලිවූ; ජගන්නෙත්‍රෙ, ලෝවැස් සත්ව නෙත්‍ර බඳුවූ.සූය්‍යාචන්ද්‍රමසෞ අපි, හිරුසඳුදෙදෙනාද; අස්තම්, අස්තයට; ගච්ඡත එව, යත්නේමය; නියතිඃ, නියමය; කෙන, කවරක්හු විසින්; ලඞ්ඝ්‍යතෙ, උල්ලඞ්ඝනය කරනුලැබේද; මෙහි බ්‍රහ්මයා ආදිවූ පණුවන් අන්තකොට ඇති සියල්ලෝව නියමය ඉක්මවාලියනොහෙත්නාහුයයි ප්‍රකාශකිරීමෙන් සතරවනපාදය විශ්වව්‍යාපිවූයේය; එබැවින් මේ අර්ථාන්තරන්‍යාසය විශ්වව්‍යාපිනමැයි දතයුතුයි.

173 පයොමුචඃපරිතාපං හරන්ත්‍යෙවශරීරිණාම්
නන්වාත්මලාභොමහතාං පරදුඃඛොපශාන්තයෙ.

පයොමුචඃ, මෙඝයෝ; ශරීරිණාම්, ශරීරීන්ගේ; පරිතාපම්, තාපය; හරන්තිඑව, දුරුකෙරෙත්මය; මහතාම්, මහතුන්ගේ; ආත්මලාභඃ, ආත්මලාභය; පරදුඃඛොපශාන්තයෙනනු, අනුන්ගේ දුක්සංසිඳවනු පිණිස නොවේද. මෙහි කියනලද රීතිය මහතුන්ට මුත් අන්‍යසත්ව නොවන හෙයින් මේ විශෙෂසථවූ අර්ථාන්තරන්‍යාසයි.

174 උත්පාදයතිලොකස්‍ය ප්‍රීතිංමලයමාරුතඃ
නනුදක්ෂිණ්‍ය සම්පන්නඃ සර්ව්‍යස්‍යභවතිප්‍රියඃ.

දක්ෂිණ්‍යසම්පන්නඃ, දකුණුදිගින් ආවාවූ; මලයමාරුතඃ, මලයමාරුතය; ලොකස්‍ය, ලොකයාහට; ප්‍රීතිම්, ප්‍රීතිය; උත්පාදයති, උපදවයි; දක්ෂිණ්‍යසම්පන්නඃ, උදාරගුණයෙන් යුක්තවූයේ; සර්ව්‍යස්‍ය, හැමදෙනාහට; ප්‍රියඃනනු, ප්‍රියනොවේද? මෙහි අපරාර්ථය ශ්ලෙෂච්ඡලයෙන් පූර්වාර්ථය සමර්ථනය කළහෙයින් ශ්ලෙෂාවිඬනම් අර්ථාන්තරන්‍යාසයවේ. මෙහි ශ්ලෙෂනම් දක්ෂිණ්‍ය සම්පන්නඃ යන පදයයි.

175 ජගදානන්දයත්‍යෙෂ මලිනොපිනිශාකරඃ
අනුගෘහ්ණාතිහිපරං සදොෂොපිද්විජෙශ්වරඃ.

එෂඃ නිශාකරඃ, මේ චන්ද්‍රයා; මලිනඃඅපි, කිලිටිවූයේද; ජගත්, ලොකය; ආනන්දයති, සතුටුකරයි; හි, එසේමැයි; විජෙශ්වරඃ, බ්‍රාහ්ම ණොත්තමතෙම; සදෙෂඃ අපි, දෙෂ සහිතවූයේද; පරාන්, අනුන්ට; අනුගෘහණාති, අනුග්‍රහකෙරේ; මේ විරොධවදර්ථාන්තර න්‍යාසයි. මේ සදෙෂත්ව අනුග්‍රහොපකාරකත්වයන විරුඬ ධර්ම්මවයකින් යුක්තයි.

176 මධුපානකලාත් කණ්ඨාන්නිර්ගතොප්‍යලිනාංධ්වනිඃ
කටුර්භවති කර්ණස්‍යකාමිනාංපාපම්දෘශම්

මධුපානකලාත්, මීබීමෙන් මධුරවූ; කණ්ඨාත්, බොටුවෙන්; නිර්ගතඃ, නික්මුනාවූ; අලිනාම්, භෘඞගයන්ගේ; ධ්වනිඃඅපි, රාවයද; කාමිනාම්, කාමීන්ගේ; කර්ණස්‍ය, කණට; කටුර්භවති, කටුකවෙයි; පාපම්, පාපය; ඊදෘශම්, මෙබඳුයි. මෙහි මධුරවූද භෘඞගධ්වනියගේ කටුත්වසම්පාදනයෙන් මේ අයුක්තකාරිනම් අර්ථාන්තරන්‍යාසයි.

177 අයංමමදහත්‍යඞග මම්භොජදලසංස්තරඃ
හුතාශනප්‍රතිනිධිර්දාහාත්මා නනුජ්‍යතෙ

අයම්, මේ; අම්භොජදලසංස්තරඃ, පියුම්පෙති ඇතිරිය; මම, මාගේ; අඞගම්, ශරීරය; දහති, දවයි; හුතාශනප්‍රතිනිධිඃ, වහ්නිසදෘශ වූයේ; දාහාත්මා, දාහස්වභාව ඇත්තේ; නනුයුජ්‍යතෙ, යෙදෙන්නේ නොවේද,. මෙහි වහ්නිත්වයෙන් පද්මපත්‍රයන්ගේද දාහස්වභාව සම ර්ථනය කොළේනුයි යුක්තාත්මත්නම් අර්ථාන්තරන්‍යාසයි.

178 ක්ෂිණොතුකාමංශිතාංශුඃ කිංවසන්තොනදුනොතිමාම්
මලිනාචරිතංකර්ම සුරභෙර්නන්වසාම්ප්‍රතම්

ශිතාංශුඃ, චන්ද්‍රතෙම; මාම්, මා; කාමම්, කැමති පරිද්දෙන්, ක්ෂිණොතු, හිංසාකෙරේවා; චන්ද්‍රයාකැලැල් ඇත්තක්හු බැවින් පරපීඩනය යුතුය යනුභාවයි; වසන්තඃ, වසන්තකාලය; කිම්, කවරහෙයකින්; මාම්, මා; දුනොති තවයිද; මලිනාචරිතම්, මලිනයක්හුවිසින් කරණලද; කර්ම, කර්මය; සුරභෙඃ, වසන්තයහට; අසාම්ප්‍රතංනනු, අයුක්තනොවේද? මෙහි උක්තාර්ථයාගේ අපකර්මකරණයෙන් අයුක්තතාද මලිනයාගේ අපකර්ම කරණයෙන් යුක්තතාද ඇතිවූහෙයින් මේ යුක්තායුක්ත අර්ථාන්තරන්‍යාසයි.

179 කුමුදාන්‍යපිදාහාය කිමයංකමලාකරඃ
නහීන්දුගෘහ්‍යෙෂ්‍වුග්‍රෙෂු සූර්‍ය්‍යගෘහ්‍යොමෘදුර්භවෙත්

කුමුදානිපි, කුමුදයෝද; දාහාය, දාහපිණිසවෙති; අයංකමලාකරඃ, මේ පද්මාකරය, කිං, කිමෙක් දාහපිණිස නොවේද; ඉන්දුගෘහ්‍යෙෂු, චන්ද්‍රපාක්ෂිකයන්; උග්‍රෙෂු, උග්‍රවනකල; සූර්‍ය්‍යගෘහ්‍යඃ, සූර්‍ය්‍යපාක්ෂිකවූ; කමලාකරය; නහිමෘදුර්භවෙත්, මෘදුනොවෙයි. මෙහි කුමුදයන්ගේ තාපකරත්වස අයුක්තය මෙසේ ඇතිකල පද්මයන්ගේ තාපකරත්වය කියනු කිම්දයි ප්‍රකාශකරණයෙන්; මේ විපර්‍ය්‍යාශනම් අර්ථාන්තර න්‍යාසයි.

**ඉත්‍යර්ථාන්තරන්‍යාස චක්‍රම්, මේ අර්ථාන්තරන්‍යාස චක්‍රයයි.**

180 ශබ්දොපාත්තෙප්‍රතීතෙවා සාදෘශ්‍යෙවස්තුනොර්ද්වයොඃ
තත්‍රයද්භෙදකථනං ව්‍යතිරෙකඃසකථ්‍යතෙ

ද්වයොඃවස්තුනොඃ, උපමාඋපමෙය සංඛ්‍යාතවස්තූන් දෙදෙනක් හුගේ; සාදෘශ්‍යෙ, සාදෘශ්‍යබව; ශබ්දොපාත්තෙ, ශබ්දයෙන් ගත්කල්හී හෝ; හෙවත් සාධාරණ ධර්මප්‍රතිපාදකශබ්ද ප්‍රයොගයෙන් අවබොධ කළකල්හී හෝ; ප්‍රතීතෙවා, හැඟවීමක් ඇතිකල්හිහෝ; තත්‍ර, එහි, යද්භෙදකථනම්, යම්භෙදකථනයක්වේද; සඃ, එය; ව්‍යතිරෙකඃ, ව්‍යතිරෙකයයි; කථ්‍යතෙ, කියනු ලැබේ.

181 ධෛර්‍ය්‍යලාවණ්‍යගාම්භීර්‍ය්‍ය ප්‍රමුඛෛස්ත්වමුදන්වතඃ
ගුණෛස්තුල්‍යොසිභෙදස්තු වපුෂෛවෙදෘශෙනතෙ

ධෛර්‍ය්‍ය. ධෛර්‍ය්‍යය; නොහොත් වෙරළ නොඉක්මවන බවය; ලාවණ්‍ය, රූපසෞන්දර්‍ය්‍යය නොහොත් ලුණුරසඇති බවය; ගාම්භීර්‍ය්‍ය දුරවගාහස්වභාවය; නොහොත් ගැඹුරුබවය යන මේ; ප්‍රමුඛෛඃ, ප්‍රමුඛකොටඇති; ගුණෛඃ, ගුණයෙන්; ත්වම්, තෝ; උදන්වතඃ, සාගරයට; තුල්‍යඃ, සදෘශයි; භෙදස්තු, භෙදය වනාහි; තෙ, තාගේ; ඊදෘශෙන, මෙබඳුවූ, වපුෂාඑව, ශරීරයෙන්මය.

182 ඉත්‍යෙකව්‍යතිරෙකොයං ධර්මෙණෛකත්‍රවර්ත්තිනා
ප්‍රතීතිවිෂයප්‍රාප්තෙර්භෙදස්‍යොභයවර්ත්තිනඃ

ඉති, මෙසේ; එකත්‍රවර්ත්තිනා, එක්තැනෙක පවත්නා; හෙවත් උපමෙයයෙහි පවත්නා; ධර්මෙණ, ගුණයෙන්; උභයවර්ත්තිනඃ, උපමෙය උපමානදෙදෙනා කෙරෙහි පවත්නා; භෙදස්‍ය, භෙදයාගේ; ප්‍රතීතිවිෂය ප්‍රාප්තෙඃ, ප්‍රතීතිවිෂය පැමිණිහෙයින්; හෙවත් හැඟිම පැමිණිහෙයින්; අයම්, මේ එකව්‍යතිරෙකඃ, එකව්‍යතිරෙක නම්වේ. එකක් කෙරෙහි පිහිටි ගුණයෙන් උපමෙය උපමාන දෙදෙනාගේම භෙදයහැඟවූ හෙයිනැයිසේයි.

183 අභින්නවෙලෞ ගම්භීරාවම්බුරාශිර්භවානපි
අසාවඤ්ජනසඞ්කාශ ස්ත්වන්තුචාමීකරද්‍යුතිඃ.

අම්බුරාශිඃ, සාගරයද; භවාන්අපි, භවත්තෙමේද යන දෙදෙන අභින්නවෙලෞ, නොඉක්මවනලද වෙරළිඇත්තාහුය; ගම්භීරෞ, ගම්භීරයහ; අසෞ. මේ සාගරයතෙම; අඤ්ජනසඞ්කාශඃ, අඳුන්හා සදෘශය; ත්වන්තු, තෝ වනාහි; චාමීකරද්‍යුතිඃ, ස්වර්ණයට බඳුවූ කාන්ති ඇත්තේය.

184 උභයව්‍යතිරෙකොය මුභයොර්භෙදකෞගුණෞ
කාෂ්ණ්‍යංපිශඞ්ගතාචොභෞ යත්පෘථග්දර්ශිතාවිහ.

ඉහ, මෙහි; භෙදකෞ, භෙදකරවූ; කාෂ්ණ්‍යම්, කළුබවය; පිශඞ්ගතාච, පිඟුවන්බවද යන; උභෞගුණෞ, ගුනයෝ දෙදෙන; යත්, යම්හෙයකින්; පෘථක්, වෙන වෙනම; දර්ශිතෞ, දක්වනලද්දාහුද; එහෙයින්; අයම්, මේ; උභයව්‍යතිරෙකඃ, උභයව්‍යතිරෙකනම්වේ.

185 ත්වංසමුද්‍රශ්චදුර්වාරෞ මහාසත්වෞසතේජසෞ
අයනතුයුවයොර්භේදඃ සජඩාත්මාපටුර්භවාන්.

ත්වම්, තෝද; සමුද්‍රශ්ච, සමුද්‍රයද; දුර්වාරෞ, දුර්වාරයහ; නෘපපක්ෂයෙහි සතුරන් විසින් නොවැළැක්විය හැක්කේය; සමුද්‍රපක්ෂයෙහි නොවැළැක්වියහැකි රළවෙග ඇත්තේය යනු භාවයි; මහාසත්වෞ, මහාසත්වයන් ඇත්තාහ; නෘපපක්ෂයෙහි අධිකවූ සත්වගුණඇත්තේය සාගරපක්ෂයෙහි මහත්වූ ජලජන්තූන් ඇත්තේය යනු භාවයි. සතේජසෞ, තෙජස් සහිතයහ; නෘපපක්ෂයේහි ප්‍රතාපගුණ සහිතය සමුද්‍රපක්ෂයෙහි වඩබාග්නි ඇත්තේය යනු භාවයි. අයනතු, මේ වනාහි යුවයොර්භේදඃ, ඔබ දෙදෙනාගේ විශෙෂයවෙයි. සඃ, ඒ සමුද්‍රය; ජඩාත්මා, ජඩවූ සවභාව ඇත්තේය, භවාන්, භවත්තෙමේ; පටුඃ, නිපුණය.

186 සඑෂශ්ලෙෂරූපත්වාත් සශ්ලෙෂඉතිගෘහ්‍යතාම්
සාක්ෂේපශ්චසහෙතුශ්ච දර්ශ්‍යතෙතදපිද්වයම්.

සඃ එෂඃ, එමේ ව්‍යතිරෙකය; ශ්ලෙෂරූපත්වාත්, ශ්ලෙෂරූපඇති හෙයින්; සශ්ලෙෂඃඉති, සශ්ලෙෂයයි; ගෘහ්‍යතාම්, ගන්නා ලැබේවා; සාක්ෂේපශ්ච, සාක්ෂේපයද; සහෙතුශ්ච, සහෙතුද යන; තදපිද්වයම්, ඒ ව්‍යතිරෙක දෙකද; දර්ශ්‍යතෙ, දක්වනු ලැබේ.

187 ස්ථිතිමානපිධීරොපි රත්නානාමාකරොපිසන්
තවකක්ෂාංනයාත්‍යෙව මලිනොමකරාලයඃ.

ස්ථිතිමාන්අපි, අනතික්‍රාන්තමර්‍යාදා ඇත්තේද; ධීරඃඅපි, ධීරවූයේද; රත්නානාම්, රත්නයන්ට; ආකරඃ අපිසන්, ආකරවූයේද; මකරාලයඃ, සාගරය; මලිනඃ, මලිනවූයේ; තවකක්ෂාම්, තාගේ කක්ෂයට; නයාතිඑව, නොයේමය; මේසාක්ෂේප ව්‍යතිරෙකයට උදාහරණයි. මෙය තවකක්ෂාංනයාත්‍යෙව යන ආක්ෂේපය කරණකොටගෙණ සාක්ෂේපව්‍යතිරෙක නම්විය.

188 වහන්නපිමහීංකෘත්ස්නාං සශෛලද්වීපසාගරාම්
භර්තෘභාවාත්භුජඞ්ගානාං ශෙෂඃත්වත්තොනිකෘෂ්‍යතෙ.

සශෛලද්වීපසාගරාම්, පර්වත ද්වීපසාගර සහිතවූ; කෘත්ස්නාම්, සියලු; මහිම්, පෘථිවිය; වහන්නපි, උසුලන්නේද; ශෙෂඃ, අනන්තනෙමේ; භුජඞ්ගානාම්, න ගයන්ගේ; භර්තෘභාවාත්, ස්වාමිහෙයින්; ත්වත්තඃ, තා කෙරෙන්; නිකෘෂ්‍යතෙ, ඉවත්කරනුලැබේ; මේ හෙතුව්‍යතිරෙකයට උදාහරණයි. මේ භර්තෘභාවාත් භුජඞ්ගානාම් යන හෙතුප්‍රදර්ශනයෙන් සහෙතුව්‍යතිරෙක නම්වේ.

189 ශබ්දොපාදානසාදෘශ්‍ය ව්‍යතිරෙකොයමීදෘශඃ
ප්‍රතීයමානසාදෘශ්‍යො ප්‍යස්තිසොප්‍යභිධීයතෙ

අයම්, මේ; ශබ්දොපාදානසාදෘශ්‍ය, ශබ්දප්‍රයොගයෙන් ගන්නාලද සදෘශබව ඇති; ව්‍යතිරෙකඃ, ව්‍යතිරෙකය; ඊදෘශඃ, මේ උක්තප්‍රකාරවේ; ප්‍රතීයමානසාදෘශ්‍යඃඅපි හැඟෙනුලැබෙන සදෘශබැව් ඇති ව්‍යතිරෙකයකුදු; අස්ති, ඇත; සඃඅපි, එයද; අභිධීයතෙ, කියනුලැබේ

190 ත්වන්මුඛං කමලඤ්චෙති ද්වයොරප්‍යනයොර්භිදා
කමලංජලසංරොහි ත්වන්මුඛංත්වදුපාශ්‍රයම්

ත්වන්මුඛම්, තීගේ මුහුණය; කමලඤ්චෙති, පද්මයද යන; අනයොඃද්වයොඃඅපි, මේදෙදෙනාගේද; භිදා, විශෙෂයවේ; කමලම්, පද්මය; ජලසංරොහි, ජලයෙහි හටගත්තේය; ත්වන්මුඛම්, තීගේමුඛය; ත්වදුපාශ්‍රයම්, තී ආශ්‍රයකොට ඇත්තේය; මෙහි සාධාරණ ගුණයක් නොයෙදූයේනමුදු මුඛකමලදෙදෙනාගේ සාම්‍යය ලොකප්‍රසිද්ධ වශයෙන් හැඟේනුයි මේ ප්‍රතීයමාන ව්‍යතිරෙකනම්වේ.

191 අභ්‍රූවිලාසමස්පෘෂ්ටමදරාගං මෘගෙක්ෂණම්
ඉදන්තු නයනද්වන්ද්වං තවතද්ගුණභූෂිතම්.

මෘගෙක්ෂණම්, මෘගනෙත්‍රය; අභ්‍රූවිලාසම්, භ්‍රූවිලාස රහිතය; අස්පෘෂ්ට, ස්පර්ශනොකරණලද; මදරාගම්, මද්‍යපානජනිතවූ රත්පැහැ ඇත්තේය; තව, තීගේ; ඉදන්තු නයනද්වන්ද්වම්, මේ නෙත්‍රවය; තද්ගුණභූෂිතම්, ඒ ගුණයන්ගෙන් හෙබියේය. මෙහි උපමානවූ මෘගනෙත්‍රයන්ගේද උපමෙයවූ ස්ත්‍රිනෙත්‍රයන්ගේද විරුද්ධ ස්වභාව දක්වනලදී. නුමුත් ප්‍රතීයමාන සදෘශ්‍යය ඇත්තේමය. එහෙයින් මේද ප්‍රතීයමාන ව්‍යතිරෙකයි.

192 පූර්වස්මින්භෙදමාත්‍රොක්ති රස්මින්නාධික්‍යදර්ශනම්
සදෘශව්‍යතිරෙකශ්ච පුනරන්‍යඃප්‍රදර්ශ්‍යතෙ.

පූර්වස්මින්, පූර්වඋදාහරණයෙහි; භෙදමාත්‍රොක්තිඃ, භෙදමාත්‍රයක් හුගේ කථනයයි; අස්මින්, අනන්තරොක්ත උදාහරණයෙහි; ආධික්‍ය දර්ශනම්, නිකෘෂ්ටොත්කර්ෂරූපවූ අධිකත්වයාගේ දැක්වීමයි; පුනඃ, නැවත; අන්‍යඃ, අන්‍යවූ; සදෘශව්‍යතිරෙකශ්ච, සදෘශව්‍යතිරෙකයකුද; ප්‍රදර්ශ්‍යතෙ, දක්වනු ලැබේ.

193 ත්වන්මුඛංපුණ්ඩරීකඤ්ච ඵුල්ලෙසුරභිගන්ධිනී
භ්‍රමද්භ්‍රමරමම්භොජං ලොලනෙත්‍රංමුඛන්තුතෙ.

ත්වන්මුඛම්, තීගේමුඛයද; පුණ්ඩරීකඤ්ච, හෙළපියුමද; ඵුල්ලෙ, ප්‍රබුද්ධයහ; සුරභිගන්ධිනී, ඉෂ්ටවූ ගන්ධඇත්තාහු; අම්භොජම්, පද්මය; භ්‍රමද්භ්‍රමරම්, බමන්නාවූ භෘඞ්ගයන් ඇත්තේය; තෙ, තීගේ; මුඛන්තු මුඛයවනාහි; ලොලනෙත්‍රම්, චඤ්චලවූ නෙත්‍රඇත්තේය; මුඛයෙහි ප්‍රබුද්ධත්වයනම් සිනහවෙන් ශොභිත බවය. මෙහි පුල්ලත්වසුරභිගන්ධත්වයන්ගේ මුඛපුණ්ඩරීක දෙදෙනාහට සාධාරණ බැවින් ශබ්දයන් සම්බන්ධවූ සදෘශබවයි. බමනබමරුන් ඇතිබවත් චඤ්චලවූ ඇස්ඇතිබවත් සාධාරණ නුවූයේද උන්ගේද සාම්‍යත්වය ලොක ප්‍රසිද්ධවශයෙන් හැඟෙනහෙයින් අවිරුද්ධනුයි. මේද ශබ්දසම්බන්ධවූ සදෘශව්‍යතිරෙකනම්වේ.

194 චන්ද්‍රොයමම්බරොත්තංසො හංසොයංතොයභූෂණම්
නභොනක්ෂත්‍රමාලිද මුත්ඵුල්ලකුමුදංපයඃ

අයංචන්ද්‍රඃ, මේ චන්ද්‍රතෙම; අම්බරොත්තංසඃ, ආකාශයට ශෙඛරවෙයි; අයංහංසඃ, මේ හංසතෙම; තොයභූෂණම්, ජලයට ආභරණයි; ඉදංනභඃ, මේ ආකාශය; නක්ෂත්‍රමාලී, නක්ෂත්‍රමාලා ඇත්තේය; පයඃ, ජලය; උත්ඵුල්ලකුමුදම්, පිපිගියාවූ කෛරවඇත්තේය; මෙහි චන්ද්‍රහංස දෙදෙනාගේද; ආකාශජල දෙදෙනාගේද යන උපමාන උපමෙය දෙදෙනාගේ අවිවශයෙන් සදෘශබවවේ. එබැවින් මම් අර්ථගතවූ සාදෘශ්‍යව්‍යතිරෙකයි.

195 ප්‍රතීයමානශෞක්ල්‍යාදිසාම්‍යයොඃ චන්ද්‍රහංසයොඃ
කෘතඃප්‍රතීතශුද්ධ්‍යාශ්ච භෙදොස්මින් වියදම්භසොඃ.

අස්මින්, මේ අනන්තරොක්ත උදාහරණයෙහි; ප්‍රතීයමාන, හැඟෙනු ලබන්නාවූ; ශෞක්ල්‍යා දිසාම්‍යයොඃ, ශුභ්‍රත්වාදි සදෘශබැව්ඇති; චන්ද්‍රහංසයොඃ, චන්ද්‍රහංස දෙදෙනාගේද; ප්‍රතීතශුද්ධ්‍යොඃ, හැඟෙන්නාවූ ශුද්ධිඇති; වියදම්භසොඃ, ආකාශජල දෙදෙනාගේද; භෙදඃ, භෙදය; කෘතඃ, කරණලදී.

196 පූර්වත්‍රශබ්දවත්සාම්‍ය මුභයත්‍රාපිභෙදකම්
භෘඞ්ගනෙත්‍රාදිතුල්‍යංතත් සදෘශව්‍යතිරෙකතා

පූර්වත්‍ර, පූර්වඋදාහරණයෙහි හෙවත් ත්වන්මුඛංපුණ්ඩරීකම යනාදි උදාහරණයෙහි; උභයත්‍රාපි, දෙතන්හිම; ශබ්දවත්, වාචක ශබ්දඇති; සාම්‍යම්, සමානබව; භෙදකම්, භෙදකයි; භෘඞ්ගනෙත්‍රාදි, භෘඞ්ගනෙත්‍රාදිය; තුල්‍යම්, සදෘශයි; තත්, එහෙයින්; සදෘශ ව්‍යතිරෙකතා, පූර්වඋදාහරණයාගේ; ශබ්දගතවූ සදෘශව්‍යතිරෙකතායි.

197 අරත්නාලොකසංහාය්‍ය මවාය්‍යංසූය්‍යරශ්මිභිඃ
දෘෂ්ටිරොධකරංයූනාං යෞවනප්‍රභවංතමඃ

යූනාම්, තරුණයන්ගේ; දෘෂ්ටිරොධකරඃ, ඥානදෘෂ්ටි ආවරණය කරන්නාවූ; යෞවන ප්‍රභවම්, යොවුන් බැවින් හටගත්; තමඃ, මොහනැමති අන්ධකාරය; අරත්නාලොක සංහාය්‍යම්, රත්නාලොකයෙන් නොනැසිය හැක්ක; සූය්‍යරශ්මිභිඃ, හිරුරැසින්, අවාය්‍යම්, නොවැළැක්වියහැක්ක.

198 සජාතිව්‍යතිරෙකොයං තමොජාතෙරිදංතමඃ
දෘෂ්ටිරොධිතයාතුල්‍යං භින්නමන්‍යෛරදර්ශියත්

යත්, යම්හෙයකින්; දෘෂ්ටිරොධිතයා, දෘෂ්ටිරොධිත්වයෙන්; තුල්‍යම්, (අන්ධකාරයට) තුල්‍යවූ; ඉදං තමඃ, මොහාන්ධකාරරූපවූ මේ අන්ධකාරය; අන්‍යෛඃ, අන්‍යවූ; (රත්නාලොකයෙන් නොවැළැක්විය සුතුබැව් ආදි සාධාරණ) ධර්මයන් කරණකොටගෙණ; තමොජාතෙඃ, අන්ධකාරජාතියෙන්; භින්නම්, භින්නවූයේ; අදර්ශි, දක්වනලදද; (එහෙයින්) අයම්, මෙය; සජාත්ව්‍යතිරෙකඃ, සජාතිව්‍යතිරෙකනම්වේ.

**ව්‍යතිරෙක චක්‍රම්-ව්‍යතිරෙක චක්‍රයයි.**

199 ප්‍රසිද්ධහෙතුව්‍යාවෘත්ත්‍යා යත්කිඤ්චිත්කාරණාන්තරම්
යත්‍රස්වාභාවිකත්වංවා විභාව්‍යංසාවිභාවනා

යත්‍ර, යම් වෛචිත්‍ර්‍යකථනයෙක්හි; ප්‍රසිද්ධහෙතු ව්‍යාවෘත්ත්‍යා, ප්‍රසිද්ධ හෙතූහුගේ වැළැක්වීමෙන්; යත්කිඤ්චිත්, යම්කිසි; කාරණාන්තරම්වා, අනික් කාරණයක් හෝ; හෙවත් ප්‍රසිද්ධ හෙතුවෙන් අන්‍යවූ කාරණයක්හෝ; ස්වාභාවිකත්වංවා, ස්වභාවිකත්වයෙක් හෝ; විභාව්‍යම්, ප්‍රකාශ කටයුතුවූයේනම්; සා, ඕතොමෝ; විභාවනා, විභාවනා නම්වේ.

200 අපීතක්ෂීවකාදම්බ මසංමෘෂ්ටාමලාම්බරම්
අප්‍රසාදිතශුද්ධාම්බු ජගදාසීන්මනොහරම්.

අපීත, මධුපානය නොකළාවූ; ක්ෂීව, මත්වූ; කාදම්බම්, කලහංස යන් ඇති; අසංමෘෂ්ට, ශුද්ධනොකළාවූ; අමල, නිර්මලවූ; අම්බරම්, ආකාශඇති; අප්‍රසාදිත, ප්‍රසාදනය නොකළාවූ; ශුද්ධාම්බු, පිරිසිදුජල යඇති; ජගත්, ලොකය; මනොහරං ආසීත්, මනොඥවී. මෙහි මත් වීමට කාරණවූ පාණයාගේද නිර්මලත්වයට කාරණවූ පරිශුද්ධකරණයා ගේද ජලශුද්ධියට කාරණවූ කතකාදිකෘත ප්‍රසාදනයාගේද අභාවයෙහිත් ඒ ඒ ඵලයන්ගේ ඉපැදුමඇති ශරත්කාලරූපවූ අනික් කාරණයක් ප්‍රකාශවේනුයි. මේ කාරණාන්තර විභාවනා නම්වේ.

201 අනඤ්ජිතාශිතා දෘෂ්ටිර්භ්‍රූරනාවර්ජිතානතා
අරඤ්ජිතොරුණශ්චාය මධරස්තවසුන්දරි.

සුන්දරී, සුන්දරිය; තව, තීගේ; දෘෂ්ටිඃ, දෘෂ්ටිතොමෝ; අනඤ්ජිතා අඤ්ජිතනොවූවා; අසිතා, කළුවූවාය; භ්‍රූ, භ්‍රෑතොමෝ; අනාවර්ජිතා, නොනැමූවා; නතා, වක්‍රය; අයම් අධරශ්ච, මේඅධරයද; අනඤ්ජිතඃ, අඤ්ජනය නොකරණලද්දේ; අරුණඃ, රක්තවර්ණය.

202 යදපීතාදිජන්‍යංස්‍යාත් ක්ෂීවත්වාද්‍යන්‍යහෙතුජම්
අහෙතුකත්වංතස්‍යෙහ විවක්ෂිතාවිරුද්ධතා.

යත්, යම්හෙයකින්; අපීතාදිජන්‍යම්, මධුපානයනොකිරීම් ආදියෙන් ජන්‍යවූ; ක්ෂීවත්වාදි, මත්තභාවාදිය; අන්‍යහෙතුජංස්‍යාත්, ශරත්කාලස්වරූපවූ කාරණාන්තරජන්‍යවෙයි; (දෙවෙනි උදහරණයෙහි) අහෙතුකත්ව, (අශිතත්වාදිය) අහෙතුකය හෙවත් ස්වාභාවිකය; ඉහ, මේ උදහරණවයෙහි; තස්‍ය, ඔහුගේ; (අන්‍යහෙතුජත්වයාගේද, අහෙතුකයාගේද;) විවක්ෂා, කියපිබව සම්බන්ධවූ; අවිරුද්ධතා, අවිරුද්ධබවයි; යටකී උදහරණවයම අභිගතවිභාවනාවට උදහරණයි.

203 වක්ත්‍රංනිසර්ගසුරභි වපුරව්‍යාජසුන්දරම්
අකාරණරිපුශ්චන්ද්‍රො නිර්නිමිත්තාසුහෘත්ස්මරඃ.

වක්ත්‍රම්, මුහුණ; නිසර්ගසුරභි, ස්වභාවයෙන් සුගන්ධය; වපුඃ, ශරීරය; අව්‍යාජසුන්දරම්, ස්වභාව සුන්දරය; චන්ද්‍රඃ චන්ද්‍රතෙමේ; අකාරණ රිපුඃ, අකාරණශත්‍රුය; ස්මරඃ, අනඞ්ගතෙම; නිර්නිමිත්තාසුහෘත්, (එසේම) අකාරණශත්‍රුය.

204 නිසර්ගාදිපදෛරත්‍ර හෙතුඃ සාක්ෂාන්නිවර්තිතඃ
උක්තඤ්චසුරභිත්වාදි ඵලංතත්සාවිභාවනා.

අත්‍ර, මෙහි; නිසර්ගාදිපදෛඃ, නිසර්ගාදි පදයන්ගෙන්; හෙතුඃ, කාරණය; සාක්ෂාත්, ප්‍රත්‍යක්ෂයෙන්; නිවර්තිතඃ, වළකනලද්දේය; සුරභිත්වාදිඵලඤ්ච, සුරභිත්වාදිඵලයද; උක්තම්, කියනලදී; තත්, එහෙයින්; සා, ඕතොමෝ; විභාවනා, විභාවනානම්වේ. මේ ශබ්දගත විභාවනාවට උදාහරණයි.

**ඉතිවිභාවනාචක්‍රම්-උක්තප්‍රකාරවූයේ විභාවනා චක්‍රයයි.**

---

205 වස්තුකිඤ්චිදභිප්‍රෙත්‍ය තත්තුල්‍යස්‍යාන්‍යවස්තුනඃ
උක්තිඃසංක්ෂෙපරූපත්වාත් සාසමාසොක්තිරිෂ්‍යතෙ.

කිඤ්චිත්වස්තු, කිසිවස්තුවක්; අභිප්‍රෙත්‍ය, කල්පනාකොට; තත් තුල්‍යස්‍ය, ඊට සමානවූ; අන්‍යස්‍යවස්තුනඃ, අන් වස්තුවක්හුගේ; උක්තිඃ, කථනයක්වේද; සා, ඕතොමෝ; සංක්ෂෙපරූපත්වාත්, සංක්ෂෙපස්වරූපකථන හෙයින්; සමාසොක්තිඃ, සමසොක්තියයි; ඉෂ්‍යතෙ, කැමතිවනු ලැබේ.

ප්‍රස්තුත අප්‍රස්තුතවූ දෙදෙනෙකු ශබ්දයෙන් ප්‍රකාශකරණකල බොහෝවූ ශබ්දවිස්තාරයෙක් ඇතිවෙයි. එය වෛචිත්‍ර්‍යාවහ නොවෙයි. අප්‍රස්තුතවස්තු මාත්‍රයක් ශබ්දයෙන් ප්‍රතිපාදනයකොට ව්‍යාජයෙන් ප්‍රස්තුතාර්ථය හඟවයිනම් එය අතිශයචමත්කාර ජනකවේ. එය සංක්ෂෙපොක්තිහෙයින් සමාසොක්ති නම්විය යනු මෙහිභාවයි.

206 පිබන්මධුයථාකාමංභ්‍රමරඃ ඵුල්ලපඞ්කජෙ
අප්‍යසන්නද්ධසෞරභ්‍යං පශ්‍යචුම්බතිකුඩ්මලම්.

භ්‍රමරඃ, භෘඞ්ගතෙම; උත්ඵුල්ලපඞ්කජෙ, පිපීගිය පද්මයෙක්හි; යථාකාමම්, කැමති පරිද්දෙන්; මධු, පුෂ්පරසය; පිබන්, පානයකරමින්; අසන්නද්ධ සෞරභ්‍යම්, හටනොගත් සුගන්ධඇති; කුඩ්මලම්අපි, පියුම් කැකුලක්ද; චුම්බති, සිඹී; පශ්‍ය, බල.

207 ඉතිප්‍රෞඪාඞ්ගනාබද්ධ රතිලීලස්‍යරාගිනඃ
කස්‍යාඤ්චිදපිබාලායා මිච්ඡාවෘත්තිර්විභාව්‍යතෙ.

ඉති, මෙසේ; ප්‍රෞඪාඞ්ගනා, පෞඪවූස්ත්‍රියක් කෙරෙහි; ආබද්ධ, බඳනාලද; රතිලීලස්‍ය, සම්භොග විලාසඇති; රාගිනඃ, රාගීපුරුෂයක්හුගේ; කස්‍යාඤ්චිදපිබාලායාම්, කිසි බාලස්ත්‍රියක් කෙරෙහිද; ඉච්ඡාවෘත්තිඃ, අභිලාෂ වෘත්තිය; විභාව්‍යතෙ, ප්‍රකාශකරනු ලැබේ.

208 විශෙෂ්‍යමාත්‍රභින්නාපි තුල්‍යාකාරවිශෙෂණා
අස්ත්‍යසාවපරාප්‍යස්ති භින්නාභින්නවිශෙෂණා.

විශෙෂ්‍යමාත්‍ර, විශෙෂ්‍යපදමාත්‍රයෙන්; භින්නාඅපි, භින්නවූද; තුල්‍යාකාර විශෙෂණා, සදෘශාකාරවූ; (වාච්‍යව්‍යඞ්ගාර්ථබොධකවූ); විශෙෂණඇති; සමාසොක්තියක්; අස්ති, ඇති; භින්නාභින්න විශෙෂණා, භින්නවූද අභින්නවූද විශෙෂණඇති; අපරාපි, අනිකුදු සමාසොක්තියක්; අස්ති, ඇති.

209 රූඪමූලඃඵලභරෛඃ පුෂ්ණන්නනිශමර්ථිනඃ
සාන්ද්‍රච්ඡායොමහාවෘක්ෂඃ සොයමාසාදිතොමයා.

රූඪමූලඃ, හටගත්තාවූ මුල්ඇති (නොහොත් සඤ්ජාත මූලධන ඇති) ඵලභරෛඃ, ඵලභාරයෙන්; අනිශම්, නිරන්තරයෙන්; අර්ථිනඃ, යාචකයන්; පුෂ්ණන්, පොෂ්‍යකරන්නාවූ; සාන්ද්‍රච්ඡායඃ, ඝනවූ ඡායා ඇති; මහාවෘක්ෂඃ, මහාවෘක්ෂයෙක්; අ[illegible], ඇති; සඃ අයම්, ඒ මේ වෘක්ෂයතෙමේ; මයා, මාවිසින්; ආසාදිතඃ, පැමිණෙනලදී. මේ තුල්‍යාකාර විශෙෂණඇති සමාසොක්තියට උදාහරණයි. වෘක්ෂපුරුෂ දෙදෙනාහටම සාධාරණවූ විශෙෂණ ඇතිහෙයිනි.

210 අනල්පවිටපාභොගඃ ඵලපුෂ්පසමෘද්ධිමාන්
සුච්ඡායඃස්ථෛර්‍යවාන්දෛවාදෙෂලබ්ධොමයාද්‍රුමඃ.

අනල්ප, බොහෝවූ; විටපාභොගඃ, ශාඛාවිස්තාරඇති; ඵලපුෂ්පසමෘද්ධිමාන්, ඵලපුෂ්ප සම්බන්ධවූ සමෘද්ධිඇති; සුච්ඡායඃ, යහපත්වූ ඡායාඇති නොහොත් ශරීරකාන්තිඇති; ස්ථෛර්‍යවාන්, වාතාදීන් අකම්ප්‍ය ස්වභාවඇති; නොහොත් අන්‍යයන් විසින්; නොසෙල්විය හැකි සාරත්වයෙන් යුක්තවූ; එෂඃ ද්‍රුමඃ, මේ වෘක්ෂය; මයා, මාවිසින්; දෛවාත්, දෛවය හෙතුකොටගෙන; ලබ්ධඃ, ලබනලදී. මේ භින්නවූද සාධාරණවූද විශෙෂණඇති සමාසොක්තියට උදාහරණයි.

211 උභයත්‍රපුමාන්කශ්චිත් වෘක්ෂත්වෙනොපවර්ණිතඃ
සර්වෙසාධාරණාධර්මාඃ පූර්වත්‍රාන්‍යත්‍රතුවයම්.

උභයත්‍ර, පද්‍යවයෙහිම; කශ්චිත් පුමාන්, කිසි පුරුෂයකු; වෘක්ෂත්වෙන, වෘක්ෂත්වයෙන්; වර්ණිතඃ, වර්ණනාකරණලද්දේය; පූර්වත්‍ර, පූර්ව පද්‍යයෙහි; සර්වෙධර්මාඃ, සියලු ගුණයෝ; සාධාරණාඃ, සාධාරණයහ; අන්‍යත්‍රතු, අනික් පද්‍යයෙහි වනාහි; වයම්, දෙකෙහි.

212 නිවෘත්තව්‍යාලසංසර්ගො නිසර්ගමධුරාශයඃ
අයමම්භොනිධිඃකෂ්ටං කාලෙනපරිශුෂ්‍යතෙ.

නිවෘත්ත, වළකනලද; ව්‍යාලසංසර්ගඃ, සර්පයන්ගේ සංසර්ගඇති; (අනිත්පක්ෂයෙහි) වළකනලද අසත්පුරුෂ සංසර්ගඇති; නිසර්ගමධුරාශයඃ, ස්වභාවයෙන් මධුරවූ ජලයට ආධාරවූ; අනිත්පක්ෂයෙහි; නිසර්ගමධුරවූ අධ්‍යාශයඇති; අයං අම්භොනිධිඃ, මේ සාගරය; කාලෙන, කලකින්; අනිත්පක්ෂයෙහි යමයා විසින්; පරිශුෂ්‍යතෙ, වියලෙනු ලැබේ; අනිත්පක්ෂයෙහි විනාශකරනුලැබේ. කෂ්ටම්, නපුරී; මෙහි සමුද්‍රයාගේ ව්‍යාලසංසර්ගත්වයද ලවණජලාශයත්වයද පූර්වධර්මයි. ඒ පූර්වධර්මවලකා තද් විපරීතවූ අව්‍යාල සංසර්ගත්ව මධුරාශයත්වයන් වාච්‍යවූ සාගරය කෙරෙහි ආරොපිතයි.

213 ඉත්‍යපූර්වසමාසොක්තිඃ පූර්වධර්මනිවර්තනාත්
සමුද්‍රෙණසමානස්‍ය පුංසොව්‍යාපත්තිසූචනාත්.

ඉති, මෙසේ; පූර්වධර්මනිවර්තනාත්, පූර්වධර්මයන් වැළකීමෙන්; සමුද්‍රෙණ, සාගරයහා, සමානස්‍ය, සමානවූ; පුංසඃ, පුරුෂයකුගේ; ව්‍යාපත්ති, ව්‍යාපාදනය හෙවත් විනාශය; සූචනාත්, ප්‍රකාශකිරීමෙන්; අපූර්වසමාසොක්තිඃ, අපූර්වසමාසොක්තිනම්වේ.

**ඉතිසමාසොක්තිචක්‍රම්-උක්තප්‍රකාරවූයේ සමාසොක්ති චක්‍රයයි.**

---

214 විවක්‍ෂායාවිශෙෂස්‍ය ලොකසීමාතිවර්තිනි
අසාවතිශයොක්තිඃ ස්‍යාදලඞ්කාරොත්තමායථා.

විශෙෂස්‍ය, ප්‍රස්තුතවස්තුගතවූ උත්කර්ෂයාගේ; ලොකසීමාතිවර්තිනි, ලොකසීමාව ඉක්ම පවත්නාවූ; හෙවත් අලෞකිකචමත්කාර යුක්තවූ; යාවිවක්‍ෂා, යම් වෛචිත්‍ර්‍යොක්තියක්වේද; අලඞ්කාරොත්තමා, අලඞ්කාරයන්ට උතුම්වූ; අසෞ, මෝතොමෝ; අතිශයොක්තිස්‍යාත්, අතිශයොක්තිනම්වේ.

215 මල්ලිකාමාලධාරිණ්‍යඃ සර්වාඞ්ගීණාර්ද්‍රචන්දනාඃ
ක්‍ෂෞමවත්‍යොනලක්‍ෂ්‍යන්තෙ ජ්‍යොත්ස්නායාමභිසාරිකා.

මල්ලිකාමාලධාරිණ්‍යා, බොලිද්දමල්මාලාදරන්නාවූ; සර්වාඞ්ගීණ; සර්වාඞ්ගව්‍යාප්තවූ; ආර්ද්‍රචන්දනාඃ, තෙත්වූ සඳුන්ඇති; ක්‍ෂෞමවත්‍යඃ, හඳනාලදශ්වෙතපටවස්ත්‍රඇති; අභිසාරිකාඃ, අභිසාරිකාවෝ, ජ්‍යොත්ස්නායාම්, චන්ද්‍රරශ්මියෙහි; නලක්‍ෂ්‍යන්තෙ, දක්නාතොලැබෙති. මෙහි වර්ණනීයත්වයෙන් චන්ද්‍රරශ්මියම ප්‍රස්තුතයි. චන්ද්‍රරශ්මියෙන් යුක්තවූ රාත්‍රියෙහි උක්තප්‍රකාර අභිසාරිකාවන්ගේ අදෘශ්‍යත්වය අසම්බන්ධනමුදු එසේකීමෙන් ප්‍රස්තුතචන්ද්‍රරශ්මිහුගේ ශ්වෙතත්වොත්කර්ෂය ප්‍රතීයමානවේනුයි. මේ අතිශයොක්තියට උදාහරණයි.

216 චන්ද්‍රාතපස්‍යබාහුල්‍ය මුක්තමුත්කර්ෂවත්තයා
සංශයාතිශයාදීනාං ව්‍යක්තෞ කිඤ්චින්නිදර්ශ්‍යතෙ.

චන්ද්‍රාතපස්‍ය, චන්ද්‍රරශ්මිහුගේ; බාහුල්‍යම්, ඝනබව; උත්කර්ෂවත්තයා, උත්කර්ෂප්‍රතිපාදනය පිණිස; උක්තම්, කියනලදී. සංශයාතිශයාදීනාම්, සංශය අතිශයාදීන්ගේ ව්‍යක්තෞ, ව්‍යක්තියෙහිලා හෙවත්ප්‍රකාශකිරීමට; කිඤ්චිත්, මදක්; නිදර්ශ්‍යතෙ, දක්වනුලැබේ.

217 ස්තනයොර්ජඝනස්‍යාපි මධ්‍යමධ්‍යංප්‍රියෙතව
අස්තිනාස්තිතිසන්දෙහො නමෙද්‍යාපිනිවර්තතෙ.

ප්‍රියෙ, සොඳුර; තව, තීගේ; ස්තනයොඃ, පයොධරයුගමයටද; ජඝනස්‍යාපි, උකුලටද; මධ්‍ය, මැද; මධ්‍යම්, මධ්‍යප්‍රදෙශය හෙවත් ඉඟ, අස්තිනාස්තිඉති, ඇද්ද නැද්ද යන; මෙ, මාගේ; සන්දෙහඃ, සැකය; අද්‍යාපි, අදදක්වාත්; නනිවර්තතෙ, නොනවතී.

218 නිර්ණේතුංශක්‍යමස්තිති මධ්‍යංතවනිතම්බිනි
අන්‍යථානොපපද්‍යෙත පයොධරභරස්ථිතිඃ.

නිතම්බිනි, නිතම්බිනිය; තව, තීගේ; මධ්‍යම්, මධ්‍යප්‍රදේශය; අස්තීති, ඇතැයි; නිර්ණේතුම්, නිර්ණයකරන්ට; ශක්‍යම්, හැක්ක; පයොධරභරස්ථිතිඃ, පයොධරභාරයාගේ ස්ථිතිය; අන්‍යථා, අන්පරිද්දකින්; නඋපපද්‍යෙත, නුපදනේය මෙහි නිරවලම්බනව පයොධරයන්ගෙ ස්ථිතිය, නොවන හෙයින් මධ්‍යප්‍රදේශය ඇතැයි නිර්ණය කිරීම අසම්බන්ධනමුදු එසේ කීමෙන් මධ්‍යයාගේ ඉතාම සිහින් බැව් නිර්ණයවේ. එබැවින් මේ නිර්ණයාතිශයොක්තිනමි.

219 අහොවිශාලංභූපාලභුවනත්‍රිතයොදරම්
මාතිමාතුමශක්‍යොපි යශොරාශියදත්‍රතෙ.

භූපාල, නරේන්ද්‍රය; භුවනත්‍රිතයොදරම්, තුන්ලෝකුස, විශාලම්, විශාලය; අහො, ආශ්චර්යයි; යත්, යම්හෙයකින්; අත්‍ර, මෙහි; මාතුම්, ප්‍රමාණකරන්ට; අශක්‍යඃඅපි, නොහැකිවූද; තෙ යශොරාශිඃ, ඔබගේ යශොරාශිය; මාති, පර්‍ය්‍යාප්තභාවයටයේද, එහෙයිනි. මෙහි ආශ්‍රයවූ ත්‍රිභුවනොදරයාගේ විශාලත්ව ප්‍රතිපාදනයෙන් අශ්‍රිතවූ යශොරාශියගේ ආධික්‍යවර්ණනා ප්‍රතීතිහෙයින්, අශ්‍රයාධික්‍ය අතිශයොක්තිනම්වේ

220 අලඞ්කාරාන්තරාණාම ප්‍යෙකමාහුඃ පරායණම්
වාගීශමහිතාමුක්ති මිමාමතිශයාහ්වයාම්.

වාගීශමහිතාම්, වගීශ්වරයන් විසින් පූජිතවූ; ඉමාම්, මේ; අතිශයාහ්වයාම්, අතිශයනම්වූ; උක්තිම්, උක්තිය හෙවත් අතිශයොක්තිය; අලඞ්කාරාන්තරාණාම් අපි, අන්‍යඅලඞ්කාරයන්ටද; එකම්පරායණම්, අවිත්‍යප්‍රතිෂ්ඨායයි; ආහුඃ, කියත්.

**ඉති අතිශයොක්ති චක්‍රම්–අතිශයොක්ති චක්‍රය මෙසේයි.**

---

221 අන්‍යථෛවස්ථිතාවෘත්ති ශ්චෙතනස්‍යෙතරස්‍යවා
අන්‍යථොත්ප්‍රෙක්ෂ්‍යතෙයත්‍ර තාමුත්ප්‍රෙක්ෂාං විදුර්යථා.

චෙතනස්‍යවා, සජීවයක්හුගේ හෝ; ඉතරස්‍යවා, අනිකක්හුගේ හෝ; අන්‍යථාඑව, අන්පරිද්දකින්ම; ස්ථිතා, සිටියාවූ; වෘත්තිඃ, පැවැත්ම (ස්වභාවික පැවැත්මයයිසේයි); යත්‍ර, යම් වෛචිත්‍ර්‍ය කථනයෙක්හි; අන්‍යථා, අන්පරිද්දකින්; උත්ප්‍රෙක්ෂ්‍යතෙ, සම්භාවනාකරනු ලැබේද; තාම්, එය; උත්ප්‍රෙක්ෂාම්, උත්ප්‍රෙක්ෂායයි; විදුඃ, දනිති; යථා, ඊට උදාහරණ මෙසේයි.

222 මධ්‍යන්දිනාර්කසන්තප්තඃ සරසීංගාහතෙගජඃ
මන්‍යෙමාර්තණ්ඩගෘහ්‍යාණි පද්මාන්‍යුද්ධර්තු මුද්‍යතඃ.

මධ්‍යන්දිනාර්ක, මධ්‍යාහ්නසූර්‍ය්‍යයා විසින්; සන්තප්තඃ, තවනලද; ගජඃ, හස්තිතෙමේ, සරසීම්, විලට; ගාහතෙ, බසී; මාර්තණ්ඩගෘහ්‍යානි, සූර්‍ය්‍යපක්ෂවූ; පද්මානි, පද්මයන්; උද්ධර්තුම්,උදුරන්ට; උද්‍යතඃ, උත්සාහකරන්නේයයි; මන්‍යෙ, සිතමි. මෙහි සූර්‍ය්‍යතාපයෙන් සන්තප්තවූ හස්තීහුගේ ස්නානපානාදිය පිණිස පැවති සරොවගාහනය ශත්‍රුපක්ෂොද්ධරණත්වයෙන් උත්ප්‍රෙක්ෂිතයි. මේ චෛතන්‍යගත උත්ප්‍රෙක්ෂාවට උදාහරණයි.

223 ස්නාතුංපාතුං විසාන්‍යත්තුං සරසිංගාහතෙගජඃ
තද්වෛරනිෂ්ක්‍රියායෙති කවිනොත්ප්‍රෙක්‍ෂ්‍යවර්ණ්‍යතෙ.

ගජඃ, හස්තිතෙම; ස්නාතුං, නහන පිණිසද; පාතුම්, පැන්බොනු පිණිසද; විසානි, මෘණාලයන්; අත්තුම්, කනපිණිසද; සරසිං, විලට; ගාහතෙ, බසී; තත්, ඒ විලට බැසීම; වෛරනිෂ්ක්‍රියාය ඉති, වෛර ප්‍රතිකාර පිණිසයයි; කවිනා, කවිහු විසින්; උත්ප්‍රෙක්‍ෂ්‍ය සම්භාවනා කොට; වර්ණ්‍යතෙ, වර්ණනාකරනු ලැබේ.

224 කර්ණස්‍යභූෂණමිදං මමායතිවිරොධිනඃ
ඉතිකර්ණොත්පලංප්‍රායඃ තවදෘෂ්ට්‍යාවිලඞ්ඝ්‍යතෙ.

ඉදං, මේමානිල්මල; මම, මාගේ; ආයති, දික්විමට; විරොධිනඃ, විරොධිවූ; කර්ණස්‍ය, කර්ණයට; භූෂණම්ඉති, ආභරණයයි; තව, තීගේ; දෘෂ්ට්‍යා, චක්‍ෂුසින්; කර්ණොත්පලම්, කර්ණොත්පලයට; විලඞ්ඝ්‍යතෙ ප්‍රායඃ, ස්වකීය රශ්මිසම්පර්කයෙන් තළනුලැබේයයි සිතම්; මෙහි ප්‍රායඃ, යනු උත්ප්‍රෙක්‍ෂාබොධකයි.

225 අපාඞ්ගභාගපාතින්‍යා දෘෂ්ටෙරංශුභිරුත්පලම්
ස්පෘශ්‍යතෙවානවෙත්‍යෙවංකවිනොත්ප්‍රෙක්‍ෂ්‍යවර්ණ්‍යතෙ.

අපාඞ්ගභාග, නෙත්‍රකොටි භාගයෙහි; පාතින්‍යාඃ, හෙන්නාවූ; දෘෂ්ටෙඃ, දෘෂ්ටියගේ; අංශුභිඃ, රශ්මියෙන්; උත්පලම්, උත්පලය; ස්පෘශ්‍යතෙවා, ස්පර්ශකරණු ලබයි හෝ; නවා, නොවෙයි හෝ; එවම්, මෙසේ; කවිනා, කවිහු විසින්; උත්ප්‍රෙක්‍ෂ්‍ය, සම්භාවනාකොට; වර්ණ්‍යතෙ, වර්ණනාකරනු ලැබේ.

226 ලිම්පතීවතමොඞ්ගානි වර්ෂතීවාඤ්ජනංනභඃ
ඉතීදමපිභූයිෂ්ඨමුත්ප්‍රෙක්‍ෂා ලක්‍ෂණාන්විතම්.

තමඃ, අන්ධකාරය; අඞ්ගානි, ශරීරාවයවයන්; ලිම්පතිඉව, ආලෙපකරන්නාක් වැන්න; නභඃ, ආකාශය; අඤ්ජනම්, අඳුනක්; වර්ෂති ඉව, වසින්නාක්වැන්න; ඉති, මෙසේවූ; ඉදමපි, මේද; භූයිෂ්ඨම්, බොහෝසෙයින්; උත්ප්‍රෙක්‍ෂා ලක්‍ෂණාන්විතම්, උත්ප්‍රෙක්‍ෂා ලක්‍ෂණයෙන් යුක්තයි.

227 කෙෂාඤ්චිදුපමාභ්‍රාන්ති රිවශෘත්‍යෙහජායතෙ
නොපමානංතිඞන්තෙනෙත්‍යති ක්‍රම්‍යාප්තභාෂිතම්.

ඉහ, මේ ලිම්පතියනාදි පදයෙහි; ඉවශෘත්‍යා, ඉවශබ්දශෘතියෙන් තිඞන්තෙන, තිඞන්තයහා; න උපමානම්ඉති, උපමානැත්තේය;යන ආප්තභාෂිතම්, ආප්තවචනය; අතික්‍රම්‍ය, ඉක්මවා; කෙෂාඤ්චිත්, කිසිකෙනෙකුන්ට; හෙවත් අප්‍රාඥයන්ට; භ්‍රාන්තිඃ, භ්‍රාන්තියක්; ජායතෙ, උපදී. උපමාවෙහි වනාහි උපමානයාගේ සිද්ධත්වය ආවශ්‍යකමැයි. මෙහි වනාහි සාධ්‍යත්වයවේ. තිඞන්ත පදයෙන් ප්‍රතිපාදිතවූ ලෙපනයාගේද වර්ෂණයාගේද සාධ්‍යත්වය ඇතිහෙයින් මෙහි උපමාශඞ්කාවෙක් නැති.

228 උපමානොපමෙයත්වං තුල්‍යධර්මව්‍යපෙක්ෂයා
ලිම්පතෙස්තමසශ්චාසෞ ධර්මඃකොත්‍රසමීක්ෂ්‍යතෙ.

උපමානොපමෙයත්වම්, උපමානභාවය හා උපමෙයභාවය; තුල්‍ය ධර්මව්‍යපෙක්ෂයා, සාධාරණ ධර්මයන්ගේ ව්‍යපෙක්ෂායෙන් හෙවත් අපි රූඪත්වයෙන් වෙයි. ලිම්පතෙශ්ච, ලිම්පති යන ක්‍රියා පදයාගේද; තමසශ්ච, අන්ධකාරයාගේද; අසෞකඃ ධර්මඃ, මේ කවර සාධාරණධර්මයක්; අත්‍ර, මෙහිලා; සමීක්ෂ්‍යතෙ, දක්නාලැබේද.

229 යදිලෙපනමෙවෙෂ්ටං ලිම්පතිර්නාමකොපරඃ
සඑවධර්මොධර්මීචෙත් තදුන්මත්තෙනාපිනභාෂතෙ.

යදි, ඉදින්; ලෙපනමෙව, ලිම්පනයම; ඉෂ්ටම්, සමානධර්මත්වයෙන්; කැමතිවනලද්දේනම්; ලිම්පතිඃනාම, ලිම්පතිනම්වූ; අපරඃකඃ නාම; අනික් කවර ධර්මයක්; ධර්මඃ, ධර්මවූයේද; ධර්මීච, ධර්මායත්ත වූයේද; සඃ එවඉති, ඒ ලිම්පනයමැයි; උන්මත්තෙනාපි, උන්මත්ත යෙක්ද; නභාෂතෙ, නොකියයි.

230 කර්තායද්‍යුපමාන ස්‍යාත් න්‍යග්භූතොසෞක්‍රියාපදෙ
ස්වක්‍රියා සාධනව්‍යග්‍රො නාලමන්‍යදපෙක්ෂිතුම්.

යදි, ඉදින්; කර්තා, තිඞන්තක්‍රියාවෙන් ප්‍රතිපාද්‍යකර්තෘතෙමේ; උප මානංස්‍යාත්, උපමාව වන්නේනම්; ස්වක්‍රියාසාධනව්‍යග්‍රඃ, ස්වක්‍රියා සාධනයෙහි ව්‍යාවෘතවූයේ; ක්‍රියාපදෙ, ලිම්පතියන ක්‍රියාපදයෙහි; න්‍යග්භූතඃ, සැඟවුනාවූ; අසෞ, මේතෙමේ; අන්‍යත්, අනිකක්; අපෙ ක්ෂිතුම්, බලන්ට; නඅලම්, සමර්ථනොවේ.

231 යොලිම්පත්‍යමුනාතුල්‍යං තමඉත්‍යපිශංසතඃ
අඞ්ගානීතිනසම්බන්ධං සොපිමෘග්‍යඃසමොගුණඃ.

යඃ, යමෙක්තෙම; ලිම්පති, ලෙපනයකෙරේද; තමඃ, අන්ධකාරය, අමුනා, මොහුහා; තුල්‍යංඉතිඅපි, තුල්‍යයයිද; ශංසතඃ, කියන්නහුගේ මතයෙහි; අඞ්ගානිඉති, අඞ්ගානියන කර්මපදය; අසම්බද්ධම්, අසම්බන්ධ තයි: සඃ, ඒ: සමඃ, සාධාරණවූ; ගුණඃඅපි, ගුණයද; මෘග්‍යඃ, සෙවිය යුතුයි; එබඳක් මෙහි නැනැයිසේයි.

232 යථෙන්දුරිවතෙවක්ත්‍ර මිතිකාන්තිඃප්‍රතීයතෙ
නතථාලිම්පතෞලෙපා දන්‍යදත්‍රප්‍රතීයතෙ.

තෙ, තීගේ; වක්ත්‍රම්, මුහුණ; ඉන්දුඃ ඉව ඉති, චන්ද්‍රයාවැනිය යන මෙහි; යථා, යම්සේ කාන්තිඃ, මුඛචන්ද්‍රදෙදෙනාහට සාධාරණවූ සෞන්දර්‍ය්‍යගුණය; ප්‍රතීයතෙ, හැඟේද; අත්‍රලිම්පතෞ, මේ ලෙපනයෙහි; ලෙපාත්, ලෙපනයෙන්; අන්‍යත්, අන්‍යවූ ධර්මයක්; තථා, එසේ; න, ප්‍රතීයමානනොවේ.

233 තදුපශ්ලෙෂණාර්ථොයං ලිම්පතිර්ධ්වාන්තකර්තෘකඃ
අඞ්ගකර්මාචපුංසෙව මුත්ප්‍රෙක්ෂ්‍යතඉතීෂ්‍යතාම්.

තත්, එහෙයින්; උපශ්ලෙෂණාර්ථඃ, ව්‍යාපනාර්ථවූ; ධ්වාන්තකර්තෘ කඃ, අන්ධකාරය කර්තෘකොටඇති; අඞ්ගකර්මාච, ශරීරය කර්මකොට

ඇත්තාවූද; අයංලිම්පතීඃ, මේ ලිම්පතියන ශබ්දය; පුංසාඑව, තව්සංඛ්‍යාත පුරුෂයා විසින්: උත්ප්‍රෙක්‍ෂ්‍යතඉති, සම්භාවනාකරනු ලැබේ යයි; ඉෂ්‍යතාම්, කැමතිවනු ලැබේ.

234 මන්‍යෙශඞ්කධ්‍රුවං ප්‍රායොනූනමිත්‍යෙවමාදිභිඃ
උත්ප්‍රෙක්‍ෂාව්‍යජ්‍යතෙශබ්දෛ රිවශබ්දොපිතාදෘශඃ.

මන්‍යෙශඞ්කධ්‍රුවංප්‍රයොනූනම්ඉති, මන්‍යෙ, ශඞ්ක, ධ්‍රුවම්, ප්‍රායඃ, නූනම් යන; එවමාදිභිඃශබ්දෛඃ, මේ ආදිශබ්දයන් විසින්; උත්ප්‍රෙක්‍ෂා, සම්භාවනාව; ව්‍යජ්‍යතෙ, ප්‍රකාශකරණුලැබේ. ඉව ශබ්දඃඅපි, ඉවශබ්දයද; තාදෘශඃ, එබඳුයි.

**ඉතිඋත්ප්‍රෙක්‍ෂාචක්‍රම්, මේ උත්ප්‍රෙක්‍ෂාචක්‍රයයි.**

---

235 හෙතුශ්චසූක්‍ෂ්මලෙශෞච වාචාමුත්තමභූෂණම්
කාරකඥාපකෞහෙතු තෞචානෙකවිධෞයථා.

හෙතුශ්ච, හෙතුවද; සූක්‍ෂ්මලෙශෞච, සූක්‍ෂ්මලෙශ දෙදෙනාද යන මේ; වාචාම්, කාව්‍යයන්ට; උත්තමභූෂණම්, උත්තමාලඞ්කාරවේ; කාරකඥාපකෞ, කාරකඥාපක දෙන්නා; හෙතු, හෙතුනම්වෙත්; තෞච, ඔහු දෙදෙනද; අනෙකවිධෞ, අනෙක විධවෙති; යථා, ඒ මෙසේයි.

236 අයමාන්දොලිතප්‍රෞඪ චන්දනද්‍රුමපල්ලවඃ
උත්පාදයති සර්වස්‍යප්‍රීතිංමලයමාරුතඃ.

ආන්දොලිත, මදමදව කම්පාකරණලද; ප්‍රෞඪ (වසන්ත ඍතුවෙහි පරිණත බැවින්) ඝනවූ; චන්දනද්‍රුම, චන්දනවෘක්‍ෂයන්ගේ; පල්ලවඃ, පල්ලවඇති; මලයමාරුතඃ, මලයපවන; සර්වස්‍ය, සියල්ලහට; ප්‍රීතිම්, ප්‍රීතිය; උත්පාදයති, උපදවයි; අප්‍රෞඪයන පාඨයෙහි වසන්ත ඍතුහුගේ ප්‍රාරම්භහෙයින් අපරිනතවූ යන අර්ථයි.

237 ප්‍රීත්‍යුත්පාදනයොග්‍යස්‍ය රූපස්‍යාත්‍රොපවෘංහණම්
අලඞ්කාරතයොද්දිෂ්ටං නිවෘත්තාවපිතත්සමම්.

ප්‍රීත්‍යුත්පාදනයොග්‍යස්‍ය, ප්‍රීතිඉපදීමට යොග්‍යවූ; රූපස්‍ය, ස්වරූපයාගේ; අත්‍ර, මෙහි; උපවෘංහණම්, වෛචිත්‍ර්‍යජනකත්වයෙන් උපන්‍යාසකිරීම; අලඞ්කාරතයා, අලඞ්කාරත්වයෙන් උද්දිෂ්ටම්, විවක්‍ෂිතයි; නිවෘත්තෞඅපි, උත්පාදන ක්‍රියාවගේ අප්‍රවෘත්තියක් ඇතිකල්හිද; තත්සමම්, ඒ හා සදෘශයි.

238 චන්දනාරණ්‍යමාධූය ස්පෘෂ්ට්වාමලයනිර්ඣරාන්
පථිකානාමභාවාය පවනොයමුපස්ථිතඃ.

චන්දනාරණ්‍යම්, සඳුන්වනය; ආධූය, කම්පාකොට; (මෙයින් සෞගන්ධ්‍යයද මන්දතාද ප්‍රතිපාදිතයි); මලයනිර්ඣරාන්, මලය පර්වතයෙහි ගඟුල්හැලි, ස්පෘෂ්ට්වා, ස්පර්ශකොට; (මෙයින් ශෛත්‍යයදිපිතයි); අයම්පවනඃ, මේ මාරුතය; පථිකානාම්, මාර්ගිකයන්ගේ; අභාවාය, විනාශය පිණිස; උපස්ථිතඃ, එළඹසිටියේය.

239 අභාවසාධනායාල මෙවංභූතොහිමාරුතඃ.
විරහජ්වරසම්භූත මදනාගනාතුරෙපනෙ.

එවම්භූතොහි, මෙබඳුවූ: මාරුතඃ, දක්ෂිණ මාරුතයතෙම; විරහ ජ්වරසම්භූත, විරහජ්වරයෙන් හටගත්තාවූ; මදනාගනි, කාමගින් නෙන්; ආතුරෙ, ආතුරයා කෙරෙහි; අභාවසාධනාය, විනාශයකිරීමට; අලම්, සමර්ථයි.

240 නිර්වර්ත්‍යෙචවිකාර්‍යෙච හෙතුත්වංතදපෙක්ෂයා
ප්‍රාප්‍යෙතුකර්මණිප්‍රායඃ ක්‍රියාපෙක්ෂෛවහෙතුතා.

නිර්වර්ත්‍යෙච, නිර්වර්ත්‍යකර්මයෙහිද; විකාර්‍යෙච, විකාර්‍යකර්මයෙහිද හෙතුත්වම්, හෙතුත්වය; තදපෙක්ෂයා, ඒ කර්මාපෙක්ෂා වෙන්වෙයි; ප්‍රාප්‍යෙතුකර්මණි, ප්‍රාප්‍යකර්මයෙහි වනාහි; හෙතුතා, හෙතුභාවය; ප්‍රායඃ, බොහෝසේ; ක්‍රියාපෙක්ෂාඑව, ක්‍රියාව අපෙක්ෂාකොට ඇත්තේමය.

241 හෙතුර්නිර්වර්ත්තනියස්‍ය දර්ශිතඃ ශෙෂයොර්ද්වයොඃ
දත්වොදාහරණද්වනවං ඝටපකොවර්ණයිෂ්‍යතෙ.

නිර්වර්තනියස්‍ය, නිර්වර්ත්‍යකර්මය සම්බන්ධවූ; හෙතුඃ, හෙතුව; (අයම් ආන්දොලිතඃ යනාදි උදාහරණයෙහි); දර්ශිතඃ, දක්වනලදී; ශෙෂයොඃ, අවශිෂ්ටවූ; ද්වයොඃ, විකාර්‍යප්‍රාප්‍යයන කර්මද්වය සම්බන්ධවූ; උදාහරණම්, උදාහරණය; දත්වා, දක්වා; ඝටපකඃ, ඝටපකහෙතුව; වර්ණයිෂ්‍යතෙ, වර්ණනාකරනු ලැබේ.

242 උත්ප්‍රබාලාන්‍යරණ්‍යානි වාප්‍යඃසම්ඵුල්ලපඞ්කජාඃ
චන්ද්‍රඃපූර්ණශ්චකාමෙන පාන්ථදෘෂ්ටෙර්විෂංකෘතම්.

උත්ප්‍රබාලානි, උදගතවූ පලලවඇති; අරණ්‍යානි, වනයෝද; සම්ඵුල්ල, මොනවට පිපිගියාවූ; පඞ්කජාඃ, පියුම්ඇති; වාප්‍යඃ, වාපිහුද; පූර්ණඃ, සම්පූර්ණවූ; චන්ද්‍රශ්ච, චන්ද්‍රයාද යන මේ තුණ; පාන්ථදෘෂ්ටෙඃ, පර්කයන්ගේ ඇසට; කාමෙන, අනඞ්ගයාවිසින්; විෂංකෘතම්, විෂයක් කරණලදී. මේ විකාර්‍යහෙතුයි.

243 මානයොගත්‍යංකරෙමීති ප්‍රියස්ථානස්ථිතාංසඛිම්
බාලාභ්‍රූභඞ්ගජිහ්මාක්ෂි පශ්‍යතිස්ඵුරිතාධරා.

බාලා, බාලානොමෝ; භ්‍රූභඞ්ග, භ්‍රූභඞ්ගයෙන්; ජිහ්ම, වක්‍රවූ; අක්ෂි, ඇස්ඇත්තී; ස්ඵුරිත, වෙව්ලන්නාවූ; අධරා, අධරඇත්තී; ප්‍රියස්ථානස්ථිතාම්, වල්ලභ ස්ථානයෙහි සිටියාවූ; සඛිම්, යෙහෙළිය; මානයොගත්‍යාම්, මානාභ්‍යාෂඇත්තියක්; කරෙමිති, කරමියි; පශ්‍යති, බලා.

244 ගතොස්තමර්කොභාතීන්දුර්යාන්තිවාසායපක්ෂිණඃ
ඉතීදමපිසාධෙවව කාලාවස්ථානිවෙදනෙ.

අර්කඃ, සූර්‍යතෙම; අස්තම්, අස්තයට; ගතඃ, ගියේය; ඉන්දුඃ, චන්ද්‍රතෙම; භාති, බබලයි; පක්ෂිණඃ, පක්ෂිහු; වාසාය, වාසස්ථානයට; යාන්ති, යති; ඉති, මෙබඳුවූ; ඉදම්, මෙය; කාලාවස්ථා, කාලවිශෙෂයක් හුගේ; හෙවත් සන්ධ්‍යාකාලයාගේ; නිවෙදනෙ, නිවෙදනයෙහි; සාධු, මනායි; වෙචිත්‍ර්‍යජනකත්වයෙන් උත්කෘෂ්ටවූ උපායයිසේයි. මේ ප්‍රාප්‍යහෙතුයි.

245 අබාධ්‍යෛරින්දුපාදනාමසා ධ්‍යෛශ්චන්දනාම්භසා
දේහොෂ්මාභිඃ සුබොධංතෙ සඛිකාමාතුරංමනඃ.

සඛි, එම්බා යෙහෙලිය; ඉන්දුපාදනාම්, චන්ද්‍රරශ්මියෙන්; අබාධ්‍යෛඃ, නොනැසියහැකිවූ; චන්දනාම්භසා, සඳුන්දියෙන්; අසාධ්‍යෛඃ සිඩනොකළහැකිවූ; හෙවත් අප්‍රතිකාර්‍ය්‍යවූ; දේහොෂ්මාභිඃ, ශරීරොෂ්මයෙන්; තෙ, තීගේ; කාමාතුරම්, කාමයෙන් පීඩිතවූ; මනඃ, සිත; සුබොධම්, සුබොධයි. මේ ශබ්දගත ඥාපකහෙතුයි.

246 ඉතිලක්ෂ්‍යාඃප්‍රයොගෙෂුරම්‍යා ඥාපකහෙතවඃ
අභාවහෙතවඃකෙචිද්ව්‍යාහ්‍රියන්තෙමනොහරාඃ.

ඉති, මෙසේ රම්‍යාඃ, රම්‍යවූ; ඥාපකහෙතවඃ, ඥාපකහෙතුහු; ප්‍රයොගෙෂු, ප්‍රයොගයන්හිලා; ලක්ෂ්‍යාඃ, දතයුත්තාහ; මනොහරාඃ, සිත්කලුවූ; කෙචිත් අභාවහෙතවඃ, කිසි අභාවහෙතුකෙනෙක්; ව්‍යාහ්‍රියන්තෙ, ව්‍යවහාරකරනුලබත් ප්‍රකාශකරනුලැබෙති.

247 අනභ්‍යාසෙනවිද්‍යානාම සංසර්ගෙණධීමතාම්
අනිග්‍රහෙණචාක්ෂාණාං ජායතෙව්‍යසනංනෘණාම්.

විද්‍යානාම්, විද්‍යාවන්ගේ; අනභ්‍යාසෙන, අනභ්‍යාසයෙන්ද; ධීමතාම්, පණ්ඩිතයන්ගේ; අසංසර්ගෙණ, අසංසර්ගයෙන්ද; අක්ෂාණාම්, ඉන්ද්‍රියයන්ගේ; අනිග්‍රහෙණ, අනිග්‍රහයෙන්ද; නෘණාම්, මිනිසුන්ට; ව්‍යසනම්, ව්‍යසනය; ජායතෙ, උපදී. අභාවහෙතුව, ප්‍රාගභාවය, ධ්වංසාභාවය, අන්‍යොන්‍යාභාවය, අත්‍යන්තාභාවයයි සතර වැදෑරුම්වේ. ඔවුන් අතුරෙන් මේ ප්‍රාගභාවහෙතුයි.

248 ගතඃකාමකථොන්මාදො ගලිතොයෞවනජ්වරඃ
ගතොමොහශ්ච්‍යුතාතෘෂ්ණා කෘතංපුණ්‍යාශ්‍රමෙමනඃ.

කාමකථොන්මාදො, කාමකථාවෙන් යුක්තවූ උන්මාදය; ගතඃ, පහව්ගියේය; යෞවනජ්වරඃ, තාරුණ්‍යජ්වරය; ගලිතඃ, ගිලිහුනේය; මොහඃ, මොහය; ගතඃ, ඉක්මගියේය; තෘෂ්ණා, තෘෂ්ණාතොමෝ; ච්‍යුතා, ච්‍යුතවූවාය; පුණ්‍යාශ්‍රමෙ, පුණ්‍යාශ්‍රමයෙහි හෙවත් ප්‍රව්‍රජ්‍යාභූමියෙහි; මනඃ, චිත්තය; කෘතම්, කරණලදී. මේ ධ්වංසරූපාභාවහෙතුයි.

249 වනාන්‍යමූනිනගෘහා ණ්‍යෙතානද්‍යොනයොෂිතඃ
මෘගාඉමෙනදායාදා ස්තන්මෙනන්දතිමානසම්.

අමූනි, මොව්හු; වනානි, වනයෝයි; නගෘහාණි, ගෘහයෝ නොවෙති; එතානි, මොව්හු; නද්‍යාඃ, නදීහුයි; නයොෂිතඃ, ස්ත්‍රීහුනොවෙති; ඉමෙ, මොව්හු; මෘගාඃ, මෘගයෝයි; නදායාදාඃ දායාදයෝ නොවෙති; තත්, එහෙයින්; මෙ, මාගේ; මානසම්, සිත; නන්දති, සතුටුවේ. මේ අන්‍යොන්‍යාභාව රූපහෙතුයි.

250 අත්‍යන්තමසදාර්‍ය්‍යාණා මනාලොචිතචෙෂ්ටිතම්
අතස්තෙෂාංවිවර්ධන්තෙ සතතංසර්වසම්පදඃ.

ආයර්‍ය්‍යාණාම්, ආයර්‍ය්‍යයන්ට; අනාලොචිතචෙෂ්ටිතම්, නොබලා කරණලද ක්‍රියාවක්; අසත්, අවිද්‍යමානයි; අතඃ, මේ හෙතුවින්; තෙෂාම්, ඔවුන්ගේ: සර්‍වසම්පදඃ, සියලුසම්පත්: සතතම්, නිරන්තරයෙන්; විවර්ධන්තෙ, වැඩෙති. මේ අන්‍යත්‍රාභාවහෙතුයි.

251 උද්‍යානසහකාරාණා මනුද්භින්නාන්මඤ්ජරී
දෙයඃපථිකනාරීණාං සතිලඃසලිලාඤ්ජලිඃ.

උද්‍යානසහකාරාණාම්, උපවනවූත වෘක්‍ෂයන්ගේ; මඤ්ජරී, මඤ්ජරීතොමෝ; නඅනුද්භින්නා, උද්භින්නනුවූවානොවේ මොන්වට පිපි ගියායිසේයි; පථිකනාරීණාම්, පථිකයන්ගේ සත්‍රීන්ට හෙවත් විරහිණීන්ට; සතිලඃ, තලසහිතවූ; සලිලාඤ්ජලිඃ, දියඇඳිලියක්; දෙයඃ, දියයුතුයි. මේ අභාවාභාවහෙතුයි.

252 ප්‍රාගභාවාදිරූපස්‍ය හෙතුත්වමිහවස්තුනඃ
භාවාභාවස්වරූපස්‍ය කාර්‍ය්‍යස්‍යොත්පාදනංප්‍රති.

ඉහ, මේ උදාහරණයන්හි; භාවාභාවස්වරූපස්‍ය, භාවරූපයාගේද අභාවරූපයාගේද; කාර්‍ය්‍යස්‍ය, කාර්‍ය්‍යය; උත්පාදනංප්‍රති, ඉපදවීම පිණිස; ප්‍රාගභාවාදිරූපස්‍ය, ප්‍රාගභාවාදි රූපවූ: වස්තුනඃ, වස්තුහුගේ; හෙතුත්වම්, හෙතුභාවය; (දර්ශිතමිතිශෙෂයි) දර්ශිතම්, දක්වනලද්දේය.

253 දූරකාර්‍ය්‍යඃතත්සහජඃ කාර්‍ය්‍යානන්තරජස්තථා
අයුක්තයුක්තකාර්‍ය්‍යෞචෙ ත්‍යසංඛ්‍යාශ්චිත්‍රහෙතවඃ.

දූරකාර්‍ය්‍යඃ, දූරකාර්‍ය්‍යය; තත්සහජඃ, තත්සහජය; තථා, එසේම; කාර්‍ය්‍යානන්තරජඃ, කාර්‍ය්‍යානන්තරජය; අයුක්තයුක්තකාර්‍ය්‍යෞචඉති, අයුක්තකාර්‍ය්‍ය යුක්තකාර්‍ය්‍යදෙකදයි; චිත්‍රහෙතවඃ, චිත්‍රහෙතුහු; අසංඛ්‍යාඃ, සංඛ්‍යානැත්තාහ.

254 නෙම්ප්‍රයොගමාර්ගෙෂු ගෞණවෘත්තිව්‍යපාශ්‍රයාඃ
අත්‍යන්තසුන්දරාදෘෂ්ටා තදුදාහෘතයො යථා.

ගෞණවෘත්තිව්‍යපාශ්‍රයඃ, සාමාන්‍යවෘත්තිය විෂයකොටඇති; අත්‍යන්තසුන්දරාඃ, අත්‍යන්තසුන්දරවූ; තෙඅපි, ඒ මේ හෙතුහු; ප්‍රයොගමාර්ගෙෂු, ප්‍රයොගමාර්ගයන්හි; හෙවත් කාව්‍යරීතියෙහි; දෘෂ්ටාඃ, දක්නාලද්දාහ; තත්, ඒ සම්බන්ධවූ; උදාහෘතයඃ, උදාහරණයෝ; යථා, මේ ආකාරවේති.

255 ත්වදපාඞ්ගාහ්වයංජෛත්‍ර මනඞ්ගාස්ත්‍රංයදඞ්ගනෙ
මුක්තං තදන්‍යතස්තෙන සොප්‍යහංමනසික්‍ෂතඃ.

අඞ්ගනෙ, අඞ්ගනාව; ජෛත්‍රම්, ජයසාධනවූ; ත්වදපාඞ්ගාහ්වයම්, තිගේ නෙත්‍රාන්තනිරීක්‍ෂණනැමති; යත්තත්, යම්ඒ; අනඞ්ගාස්ත්‍රම්, අනඞ්ගශස්ත්‍රයක්; මුක්තඃ, තී විසින් හරණලද්ද; තෙන, එයින්; සඃ, ඒ ලක්‍ෂ්‍යවූ පුරුෂයාද; අහම්අපි, මමද; මනසි, සිතෙහිලා; ක්‍ෂතඃ, පහරණලද්දේය; මේදූරකාර්‍ය්‍යචිත්‍රහෙතුයි. මෙහි ලක්‍ෂ්‍යභූතපුරුෂයා විදීමසන්නිහිතකාර්‍ය්‍යයි. අස්ත්‍රයට අලක්‍ෂ්‍යපුරුෂයාගේවිදීම දූරකාර්‍ය්‍යයයි දතයුතුයි.

256 ආවිර්භවතිනාරීණාංවයඃ පය්‍ර්‍යස්තශෛශවම්
සහෛවවිවිධෛඃ පුංසාමඞ්ගජොන්මාදවිභ්‍රමෛඃ.

නාරීණාම්, ස්ත්‍රීන්ගේ; පය්‍ර්‍යස්තශෛශවම්, දුරුකරණලද බාල බවඇති; වයඃ, වයස; පුංසාම්, පුරුෂයන්ගේ; විවිධෛඃ, නානාප්‍රකාරවූ; අඞ්ගජොන්මාදවිභ්‍රමෛඃ, කාමයෙන් හටගත් උන්මාදවිභ්‍රමයන් හා; සහෛව, එක්වම; ආවිර්භවති, පහළවේ; මේ තත්සහජචිත්‍රහෙතුයි. මෙහි යෞවන ස්වරූපහෙතුව තත්කාය්‍ර්‍යවූ පුරුෂයන්ගේ කාමවිභ්‍රමය හා එක්ව; පහළවූහෙයින් මේ තත්සහජනමැයි දත යුතුයි.

257 පශ්චාත්පය්‍ර්‍යස්‍යකිරණා නුදීර්ණංචන්ද්‍රමණ්ඩලම්
ප්‍රාගෙවහරිණාක්ෂීණා මුදීර්ණොරාගසාගරඃ.

හරිණාක්ෂීණාම්, මෘගාක්ෂීන්ගේ; රාගසාගරඃ, රාගනැමති සාගරය; ප්‍රාක්එව, පළමුකොටම; උදීර්ණඃ, නැංගේය; පශ්චාත්, පසුව; කිරණාන්, රශ්මීන්; පය්‍ර්‍යස්‍ය, විසුරුවා; චන්ද්‍රමණ්ඩලම්, චන්ද්‍රමණ්ඩලය උදීර්ණම්, නැංගේය; මේ කාය්‍ර්‍යානන්තරජචිත්‍රහෙතුයි. මෙහි රාගයාගේ උද්දීපනයට හෙතුවූ චන්ද්‍රොදය සංඛ්‍යාතකාරණයාගේ පශ්චාත් භාවය හා කාය්‍ර්‍යයාගේ පූර්වප්‍රතිපාදනයෙන් සමධිකවෛචිත්‍ර්‍යාවහනය වේනුයි මෙයි චිත්‍රබවයි. මේ එහෙයින්ම කාය්‍ර්‍යානන්තරජ නම්විය.

258 රාඥංහස්තාරවින්දානි කුඩ්මලීකුරුතෙකුතඃ
දෙවත්වච්චරණද්වන්ද්ව රවිබාලාතපඃස්පෘශන්.

දෙව, දෙවයන්වහන්ස; ත්වත්, නුඹවහන්සේගේ; චරණද්වන්ද්ව, පාදද්වන්ද්වනැමති; රවි, සූය්‍ර්‍යයාගේ; බාලාතපඃ, බාලරශ්මිය; රාඥම්, රජදරුවන්ගේ; හස්තාරවින්දානි, හස්තපද්මයන්; ස්පෘශන්, ස්පර්ශකරමින්; කුතඃ, කවරහෙයකින්; කුඩ්මලීකුරුතෙ, මුකුලිතකරයිද මේ අයුක්ත කාය්‍ර්‍යයි. බාලාතපස්පර්ශයෙන් පද්මයන්ගේ ප්‍රබොධයවීම යුතුවෙයි, හැකිලීම අයුතුවෙයි; එබැවින් කාය්‍ර්‍යයාගේ අයුක්තිනුයි. මේ අයුක්ත කාය්‍ර්‍යනම්වියයි දතයුතුයි.

259 පාණිපද්මානිභූපානාං සඞ්කොචයිතුමීශතෙ
ත්වත්පාදනඛචන්ද්‍රාණා මර්චිෂඃකුන්දනිර්මලාඃ.

කුන්දනිර්මලාඃ, කොදහැන්සේ නිර්මලවූ; ත්වත්පාදනඛචන්ද්‍රාණාංමර්චිෂඃ, ඔබගේ පාදනඛනමැති චන්ද්‍රරශ්මිහු; භූපානාම්, රජුන්ගේ; පාණිපද්මානි, හස්තනැමතිපද්මයන්; සඞ්කොචයිතුම්, හකුලුවන්ට; ඊශතෙ, සමර්ථවෙති; මේ යුක්තකාය්‍ර්‍යයි. මෙහි චන්ද්‍රරශ්මිස්වරූප කාරණයාගේ පද්මසඞ්කොචනය යුක්තහෙයින් මේ යුක්තකාය්‍ර්‍ය නම්විය.

260 ඉතිහෙතුවිකල්පානාං දර්ශිතාගතිරීදෘශී

ඉති, මෙසේ; හෙතුවිකල්පානාම්, හෙතුවිකල්පයන්ගේ; ඊදෘශී, මෙබඳුවූ; ගතිඃ, ගතිය; දර්ශිතා, දක්වනලද්දීය.

**ඉතිහෙතු චක්‍රම්, හෙතුචක්‍රය මෙසේයි.**

ඉඞ්ගිතාකාරලක්ෂ්‍යොර්ථඃ සෞක්ෂ්මයාත් සූක්ෂ්මඉතිස්මෘතඃ.

ඉඞ්ගිතාකාර, ඉඞ්ගිතයෙන් හා ආකාරයෙන්; ලක්ෂ්‍යඃ, අනුමෙයවූ; අර්ථඃ, අර්ථය; සෞක්ෂ්මයාත්, සූක්ෂ්මභාවය හෙතුකොටගෙන; සූක්ෂ්ම ඉති, සූක්ෂ්මයයි; ස්මෘතඃ, දන්නාලදි. ඉඞ්ගිත නම් අභිප්‍රාය ප්‍රකාශක ක්‍රියාවිශෙෂයි, ආකාරනම් අවස්ථාප්‍රකාශකවූමුඛරාගාදියයි.

261 කදාහෞසඞ්ගමොභාවී ත්‍යාකීර්ණෙවක්තුමක්ෂමම්
අවෙක්ෂ්‍යකාන්තමබලා ලීලාපද්මංන්‍යමීලයත්.

කදා, කවරකලෙක; නෞ, අපදෙදෙනාගේ; සඞ්ගමඃ, සඞ්ගමය; භාවීඉති, වන්නේදැයි; ආකීර්ණෙ, ජනසම්බාධස්ථානයකදී; වක්තුම්, කියන්ට; අක්ෂමම්, අසමර්ථවූ; කාන්තම්, වල්ලභයා; අවෙක්ෂ්‍ය, බලා; අබලා, ස්ත්‍රියක්තොමෝ; ලීලාපද්මම්, ක්‍රීඩාපද්මය; න්‍යමීලයත්, හැකිළවූ.

262 පද්මසම්මීලනාදත්‍ර සූචිතොනිශිසඞ්ගමඃ
ආශ්වාසයිතුමිච්ඡන්ත්‍යා ප්‍රියමඞ්ගජපීඩිතම්.

අත්‍ර, මෙහි; අඞ්ගජපීඩිතම්, කාමයෙන් පීඩිතවූ; ප්‍රියම්. වල්ලභයා; ආශ්වාසයිතුම්, අස්වසන්ට; ඉච්ඡන්ත්‍යා කැමතිවන ස්ත්‍රියක විසින්; පද්මසම්මීලනාත්, පද්මසඞ්කොචනය හෙතුකොටගෙණ; නිශි, රාත්‍රියෙහි; සඞ්ගමඃ, සඞ්ගමය; සූචිතඃ, ප්‍රකාශකරණලදි. මේ ඉඞ්ගිතලක්ෂ්‍යවූ සූක්ෂ්මයි. මෙහි පද්මනිමීලන සංඛ්‍යාතඉඞ්ගිතය රාත්‍රියෙහි වල්ලභසඞ්ගමරූපසූක්ෂ්මවූ අර්ථයයි දතයුතුයි.

263 මදර්පිතදශස්තස්‍යා ගීතගොෂ්ඨ්‍යාමවර්ධත
උද්දාමරාගතරලා ඡායාකාපිමුඛාම්බුජෙ.

ගීතගොෂ්ඨ්‍යාම්, සඞ්ගීතසභාවෙහිදී; මදර්පිතදශඃ, මා කෙරෙහි පිහිටුවනලද ඇස්ඇති; තස්‍යාඃ, ඇගේ; උද්දාමතරලා, අධිකරාගයෙන් මනොඥවූ; කාපිඡායා, කිසි ඡායාවක්; අවර්ධත, වැඩුනිය.

264 ඉත්‍යනුද්භින්නරූපත්වාත් රත්‍යුත්සවමනොරථඃ
අනුල්ලඞ්ඝ්‍යවසූක්ෂ්මත්ව මත්‍රදත්‍රව්‍යවස්ථිතඃ.

ඉති, මෙසේ; රත්‍යුත්සවමනොරථඃ, රතිඋත්සවයෙහි අභිලාෂය; අනුද්භින්නරූපත්වාත්, ස්ඵුටත්වයෙන් අප්‍රකාශ ස්වරූප ඇතිහෙයින්; සූක්ෂ්මත්වම්, සූක්ෂ්මත්වය; අනුල්ලඞ්ඝ්‍යව, උල්ලඞ්ඝනය නොකොටම; අත්‍ර, මෙහිලා; ව්‍යවස්ථිතඃ, ව්‍යවස්ථාකරණලද්දේ; අභූත්, වූයේය. එබඳුවූ මුඛඡායාතොමෝ අවශ්‍යයෙන්ම රත්‍යුත්සවාභිලාෂය ප්‍රකාශ කෙරේයයි නියමයක් නැත. අන්‍යප්‍රකාරවූ අභිලාෂයකුදු වියහැක්කේය. එසේවුවද විශෙෂකල්පනාඇති එබඳු අතිශයින් දක්ෂපුරුෂයක්හට කෙසේනමුත් මේ කාරණය දැනගතහැකිවෙයි. එහෙයින් මෙය සූක්ෂ්මාලඞ්කාරයට බාධා නැත්තේය. මේ ආකාරලක්ෂ්‍යවූ සූක්ෂ්මයි.

265 ලෙශොලෙශෙනනිර්භින්නා වස්තුරූපනිගුහනම්.
උදාහරණඑවාස්‍ය රූපමාවිර්භවිෂ්‍යති.

ලෙශෙන, ලෙශයකින්; හෙවත් ස්වල්පමාත්‍රයකින්; නිර්භින්නා, ප්‍රකටවූ; වස්තුරූප, වස්තුස්වරූපයාගේ; නිගූහනම්, සැඟවීම; හෙවත් රෝමෝද්ගමාදිභෙදවූ අඞ්ගවිකාරාදියෙන් ස්වල්පවශයෙන් ප්‍රකටවන්නාවූ; සැඟවියයුතු වස්තුවක් යම්කිසි ව්‍යාජයකින් සැඟවීම; ලෙශඃ, ලෙශනම්වේ; අස්‍ය, මේ ලෙශයාගේ; රූපම්, රූපය; උදාහරණෙඑව, උදාහරණයෙහිලාම; ආවිර්භවිෂ්‍යති, පහළවන්නේය.

266 රාජකන්‍යානුරක්තංමාං රෝමෝද්භෙදෙනරක්ෂකාඃ
අවගච්ඡෙයුරාඥාතම හොශීතානිලංවනම්.

රාජකන්‍යානුරක්තම්, රාජකන්‍යාව කෙරෙහි අනුරක්තවූ; මාම්, මා; රෝමෝද්භෙදෙන, රෝමෝද්ගමයෙන්; රක්ෂකාඃ, අන්තඃපුරරක්ෂකයෝ; අවගච්ඡෙයුඃ, අවබොධකරන්නාහුය; ආඥාතම්, දන්නාලදී. මෙහි අයනුසම්භ්‍රමද්‍යොතකයි. අහො, අනේ; වනම්, වනය; ශීතානිලම්, සිහිල්පවන් ඇත්තේවෙයි; මෙහි රෝමෝද්භෙදය සිහිල්පවින් හටගත්බැව් හැඟවීමෙන් අනුරාගනිගූහනයයි; ඒ වෛචිත්‍ර්‍යාවහනය කෙරේනුයි, මෙහි අලඞ්කාරත්‍වයවේ.

267 ආනන්දාශ්‍රු ප්‍රවෘත්තංමෙ කථංදෘෂ්ට්වෛවකන්‍යකාම්.
අක්ෂිමෙපුෂ්පරජසා වාතොද්ධූතෙනදූෂිතම්.

කන්‍යකාම්, කන්‍යාව; දෘෂ්ට්වාඑව, දැකම; කථම්, කෙසේ; මෙ, මාගේ; ආනන්දාශ්‍රු, සතුටුකඳුළු; ප්‍රවෘත්තම්, පැවැත්තේද; (කන්‍යාදර්ශනයෙන් පහළවූ අනුරාගයෙන් සතුටුකඳුළු පැවැත්ම ලජ්ජාකරුයිසේයි එහෙයින් ඒ සඟවන පරිදි කියත්. මේඅක්ෂි, මාගේ ඇස; වාතොද්ධූතෙන, වාතයෙන් කම්පිතවූ; පුෂ්පරජසා, මල්රේණුයෙන්; දූෂිතම්, දූෂ්‍යකරණලද්දේය. මෙහි ආනන්දාශ්‍රුප්‍රවෘත්තිය අක්ෂිදූෂණයෙන් හටගත්බැව් හැඟවීමෙන් අනුරාගප්‍රකාශවීම වළකනලදී. මේ ශ්ලොකයවිය අනිෂ්ටසම්භාවනා ලජ්ජාදෙක පිළිබඳවූ ලෙශවියට පිළිවෙළින් උදාහරණයි.

268 ඉත්‍යෙවමාදිස්ථානෙය මලඞ්කාරොතිශොභතෙ
ලෙශමෙකෙවිදුර්නින්දාං ස්තුතිංවාලෙශතඃකෘතම්.

ඉති, මෙසේ; එවමාදිස්ථානෙ, මේ ආදිස්ථානයෙහි; අයම්අලඞ්කාරඃ, මේ අලඞ්කාරය; අතිශොභතෙ, අතිශයින් හොබනේය; එකෙ, සමහර කෙනෙක්; ලෙශතඃ, ස්වල්පමාත්‍රවශයෙන්; කෘතම්, කරණලද; නින්දාංවා, නින්දාව හෝ; ස්තුතිංවා, ස්තුතියහෝ; ලෙශම්, ලෙශයයි; විදුඃ, දනිති.

269 යුවෛෂගුණවාන්රාජා යොග්‍යස්තෙපතිරූර්ජිතඃ
රණොත්සවෙමනඃසක්තම් යස්‍යකාමොත්සවාදපි.

යස්‍යමනඃ, යමෙකුගේ සිත; කාමොත්සවාදපි, කාමොත්සවයටත් වඩා; රණොත්සවෙ, යුද්ධක්‍රීඩායෙහි, සක්තම්, ඇලුනේද; යුවා, තරුණවූ; ගුණවත්, ගුණඇත්තාවූ; ඌර්ජිතඃ, වික්‍රමඇති; එෂරාජා, මේ රජතෙම; තෙ, නිට; යොග්‍යඃපතිඃ, සුදුසුවූ වල්ලභයාවේ.

270 වියෝජිතකශ්ශස්තුහිර්නිර්වෛවාසමින් භාවනිවෘත්තයෙ
කන්‍යායාඃකල්පනෙභොගාන් නිර්විශෙෂානිරන්තරම්.

අස්මින්, මේ අනන්තරොක්තපද්‍යයෙහි; භොගාන්, සුරතොත්සව යන්; නිරන්තරම්, නිතර; නිර්විශෙෂාඃ, උපභොගකරනු කැමතිවූ රජහුගේ; කන්‍යායාඃ භාවනිවෘත්තයෙ, කන්‍යාවාරණාභිප්‍රාය වලකනු පිණිස; වියෝජිතකශ්ශස්තුතිඃ, වියඤ්ඤසම්බන්ධවූ උත්කර්ෂස්තුතීය; නින්දාව, නින්දමැයි.

271 චපලොනිර්දයශ්චාසෞ ජනඃකිංතෙනමෙසඛි
ආගඃප්‍රමාර්ජනායෛවචාටවොයෙන ශික්ෂිතාඃ.

සඛි, යෙහෙළිය; අසෞජනඃ, මේ ජනතෙම; චපලඃ, චපලය; නිර්දයඃ, දයාරහිතය; යෙන, යමක්හෙයින්; ආගඃප්‍රමාර්ජනායඑව, අපරාධශොධනයපිණිසම; චාටවඃ, චාටුහු හෙවත් ප්‍රියවචනයෝ; ශික්ෂිතාඃ, ශික්ෂණයකරණලද්දාහුද (එහෙයින්); තෙන, ඒ මානයෙන්; කිම්, ප්‍රයෝජනකිම.

272 දොෂාභාසොගුණඃකොපි දර්ශිතශ්චාටුකාරිතා
මානංසඛීජනොද්දිෂ්ටං කර්තුංරාගාදශක්තයා.

රාගාත්, ප්‍රියානුරාගය හෙතුකොටගෙන; සඛීජන, සඛීජනයාවිසින්; උද්දිෂ්ටම්, උද්දෙශකරණලද; මානම්, මානය; කර්තුම්, කරන්ට; අශක්තයා, නොහැකිවූ; නායිකාවකගේ; චාටුකාරිතා, චාටුකාරීස්වභාව; කොපිගුණඃ, කිසිගුණයක; (එය) දොෂාභාසඃ, දොෂාභාෂවූයේ; දර්ශිතඃ, දක්වනලදී; දොෂස්වභාවයෙන් ප්‍රකාශකරණලදැයිසේයි. මේ ව්‍යාජස්තුතියි.

## ඉතිලෙශචක්‍රම්-මේ ලෙශචක්‍රයයි.

---

273 උද්දිෂ්ටානාංපදාර්ථානාමනුද්දෙශොයථාක්‍රමම්
යථාසංඛ්‍යමිතිප්‍රොක්තං සංඛ්‍යානංක්‍රමඉත්‍යපි.

උද්දිෂ්ටානාම්, උද්දිෂ්ටවූ; පදාර්ථානාම්, පදාර්ථයන්ගේ; හෙවත් වස්තූන්ගේ; යථාක්‍රමම්, පිළිවෙළින්; අනුද්දෙශඃ, අනුද්දෙශය; හෙවත් පසුපසුවදක්වූවන්ගේ සඞ්ගමය; යථාසංඛ්‍යම්ඉති, යථාසංඛ්‍යයයිද; සංඛ්‍යානම්, සංඛ්‍යානයයිද; ක්‍රමඃ ඉත්‍යපි, ක්‍රමයයිද; ප්‍රොක්තම්, කියනලදී.

274 ධ්‍රුවන්තෙචොරිතාතන්වි ස්මිතෙක්ෂණමුඛද්‍යුතිඃ
ස්නාතුමම්භඃප්‍රවිෂ්ටායාඃ කුමුදොත්පලපඞ්කජෛඃ.

තන්වි, තුනුවග; ස්නාතුම්, නහන්ට; අම්භඃ, ජලයට; ප්‍රවිෂ්ටායාඃ, ප්‍රවිෂ්ටවූ; තෙ, තීගේ; ස්මිතෙක්ෂණමුඛද්‍යුතිඃ, සිනාය ඇසය මුඛය යන මොවුන්ගේ කාන්තිය; කුමුදොත්පලපඞ්කජෛඃ, කුමුදුය උපුල්ය; පියුම්ය යන මොවුන් විසින්; චොරිතා, මදක් සොරකම්කරණලදුයි; ධ්‍රුවම්, සිතමි. *

---

* චොරිතෙතිකිඤ්චිදපහෘතෙත්‍යර්ථඃ සමුදායහරණෙනායිකායාංතද සම්ප්‍රතිපත්ත්‍යා වෛරස්‍යාපත්තෙඃ යනු මාලින්‍යප්‍රොක්ශිනී ටීකායි.

275 ප්‍රෙයඃප්‍රියතරාඛ්‍යානං රසවද්‍රසපෙශලම්
ඌර්ජස්විරූඪාහඞ්කාරං යුක්තොත්කර්ෂඤ්චතත්‍රයම්.

ප්‍රියතරඃ, භාවාදිව්‍යඤ්ජකත්වයෙන් අතිශයින් ප්‍රියවූ; ආඛ්‍යානම්, ආඛ්‍යානය; ප්‍රෙයඃ, ප්‍රෙයස්නම්වෙයි; රසපෙශලම්, ශෘඞ්ගාරාදිරස යෙන්මනොඥවූයේ; රසවත්, රසවත්නම්වේ; රූඪාහඞ්කාරම්, රූඪවූ හෙවත් අභිව්‍යක්තවූ අහඞ්කාරඇත්තේ; ඌර්ජස්වි, ඌර්ජස්වි නම්වේ; තත්‍රයම්, ඒ අලඞ්කාරත්‍රය; යුක්තොත්කර්ෂඤ්ච, යුක්තවූ උත්කර්ෂතා ඇත්තේය.

276 අද්‍යයාමමගොවින්ද ජාතාත්වයිගෘහාගතෙ
කාලෙනෛෂාභවෙත්ප්‍රීතිස්තවෛවාගමනාත්පුනඃ.

ගොවින්ද, ගරුඬධ්වජය; ත්වයි, නුඹවහන්සේ; ගෘහාගතෙ, අප ගේ ගෙටපැමිණිකල්හි; අද්‍ය, අද; යාප්‍රීතිඃ, යම්ප්‍රීතියක්; මම, මට; ජාතා, වූවාද; ඒෂාප්‍රීතිඃ, මේ ප්‍රීතිය; පුනඃ, නැවත; කාලෙන, කල කින්; තවෛව, නුඹවහන්සේගේම; ආගමනාත්, ඊමෙන් වන්නේය.

277 ඉත්‍යාහයුක්තංවිදුරෝ නාන්‍යතස්තාදෘශීධෘතිඃ
භක්තිමාත්‍රසමාරාධ්‍යඃ සුප්‍රීතශ්චතතොහරිඃ.

අන්‍යතඃ, (ගොවින්දාගමනය හැර) අන්‍යහෙතුවකින්; තාදෘශී, එබඳුවූ; ධෘතිඃ, සන්තොෂයක්; න, යම්හෙයකින් නැද්ද; එහෙයින්; විදුරඃ, විදුරරජතෙමේ; ඉති, උක්තප්‍රකාරයෙන්; යුක්තාම්, යොග්‍යවූ වචනයක්; ආහ, කියේය; භක්තිමාත්‍ර, භක්තිමාත්‍රයෙන්; සමාරාධ්‍යඃ, සමාරාධ්‍යවූ; හෙවත් සතුටුකළයුතුවූ; හරිඃ, විෂ්ණු; තතඃ, ඒ භක්තිය හෙතුකොටගෙන; සුප්‍රීතශ්ච, අතිශයින් ප්‍රීතිමත්වූයේදවිය.

278 සොමඃසූර්‍ය්‍යොමරුද්භූමි ර්ව්‍යොමහොතානලොජලම්
ඉතිරූපාන්‍යතික්‍රම්‍ය ත්වාංද්‍රෂ්ටුංදෙවකෙවයම්.

දෙව, පින්වත්මහාදෙවය; සොමඃ, චන්ද්‍රයාය; සූර්‍ය්‍යඃ, දිවාකරය; මරුත්, වාතය; භූමි, පෘථිවිය; ව්‍යොම, ආකාශය; හොතා, යජමා නය; අනලඃ, වහ්නිය; ජලම්, ජලය; ඉතිරූපාණි, මෙබඳුවූ රූපයන්; අතික්‍රම්‍ය, ඉක්මවා; ත්වාම්, නුඹවහන්සේ; ද්‍රෂ්ටුම්, දකින්ට; වයම්, අපි; කෙ, කවරහුද.

279 ඉතිසාක්ෂාත්කෘතෙදෙවෙ රාඥොයත් රාජවර්මණඃ
ප්‍රීතිප්‍රකාශනංතච්ච ප්‍රෙයඉත්‍යවගම්‍යතාම්.

දෙවෙ, මහෙශ්වරයා; සාක්ෂාත්කෘතෙ, ප්‍රත්‍යක්ෂවූකල්හි; රාජවර්මණඃ, රාජවර්මනම්වූ; රාඥඃ, රජහුගේ; ඉති, මෙබඳුවූ; යත්ප්‍රීතිප්‍රකාශ නම්; යම්ප්‍රීතිප්‍රකාශයක්වේද; තච්ච, ඒද; ප්‍රෙයඉති, ප්‍රෙයස්නම් අල ඞ්කාරයයි; අවගම්‍යතාම්, අවබොධකරනු ලැබේවා

280 මෘතෙතිප්‍රෙත්‍යසඞ්ගන්තුං යයාමෙමරණංමතම්
සෛෂාතන්වීමයාලබ්ධා කථමත්‍රෛවජන්මනි.

මෘතාඉති, මළායයි සිතා; ප්‍රෙත්‍ය, පරලොවදී; යයා, යම්කා න්තාවක් හා; සඞ්ගන්තුම්, එක්වන්ට; මෙ, මට; මරණම්, මරණය;

මතම්, අභිමතවිද; සාඑෂාවන්තී, එමේතුනුවන; අත්‍රෛවජන්මනි, මේ ජාතියෙහිම; කථම්, කෙසේ; මයා, මා විසින්; ලබ්ධා, ලබනලද්දීද. මෙහි සෛෂාවන්ති යන තැන සෛවාවන්ති කියාත් පාඨඇත. සාඑවඅවන්ති, අවන්තිදෙශජවූහොම හෙවත් ඒවාසවදත්තාවම යනු එහි අර්ථයි. මේ වාසවදත්තාවමලහයි අසා බලවත් ශොකයට පැමිණි වත්සරජහු ඈ නැවත ලැබීමෙන් කී ප්‍රීතිවාක්‍යයි.

281 ප්‍රාක්ප්‍රීතිර්දර්ශිතාසෙයංරතිඃ ශෘඞ්ගාරතාංගතා
රූපබාහුල්‍යයොගෙන තදිදංරසවද්වචඃ.

ප්‍රාක්, පළමුකොට; ප්‍රීතිඃ, ප්‍රීතිය; දර්ශිතා, දක්වනලදුයි; සාඉයම්රතිඃ, ඒ මේරතිය; රූපබාහුල්‍යයොගෙන, විභාවඅනුභාවව්‍යභිචාරයන රූපයන්ගේ බාහුල්‍යයොගයෙන්; ශෘඞ්ගාරතාම්, ශෘඞ්ගාරබවට; ගතා, පැමිණියාය; තද්, එහෙයින්; ඉදංවචඃ, මේ වචනය; රසවද්, රසවත් අලඞ්කාරනම්වේ.

282 නිගෘහ්‍යකෙශෙෂ්වාකෘෂ්ටා කෘෂ්ණායෙනාග්‍රතොමම
සොයංදුඃශාසනඃ පාපොලබ්ධඃ කිංජීවතිකෂණම්.

යෙන, යමක්හු විසින්; කෘෂ්ණා, ද්‍රෞපදීතොමෝ; මම, මාගේ; අග්‍රතඃ, ඉදිරියේදී; කෙශෙෂු, හිසකේවැටියෙහිලා; නිගෘහ්‍ය, අල්වාගෙන; ආකෘෂ්ටා, අදනාලද්දීද; පාපඃ, දුරාත්මකවූ; සඃඅයංදුඃශාසනඃ, ඒ මේ දුඃශාසනයා; ලබ්ධඃ, ලබනලද්දේ; කෂණම්, කෂණයක්; කිංජීවති, කිම්ජීවත්වේද; නොවේමය.

283 ඉත්‍යාරුහ්‍යපරාංකොටිං ක්‍රොධඃ රෞද්‍රාත්මතාංගතඃ
භීමස්‍යපශ්‍යතඃශත්‍රූ මිත්‍යෙතද්රසවද්වචඃ

ශත්‍රූම්, සතුරා; පශ්‍යතඃ, දක්නාවූ; භීමස්‍ය, භීමයාගේ; ක්‍රොධඃ, ක්‍රොධය; ඉති, මෙසේ; පරාංකොටිම්, අත්‍යන්තකොටියට; ආරුහ්‍ය, නැග; රෞද්‍රාත්මතාම්, රෞද්‍රාත්මකබවට; ගතඃ, ගියේය; ඉති, මෙබඳුවූ; එතද්වචඃ, මේ වචනය; රසවද්, රසවත් අලඞ්කාරනම්වෙ; මේ රෞද්‍රරසයට උදාහරණයි.

284 අජිත්වාසාර්ණවාමුර්වී මනිෂ්ටවා විවිධෛර්මඛෛඃ
අදත්වාචාර්ථමර්ථිභ්‍යො භවෙයංපාර්ථිවඃකථම්.

සාර්ණවාම්, සාගරසහිතවූ; උර්වීම්, පෘථිවිය; අජිත්වා, නොදිනා; විවිධෛඃ, නානාප්‍රකාරවූ; මඛෛඃ, යාගයෙන්; අනිෂ්ටවා, යාගනොකොට; අර්ථිභ්‍යඃ, යාචකයන්ට; අර්ථම්, වස්තුව; අදත්වාච, නොදී; කථම්, කෙසේ; පාර්ථිවඃ භවෙයම්, රජවෙම්ද.

285 ඉත්‍යුත්සාහඃප්‍රකෘෂ්ටාත්මා තිෂ්ඨන්වීරරසාත්මනා
රසවත්වංගිරාමාසාං සමර්ථයිතුමීශ්වරඃ.

ඉති, මෙසේ; ප්‍රකෘෂ්ටාත්මා, උත්කෘෂ්ටවූ ස්වභාවඇති; උත්සාහඃ, උත්සාහය; වීරරසාත්මනා, වීරරසස්වභාවයෙන්; තිෂ්ඨන්, සිටින්නේ; ආසාංගිරාම්, මේ කාව්‍යරූපවචනයන්ගේ; රසවත්වම්, රසවත්භාවය; සමර්ථයිතුම්, සමර්ථනයකරන්ට; ඊශ්වරඃ, සමර්ථයි.

286 යස්‍යාඃකුසුමශය්‍යාපි කොමලාඞ්ග්‍යාරුජාකරී
සාධිශෙතෙකථංතන්වී හුතාශනවතීංචිතාම්.

යස්‍යාඃකොමලාඞ්ග්‍යාඃ, යම්කොමලාඞ්ගියකට; කුසුමශය්‍යාපි, පුෂ්පශය්‍යාවද; රුජාකරී, රුජාකරවීනම්, සානන්වී, ඒ තුනුවග; කථම්, කෙසේ; හුතාශනවතීම්, ගිනිඇති; චිතාම්, දරසෑයෙහි; අධිශෙතෙ, හොවිද.

287 ඉතිකාරුණ්‍යමුද්‍රික්ත මලඞ්කාරතයාස්මෘතම්
තථාපරෙපි බීභත්ස හාස්‍යාද්භුතභයානකාඃ.

ඉති, මෙසේ; උද්‍රික්තම්, විභාවාදියෙන් පරිපුෂ්ටවූ; කාරුණ්‍යම්, කරුණාරසස්ථායිභාවය; නොහොත් ශොකය; අලඞ්කාරතයා, අලඞ්කාරත්වයෙන්; ස්මෘතම්, දන්නාලදී; තථා, එසේ; අපරෙපි, අන්‍යවූද; බීභත්සහාස්‍යාද්භුතභයානකාඃ, බීභත්සහාස්‍ය අද්භුත් භයානක රසයෝද; (වෙදිතව්‍යාඃ), දතයුත්තාහුය.

288 පායංපායංතවාරීණාං ශොණිතංපාණිසම්පුටෛඃ
කෞණපාඃසහනෘත්‍යන්ති කබන්ධෛරන්ත්‍රභූෂණාඃ

අන්ත්‍රභූෂණාඃ, බඩවැල් ආභරණකොටඇති; කෞණපාඃ, රාක්ෂසයෝ; තව, ඔබගේ; අරීණාම්, සතුරන්ගේ; ශොණිතම්, ලෙහෙ; පාණිසම්පුටෛඃ, දෝතින්; පායං පායම්; බිබී; කබන්ධෛඃසහ, කබන්ධයන් සමග; නෘත්‍යන්ති, නටත්; කබන්ධනම් අශිරෂ්කක්‍රියායුක්තශරීරයි; මේ බීභත්සොදාහරණයි.

289 ඉදම්ම්ලානමානායා ලග්නංස්තනතටෙතව
ඡාද්‍යතාමුත්තරීයෙණ නවංනඛපදංසඛි.

සඛි, යෙහෙළිය; අම්ලානමානායා, ම්ලානනුවූ මානඇති; තව තිගේ; ස්තනතටෙ, පයොධරතටයෙහි; ලග්නම්, ලග්නවූ; නවම්, අලුත්වූ; නඛපදම්, නියපාර; උත්තරීයෙණ, උතුරුසළුවෙන්; ඡාද්‍යතාම්, වසනුලැබේවා; මේ හාස්‍යරසයට උදාහරණයි.

290 අංශුකානිප්‍රබාලානි පුෂ්පංහාරාදිභූෂණම්
ශාඛාශ්චමන්දිරාණ්‍යෙෂාං චිත්‍රංනන්දනශාඛිනාම්.

එෂාංනන්දනශාඛිනාම්, මේ නන්දනොද්‍යානයෙහිවූ වෘක්ෂයන්ගේ; ප්‍රබාලානි, බාලපල්ලවයෝ; අංශුකානි, වස්ත්‍රයෝයි; පුෂ්පම්, පුෂ්පය; හාරාදිභූෂණම්, මුක්තාහාරාදි ආභරණයයි; ශාඛාශ්ච, ශාඛාවෝද; මන්දිරාණි, ගෘහයෝයි; චිත්‍රම්, (මේ) අද්භූතයි. මේ අද්භූත රසයට උදාහරණයි

291 ඉදංමඝොනඃකුලිශං ධාරාසන්නිහිතානලම්
ස්මරණංයස්‍යදෛත්‍යස්ත්‍රී ගර්භපාතායකල්පතෙ.

යස්‍ය, යමකගේ; ස්මරණම්, සිහිකිරීම; දෛත්‍යස්ත්‍රී, අසුරකාමිනින්ගේ; ගර්භපාතාය, ගැප්හෙලීම පිණිස; කල්පතෙ, සමර්ථවේද; ඉදම්, මෙය; මඝොනඃ, ශක්‍රයාගේ; ධාරාසන්නිහිතානලම්, ධාරායෙහි පිහිටි ගිනිඇති; කුලිශම්, වජ්‍රායුධයයි. මේ භයානක රසයට උදාහරණයි.

292 වාක්‍යස්‍යාග්‍රාම්‍යතායොනිර්මාධුර්‍ය්‍යෙදර්ශිතොරසඃ
ඉහත්වෂ්ටරසායත්තා රසවත්තාස්මෘතාගිරාම්.

මාධුර්‍ය්‍යෙ, මාධුර්‍ය්‍යගුණ නිරූපණයෙහිලා; වාක්‍යස්‍ය, වාක්‍යය සම්බන්ධවූ; අග්‍රාම්‍යතායොනිඃ, අග්‍රාම්‍යබව කාරණකොටඇති; රසඃ, රසය; දර්ශිතඃ, දක්වනලද්දී; ඉහතු, මෙහි වනාහි; අෂ්ටරසායත්තා, ශෘඞ්ගාරාදි අෂ්ටරස ප්‍රතිබද්ධවූ; ගිරාම්, වචනයන් සම්බන්ධවූ; රස වත්තා, රසවත්බව; ස්මෘතා, දන්නාලද්දු; මධුරංරසවත්වාචි යනාදින් ග්‍රාම්‍යතාදොෂරාහිත්‍යයමාධුර්‍ය්‍ය ගුණයයි දර්ශිතයි. මෙහි රස වත්නම් අලඞ්කාරවාක්‍යය සම්බන්ධවූ ශෘඞ්ගාරාදිරස සමුපෙතබවයි.

**ඉතිරසවච්චක්‍රම්–උක්තභූෂාරවූයේ රසවත් වනුයයි.**

---

293 අපකර්තාහමස්මීති හෘදිතෙමාස්මභූද්භයම්
විමුඛෙෂුනමෙඛඞ්ගඃ ප්‍රහර්තුංජාතු වාඤ්ඡති·

අහම්, මම; අපකර්තාඅස්මි ඉති, සතුරෙක්මියි; තෙහෘදි, තාගේ හෘදයෙහි; භයම්, භයක්; මාස්මභූත්, නොවේවා; මෙ, මාගේ; ඛඞ්ගඃ, කඩුව; විමුඛෙෂු, පරාඞ්මුඛයන් කෙරෙහි; ප්‍රහර්තුම්, පහරදෙන්ට; ජාතු, කිසිකලෙකත්; නවාඤ්ඡති, කැමතිනොවේ;

294 එවමුක්ත්වාපරොයුධෙ නිරුඬොදර්පශාලිනා
පුංසාකෙනාපිතජ්ඥෙය මූර්ජස්වීත්‍යෙවමාදිකම්.

දර්පශාලිනා, ගර්වයුක්තවූ; කෙනාපිපුංසා, කිසිපුරුෂයකු විසින්; එවම්, මෙසේ; උක්ත්වා, කියා; යුධෙ, යුධයෙහිදී; පරඃ, සතුරෙක්; නිරුඬඃ, වළකනලද්දේද; තත්, එහෙයින්; එවමාදිකම්, මේආදිය; ඌර්ජස්වී ඉති, ඌර්ජස්වියයි; ඥෙයම්, දතයුතුයි.

**ඌර්ජස්වි, ඌර්ජස්විදී.**

---

295 අභිෂ්ටමනාඛ්‍යාය සාක්ෂාත්තස්‍යෙවසිද්ධයෙ
යත්ප්‍රකාරාන්තරාඛ්‍යානං පර්‍ය්‍යායොක්තංතදිෂ්‍යතෙ.

ඉෂ්ටම්, අභිලෂිතවූ; අර්ථම්, අර්ථය; සාක්ෂාත්, ප්‍රත්‍යක්ෂයෙන් හෙවත් වාචක ශබ්දයෙන්; අනාඛ්‍යාය, නොකියා; තස්‍යෙව, ඒ ඉෂ්ටාර්ථයාගේම; සිද්ධයෙ, සිද්ධිපිණිස; යත්, යම්; ප්‍රකාරාන්තරාඛ්‍යානම්, ප්‍රකාරාන්තරයකින් කීමක් ඇද්ද; තත්, එය; පර්‍ය්‍යායොක්තම්, පර්‍ය්‍යායොක්තයයි; ඉෂ්‍යතෙ, කැමතිවනුලැබේ.

296 දශත්‍යසෞපරභෘතඃ සහකාරස්‍යමඤ්ජරීම්
තමහංවාරයිෂ්‍යාමි යුවාභ්‍යාංස්වෛරමාස්‍යතාම්.

අසෞපරභෘතඃ, මේ කොකිලතෙම; සහකාරස්‍ය, චූතවෘක්ෂයක්හුගේ; මඤ්ජරීම්, පුෂ්පස්තවකය; දශති, ඩසී; තම්, ඔහු; අහම්, මම; වාරයිෂ්‍යාමි, වළකන්නෙමි; යුවාභ්‍යාම්, තොපදෙදෙනා විසින්; ස්වෛරම්, කැමතිපරිද්දෙන්; ආස්‍යතාම්, සිටිනු ලැබෙත්වා.

297 සඞ්ගමය්‍යසඞ්යුනා සඞ්කෙතෙතද්‍රතොත්සවම්
නිර්ජිතුමිව්ජත්ත්‍යා කයාප්‍යපසෘතංතතඃ.

සඞ්කෙතෙ, සඞ්කෙතසථානයෙහි; සඞ්ම්, යෙහෙලියක්; යුනා, තරුණයකු සමග; සඞ්ගමය්‍ය, එක්කොට; තත්‍රතොත්සවම්, ඒ සුර තොත්සවය; නිර්ජිතුම්, නිපදවන්ට; ඉච්ඡන්ත්‍යා, කැමතිවූ; කයාපි, කිසිසත්‍රියක් විසින්; තතඃ, එයින්; අපසෘතම්, පහවීමය. අනන්තර පද්‍යයෙහි කාමිකාමිනි දෙදෙනක්හුගේ රතොත්සවය නිපදවනු කැ මති කිසි සත්‍රියක් විසින් මම මෙයින් පහවයෙමියි වාචක ශබ්දයෙන් කියනකල වෛචිත්‍ර්‍යාතිශයක් නැත්තුයි කොවුලෙකුවැළැක්වීම්ව්‍යා ජයෙන් ඇගේ පහවීම ව්‍යක්තකරණලද්දේනුයි. මේ පයඩ්යොක්ත නමැයි දතයුතුයි.

ඉතිපයඩ්යොක්තම්, උක්තප්‍රකාරවූයේ පයඩ්යොක්තයි.

298 කිඤ්චිදාරභමානස්‍ය කාය‍්‍යම්දෛවවසාත්පුනඃ
තත්සාධනසමාපත්තිර්යා තදාහුඃසමාහිතම්.

කිඤ්චිත්කාය‍්‍යම්, කිසි කාය‍්‍යයක්; ආරභමානස්‍ය, පටන්ගනු ලබන්නාවූ පුරුෂයක්හුගේ; දෛවවසාත්, දෛවවශයෙන්; යා, යම් බඳුවූ; තත්සාධනසමාපත්තිඃ, ඒ කාය‍්‍යසාධන ප්‍රාප්තියක්වේද; තත්, එය; සමාහිතම්, සමාහිතයයි; ආහුඃ, කියති.

299 මානමස්‍යානිරාකත්තුං පාදයොර්මේපතිෂ්‍යතඃ
උපකාරායදිෂ්ට්‍යෙද මුදීණ්ණංඝනගජ්ජිතම්.

අස්‍යාඃ, මේමානිනියගේ; මානම්, මානය; නිරාකත්තුම්, නිරාකර ණයකරන්ට; පාදයොඃ, පාදවයෙහි; පතිෂ්‍යතඃ, හෙන්නාවූ; මෙ, මට; උපකාරාය, උපකාරපිණිස; දිෂ්ට්‍යා, භාග්‍යය හෙතුකොටගෙන; එතත්ඝනගජ්ජිතම්, මේ මෙඝගජ්ජනාව; උදීණ්ණම්, පහළවූයේය.

ඉතිසමාහිතම්, උක්තප්‍රකාරවූයේ සමාහිතයයි.

300 ආශයස්‍යවිභූතෙර්වා යන්මහත්ත්වමනුත්තමම්
උදාත්තංනාමතංප්‍රාහු රලඞ්කාරංමනීෂිණඃ.

ආශයස්‍යවා, අභිප්‍රායයාගේහෝ;; විභූතෙර්වා, සම්පත්තියගේ හෝ; අනුත්තමම්, නිරුත්තරවූ; යන්මහත්ත්වම්, යම් මහත් බවෙක් වේද; තම්, එය; උදාත්තනාම අලඞ්කාරම්, උදාත්තනම් අලඞ්කාර යයි; මනීෂිණඃ, පණ්ඩිතයෝ; ප්‍රාහුඃ, කීයති.

301 ගුරොඃශාසනමත්‍යෙතුං නශශාකසරාඝවඃ
යොරාවණශිරශ්ඡෙද කාය‍්‍යභාරෙප්‍යවිකළවඃ.

යඃ, යමෙක්තෙම; රාවණ, රාවණයාගේ; ශිරශ්ඡෙද කාය‍්‍යභා රෙපි, හිස්සිඳීම්, සඞ්ඛ්‍යාතකාය‍්‍යභාරයෙහිද; අවිකළවඃ, ව්‍යාකූලනුවූ යේ; සඃරාඝවඃ, ඒ රාමකුමාරතෙම; ගුරොඃ, පියාගේ; ශාසනම්, ආඥව; අත්‍යෙතුම්, ඉක්මවන්ට; නශශාක, නොහැකිවිල. මෙ

රාවණවධස්වරූපවූ අසාධ්‍යකර්තව්‍යසාධනයෙහිද සමර්ථවූ රාම කුමාරයා පියරජුගේ ආඥාව නොඉක්මවීම අලෞකික මාහාත්ම්‍යප්‍රතීතිය කෙරේනුයි මේ උදාත්තාලඞ්කාර නම්වේය.

3´2 රත්නභිත්තිෂුසඞ්ක්‍රාන්තෛඃ ප්‍රතිබිම්බශතෛර්වෘතඃ
ඥාතොලඞ්කෙශ්වරඃකෘච්ඡ්‍රා දාඤ්ජනෙයෙනතත්වතඃ.

ආඤ්ජනෙයෙන, හනුමත්හු විසින්; රත්නභිත්තිෂු, රත්නභිත්තීන්හි; සඞ්ක්‍රාන්තෛඃ, සඞ්ක්‍රමිතවූ; ප්‍රතිබිම්බශතෛඃ, පිළිබිඹුසියගණනින්; වෘතඃ, පිරිවරණලද; ලඞ්කෙශ්වරඃ, රාවණතෙම; කෘච්ඡ්‍රාත්, දුකින්; තත්වතඃ, තත්වූපරිද්දෙන්; ඥාතඃ, දන්නාලදි. මෙහි ලඞ්කෙශ්වරයාගේ එබඳුවූ ඓශ්වර්ය්‍ය මහත්ව කීර්තනයම උදාත්තාලඞ්කාරනමැයි දතයුතුයි. හනුමත් විසින් රාවණයාගේ දුකසේ හැඳිනගැනීම වක්‍තෘහට අභිමත නම් ඒ උදාත්තාලඞ්කාරනොවේ.

303 පූර්වත්‍රාශයමාහාත්ම්‍යමත්‍රාභ්‍යුදයගෞරවම්
සුව්‍යඤ්ජිතමිතිප්‍රොක්ත මුදාත්තද්වයම්ප්‍යදඃ.

පූර්වත්‍ර, ගුරොඃයනාදි පූර්වඋදාහරණයෙහි; ආශයමාහාත්ම්‍යම්, අභිප්‍රායයාගේ මහත්බවද; අත්‍ර, මේ රත්නභිත්තිෂු යනාදි උදාහරණයෙහි; අභ්‍යුදයගෞරවම්, විභූතිමහත්වයද; සුව්‍යඤ්ජිතම්, සුප්‍රතීතයි; ඉති, මෙසේ; අදඃඋදාත්තද්වයංඅපි, මේ උදාත්තදෙකද; ප්‍රොක්තම්, කියනලදි.

## උදාත්තම්, උදාත්තයි.

304 අපහ්නුතිරපහ්නුත්‍ය කිඤ්චිදන්‍යාර්ථදර්ශනම්
නපඤ්චෙෂුඃ ස්මරස්තස්‍ය සහස්‍රංපත්‍රිණාමිති.

කිඤ්චිත්, කිසිපදාර්ථයක්; අපහ්නුත්‍ය, සඟවා; අන්‍යාර්ථදර්ශනම්, අනික්අර්ථයක්හුගේ දැක්වීම; අපහ්නුතිඃ, අපහ්නුතිනම්; ස්මරඃ, අනඞ්ගතෙමේ; නපඤ්චෙෂුඃ, ඊපසක් ඇත්තේනොවෙයි; තස්‍ය ඕහට; පත්‍රිණාම්, ශරසම්බන්ධවූ; සහස්‍රම්, දහසෙක්වේ; මෙහි අනඞ්ගයාගේ පඤ්චබාණත්වය වළකා සහස්‍රබාණරූපවූ ධර්මාන්තරාරොපණය රූපාපහ්නුත්නමැයි දතයුතුයි.

305 චන්දනංචන්ද්‍රිකාමන්දො ගන්ධවාහශ්චදක්ෂිණඃ
සෙයමග්නිමයී සෘෂ්ටිර්මයිශීතාපරාන්ප්‍රති.

චන්දනම්, සඳුන; චන්ද්‍රිකා, සඳරැස; මන්දඃ, මඳවූ; දක්ෂිණඃ ගන්ධවාහඃ, දක්ෂිණමාරුතය යන; සාඉයම්, ඒමේ; සෘෂ්ටිඃ, සෘෂ්ටිතොමෝ, මයි, මා කෙරෙහි; අග්නිමයී, වහ්නිමයවූවා; පරාන්ප්‍රති, අනුන් කෙරෙහි; ශීතා, ශීතවූවාය; මේ විරහිපුරුෂයක්හුගේ වචනයි.

306 ශෛශිර්‍ය්‍යමභ්‍යුපෙත්‍යෛව පරෙෂ්වාත්මනිකාමිනා
ඖෂ්ණ්‍යප්‍රකාශනාත්තස්‍ය සෙයංවිෂයනිහ්නුතිඃ.

කාමිනා, කාමිපුද්ගලයක්හු විසින්; පරෙෂු, අන්‍යයන් කෙරෙහි ශෛශිර්‍ය්‍යම්, සිහිල්බව; අභ්‍යුපෙත්‍ය, ආරොපණයකොට; ආත්මනි, තමාකෙරෙහි; තස්‍ය, ඒ චන්දනාදියගේ; ඖෂ්ණ්‍යප්‍රකාශනාත්, උෂ්ණ

සුම්බව ප්‍රකාශකිරීමෙන්; සාදෘශයම්, එමේ අපහ්නුතිනොමෝ; විෂය නිහ්නුතිඃ, විෂයාපහ්නුතිනම්වේ. කිසි පොතක තස්‍යයන තන්ති නෙෂාම් කියාත් පාඨයි; ඒ වැඩියක් මනොරම්‍යයි.

307 අමෘතස්‍යන්දිකිරණ ශ්චන්ද්‍රමා නාමනොමතඃ
අන්‍යඑවායමර්ථාත්මා විෂනිෂ්‍යන්දිදීධිතිඃ.

චන්ද්‍රමා, චන්ද්‍රතෙමේ; අමෘතස්‍යන්දිකිරණඃ, අමාවැහෙන රැස්ඇත්තේයනු; නාමතඃ, නම්වශයෙන්; මතඃ, දන්නාලදී; අර්ථවශයෙන්හො වෙයිසේයි; අන්‍යඃඑව, අන්‍යවූම; අර්ථාත්මා, වස්තුස්වරූපවූ; අයම්, මේ තෙමේ; විෂනිෂ්‍යන්දිදීධිතිඃ, විෂවැහෙන රශ්මිඇත්තේය.

308 ඉතිචන්ද්‍රත්වමෙවෛන්දොඃ නිවර්ත්‍යාර්ථාන්තරාත්මතා
උක්තාස්මරාර්තේනෙනෙෂා ස්වරූපාපහ්නුතිර්මතා.

ඉති, මෙසේ; ස්මරාර්තේන, කාමපීඩිතයක්හු විසින්; ඉන්දොඃ, චන්ද්‍රයාකෙරෙහි; චන්ද්‍රත්වම්, චන්ද්‍රත්වය; නිවර්ත්‍යඑව, වළකාම; අර්ථාන්තරාත්මතා, අන්‍යවස්ත්වාත්මකබව හෙවත් අනික්වස්තුවක් ආත්මකොට ඇතිබව; උක්තා, කියනලදී; ඉති, මෙබඳුවූ; එෂා, මෝනොමෝ; ස්වරූපාපහ්නුතිඃ, ස්වරූපාපහ්නුතියයි; මතා, දන්නාලදු.

309 උපමාපහ්නුතිඃපූර්ව මුපමාස්වේවදර්ශිතා.
ඉත්‍යපහ්නුතිභෙදානාං ලක්ෂ්‍යාලක්ෂ්‍යෂුවිස්තරඃ.

උපමාපහ්නුතිඃ, උපමාපහ්නුතිය; පූර්වම්, පළමුකොට; උපමාසුඑව, උපමාවිෂයන්හිම; දර්ශිතා, දක්වනලදු; ඉති, මේ උක්තප්‍රකාරයෙන් අපහ්නුතිභෙදනාම්, අපහ්නුති භෙදයන්ගේ; විස්තරඃ, විස්තරය; ලක්ෂ්‍යෙෂු, උදාහරණයන්හිලා; ලක්ෂ්‍යඃ, දැක්කයුතුයි.

## අපහ්නුතිචක්‍රම් අපහ්නුතිචක්‍රයයි.

310 ශ්ලිෂ්ටමිෂ්ටමනෙකාර්ථ මෙකරූපාන්විතංවචඃ
තදභින්නපදංභින්නපදප්‍රායමිතිද්විධා.

අනෙකාර්ථම්, නොයෙක් අර්ථඇති; එකරූපාන්විතම්, එකශබ්ද ස්වරූපයෙන් යුක්තවූ; වචඃ, වචනය; ශ්ලිෂ්ටම්, ශ්ලිෂ්ටයයි; ඉෂ්ටම්, කැමතිවනලදී; තත්, ඒ ශ්ලිෂ්ටය; අභින්නපදම්, අභින්නපදය; භින්නපදප්‍රායම්ඉති, භින්නපදප්‍රායයි; ද්විධා, දෙවැදෑරුම්වේ.

311 අසාවුදයමාරූඪඃ කාන්තිමාන්රක්තමණ්ඩලඃ
රාජාහරතිලොකස්‍ය හෘදයංමෘදුභිඃකරෛඃ.

උදයම්, උදයාද්‍රියට; ද්‍යෙහෝ, නොහොත්; උදයපර්වතයට; ආරූඪඃ, නැංගාවූ; කාන්තිමාන්, මනොරම්‍යවූ; ද්‍යෙහෝ, නොහොත් රශ්මිඇත්තාවූ; රක්තමණ්ඩලඃ, අනුරක්තවූ මණ්ඩලවාසීන්ඇති; ද්‍යෙහෝ, නොහොත් රක්තවර්ණබිම්බඇති; මෘදුභිඃ, මෘදුවූ; ද්‍යෙහෝ, නොහොත් ශිතලවූ; කරෛඃ, අතින්; ද්‍යෙහෝ නොහොත් රශ්මි යෙන්; අසෞ, මේ; රාජා, රජතෙම; ද්‍යෙහෝ නොහොත් චන්ද්‍රතෙම;

ලොකස්‍ය, ලොකයාගේ; හෘදයම්, චිත්තය; හරති, පැහැරගනී. මෙහි මේ උදයාදිපදයන් ප්‍රකෘතිප්‍රත්‍යයන් සම්බන්ධව අභින්නහෙයින් අභඞ්ගශ්ලෙෂයට උදාහරණයි.

312 දොෂාකරෙණ සම්බධ්නන් නක්‍ෂත්‍රපථවර්ත්තිනා
රාඥප්‍රදොෂොමාමිත්ථ මප්‍රියංකිංනබාධතෙ.

ප්‍රදොෂඃ, රාත්‍රිමුඛයදෙහෝ නොහොත් ප්‍රකෘෂ්ටදොෂඇති පුරුෂ තෙමෙ; දොෂාකරෙණ, රාත්‍රිප්‍රවර්තිකවූදෙහෝ නොහොත් දොෂයන්ට ආකරවූ; නක්‍ෂත්‍රපථවර්ත්තිනා, ආකාශයෙහි පවත්නාවූදෙහෝ නොහොත් ක්‍ෂත්‍රපථයෙහි හෙවත් රාජරීතියෙහි නොපවත්නාවූ; රාඥ, චන්ද්‍රයාහා දෙහෝ නොහොත් රජුහා; සම්බධ්නන්, සම්බන්ධකරමින්; අප්‍රියම්, ප්‍රියාවිරහිතවූදෙහෝ නොහොත් අප්‍රියවූ; මාම්, මා; ඉත්ථම්, මෙසේ; කිංනබාධතෙ, කුමැයි බාධා නොකරයිද; මෙහි දොෂාකරෙණ යනාදි පද දොෂාංරාත්‍රිංකරොති දොෂස්‍යආකාරඃ යන මේ ආදි ව්‍යුත්පත්තියෙන් ප්‍රකෘතිප්‍රත්‍යය සමාසසම්බන්ධවූ භින්නත්වය ඇති හෙයින් මේ සභඞ්ගශ්ලෙෂනම.

313 උපමාරූපකාක්‍ෂෙප ව්‍යතිරෙකාදිගොචරාඃ
ප්‍රාගෙවදර්ශිතාඃශ්ලෙෂා දර්ශ්‍යන්තෙකෙචනාපරෙ.

උපමාරූපකාක්‍ෂෙප ව්‍යතිරෙකාදිගොචරාඃ, උපමාරූපකආක්‍ෂෙප ව්‍යතිරෙකාදීන් ගොචරකොටඇති; ශ්ලෙෂාඃ, ශ්ලෙෂයෝ; ප්‍රාක්එව, පළමුකොටම; දර්ශිතාඃ, දක්වනලද්දාහු; අපරෙ, අන්‍යවූ; කෙචන, කිසිශ්ලෙෂකෙනෙක්; දර්ශ්‍යන්තෙ, දක්වනුලැබෙති.

314 අස්ත්‍යභින්නාඃ ක්‍රියඃකශ්චිද්විරුද්ධක්‍රියොපරඃ
විරුද්ධකර්මාචාස්ත්‍යන්‍යඃ ශ්ලෙෂොනියමවානපි

315 නියමාක්‍ෂෙපරූපොක්ති රවිරොධීවිරොධ්‍යපි
තෙෂාංනිදර්ශනෙෂෙවව රූපමාවිර්භවිෂ්‍යති.

අභින්නක්‍රියඃ, අභින්නවූ ක්‍රියාඇති; කශ්චිත්, කිසි ශ්ලෙෂයක්; අස්ති, ඇත; අපරඃ, අනිකෙක්; අවිරුද්ධක්‍රියඃ, අවිරුද්ධ ක්‍රියා ඇත්තේය; විරුද්ධකර්මාච, අනිකෙක් විරුද්ධකර්ම ඇත්තේදවෙයි; අනියමවාන්අපි, අනියමවත්වූද; අන්‍යඃශ්ලෙෂඃ, අනික් ශ්ලෙෂයෙක්; අස්ති, ඇත්තේය; නියමාක්‍ෂෙපරූපොක්තිඃ, නියමාක්‍ෂෙපරූපොක්ති ශ්ලෙෂයෙක්ද; අවිරොධී, අවිරොධිශ්ලෙෂයෙක්ද; විරොධීඅපි, විරොධීශ්ලෙෂයෙක්ද; අස්ති, ඇත්තේය; තෙෂාම්, ඔවුන්ගේ; රූපම්, රූපය; නිදර්ශනෙෂුඑව, නිදර්ශනයන්හිලාම; ආවිර්භවිෂ්‍යති, පහළවන්නේය.

316 වක්‍රාඃස්වභාවමධුරාඃ ශංසන්ත්‍යාරාගමුල්වණම්
දෘශොදූත්‍යශ්චකර්ෂන්ති කාන්තාභිඃප්‍රෙෂිතාඃප්‍රියාන්.

කාන්තාභිඃ, කාන්තාවන් විසින්; ප්‍රෙෂිතාඃ, ප්‍රක්‍ෂිප්තවූදෙහෝ නොහොත් ප්‍රෙරිතවූ; වක්‍රාඃ, කුටිලවූදෙහෝ නොහොත් කුටිල මාර්ගයන් දක්වන්නාවූ; ස්වභාවමධුරාඃ, ස්වභාවයෙන් මධුරවූදෙහෝ නොහොත් මධුරවචන කියන්නාවූ; උල්වණම්, අතිශයින් වැඩිගියාවූ;

රාගම්, රක්තවර්ණයදෙහෝ නොහොත් අනුරාගය; ශංසන්ත්‍යඃ, ප්‍රකාශ කරන්නාවූ; දෘශඃ, නෙත්‍රයෝද; දූත්‍යශ්ච, දූතියෝද; ප්‍රියාන්, වල්ලභයන්; කර්ෂන්ති, අදිති. මෙහි වක්‍රාදි විශෙෂණ පදයන්ගේ ශ්ලෙෂබවයි. නෙත්‍රයන්ටද දූතීන්ටද එකම ආකර්ෂණක්‍රියාව බැවින් මේ අභින්නක්‍රියා ශ්ලෙෂනම. එක ක්‍රියාවෙන් වාක්‍යවයාගේ දීපනය ඇතිහෙයින් මෙහි දීපකාඞ්ග ඇතැයි ඇතැම්කෙනෙක් කියත්යයි ටීකාවල පෙණේ.

317 මධුරාරාගවර්ධින්‍යඃ කොමලාඃකොකිලාගිරඃ
ආකර්ණ්‍යන්තෙමදකලාඃ ශ්ලිෂ්‍යන්තෙචාසිතෙක්ෂණාඃ.

මධුරාඃ, ස්වරමාධුර්‍ය්‍යඇති; දෙහෝ නොහොත් මාධුර්‍ය්‍යනම්නායිකාලඞ්කාරඇති; රාගවර්ධින්‍යඃ, උද්දීපකත්වයෙන්දෙහෝ නොහොත් ප්‍රේමපහළකිරීමෙන් අනුරාගවර්ධනයකරන්නාවූ; කොමලාඃ, සුශ්‍රාව්‍යවූ; දෙහෝ නොහොත් මොළලාක්වූ; මදකලාඃ, වසන්ත ප්‍රාරම්භය හෙතුකොටගෙන පුෂ්පරසපානමදයෙන් මත්වූ; දෙහෝ නොහොත් සෞභාග්‍යාදි ගර්වජවිකාරයෙන් උමතුවූ; කොකිලාගිරඃ, කොකිලරුතයෝ; ආකර්ණ්‍යන්තෙ, අසනුලැබෙති; අසිතෙක්ෂණාශ්ච, අසිතනෙත්‍රඇති; කාන්තාවෝද ශ්ලිෂ්‍යන්තෙ, වැළඳගනුලැබෙති. මෙහි ශ්‍රවණ ශ්ලෙෂනා ක්‍රියාවයගේ එකකාලීනත්වයෙන් මේ අවිරුද්ධක්‍රියා ඇති අභඞ්ගශ්ලෙෂනම්වේ. මෙහිද ශ්ලෙෂාඞ්ගයතුල්‍යයොගිතා පරිපොෂණයෙන්මවේ.

318 රාගමාදර්ශයන්නෙෂ වාරුණීයොගවර්ධිතම්
තිරොභවතිඝර්මාංශූ රඞ්ගජස්තුවිජෘම්භතෙ.

එෂඃඝර්මාංශුඃ, මේ සූර්‍ය්‍යතෙම; වාරුණීයොග, පශ්චිමදිගාශ්‍රයෙන් වර්ධිතම්, වැඩුනාවූ; රාගම්, රක්තවර්ණය; ආදර්ශයන්, දක්වමින්; තිරොභවති, සැඟවේ; අඞ්ගජස්තු, අනඞ්ගතෙමේ; වාරුණී යොග, සුරාපානයොගයෙන්; වර්ධිතම්, වැඩුනාවූ; රාගම්, අනුරාගය; දර්ශයන්, දක්වමින්; විජෘම්භතෙ, විජෘම්භනයකෙරේ. මෙහි තිරොභවති විජෘම්භතෙ යන ක්‍රියාවය පරසපර විරුද්ධහෙයින් විරුද්ධ ක්‍රියාශ්ලෙෂනම්විය. මෙහිද තුල්‍යයොගිතා පරිපොෂණය ඇතිනුයි ශ්ලෙෂාඞ්ගවේ.

319 නිස්ත්‍රිංශත්වමසාවෙව ධනුෂ්‍යෙවාස්‍යවක්‍රතා
ශරෙෂ්වෙවනරෙන්ද්‍රස්‍ය මාර්ගණත්වඤ්චවර්තතෙ.

අස්‍යනරෙන්ද්‍රස්‍ය, මේ නරෙන්ද්‍රයාගේ; නිස්ත්‍රිංශත්වම්, නිර්ගතත්‍රිංශදඞ්ගුලිත්වය නොහොත් නිස්කාරුණිකබව; අසෞඑව, කඩුවෙහිම පවතී; වක්‍රතා, වක්‍රබව; නොහොත් ශඨබව; ධනුෂිඑව, දුන්නෙහිම පවතී; මාර්ගණත්වඤ්ච, බාණත්වය නොහොත් යාචකත්වය; ශරෙෂ්වෙව, ඊකෙරෙහිම; වර්තතෙ, පවතී; තමා කෙරෙහි මේ දුෂ්ටගුණ කිසිත් නැතැයිසේයි. මෙහි එවශබ්දයන්ගෙන් නිස්ත්‍රිංශශබ්දාදියෙහි දෙවනා අර්ථඇතිබැව් ව්‍යවච්ඡෙදනොකළහෙයින් මෙහි යුගලාර්ථප්‍රතීතියවේනුයි ශ්ලෙෂබැව් ඇත්තේය; එම එවශබ්දයන්ගෙන්ම නියමද්‍යොතනයද වනහෙයින් මේ නියමවත් ශ්ලෙෂනම්විය.

320 පද්මානාමෙවදණ්ඩෙඤු කණ්ටකත්වයිරක්ෂති
අථවාදශ්‍යෙතෙරාගි මිථුනාලිඞ්ගනෙෂ්වපි.

ත්වයි, තා; රක්ෂති, පෘථිවිය පාලනයකරණකල්හි; පද්මානාම්, පද්මයන්ගේ; දණ්ඩෙෂුඑව, දණ්ඩහිම; කණ්ටකත්‍ව, කටුවේ; දණ්ඩාපායෙහි නැතැයිසේයි; අථවා, නොහොත්; රාගිමිථුනාලිඞ්ගනෙෂුඅප්, අනුරාගීවූ ස්ත්‍රීපුරුෂ මිථුනයන්ගේ ආලිඞ්ගනයෙහිද; කණ්ටකත්‍ව, කටුඇත්තේවෙයි. මෙහි පද්මානාම් දණ්ඩෙෂ්වවයිකල නියමය අථවා යනාදියෙන් වැළැක්වූහෙයින් මේ නියමාක්ෂෙපයි. කණ්ටක ශබ්දයෙහි ශ්ලෙෂාර්ථදඇති. විතීයාර්ථයෙහි කණ්ටක ශබ්දයෙන් කියේ තියුණුඅක්ඇති රොමෝද්ගමයයි දනයුතුයි නොහොත් කුඩා සැනසි.

321 මහිභෘත්භූරිකටක සෙතජස්වීනියතොදයඃ
දක්ෂඃප්‍රජාපතිශ්වාසීත් ස්වාමිශක්තිධරශ්වසඃ.

සඃ, හෙතෙම; මහීභෘත්, රජවූයේ නොහොත් පර්වතවූයේ; භූරිකටකඃ, බොහෝ කඳවුරුඇත්තේය; නොහොත් විශාලවූ නිතම්බ ඇත්තේය; තෙජස්වී, ප්‍රතාපඇත්තේය; නොහොත් රශ්මිඇත්තේය නියතොදයඃ, නිරන්තරයෙන් අභ්‍යුදයඇත්තේය නොහොත් උද්ගම ඇත්තේය; දක්ෂඃ, දක්ෂවූයේය නොහොත් දක්ෂනම් සෘෂිවූයේය; ප්‍රජාපතිශ්චඅාසීත්, ප්‍රජාපාලකවූයේය නොහොත් නිර්මාණකර්තෘවූ බ්‍රහ්මවූයේය; ස්වාමි, ප්‍රභුවූයේය නොහොත් විශාඛවූයේය; ශක්තිධරඃ, ස්වභාවය උත්සාහය මන්ත්‍රජය යන ශක්තිදරන්නේය නොහොත් ස්කන්දකුමාරවූයේය. මෙහි මහීභෘත් යනාදි ශ්ලෙෂපදාර්ථයන්ගේ පරස්පරසම්බන්ධයෙහිමලා අවිරොධහෙයින් මේ අවිරොධිශ්ලෙෂයි.

322 අච්‍යුතොප්‍යවෘෂච්ඡෙදී රාජාප්‍යවිදිතක්ෂයඃ
දෙවොප්‍යවිබුධොජඥෙ ශඞ්කරොප්‍යභුජඞ්ගවාන්.

අච්‍යුතඃඅපි, සත්පථයෙන් භ්‍රෂ්ටනුවූයේද; නොහොත් විෂ්ණුවූයේද; අවෘෂච්ඡෙදී, ධර්මච්ඡෙදකනොවේ නොහොත් වෘෂනම් අසුරයා නසන්නේ නොවෙයි; රාජාඅපි, නරපතිවූයේද නොහොත් චන්ද්‍රවූයේද; අවිදිතක්ෂයඃ, නොදන්නාලද ක්ෂයරොග ඇත්තේය; නොහොත් නොදන්නාලද ක්ෂීණතාරොග ඇත්තේය; දෙවඃඅපි, රජවූයේද නොහොත් දෙවිවූයේද; අවිබුධඃ, අපණ්ඩිතය; නොහොත් විබුධනුවූයේය; ශඞ්කරඃ, ශුභකරවූයේ නොහොත් ඊශ්වරවූයේද; අභුජඞ්ගවාන්, දුර්ජනරහිතවූයේ නොහොත් සර්පවිරහිතවූයේ; ජඥෙ, උපන්නේය. මෙහි අච්‍යුතාදි පදයන්ගේ විතියාර්ථවූ විෂ්ණුආදීන් කෙරෙහි අවෘෂච්ඡෙදත්‍යාදි පදාර්ථසම්බන්ධය විරුද්ධනුයි, මේ විරොධිශ්ලෙෂයි.

## ශ්ලෙෂවක්‍රම්—ශ්ලෙෂවක්‍රයයි.

323 ගුණජාතික්‍රියාදීනාං යත්තුවෛකල්‍යදර්ශනම්
විශෙෂදර්ශනායෛව සාවිශෙෂොක්තිරිෂ්‍යතෙ.

විශෙෂදර්ශනායඑව, (ප්‍රස්තුතයාගේ වියශක්තිශයාදී) විශෙෂදර්ශනය පිණිසම; ගුණජාතික්‍රියාදිනාම්, ගුණය ජාතිය ක්‍රියාය යන මේ

ආදීන්ගේ; යත්තු, යම්; වෛකල්‍යදර්ශනම්, විකලතා දර්ශනයක් හෙවත් කාර්‍ය්‍යසිද්ධියෙහිලා අනුපයොගිත්‍ව ප්‍රතිපාදනයක්වේද; සා, ඕතොමෝ; විශෙෂොක්තිඃ, විශෙෂොක්තියයි; ඉෂ්‍යතෙ, කැමතිවනු ලැබේ.

324 නකඨොරංනවාතීක්‍ෂ්ණ මායුධංපුෂ්පධන්‍වනඃ
තථාපිජිතමෙවාසීදමුනාභුවනත්‍රයම්.

පුෂ්පධන්‍වනඃ, අනඞ්ගයාගේ; ආයුධම්, ආයුධය; නකඨොරම්, කඨිනනොවෙයි; නවාතීක්‍ෂ්ණම්, තීක්‍ෂ්ණදනොවේ; පුෂ්පමය හෙයි නැයිසේයි; තථාපි, එසේවුවද; අමුනා, මොහුවිසින්; භුවනත්‍රයම්, භුවනත්‍රය; ජිතම්එව, දිනනලද්දේම ආසීත්වූයේය. මෙහි අනඞ්ගයාගේ විජයාතිශය රූපයාගේ දර්ශනහෙයින් ගුණවෛකල්‍යයෙහිවූ විශෙෂොක්තියි.

325 නදෙවකන්‍යකානාපි ගන්‍ධර්ව්කුලසම්භවා
තථාප්‍යෙෂාතපොභඞ්ගං විධාතුංවෙධසොප්‍යලම්.

එෂා, මේතොමෝ; දෙවකන්‍යකාන, දිව්‍යකන්‍යාවක් නොවෙයි; ගන්‍ධර්ව්කුලසම්භවාන, ගන්‍ධර්ව්කුලයෙහි උපන්නියකුත් නොවෙයි; තථාපි, එතකුදුවුවත්; වෙධසඃඅපි, මහාබ්‍රහ්මයාගේද; තපොභඞ්ගම්, තපොභඞ්ගය; විධාතුම්, කරන්ට; අලම්, සමර්ථයි. මෙහි දෙවත්‍ව ගන්‍ධර්ව්ත්‍වරූපවූ ජාතියගේ නිරපෙක්‍ෂතායෙන් තපොභඞ්ගසාමර්ථ්‍යනා වර්ණනාකළහෙයින් ජාතිවෛකල්‍යයෙහිවූ විශෙෂොක්තියි.

326 නබද්ධාභ්‍රූකුටිර්නාපි ස්ඵුරිතොදශනච්ඡදඃ
නචරක්තාභවද්දෘෂ්ටි ර්ජිතඤ්ද්විෂතාංබලම්.

භ්‍රූකුටිඃ, භ්‍රූභඞ්ගය; නබද්ධා, නොබඳනාලද; දශනච්ඡදඃ, අධරය; නස්ඵුරිතඃ, කම්පිතනොවීය; භවත්, භවත්හුගේ, දෘෂ්ටිඃ, ඇස; නරක්තා, රතුවූයේ නොවෙයි; එසේවුවද ද්විෂතාම්, සතුරන්ගේ; බලම්, බලය; ජිතඤ්, දිනනලද්දේවිය. මෙහි බන්‍ධනයද කම්පනයද රඤ්ජනයද නොකියයි. ඔවුන්ගේ වෛකල්‍යප්‍රතිපාදනය වර්ණිතයවූ වීරයාගේ; උත්කර්ෂද්‍යොතනය පිණිසවේ; එහෙයින් මේ ක්‍රියාවෛකල්‍යයෙහිවූ විශෙෂොක්තියි.

327 නරථානචමාතඞ්ගා නහයානචපත්තයඃ
ස්ත්‍රීණාමපාඞ්ගදෘෂ්ට්‍යෛවජීයතෙජගතාංත්‍රයම්.

රථා, රථයෝද; න, නැත; මාතඞ්ගාච, හස්තිහුද; න, නැත්තාහ; හයාච, අශ්වයෝද; න, නැත්තාහුය; පත්තයඃ, පාබලසෙනාද; න, නැත්තාහ; ස්ත්‍රීණාම්, ස්ත්‍රීන්ගේ; අපාඞ්ගදෘෂ්ට්‍යෛව, අපාඞ්ගදෘෂ්ටියෙන්ම හෙවත් නෙත්‍රකොටිනිරීක්‍ෂණයෙන්ම ජගතාංත්‍රයම්, තුන්ලොකය; ජීයතෙ, දිනනුලැබේ. මෙහි රථාදිවූ ද්‍රව්‍යයන්ගේ වෛකල්‍යදර්ශන පහළවූහෙයින් මේ ද්‍රව්‍යවෛකල්‍යයෙහිවූ විශෙෂොක්තියි.

328 එකචක්‍රොරථොයන්තා විකලොවිෂමාහයාඃ
ආක්‍රමතෙවතෙජස්වී තථාප්‍යර්කොනභස්තලම්.

රථඃ, රථය; එකචක්‍රඃ, එකචක්‍රයක් ඇත්තේය; යන්තා, සාරථි තෙමේ; විකලඃ, විකලයි; (අනූරුයයි ප්‍රසිද්ධහෙයිනි); හයාඃ, අශ්වයෝ;

විෂමාඃ, විෂමයන; (සඞ්ඛ්‍යාසංඛ්‍යක්‍රමයෙන් අනුගහෙයිනි) තථාපි, එත කුදුවුවත්; අර්කඃ, සූර්‍ය්‍යතෙමේ; තෙජස්වී. තෙජස්ඇත්තේ; නභස්ත ලම්, ආකාශතලය; ආක්‍රමතිඑව, ආක්‍රමණයකෙරේමැයි.

329 සෛෂාහෙතුවිශෙෂොක්තිඃ තෙජස්විතිවිශෙෂණාත්
අයමෙවක්‍රමොන්‍යෙෂාං භෙදනාමපිකල්පනෙ.

තෙජස්වීඉති, තෙජස්වීයන; විශෙෂණාත්, විශෙෂණය හෙතු කොටගෙන; සාඑෂා, එමේ විශෙෂොක්තිතොමෝ; හෙතුවිශෙෂො ක්තිඃ, හෙතුවිශෙෂොක්තිනම්වේ; අන්‍යෙෂාංඅපි, අන්‍යවූද; භෙද නාම්, විශෙෂයන්ගේ; කල්පනෙ, විධානයෙහිලා; අයම්එවක්‍රමඃ, මේ ක්‍රමයමැයි.

**විශෙෂොක්ති චක්‍රම්-විශෙෂොක්ති චක්‍රයයි.**

---

330 විවක්ෂිතගුණොත්කෘෂ්ටෙ ර්යත්සමීකෘත්‍යකස්‍යචිත්
කීර්තිනංස්තුතිනින්දාර්ථං සාමතාතුල්‍යයොගිතා.

විවක්ෂිතගුණ, විවක්ෂිතවූ ගුණයෙන් හෙවත් ප්‍රස්තුතගතත්ව යෙන් ප්‍රතිපාදනයට කැමතිවූ ගුණයෙන්; උත්කෘෂ්ටෛඃ, උත්කෘෂ්ට වූවන්හා; සමීකෘත්‍ය, සදෘශකොට; කස්‍යචිත්, කිසිවක්හු සම්බන්ධව; ස්තුතිනින්දාර්ථම්, ස්තුතිපිණිස හෝ නින්දාපිණිස; කීර්තනම්, කීර්තනය කිරීමය යන; යුත්, යමක්ඇද්ද; සා, ඕතොමෝ; තුල්‍යයොගිතා, තුල්‍යයොගිතානම්වේ.

331 යමඃකුවෙරොවරුණඃ සහස්‍රාක්ෂොභවානපි.
විභ්‍රත්‍යනන්‍යවිෂයාං ලොකපාලඉත්ශ්‍රුතිම්.

යමඃ, යමයාද; කුවෙරඃ, වෛශ්‍රවණද; සහස්‍රාක්ෂඃ, ශක්‍රයාද; භවාන්අපි, භවත්තෙමේද; අනන්‍යවිෂයාම්, අනන්‍යගොචරවූ; ලොක පාලඉතිශ්‍රුතිම්, ලොකපාලයන ශ්‍රුතිය; විභර්ති, උසුලයි;. මෙහි ලොකපාලත්වරූපවූ ගුණය ප්‍රස්තුතවූ රජුකෙරෙහි විවක්ෂිතයි. ඒ ලොකපාලත්වගුණයෙන් උත්කෘෂ්ටවූ යමාදීන් හා සමකක්ෂත්වයෙන් කීර්තනයකිරීම ස්තුතිරූපතුල්‍යයොගිතායි.

332 සඞ්ගතානිමෘගාක්ෂීණාං තඩිද්විලසිතානිච
ක්ෂණද්වයංනතිෂ්ඨන්තිඝනා රබ්ධාන්‍යපිස්වයම්.

මෘගාක්ෂීණාම්, ස්ත්‍රීන් සම්බන්ධවූ; සඞ්ගමානි, සඞ්ගමයෝද; තඩිත්, විද්‍යුල්ලතා සම්බන්ධවූ; විලසිතානි, බැබලුම්ද; ඝනාරබ්ධා න්‍යපි, ඝනව පටන්ගන්නාලද්දාහුද; විද්‍යුල්ලතා පක්ෂයෙහි මෙඝ යන් විසින් පටන්ගන්නාලද්දාහුද; ක්ෂණද්වයම්, ක්ෂණදෙකක්; නති ෂ්ඨන්ති, නොසිටිති. මෙහි ක්ෂණමාත්‍රයක් සිටීම ස්වභාවකොටඇති; ගුණය ස්ත්‍රීසඞ්ගමයෙහිලා විවක්ෂිතයි. එයින්ද අප්‍රස්තුතවූ තඩිත් විලසිතයාගේ සමකක්ෂත්වයෙන් වර්ණනාකිරීම හෙතුකොටගෙණ නින්දාව ප්‍රතීයමානවේ. එහෙයින් මේ නින්දාරූපවූ තුල්‍යයොගිතායි

**තුල්‍යයොගිතා-තුල්‍යයොගිතායි.**

---

333 විරුද්ධානාංපදාර්ථානාං යත්‍රසංසර්ගදර්ශනම්
විශෙෂදර්ශනායෛව සවිරෙධඃ ස්මෘතොයථා.

යත්‍ර, යම්වෛචිත්‍ර්‍යකථනයෙක්හිලා; විශෙෂස්‍ය, ප්‍රස්තුතගත උත්කර්ෂය; දර්ශනාය, දක්වීම පිණිස; විරුද්ධානාම්, විරුද්ධවූ; පදාර්ථානාම්, පදාර්ථයන්ගේ; සංසර්ගදර්ශනම්, සම්බන්ධ ප්‍රතිපාදනයක්වේද; සඃ, එය; විරෙධඃස්මෘතඃ, විරෙධයයි දන්නාලදී; යථා, ඊට උදාහරණ මෙසේයි.

334 කූජිතංරාජහංසානාං වර්ධතෙමදමඤ්ජුලම්
ක්ෂීයතෙචමයූරාණාං රුතමුත්ක්‍රාන්තසෞෂ්ඨවම්.

රාජහංසානාම්, රාජහංසයන්ගේ; මදමඤ්ජුලම්, මදයෙන්මනොඥවූ; කූජිතම්, නාදය; වර්ධතෙ, වැඩේ; මයූරාණාම්, මයූරයන්ගේ; උත්ක්‍රාන්තසෞෂ්ඨවම්, පහවූ මනොඥත්වයඇති; රුතම්, නාදය; ක්ෂීයතෙ, ක්ෂයවේ. මෙහි ශබ්දරූපවූ එකම කර්තෘකෙරෙහි විරුද්ධවූ වර්ධනාපික්ෂයාපිඇති ක්‍රියාවයගේ සංසර්ගය දක්නාලැබේ. ශබ්ද සම්බන්ධවූ හංසමයූරයන්ගේ භෙදය හෙතුකොටගෙන ශබ්දවය භින්නහෙයින් විරෙධ ප්‍රශමනයද ඇත්තේය. මෙයින් වර්ණිතියවූ ශරත්කාලයෙහි එක ශබ්දජාතිහුගේ වර්ධනක්ෂයනා කරණහෙයින් උත්කර්ෂතා ප්‍රතීතියවෙනුයි මෙහි අලඞ්කාරබවයි.

335 ප්‍රාවෘෂෙණ්‍යෛර්ජලධරෛ රම්බරංදුර්දිනායතෙ
රාගෙණපුනරාක්‍රාන්තං ජායතෙජගතාංමනඃ.

ප්‍රාවෘෂෙණ්‍යෛඃ, වර්ෂාකාලයෙහිවූ; ජලධරෛඃ, මෙඝයන් කාරණකොටගෙන; අම්බරම්, ආකාශය; දුර්දිනායතෙ, නීලවර්ණවේ; පුනඃ, නැවත; ජගතාම්, ලෝවැස්සන්ගේ; මනඃ, සිත; රාගෙණ, රාගයෙන් නොහොත් රක්තවර්ණයෙන්; ආක්‍රාන්තම්, මඩනාලදී. මෙහි ශ්‍යාම වර්ණ රක්තවර්ණ දෙදෙනාගේ එකම මෙඝසම්භවත්වරූපසංසර්ග කීර්තනය විරෙධය. ඒ විරෙධය ශ්ලෙෂයෙන් සමනයවිය, මෙයින් ප්‍රස්තුතවූ වර්ෂාකාලයාගේ උත්කර්ෂය ප්‍රතීයමානවේ.

336 තනුමධ්‍යංපෘථුශ්‍රොණිරක්තොෂ්ඨමසිතෙක්ෂණම්
නතනාභි වපුඃස්ත්‍රීණාං කං නහන්ත්‍යුන්නතස්තනම්.

ස්ත්‍රීණාම්, ස්ත්‍රීන්ගේ; තනුමධ්‍යම්, සිහින්වූඉඟඇති; පෘථුශ්‍රොණි, පුළුලවූ නිතම්බඇති; රක්තොෂ්ඨම්, රක්තවර්ණවූ අධරඇති; අසිතෙක්ෂණම්, කෘෂ්ණවර්ණවූ ඇස්ඇති; නතනාභිඃ, ගම්භීරවූ නාභිඇති; උන්නත, උස්වූ: ස්තනම්, පයොධරඇති; වපුඃ, ශරීරය; කම්, කවරක්හු; නහන්ති, නොනසයිද; වැලිහැමදෙනම තවයිසේයි.

මෙහි තනුත්වපෘථුත්ව දෙදෙනාගේද රක්තත්වකෘෂ්ණත්ව දෙදෙනාගේද නතත්වඋන්නතත්ව දෙදෙනාගේද අන්‍යොන්‍යගුණ විරෙධයෙන් ප්‍රස්තුතවූ ස්ත්‍රීන්ගේ වෛචිත්‍ර්‍යය ප්‍රතීයමානවෙයි.

337 මෘණාලබාහුරම්භොරු පද්මොත්පලමුඛෙක්ෂණම්
අපිතෙරූපමස්මාකං තන්විතාපාය කල්පතෙ.

තන්වි, තුනුවඟ; තෙ, තීගේ; මෘණාලබාහු, මෘණාල බඳුවූබාහු ඇති; රම්භොරු, කදලිවෘක්ෂබඳුවූ කලවාඇති; පද්මොත්පලමුඛෙක්ෂ

ණම්, පියුම් හා උපුල්බඳුවූ; මුඛය් හා නෙත්‍රඇති; රූපම්අපි, රූපයද; අසමාකම්, අපගේ; තාපාය, තැවීම පිණිස; කල්පතෙ, සමර්ථවේ. මෙහි උපමාගර්භකොට බහුව්‍රීහිසමාසවූ මෘණාලබාහුආදි පදයන්ගේ; ශීතලගුණය තාපක්‍රියාවට විරුඬය. එසේනමුදු වක්තෘහුගේ විර හිඬය හෙතුකොටගෙණ විරෙධපරිහාරයවේ.

338 උද්‍යානමාරුතොඬූතාශ් චූතචම්පකරෙණවඃ
උදශ්‍රයන්තිපාන්ථානා මස්පෘශන්තොපිලොචනෙ.

උද්‍යානමාරුත, උපවනවාතයෙන්; උඬූතාඃ, නැංගාවූ; චූතචම්පකරෙණවඃ, චූතම්පකරේණූහු; පාන්ථානාම්, පථිකයන්ගේ; ලොචනෙ, නෙත්‍රයන්; අස්පෘශන්තඃඅපි, සපර්ශනොකරන්නාහුද; උදශ්‍රයන්ති, උද්ගතබාෂ්ප ඇත්තවුන්කෙරෙති. මෙහි සපර්ශාභාවය ඇතිකලත් උදශ්‍රයනකරණය විරෙධයි. පරාගයන්ගේ උද්දීපකත්වයෙන් එහි පරිහාරදවේ.

339 කෘෂ්ණාර්ජුනානුරක්තාපි දෘෂ්ටිඃකර්ණාවලම්බිනී
යාතිවිශ්වසනීයත්වං කස්‍යතෙකලභාෂිණී.

කලභාෂිණී, මධුරවචන ඇත්තීය; තෙ, තීගේ; දෘෂ්ටිඃ, දෘෂ්ටි තොමෝ; කෘෂ්ණාර්ජුනානුරක්තාඅපි, කෘෂ්ණ අර්ජුනයන් කෙරෙහි අනුරක්තාවූවාද; කර්ණාවලම්බිනී, කර්ණයඑල්බගෙන සිටිනිය; කස්‍ය, කවරක්හට; විශ්වසනීයත්වම්, විශ්වාස කටයුතුබවට; යාති, යේද. මෙහි කෘෂ්ණාර්ජුනානුරක්තයද කර්ණාවලම්බනයද යන ක්‍රියාවයගේ විරෙධය ශ්ලෙෂාර්ථයෙන් පහවේමය. මෙහි ශ්ලෙෂනම් කවරේද කෘෂ්ණා, කලුවූ; අර්ජුන, ධවලවූ; අනු, නෙත්‍රප්‍රාන්තයෙහි; රක්තා, රක්තවර්ණවූ කර්ණාවාලම්බිනී කර්ණාන්තගාමිනීවූ යන අර්ථද ඇතිබවයි

340 ඉත්‍යනෙකප්‍රකාරොය මලඞ්කාරඃප්‍රතීයතෙ

ඉති, මෙසේ; අයම්අලඞ්කාරඃ, මේ විරෙධාලඞ්කාරය; අනෙක ප්‍රකාරඃ, අනෙකප්‍රකාරවූයේ; ප්‍රතීයතෙ, හැගේ.

## විරෙධවක්‍රම්, ඩිරෙධවක්‍රයයි.

අප්‍රස්තුතප්‍රශංසාස්‍යා දප්‍රක්‍රාන්තෙෂුයාස්තුතිඃ.

අප්‍රක්‍රාන්තෙෂු, අප්‍රස්තුතයන් කෙරෙහිවූ; යාස්තුතිඃ, යම් ස්තුති යක්වේද; සා, ඕතොමෝ; අප්‍රස්තුත ප්‍රශංසාස්‍යාත්, අප්‍රස්තුත ප්‍රශංසා නම්වේ. ප්‍රස්තුතයහට නින්දාපිණිස අප්‍රස්තුතයාගේ ස්තුතිය අප්‍ර ස්තුත ප්‍රශංසානමැයිසේයි. මෙහි අප්‍රක්‍රාන්තෙෂු යනු සම්බන්ධාර්ථයෙහි සප්තමියයි ටීකාකාරයෝ කියත්.

341 සුඛංජීවන්තිහරිණා වනෙෂ්වපරසෙවිනඃ
අන්නෛරයත්නසුලභෛ ස්තෘණදර්භාඞ්කුරාදිභිඃ.

අපරසෙවිනඃ, පරසෙවාතැත්තාවූ; හරිණාඃ, මෘගයෝ; වනෙෂු, වනයන්හි; අයත්නසුලභෛඃ, අනායාශයෙන් සුලභවූ; තෘණදර්භා ඞ්කුරාදිභිඃ, තෘණදර්භාඞ්කුරාදිවූ; අන්නෛඃ, ආහාරයෙන්; සුඛම්, සැපසේ; ජීවන්ති, ජීවත්වෙති.

342 සෙයමප්‍රස්තුතෛවාත්‍ර මෘගවෘත්තිඃප්‍රශස්‍යතෙ
රාජානුවර්තිනක්ලෙශනිර්විණ්ණෙන මනස්විනා.

අත්‍ර, මේ ප්‍රයොගයෙහි; අප්‍රස්තුතාඑව, අප්‍රස්තුතවූම; සාඉයම් මෘගවෘත්තිඃ, ඒ මේ මෘගයන් සම්බන්ධවූ වෘත්තිය; රාජානුවර්තින ක්ලෙශ, රාජානුවර්තිනයෙන්වූ ක්ලෙශයෙන්; නිර්විණ්ණෙන, කලකිරුනාවූ ඝ්සිවකු විසින්; ප්‍රශස්‍යතෙ, ප්‍රශංසාකරනුලැබේ.

## අප්‍රස්තුතප්‍රශංසා, අප්‍රස්තුතප්‍රශංසායි.

343 යදිනිඥන්නිවස්තෞති ව්‍යාජස්තුතිරසෞස්මෘතා
දොෂාභාසාගුණාඑව ලභන්තෙහ්‍යත්‍රසන්නිධිම්.

යදි, ඉදින්; නිඥන්ඉව, නින්‍දාකරන්නාක්මෙන්; ස්තෞති, ස්තුතිකෙරේද; අසෞ, මෝතොමෝ; ව්‍යාජස්තුතිඃ, ව්‍යාජස්තුතියයි; ස්මෘතා, දන්නාලද්දී; අත්‍ර, මෙහිලා; දොෂාභාසාඃ, දොෂමෙන් ප්‍රතීයමාණවූ ගුණාඃඑව, ගුණයෝම; සන්නිධිම්, පිහිට; ලභන්තෙහි, ලබත්මැයි.

344 තාපසෙනාපිරාමෙණ ජිතෙයංභූතධාරිණී
ත්වයාරාඥපිසෛවෙයං ජිතාමාභූන්මදස්තව.

තාපසෙනාපි, තාපසවූද; රාමෙණ, පරශුරාමයා විසින්; ඉයම් භූතධාරිණී, මේ පෘථිවීතොමෝ; ජිතා, දිනනලදී; රාඥ, රජවූ; ත්වයාපි, තා විසින්ද; සාඉයම්එව, ඒ මේ පෘථිවියම; ජිතා, දිනනලදී; (මේ හෙතුවින්) තව, තට; මදඃ, මදයෙක්; මාඅභූත්, නොවේවා.

මෙහි ප්‍රස්තුතවූ රජහට ආපාතවශයෙන් නින්දප්‍රතීතියවේ; එසේනමුදු භගවත්හුගේ අංශාවතාරවූ පරශුරාමයා විසින් ඊශ්වර ප්‍රසාදයෙන් ලබනලද පොරවෙන් පෘථිවිය දිනනලද්දීය, මනුෂ්‍යවූ ඔබ විසින් ස්වශක්තියෙන් ඒ පෘථිවිය දිනනලද්දියයි කීමෙන් මහත් වූ ස්තුතියක් ප්‍රකාශකළාවෙයි. එහෙයින් මේ ව්‍යාජස්තුතිම්වියයි දතයුතුයි.

345 පුංසඃපුරාණාදාච්ඡිද්‍ය ශ්‍රීස්ත්වයාපරිභුජ්‍යතෙ
රාජන්නික්ෂ්වාකුවංශස්‍ය කිමිදංතවයුජ්‍යතෙ.

රාජන්, රජ; පුරාණාත්පුංසඃ, පුරාණපුරුෂයයි කියනලද විෂ්ණු හුකෙරෙන්; ශ්‍රීඃ, ශ්‍රීකාන්තාව; අථවා නොහොත් පුරාණාත්පුංසඃ, වෘද්ධපුරුෂයක්හුකෙරෙන්; ශ්‍රීඃ, සම්පත්තිය; ආච්ඡිද්‍ය, පැහැරගෙන ත්වයා, තා විසින්; පරිභුජ්‍යතෙ, පරිභොගකරනු ලැබේ. ඉක්ෂ්වාකු වංශස්‍ය, ඉක්ෂ්වාකුවංශඇජ්; තව, තට; ඉදම්, මෙය; කිංයුජ්‍යතෙ, කුමැයිසෙදේද. ආදි පුරුෂයාකෙරෙන් ලක්ෂ්මිය පැහැරගෙන පරි භොගකිරිම ඉක්ෂ්වාකුවංශයෙහි උපන් තට අයොග්‍යයයි නින්දකිරි මෙන් ඔබගෙ සම්පත ඉතා මහතැයි යන ස්තුතිය ප්‍රතීයමානවේ. මෙහි පුරාණ ශබ්දයාගේද ලක්ෂ්මිශබ්දයාගේද අභිගත ශ්ලෙෂය අතිශ යචමත්කාරජනකවේ. මේ අභිශ්ලෙෂමූලවූ ව්‍යාජස්තුතියට උදාහර ණයි.

346 භුජඞ්ගභොගසංසක්තා කලත්‍රාතවමෙදිනී
අහඞ්කාරඃපරාංකොටි මාරොහති කුතස්තව.

භුජඞ්ගභොග, සර්පශරීරයෙන්; සංසක්තා, සංසක්තවූ; දෙහෝ නොහොත්, භුජඞ්ගභොග, ජාරසම්භොගයෙහි; සංසක්තා, ආසක්ත තවූ; මෙදිනී, පෘථිවිතොමෝ; තව, තාගේ; කලත්‍රම්, භාය්‍ර්‍යායි; එසේ වුවද; තව, තාගේ; අහඞ්කාරඃ, අහඞ්කාරය; පරාංකොටිම්, අත්‍යර්‍ථ කොටියට; ආරොහති, නැගේ; කුතඃ, කවරහෙයකින්ද; මේ භුජඞ්ගා දිශබ්දයන්ගේ අනෙකාර්‍ථභාවයෙන් ශබ්දශ්ලෙෂ මූලව්‍යාජස්තුතියට උදාහරණයි.

347 ඉතිශ්ලෙෂානුවිඩා නාමන්‍යෙෂාඤ්චොපලක්ෂ්‍යතාම්
ව්‍යාජස්තුතිප්‍රකාරාණා මපය්‍ර්‍යන්තස්තුවිස්තරඃ.

ඉති, මෙසේ; ශ්ලෙෂානුවිඩානාම්, ශ්ලෙෂයුක්තාවූද; අන්‍යෙෂාඤ්ච, අන්‍යවූද; ව්‍යාජස්තුතිප්‍රකාරාණාම්, ව්‍යාජස්තුතිප්‍රකාරයන්ගේ; අප ය්‍ර්‍යන්තඃ, පය්‍ර්‍යන්තරහිතවූ; විස්තරස්තු, විස්තරය වනාහි; උපලක්ෂ්‍ය තාම්, දන්නාලැබේවා.

**ව්‍යාජස්තුතිඃ-ව්‍යාජස්තුතියි.**

---

348 අර්‍ථාන්තරප්‍රවෘත්තෙන කිඤ්චිත්තත්සදෘශංඵලම්
සදසද්වානිදශ්‍යෙත යදිතත්ස්‍යාන්නිදර්ශනම්.

යදි, ඉදින්; අර්‍ථාන්තර ප්‍රවෘත්තෙන, කාය්‍ර්‍යාන්තරයක පවත් නාක්හු විසින්; තත්සදෘශම්, ඒ කාය්‍ර්‍යාන්තරයට සමානවූ; සත්අසත් වා, යහපත්වූ හෝ අයහපත්වූ හෝ; කිඤ්චිත්ඵලම්, කිසිඵලයක්; නිදශ්‍යෙත, දක්වනුලැබේද; තත්, එය; නිදර්ශනංස්‍යාත්, නිදර්ශන නම්වන්නේය.

349 උදයන්නෙෂසවිතා පද්මෙෂ්වර්පයතිශ්‍රියම්
විභාවයිතුමෘඩිනාං ඵලංසුහෘදනුග්‍රහම්.

එෂසවිතා, මේසූය්‍ර්‍යතෙම; උදයන්, උදාවන්නේ; සෘඩිනාම්, සමෘ ඩින්ගේ; ඵලම්, ඵලය; සුහෘත්අනුග්‍රහම්, සුහෘදනුග්‍රහයයි; විභාවයි තුම්, ප්‍රකාශකරන්ට; පද්මෙෂු, පද්මයන්හි; ශ්‍රියම්, ශොභාව; අර්පයති, පිහිටුවයි මෙහි පද්මයන් කෙරෙහි ශ්‍රීදානප්‍රවෘත්තවූ උදය සාලිවූ සූය්‍ර්‍යයා විසින් මිත්‍රොපකාරරූපවූ උදය ඵලය දක්වනුලැබේ, මෙහි ඵලය උත්කෘෂ්ටයි.

350 යාතිචන්ද්‍රාංශුභිඃ සපෘෂ්ටාධ්වාන්තරාජීපරාභවම්
සද්‍යොරාජවිරුඩානාං සූචයන්තීදුරන්තතාම්.

චන්ද්‍රාංශුභිඃ, චන්ද්‍රරශ්මියෙන්; සපෘෂ්ටා, ස්පර්ශකරණලද; ධ්වා න්තරාජී, අන්ධකාර ශ්‍රෙණීතොමෝ; රාජවිරුඩානාම්, චන්ද්‍රයාටද්‍යෙ හෝ නොහොත් රජුන්ට විරුඩයන්ගේ; දුරන්තතාම්, දුඃඛජනක කෙළවරඇතිබව; සූචයන්තී, ප්‍රකාශකරන්නී; සද්‍යඃ, එකෙණෙහි; පරාභවම්, විනාශයට; යාති, පැමිණේ. මෙහි ඵලය අපකෘෂ්ටයි.

**නිදර්ශනම්-මේ නිදර්ශනයි.**

---

351 සහොක්තිඃසහභාවෙන කථනංගුණකර්මණාම්
අර්ථානාංයොවිනිමයඃ පරිවෘත්තිස්තුසාස්මෘතා.

ගුණකර්මණාම්, ගුණක්‍රියාවන්ගේ; සහභාවෙන, සහභාවයෙන්; කථනම්, කථනයකිරීම; සහොක්තිඃ, සහොක්තිනම්වේ (ද්‍රව්‍යාදීන්ගේද සහභාවකීර්තනය හෙතුකොටගෙන ගුණ ක්‍රියාවන්ගේය යනු උපලක්ෂණයි) අර්ථානාම්, වස්තූන්ගේ; යඃ විනිමයඃ, යම්ප්‍රතිදානයක් වේද; සාතු, ඕ වනාහි; පරිවෘත්තිඃ, පරිවෘත්තියයි; ස්මෘතා, දන්නාලදී.

352 සහදීර්ඝාමමශ්වාසෛ රිමාඃසම්ප්‍රතිරාත්‍රයඃ.
පාණ්ඩුරාශ්චමමෛවාඞ්ගෛඃ සහතාශ්චන්ද්‍රභූෂණාඃ.

සම්ප්‍රති, දැන්; හෙවත් මේ ප්‍රියවිරහකාලයෙහි; ඉමාරාත්‍රයඃ, මේ රාත්‍රීහු; මම, මාගේ; ශ්වාසෛඃසහ, ශ්වාසයන් සමග; දීර්ඝාඃ, දීර්ඝයහ; චන්ද්‍රභූෂණාඃ, චන්ද්‍රයා ආභරණකොටඇති; තාඃ, ඒ රාත්‍රීහු; මම, මාගේ; අඞ්ගෛඃසහ, ශරීරාවයවයන් සමග; පාණ්ඩුරාශ්ච, පාණ්ඩුවර්ණීදවෙති මේ විරහිණියකගේ උක්තියි. මේ ගුණ සහ භාව සහොක්තියට උදාහරණයි.

353 වර්ධන්තෙසහපාන්ථානාං මූර්ඡයාචූතමඤ්ජරී
පතන්තිචසමංතෙෂා මසුභිර්මලයානිලාඃ.

චූතමඤ්ජරී, චූතපුෂ්පකලිකාතොමෝ; පාන්ථානාම්, පථිකයන්ගේ; මූර්ඡයාසහ, මූර්ඡාව සමග; වර්ධන්තෙ, වැඩේ; තෙෂාම්, ඔවුන්ගේ; අසුභිඃසහ, ප්‍රාණවාතයන් සමග; මලයානිලාඃ, මලයමාරුතයෝ; පතන්ති, හෙති. මේ ක්‍රියා සහ භාව සහොක්තියට උදාහරණයි.

354 කොකිලාලාපසුභගාඃ සුගන්ධිවනවායවඃ
යාන්ති සාර්ධංජනානන්දෛර්වෘද්ධිංසුරභිවාසරාඃ.

කොකිලාලාප, කොකිල නාදයෙන්; සුභගාඃ, මනොඥවූ; සුගන්ධිවනවායවඃ, සුගන්ධවූ වනමාරුතඇති; සුරභිවාසරාඃ, වසන්තාදින යෝ; ජනානන්දෛඃ සාර්ධම්, ජනයන්ගේ සන්තුෂ්ටීන් සමග; වෘද්ධිංයාන්ති, වෘද්ධියටයෙති. මේ අලඞ්කාරය සහ ශබ්දප්‍රයොගයෙන්ම වේය යන ශ්‍රොතෘජනයාට හටගන්නා භ්‍රම නිරාකරණය පිණිස මේ උදාහරණය දක්වනලදී. මේද ක්‍රියා සහ භාව සහොක්තිමැයි.

355 ඉත්‍යුදාහෘතයොදත්තාඃ සහොක්තෙරත්‍රකාශ්චන

ඉති, මෙසේ; අත්‍ර, මෙහිදී; සහොක්තෙඃ, සහොක්තියට; කාශ්චන උදාහෘතයඃ, කිසි උදාහරණ කෙනෙක්; දත්තාඃ, දක්වනලද්දාහ.

**මේ සහොක්තියි.**

---

ක්‍රියතෙපරිවෘත්තෙශ්ච කිඤ්චිද්‍රූපනිදර්ශනම්.

පරිවෘත්තෙශ්ච, පරිවෘත්තිය සම්බන්ධවූද; කිඤ්චිත්, ස්වල්ප මාත්‍ර වූ; රූපනිදර්ශනම්, ස්වරූප නිදර්ශනයක්; ක්‍රියතෙ, කරනුලැබේ.

356 ශස්ත්‍රප්‍රහාරංදදතා භුජෙනතවභූභුජාම්
චිරාර්ජිතංහෘතංතෙෂාං යශඃ කුමුදපාණ්ඩුරම්.

ශස්ත්‍රප්‍රහාරම්, ආයුධ පහර; දදතා, දෙන්නාවූ; තච්භුජේන, තාගේ බාහුව විසින්; තෙෂාම් භූභුජම්, ඒ රජුන් විසින්; චිරාර්ජිතම්, බොහෝකලක් රැස්කරණලද; කුමුදපාණ්ඩුරම්, කුමුදසේ ධවලවූ; යශඃ, කීර්තිය; හෘතම්, පැහැරගන්නාලදී. මෙහි න්‍යූනවූ එකකු විසින් අධිකයක්හුගේ ග්‍රහණරූපවූ ප්‍රතිදානය කරණලද්දේය මෙසේ සම එකක්හු විසින් සම එකක්හුගේද අධිකයක්හු විසින් හීනයක්හුගේදැයි යෙදෙන පරිද්දෙන් උදාහරණ සෙවියයුතුයි.

**පරිවෘත්තිඃ, මේ පරිවෘත්තියි.**

357 ආශීර්නාමාභිලෂිතෙවස්තුන්‍යාශංසනංයථා
පාතුවඃපරමංජ්‍යොති රවාඞ්මනසගොචරම්.

අභිලෂිතෙ, ඉෂ්ටවූ; වස්තුනි, වස්තුවෙක්හී; ආශංසනම්, පැමිණෙනු කැමැත්ත ප්‍රකාශකිරීම; හෙවත් ශුභ ප්‍රාර්ථනාව; ආශීර්නාම, ආශීර්නම්වේ; යථා, ඊට උදාහරණ මෙසේයි; අවාඞ්මනසගොචරම්, වාක්මනස් දෙකට නොවරනුවූ; පරමංජ්‍යොති, පරමජ්‍යොතිස; වඃ, අප; පාතු, රක්‍ෂාකෙරේවා.

**මේ ආශිර්වාදයි.**

358 අනන්වයසසන්දෙහා වුපමාස්වෙවදර්ශිතෞ
උපමාරූපකඤ්චාපි රූපකෙෂ්වෙවදර්ශිතම්.

අනන්වයසසන්දෙහෞ, අනන්වයසසන්දෙහදෙක; උපමාසුඑව, උපමාවන් කෙරෙහිම; දර්ශිතෞ, දක්වනලද්දාහුය; (චන්ද්‍රාරවින්දයොඃ කාන්ති යනාදි ශ්ලොකයෙන් දක්වනලද අසාධාරණොපමායෙහි අනන්වය අනන්‍යත්වය, කිංපද්මමන්තර්භ්‍රාන්තාලි යනාදි ශ්ලොකයෙන් දැක්වූ සංශයොපමාවෙහි සසන්දෙහය අනන්‍යත්වයිසේයි); උපමාරූපකඤ්චාපි, උපමාරූපකයද; රූපකෙෂුඑව, රූපකයන් කෙරෙහිම; දර්ශිතම්, දක්වනලදී.

359 උත්ප්‍රෙක්‍ෂාභෙදඑවාසා වුත්ප්‍රෙක්‍ෂාවයවොපිච
නානාලඞ්කාරසංසෘෂ්ටිඃ සඞ්කීර්ණන්තු නිගද්‍යතෙ.

අසෞ, උත්ප්‍රෙක්‍ෂාවයවඃඅපි, මේඋත්ප්‍රෙක්‍ෂාවයවයද; උත්ප්‍රෙක්‍ෂාභෙදඃ එව, උත්ප්‍රෙක්‍ෂා විශෙෂයෙක්මැයි; නානාලඞ්කාර, නානාලඞ්කාරයන්ගේ; සංසෘෂ්ටිඃ, එකත්‍රසමාවෙශය; හෙවත් එකතැන පිහිටුවීම; සඞ්කීර්ණන්තු, සඞ්කීර්ණයයි; නිගද්‍යතෙ, කියනුලැබේ.

360 අඞ්ගාඞ්ගිභාවාවස්ථානං සර්වෙෂාං සමකක්‍ෂතා
ඉත්‍යලඞ්කාරසංසෘෂ්ටෙ ර්ලක්‍ෂණීයාද්වයීගතිඃ.

අඞ්ගාඞ්ගිභාව, නිර්වාහ්‍යනිර්වාහක භාවයෙන්; හෙවත් අවයව අවයවීභාවයෙන්; අවස්ථානම්, සිටීමය; සර්වෙෂාම්, සියල්ලන්ගේ; සමකක්‍ෂතාඉති, සමකක්‍ෂබවයයි; අලඞ්කාරසංසෘෂ්ටෙඃ, සඞ්කීර්ණාලඞ්කාරය සම්බන්ධවූ; ද්වයීගතිඃ, ද්විප්‍රකාරගතිතොමෝ; ලක්‍ෂණීයා, දතයුත්තීය.

361 ආක්‍ෂිප්‍යන්ත්‍යරවින්දානි මුග්ධෙතවමුඛශ්‍රියම්
කොෂදණ්ඩසමග්‍රාණාං කිමෙෂාමස්තිදුෂ්කරම්.

මුග්ධෙ, බොලඳනැනැත්තිය; අරවින්දානි, පද්මයෝ; තවමුඛශ්‍රියම්, තිගේ මුඛශොභාව; අක්ෂිපන්ති; මුවහකෙරෙති; කොශ, ධනසමූහය ද්‍රේහෝ නොහොත් පද්මකොෂය; දණ්ඩ, සතරවෙනි උපාය ද්‍රේහෝ නොහොත් නාලය යන මෙයින්; සමග්‍රාණාම්, සම්පූර්ණවූ; එෂාම්, මොවුන්ට; දුෂ්කරම්, දුෂ්කරවූයේ; කිම්, කිමෙක්ද; මේ අඞ්ගාඞ්ගිහාව සඞ්කීර්ණයට උදාහරණයි.

362 ලිම්පතීවතමොඞ්ගානි වර්ෂතීවාඤ්ජනංනභඃ
අසත්පුරුෂසෙවෙව දෘෂ්ටිර්විඵලතාංගතා.

තමඃ, අන්ධකාරය; අඞ්ගානි, ගාත්‍රයන්; ලිම්පතීව, ආලිම්පනය කරන්නාක් බඳුය; නභඃ, ආකාශය; අඤ්ජනම්, අඤ්ජනවර්ණවූයේ; වර්ෂතීව, වර්ෂාකරන්නක් බඳුය; දෘෂ්ටිඃ, දෘෂ්ටිය; අසත්පුරුෂසෙවාඉව, අසත්පුරුෂ සෙවනයක්මෙන්; විඵලතාම්, විඵලබවට; ගතා, පැමිණියාය.

**සඞ්කීර්ණම්-මේ සඞ්කීර්ණයි.**

---

363 ශ්ලෙෂඃ සර්වාසුපුෂ්ණාති ප්‍රායොවක්‍රොක්තිෂුශ්‍රියම්
භින්නංද්විධාස්වභාවොක්තිර්වක්‍රොක්තිශ්චෙතිවාඞ්මයම්.

ශ්ලෙෂඃ, ශ්ලෙෂය; සර්වාසුවක්‍රොක්තිෂු, සියලු වක්‍රොක්ති අලඞ්කාරයන්හි; ප්‍රායඃ, බොහෝසෙයින්; ශ්‍රියම්, ශොභාව; පුෂ්ණාති, පොෂණයකරයි; වාඞ්මයම්, කාව්‍යශාස්ත්‍රය; ස්වභාවොක්තිඃ, ස්වභාවොක්තිය; වක්‍රොක්තිශ්චෙති, වක්‍රොක්තියදැයි; ද්විධා, දෙපරිද්දකින්; භින්නම්, හෙදවූයේය.

364 තද්භාවිකමිතිප්‍රාහුඃ ප්‍රබන්ධවිෂයංගුණම්
භාවඃකවෙරභිප්‍රායඃ කාව්‍යෙෂ්වාසිද්ධිසංස්ථිතඃ.

ප්‍රබන්ධවිෂයම්, මහාකාව්‍යාදි ප්‍රබන්ධවිෂයවූ; ගුණම්, ගුණය; තද්භාවිකම්, ඒ භාවිකයයි; ප්‍රාහුඃ, කියති; (මෙබඳු තන්හි තත්ශබ්දය ප්‍රසිද්ධාර්ථයෙහිය); කාව්‍යෙෂු, කාව්‍යයන්හි; ආසිද්ධිසංස්ථිතඃ, සමාප්තිය දක්වාසිටි; කවෙරභිප්‍රායඃ, කවිහුගේ අභිප්‍රාය; භාවඃ, භාව නම්වේ.

365 පරස්පරොපකාරිත්වං සර්වෙෂාංවස්තුපර්වණාම්
විශෙෂණානාංව්‍යර්ථානා මක්‍රියාස්ථානවර්ණනා.

සර්වෙෂාම්, සියලු; වස්තුපර්වණාම්, අධිකාරික ප්‍රාසඞ්ගිකයන්ගේ; පරස්පරොපකාරිත්වම්, අන්‍යොන්‍යොපකාරිත්වයද; ව්‍යර්ථානාම්, ව්‍යර්ථවූ හෙවත් අනුපයොගීවූ; විශෙෂණානාම්, විශෙෂණයන්ගේ; අක්‍රියා, නොයෙදීමද; ස්ථානවර්ණනා, උපයොගි විෂයන්ගේ වර්ණනාද; (මත්තට සම්බන්ධයි) රාමායනයෙහි රාමචරිතය අධිකාරිකනම සුග්‍රීවාදීන්ගෙ චරිතප්‍රාසඞ්ගිකනමැයි දතයුතුයි.

366 ව්‍යක්තිරුක්තික්‍රමබලාත් ගම්භීරස්‍යාපිවස්තුනඃ
භාවායත්තමිදංසර්ව මිතිතද්භාවිකංවිදුඃ.

උත්ක්‍රමබලාත්, වර්තක්‍රමයන්ගේ බලයෙන්; ගම්භීරස්‍යාපි, ගම්භීරවූද; වස්තුනඃ, වස්තුහුගේ; ව්‍යක්තිඃ, ස්ඵුටබැව්රීම්ද යන; ඉදංසර්වම්, මේ සියල්ල; භාවායත්තම්, භාවායත්තවේ; ඉති, මෙසේවූ; තත්, එය; භාවිකම්, භාවිකයයි; විදුඃ, දනිති.

367 යච්චසන්ධ්‍යඞ්ගවෘත්ත්‍යඞ්ග ලක්ෂණාද්‍යාගමාන්තරෙ
ව්‍යාවර්ණිතමිදංචෙෂ්ට මලඞ්කාරතයෛවනඃ.

සන්ධ්‍යඞ්ගවෘත්ත්‍යඞ්ග ලක්ෂණාදි, සන්ධ්‍යඞ්ගවෘත්ත්‍යඞ්ග ලක්ෂණාදිවූ; යච්ච, යමකුත්; ආගමාන්තරෙ, ග්‍රන්ථාන්තරයෙහි; ව්‍යාවර්ණිතම්, වර්ණනාකරණලද්දේද; ඉදංච, මේද; නඃ, අප විසින්; අලඞ්කාරතයා, අලඞ්කාරබවයෙන්; ඉෂ්ටම්, අභිමතයි. සන්ධ්‍යඞ්ගාදීන්ගේ විස්තර කැමැත්තන් විසින් භරතාදීන් විසින් ප්‍රණීතවූ නාට්‍යශාස්ත්‍රය බලා දතයුතුයි.

368 පන්ථාඃසඑෂවිවෘතඃ පරිමාණවෘත්ත්‍යා
සංහෘත්‍යවිස්තරමනන්තමලඞ්ක්‍රියාණාම්
වාචාමතීත්‍යවිෂයං පරිවර්තමානා
නභ්‍යාස එවවිවරීතුමලංවිශෙෂාන්.

අලඞ්ක්‍රියාණාම්, අලඞ්කාරයන් සම්බන්ධවූ; අනන්තං විස්තරම්, නිරවශෙෂවූ විස්තරය; සංහෘත්‍ය, හකුලා; පරිමාණවෘත්ත්‍යා, පරිමිත වෘත්තියෙන්; සඃඑෂඃපන්ථාඃ, ඒ මේ මාර්ගය; විවෘතඃ, ප්‍රකාශකරණ ලද්දේය. වාචාංවිෂයම්, වාක්විෂය; අතීත්‍ය, ඉක්මවා; පරිවර්තමානාන්, පරිවර්තනයවන්නාවූ; කියනොහැකිවූයිසේයි; විශෙෂාන්, භෙදයන්; විවරීතුම්, ප්‍රකාශකරන්ට; අභ්‍යාසඃඑව, අභ්‍යාසයම; අලම්, සමර්ථවේ.

ඉත්‍යාචාර්ය්‍යදණ්ඩිනඃකෘතෞ කාව්‍යාදර්ශේ අර්ථාලඞ්කාර
විභාගොනාම ද්විතීයඃ පරිච්ඡෙදඃ.

ආචාර්ය්‍යදණ්ඩීන්ගේ කෘතිවූ කාව්‍යාදර්ශයෙහි අර්ථාලඞ්කාරවිභාගනම්වූ

**ද්විතීය පරිච්ඡෙදය මෙසේයි.**

# තෘතීයඃ පරිච්ඡෙදඃ.

1 අව්‍යපෙතව්‍යපෙතාත්මා ව්‍යාවෘත්තිර්වර්ණසංහතෙඃ
යමකංතච්චපාදානා මාදිමධ්‍යාන්තගොචරම්.

අව්‍යපෙතව්‍යපෙතාත්මා, අව්‍යවහිතව්‍යවහිත ස්වරූපඇති; වර්ණසංහතෙඃ, වර්ණසංහතියගේ; ව්‍යාවෘත්තිඃ, විශෙෂයෙන් පුනරාවෘත්තිය; යමකං, යමක නම්වේ; තච්ච, හෙද; පාදානාම්, පාදයන් සම්බන්ධවූ; ආදිමධ්‍යාන්ත ගොචරම්, ආදිය මධ්‍යය අන්තය යන මොවුන් ගොචරකොට ඇත්තේයි. මෙහිද පාදනාම් යනු උපලක්ෂණයි, එහෙයින් පාදයෝද පාදඛණ්ඩයෝද පද්‍යාර්ධයෝද සම්පූර්ණ පද්‍යයෝද යමකයට ස්ථානහයි දතයුතුයි.

2 එකද්විත්‍රිචතුෂ්පාද යමකානාංවිකල්පනාඃ
ආදිමධ්‍යාන්තමධ්‍යාන්ත මධ්‍යාද්‍යාද්‍යන්තසර්වතඃ.

3 අත්‍යන්තබහවස්තෙෂාං භෙදාඃසම්භෙදයොනයඃ
සුකරාදුෂ්කරාශ්චෛව දර්ශ්‍යන්තෙතත්‍රකෙචන.

ආදිමධ්‍යාන්ත, ආදිමධ්‍යාන්තයන්හිද; මධ්‍යාන්ත, මධ්‍යාන්ත යන්හිද; මධ්‍යාදි, මධ්‍යය ආදිය යන මෙතැන්හිද; ආද්‍යන්ත, ආදිය අන්තය යන මෙතැන්හිද; සර්වතඃ, සකල ස්ථානයන්හිද; එකද්විත්‍රි චතුෂ්පාදයමකානාම්, එකපාද ද්විපාද ත්‍රිපාද චතුෂ්පාද යමකයන් ගේ; විකල්පනාඃ, භෙදයෝ; අත්‍යන්තබහවඃ, ඉතා බොහෝය; තෙ ෂාම්, ඔවුන්ගේ; සම්භෙදයොනයඃ, සම්මිශ්‍රණයයොනිකොට ඇති; සුකරාඃ දුෂ්කරාශ්චෛව, සුකරවූද දුෂ්කරවූද; කෙචනභෙදාඃ, කිසි භෙදකෙනෙක්; දර්ශ්‍යන්තෙ, දක්වනුලැබෙති.

4 මානෙනමානෙනසඛි ප්‍රණයොභූත්ප්‍රියෙජනෙ
ඛණ්ඩිතාකණ්ඨමාශලිෂ්‍යතමෙවකුරුසත්‍රපම්.

සඛි, එම්බා යෙහෙලිය; ප්‍රියෙජනෙ, ප්‍රියජනයා කෙරෙහි; අනෙ න, මෙබඳුවූ; මානෙන, මානයෙන්; ප්‍රණයඃ, සෙනහය; මාභූත්, නොවේවා; * ඛණ්ඩිතා, ඛණ්ඩිතාවූතී; කණ්ඨම්, බෙල්ලව; ආශලිෂ්‍ය, වැලඳගෙන; තමෙව, ඔහුම; සත්‍රපම්, ලජ්ජාසහිතයක්; කුරු, කරව.

5 මෙඝනාදෙනහංසානාං මදනොමදනොදිනා
නුන්නමානංමනඃ ස්ත්‍රීණාං සහරත්‍යාවිගාහතෙ.

මදනඃ, අනඞ්ගතෙම; රත්‍යාසහ, සවපත්නිවූ රතිනම් දෙවඟන සමග; හංසානාම්, හංසයන්ගේ; මදනොදිනා, මදදුරුකරන්නාවූ; මෙඝනාදෙන, මෙඝනාදයෙන්; නුන්නමානම්, පහවූ මානයඇති; ස්ත්‍රීණාම් මනඃ, ස්ත්‍රීන්ගේ සිත; විගාහතෙ, ආලොඩනය කෙරේ.

6 රාජන්වත්‍යඃ ප්‍රජාජාතා භවන්තංප්‍රාප්‍යසත්පතිම්
චතුරංචතුරම්භොධි රසනොර්වීකරග්‍රහෙ.

චතුරම්භොධිරසනා, චතුඃසාගරය මෙඛලාදාමකොටඇති; උර්ව්‍යා, පෘථිවියගේ; කරග්‍රහෙ, ස්වප්‍රාප්‍යභාගග්‍රහණයෙහි; ද්වෙහෝ නො හොත් පාණිග්‍රහණයෙහි; චතුරම්, දක්ෂවූ; සත්පතිම්, යහපත් ස්වාමිවූ; භවන්තම්, භවත්හු; ප්‍රාප්‍ය, පැමිණ; ප්‍රජාඃ, ප්‍රජාවෝ; රාජන්වත්‍යඃ, සුරාජ්‍යයුක්තවූවාහු; ජාතාඃ, වූහ.

7 අරණ්‍යංකෛශචිදාක්‍රාන්තං කෛශචිත්සද්මදිවෞකසාම්
පදාතිරථනාගාශ්ව රහිතෛරහිතෛස්තව.

තව, නුඹවහන්සේගේ; අහිතෛඃ, සතුරුවූ; පදාතිරථනාගාශ්ව රහිතෛඃ, පදාතිරථහස්ති අශ්ව යන මොවුන්ගෙන් තොරවූ; කෛශ්

* පාර්ශ්වමෙතිප්‍රියොයස්‍යා අන්‍යසම්භොගචිහ්නිතඃ
සාඛණ්ඩිතෙතිකථිතා ධීරෛරීර්ෂ්‍යා කෂායිතෛඃ
යනු ඛණ්ඩිතාලක්ෂණයි.

විත්, කිසි කෙණෙකුන් විසින්; අරණ්‍යම්, වනයට; ආක්‍රාන්තාම්, පැමිණෙනලද්දේය; ඇතැම් සතුරුකෙනෙක් චතුරඞ්ගබල විරහි තව පලාගියහ, ඇතැම් සතුරුකෙනෙක් යුඬයෙහිදී මළහයිසේයි.

8 මධුරංමධුරම්භොජ වදනෙවදනෙත්‍රයොඃ
විභ්‍රමංභ්‍රමරභ්‍රාන්ත්‍යා විඩම්බයතිකිංනුතෙ.

අම්භොජවදනෙ, එම්බා පද්මමුඛිය; මධුඃ, වසන්තතෙම; භ්‍රමර භ්‍රාන්ත්‍යා, ෂට්පදින්ය යන භ්‍රමයෙන්; තෙ, තීගේ; නෙත්‍රයොඃ, නෙත්‍රවය සම්බන්ධවූ; මධුරං විභ්‍රමම්, මධුර විලාසය; විඩම්බයති, විඩම්බනාකෙරේ; කිංනු, කිමෙක්ද; මාලින්‍යප්‍රොද්ඡිනීකාරයෝ අම්භොජ වදනෙයනු සප්තම්‍යන්තයයි ගෙන එය නෙත්‍රයොඃ යන්නට ආධාර කරති.

9 වාරණොවාරණොද්දාමො හයොවාස්මරදුර්ධරඃ
නයතොනයතොන්තං නස්තදහොවික්‍රමස්තව.

ස්මර, අනඞ්ගය; යතඃ, යම්හෙයකින්; රණොද්දාමො, යුඬයෙහි උද්දාමවූ; වාරණොවා, හස්තියෙක් හෝ; දුර්ධරඃ, ලංවිය නොහැකිවූ; හයඃවා, අශ්වයෙකු හෝ; න, තට නැත්ද; තත්, එහෙයින්; නඃ, අප; අන්තම්, විනාසයට; නයතඃ, පමුණුවන්නාවූ; තව, තාගේ; වික්‍රමඃ, වික්‍රමය; අහෝ, ආශ්චර්‍ය්‍යයි.

10 රාජිතෛරාජිතෛක්ෂ්ණෙන ජීයතෙත්වාදෘශෛර්නෘපෛඃ
නීයතෙචපුනස්තෘප්තිං වසුධාවසුධාරයා.

ත්වාදෘශෛඃ, තා බඳුවූ; රාජිතෛඃ. ශොභිතවූ; නෘපෛඃ, රජුන් විසින්; ආජිතෛක්ෂ්ණෙන, යුඬයෙහි තීක්ෂ්ණත්වයෙන්; වසුධා, පෘථිවීතොමෝ; ජීයතෙ, දිනනුලැබේ; පුනඃ, නැවත; වසුධාරයා, වස්තු නැමති ධාරායෙන්; තෘප්තිම්, තෘප්තියට; නීයතෙච, පමුණුවනලද් දේදවෙයි.

11 කරොතිසහකාරස්‍ය කලිකොත්කලිකොත්තරම්
මනමනොමනමනොපෙ‍්‍යෂ මත්තකොකිලනිස්වනඃ.

සහකාරස්‍ය, චූතවෘක්ෂයාගේ; කලිකා, මල්කැනද; එෂඃ, මේ මනමනඃ, මනමනස්වරූපවූ; මත්තකොකිල නිශ්වනඃ, මත්තකොකිල ධවනියද; මනමනඃ, මාගේ සිත; උත්කලිකොත්තරම්, උත්කණ්ඨාකුලවූවා; කරොති, කෙරේ. දම්පතෙ‍්‍යාඃ සාර්ථංනංයන්තුම්නමනඃනංප්‍රච්ක්ෂතෙ, යනු මනමනලක්ෂණයි.

12 කථංත්වදුපලම්භාශා විහතාවිහතාදෘශී
අවස්ථානාලමාරොඪුමඞ්ගනාමඞ්ගනාශිනී.

ඉහ, මේ වසන්ත කාලයෙහි; ත්වත්, තාගේ; උපලම්භාශාවිහතෞ, ප්‍රාප්තිආශා විඝාතයෙහිලා; අඞ්ගනාශිනී, ශරීරය විනාශකරන්නාවූ; තාදෘශීඅවස්ථා, එබඳු අවස්ථාව; අඞ්ගනාම්, අඞ්ගනාවක්වූ මා; ආරොඪුම්, ආක්‍රමණයකරන්ට; කථම්, කෙසේ; නඅලම්, සමර්ථනොවේදවේමය නාගේ විරහයෙන් මම මරණසමාන දුකට පැමිණියෙමි යනු මෙහි තාත්පර්‍ය්‍යයි.

13 නිගෘහ්‍යනෙත්‍රෙකම්පන්ති බාලපල්ලවශොභිනා
තරුණාතරුණාන්කෘෂ්ටා නලිනොනලිනොන්මුඛාඃ.

නලිනොන්මුඛාඃ, පද්මපත්‍රයෙහි අභිමුඛවූ; අලිනඃ, භෘඞ්ග
යෝ; බාලපල්ලව, බාලපත්‍රයෙන්; ශොභිනා, හොබනාවූ; තරුණා
වෘක්ෂය විසින්; කෘෂ්ටාන්, අදනාලද; තරුණාන්, තරුණයන්; නෙ
ත්‍රෙ, නෙත්‍රයෙහිලා; නිගෘහ්‍ය, අල්වාගෙන; කම්පන්ති, අදිත්.

14 විශදවිශදමත්ත සාරසෙසාරසෙජලෙ.
කුරුතෙකුරුතෙනෙයං හංසීමාමන්තකාමිෂම්.

විශන්, වදනාවූ; ආමත්තසාරසෙ, මත්වූ විල්ලිහිණිඇති; සාර
සෙජලෙ, තඩාගජලයෙහි; විශද, ධවලවූ; අයම්හංසී, මේ හංසිය;
කුරුතෙන, කුත්සිතනාදයෙන්; මාම්, මා; අන්තකාමිෂම් කුරුතෙ,
යම භොජනයකෙරේ.

15 විෂමංවිෂමබෙධි මදනං මදනන්දනඃ.
සහෙන්දුකලයාපොඪ මලයාමලයානිලඃ.

මදනන්දනඃ (මත්අනන්දනඃ), මා සතුටුනොකරන්නාවූ; මලයා
නිලඃ; දක්ෂිණවාතය; අපොඪමලයා, පහකරණලද මලිනබැව්ඇති;
ඉන්දුකලයාසහ, චන්ද්‍රකලාවහා එක්ව; විෂමං, විෂමවූ; විෂම්, විෂසම
රූපවූ; මදනම්, අනඞ්ගයා; අබෙධි, අනුවයේ. මෙහි ප්‍රථම ද්විතීය
චතුර්ථපාදගතමිශ්‍ර අව්‍යවහිත ආදිභාගයමකයි.

16 මානිනීමානිනීෂුස්තෙ නිෂඞ්ගත්වමනඞ්ග මෙ
හාරිණීහාරිණීශර්ම තනුතාංතනුතාංයතඃ.

අනඞ්ග, අනඞ්ගය; හාරිණී, හාරාලඞ්කාරඇති; හාරිණී, මනො
හාරිණීවූ; මානිනී, මානඇතිස්ත්‍රිය; මාම්, මා; තෙ, තාගේ; නිෂඞ්ග
ත්වම්, හියවුරුබවට; නිනීෂුඃ, පමුණුවනු කැමැත්තීය; තනුතාම්,
කෘෂබවට; යාතඃ, යන්නාවූ; මෙ, මට; ශර්ම, සැපයක්; තනුතාම්,
කෙරේවා. මෙහි ප්‍රථම තෘතීය චතුර්ථපාදගතවූ මිශ්‍රඅව්‍යවහිත ආදි
භාගයමකයි.

17 ජයතාත්වන්මුඛෙනාස්මා නකථංනකථංජිතම්
කමලංකමලං කුර්වද්දලිමද්දලිමත්ප්‍රියෙ.

මත්ප්‍රියෙ, මාගෙ ප්‍රියාව; අස්මාන්, අප; ජයතා, දිනන්නාවූ;
ත්වන්මුඛෙන, ත්ගේ මුහුණින්; අකථම්, කථානැත්තාවූ; කම්, ජලය;
අලංකුර්වත්, අලඞ්කාරකරන්නාවූ; අලිමත්, භෘඞ්ගයන්ඇති; දලි,
පත්‍රඇති; කමලම්, පද්මය; කථම්, කෙසේනම්; නජිතම්, නොදිනන
ලද්දේදඃ දිනනලද්දේමයයිසේයි. මෙහි ද්විතීය තෘතීය චතුර්ථපාදග
තවූ මිශ්‍රවූ අව්‍යවහිතවූ ආදිභාගයමකයි.

18 රමණීරමණීයාමෙ පාටලාපාටලාංශුකා
වාරුණීවාරුණීභූත සෞරභාසෞරභාස්පදම්.

පාටලා, පලොල්මල්සේ; ආපාටලා, මදක් රතුවූ; අංශුකා, වස්ත්‍ර ඇති; සෞරභාසපදම්, සුගන්ධයට පිහිටවූ; මෙ, මාගේ; රමණි, ප්‍රියා තොමෝ; අරුණීභූත, රත්වගියාවූ; සෞරභා, සූය්‍ර්‍යරශ්මි ඇති; වාරුණීඉව, පශ්චිම දිශාවමෙන්; රමණීයා, සිත්කලුයි. මෙහි ප්‍රථම ද්විතීය තෘතීය චතුර්ථපාදගත මිශ්‍රඅව්‍යවහිත ආදි භාග යමකයි.

19 ඉතිපාදාදියමකමව්‍යපෙතං විකල්පිතම්
ව්‍යපෙතස්‍යාපිවර්ණ්‍යන්තෙ විකල්පාඃනස්‍යකෙවත.

ඉති, මෙසේ; අව්‍යපෙතම්, අව්‍යවහිතවූ; පාදාදියමකම්, පාදාදිගතයමකය; විකල්පිතම්, විකල්පිතයි; සප්‍රභෙදව උදාහෘතයිසේයි. තස්‍යව්‍යපෙතස්‍යඅපි, ඒ ව්‍යවහිතසම්බන්ධවූද; කෙවතවිකල්පාඃ, කිසි හෙදකෙනෙක්; වර්ණ්‍යන්තෙ, වර්ණනාකරනු ලැබෙති.

20 මධුරෙණදෘශාංමානං මධුරෙණසුගන්ධිනා
සහකාරොද්ගමෙනෛව ශබ්දශෙෂංකරිෂ්‍යති.

මධුඃ, වසන්තයතෙම; එණදෘශාම්, මෘගාක්ෂීන්ගේ; මානම්, මානය; මධුරෙණ, මධුරවූ; සුගන්ධිනා, සුගන්ධඇති; සහකාරොද්ගමෙන එව, ආම්‍රකුඩ්මලොද්ගමයෙන්ම; ශබ්දශෙෂම්, ශබ්දශෙෂවූවා; කරිෂ්‍යති, කරන්නේය මෙහි ප්‍රථම ද්විතීයපාදගත ව්‍යවහිත මිශ්‍ර ආදි භාගයමකයි.

21 කරොතිතාම්‍රොරාමාණාං තන්ත්‍රීතාඩනවිභ්‍රමම්
කරොතිසෙර්ෂ්‍යං කාන්තෙවශ්‍රවණොත්පලතාඩනම්

රාමාණාම්, ස්ත්‍රීන්ගේ; අතිතාම්‍රඃ, ඉතා රත්වූ; කරඃ, හස්තය; තන්ත්‍රීතාඩනවිභ්‍රමම්, වීණාතන්ත්‍රීතාඩනරූපවූ විලාසයද; කාන්තෙ, වල්ලභයා කෙරෙහි; සෙර්ෂ්‍යං, ඊර්ෂ්‍යාසහිතව; හෙවත් ප්‍රණය කොප සහිතව; ශ්‍රවණොත්පල, කර්ණොත්පලයෙන්; තාඩනම්, තැළිමද; කරොති, කෙරේ. මෙහි ප්‍රථමතෘතීය පාදගතවූ ව්‍යවහිත මිශ්‍රආදිභාග යමකයි.

27 සකලාපොලලසනයා කලාපිනාානුනෘත්‍යතෙ
මෙඝාලීනතීතිතාවාතෛඃ සකලාපොවිමුඤ්චති.

වාතෛඃ, වාතයෙන්; නතීත්තා, නටනලද්දාවූ; සකලා, සියලු; මෙඝාලී, මෙඝමාලාතොමෝ; අපඃ, ජලය; විමුඤ්චති, මුදයි; අනු, ඊට අනතුරුව; සකලාපොල්ලසනයා, පිල්බෑබලීම් සහිතවූ; කලාපිනාා, මොණරියගේ; නෘත්‍යතෙ, නැටීමයි. මෙහි ප්‍රථමචතුර්ථපාදගත මිශ්‍ර ව්‍යවහිතආදිභාගයමකයි.

23 ස්වයමෙවගලන්මාන කලිකාමිනිතෙමනඃ
කලිකාමිහනීපස්‍ය දෘෂ්ට්වාකාංනසපෘශෙද්දශාම්.

කාමිනි, එම්බාකාමිනිය; තෙ, තීගේ; මනඃ, සිත; ගලන්මාන කලි, ගිලිහෙන්නාවූ මානවිග්‍රහඇත්තේය; ඉහ, වර්ෂාකාලයෙහි; නීපස්‍ය, නීපවෘක්ෂයාගේ; කලිකාම්, කුඩ්මලය; දෘෂ්ට්වා, දැක; කාංදශාම්, කවරඅවස්ථාවක්; නසපෘශෙත්, සපර්ශනොකරන්නේද; සියල්ලම සපර්ශකරයිසේයි. මේ ද්විතීය තෘතීයපාදගතවූ මිශ්‍රව්‍යවහිත ආදිභාග යමකයි.

24 ආරුහ්‍යාක්‍රීඩශෛලස්‍ය චන්ද්‍රකාන්තස්ථලීමිමාම්
නෘත්‍යත්‍යෙෂචලච්චාරු චන්ද්‍රකාන්තඃශිඛාවලඃ.

චලත්,චඤ්චලවත්නාවූ; චාරු, මනොඥවූ; චන්ද්‍රකාන්තඃ, සඳැස් පිල්කෙළිවරඇති; එෂඃ, මේ; ශිඛාවලඃ, මයූරතෙම; ආක්‍රීඩශෛලස්‍ය, උද්‍යානපර්වතයාගේ; ඉමාම්, මේ; චන්ද්‍රකාන්තස්ථලීම්, චන්ද්‍රකාන්තස්ථලියට; ආරුහ්‍ය, නැඟී; නෘත්‍යති, නටයි. මෙහි තෘතීය චතුර්ථපාදගතවූ මිශ්‍රව්‍යවහිතආදි භාග යමකයි.

25 උද්ධෘත්‍යරාජකාදුර්වී ධ්‍රියතෙද්‍යභුජෙනතෙ
වරාහෙණොද්ධෘතායාසෞ වරාහෙරුපරිස්ථිතා.

යාඅසෞ, යම්මේ; උර්වී, පෘථිවියක්; වරාහෙණ, වරාහමූර්තිමත්වූ විෂ්ණුහු විසින්; උද්ධෘතා, නගනලද්දී; වරාහෙඃ, ශ්‍රෙෂ්ඨනාගයාගේ; හෙවත් වාසුකිනාරජහුගේ; උපරි, මත්තෙහි; ස්ථිතා, සිටියාද; සා, ඒ පෘථිවීතොමෝ; අද්‍ය, අද; රාජකාත්, රාජසමූහයා කෙරෙන් පැහැරගෙණ; තෙ, තාවිසින්; භුජෙන, භුජයෙන්; ධ්‍රියතෙ, දරනු ලැබේ නොහොත් තෙ, තාගේ; භුජෙන, බාහුව විසින්; ධ්‍රියතෙ, දරනු ලැබේ. මෙහි තෘතීය චතුර්ථපාදගතවූ මිශ්‍රව්‍යවහිත ආදිභාගයමකයි

26 කරෙණතෙරණෙෂ්වන්තකරෙණද්විෂතාංහතාඃ
කරෙණවඃ ක්ෂරද්රක්තාභාන්තිසන්ධ්‍යාඝනාඉව.

රණෙෂු, යුද්ධයන්හි; ද්විෂතාම්අන්තකරෙණ, සතුරන් නසන්නාවූ තෙකරෙණ, තාගේ හස්තයෙන්; හතාඃ, නසනලද; ක්ෂරද්රක්තාඃ, වැහෙන්නාවූ ලේඇති; කරෙණවඃ, හස්තීහු; සන්ධ්‍යාඝනාඉව, සන්ධ්‍යා කාලීන මෙඝයන්මෙන්; භාන්ති, හොබිති. මෙහි ප්‍රථම ද්විතීය තෘතීය පාදගතමිශ්‍රව්‍යවහිත ආදිභාගයමකයි.

27 පරාගතරුරාජීව වාතෛර්ධ්වස්තාභටෛශ්චමූඃ
පරාගතමිවක්වාපි පරාගතතමම්බරම්.

වාතෛඃ, වාතයන් විසින්; අගතරුරාජීඉව, පර්වතසම්බන්ධවෘක්ෂ ශ්‍රෙණියක්මෙන්; පරා, ශත්‍රුපක්ෂීයවූ; චමූඃ, සෙනාව; භටෛඃ, භට යන් විසින්; ධ්වස්තා, විධ්වංසනයකරණලද්දීය; පරාගතතම්, පාද ධූලියෙන්; ව්‍යාප්තවූ; අම්බරම්, ආකාශය; ක්වාපි, කොහිද; පරාගතම් ඉව, පලාගියාක්වැනිවිය පාදධූලීන් අහස්තලය වැසීගියෙන් අදෘශ්‍යවියයිසේයි. මෙහි ප්‍රථම තෘතීය චතුර්ථපාදගත මිශ්‍රව්‍යවහිත ආදි යමකයි.

28 පාතුවොභගවාන්විෂ්ණුඃ සදානවඝනද්‍යුතිඃ
සදානවකුලධ්වංසී සදානවරදන්තිහා.

සදාන, මදජලසහිතවූ; වරදන්තිහා, උත්තම හස්තියා නැසුවාවූ හෙවත් කුවලයා පීඩනම් ඇත්රජ නැසුවාවූ; දානවකුලධ්වංසී, අසුර කුලය විධ්වංසනයකරණ සුලුවූ; සදා, හැමකල්හි; නවඝනද්‍යුතිඃ, අභිනව මෙඝයකට බඳුශොභාඇති; භගවාන්, භගවත්වූ; සඃ විෂ්ණුඃ, ඒ (ප්‍රසිද්ධ) විෂ්ණුතෙමේ; වඃ, අප; පාතු, රක්ෂාකෙරේවා. මෙහි ද්විතීය තෘතීය චතුර්ථපාදගතවූ මිශ්‍රව්‍යවහිත ආදි භාග යමකයි.

29 කමලෙඃසමකෙශතෙත කමලෙර්ෂ්‍යාකරංමුඛම්
කමලෙඛ්‍යංකරොෂිත්වං කමලෙවොනමදිෂණුෂු.

(හෙප්‍රියෙ) තෙ, තීගේ; කම්, හිස; අලෙඃසම, භෘඞ්ගසාදෘශ්‍යවූ; කෙශම්, කෙස්ඇත්තේය; මුඛම්, තීගේ මුඛය; කමලෙර්ෂ්‍යාකරම්, පද්‍මයට ඊර්ෂ්‍යාකරන්නේය; ත්වම්, තී, කමලාඉව, ශ්‍රීකාන්තාව මෙන්; කම්, කවරක්හු; උනමදිෂණුෂු, උනමත්තයන් අතුරෙහි; අලෙඛ්‍යම්කරොෂි, නොගිණියයුත්තක් කරන්නෙහිද. තී සියල්ලන්ම උමතුකරයිසේයි. මෙහි ප්‍රථම ද්විතීය තෘතීය චතුර්ථපාදගත මිශ්‍රව්‍යවහිත ආදිභාග යමකයි.

30 මුදුරමණමන්වීත මුදුරමණිභූෂණාඃ
මදභ්‍රමද්දෘශඃ කාන්තිමදභ්‍රජඝනාඃ ක්ෂමාඃ.

උදුරමණිභූෂණාඃ, උත්තමමාණික්‍යයන් ආභරණකොට ඇති; මදභ්‍රමත්දෘශාඃ, මදයෙන් භ්‍රමණයවන්නාවූ ඇස්ඇති; අදභ්‍රජඝනාඃ, විශාලවූ නිතම්බඇතිස්ත්‍රීහු; රමණම්, වල්ලභයා; මුදා, සන්තොෂයෙන්; අන්වීතුම්කාන්තිම්, අනුගනකරන්ට; ක්ෂමාඃ, සමර්ථවෙති. මෙහි ප්‍රථම ද්විතීය පාදයන්හිද තෘතීය චතුර්ථපාදයන්හිද මිශ්‍රව්‍යවහිත ආදිභාග යමකයි.

31 උදිතෛරන්‍යපුෂ්ටානා මාරුතෛමේහතංමනඃ
උදිතෛරපිතෙදූති මාරුතෛරප්දක්ෂිණෛඃ.

දූති, එම්බාදූතිය; අන්‍යපුෂ්ටානාම්, කොකිලයන්ගේ; * ආරුතෛඃ, හාත්පස්හිවූ නාදයෙන්ද; තෙ, තී විසින්; උදිතෛඃ, කියනලද වචනයෙන්ද; (ප්‍රියවිරහකෙලශ සූචකවචනයෙනැයිසේයි); දක්ෂිණෛඃමාරුතෛඃ අපි, දක්ෂිණ මාරුතයෙන්ද; මෙ, මාගේ; මනඃ, සිත; හතම්, ව්‍යපිතයි. මෙහි ප්‍රථම තෘතීය පාදයන්හිද ද්විතීය චතුර්ථපාදයන්හිදවූ මිශ්‍රව්‍යවහිත ආදිභාග යමකයි.

32 සුරාජිතහ්‍රියොයූනාං තනුමධ්‍යාසතෙස්ත්‍රියඃ
තනුමධ්‍යාඃ ක්ෂරත්ස්වෙද සුරාජිතමුඛෙන්දවඃ.

තනුමධ්‍යාම්, කෘෂවූ මධ්‍යප්‍රදෙශඇති; ක්ෂරත්; වැගිරෙන්නාවූ; ස්වෙද, ඛහදියෙන්; සුරාජිත, මොනවට බබලන්නාවූ; මුඛෙන්දවඃ, මුඛචන්ද්‍රයන්ඇති; සුරාජිතහ්‍රියඃ, මද්‍යපානයෙන් දිනනලද ලජ්ජාඇති; ස්ත්‍රියඃ, ස්ත්‍රීහු; යූනාම්, තරුණයන්ගේ; තනුම්, ශරීරයෙහි; අධ්‍යාසතෙ, ශයනයකෙරේ. අධ්‍යාසතෙයන ක්‍රියාපදයෙහි අධියන උපසර්ගයොගයෙන් තනුම්යනතැන කර්ම්විභක්තිවිය. මෙහි ප්‍රථම චතුර්ථයන්ගේද ද්විතීය තෘතීයයන්ගේද මිශ්‍රව්‍යවහිත ආදිභාග යමකයි

33 ඉතිව්‍යපෙතයමක ප්‍රභෙදෛපේ‍යෂදර්ශිතඃ
අව්‍යපෙතව්‍යපෙතාත්මා විකල්පොප්‍යස්තිතද්යථා.

ඉති, මෙසේ; ව්‍යපෙතයමකප්‍රභෙදඃඅපි, ව්‍යපෙතයමකප්‍රභෙදයද; දර්ශිතඃ දක්වනලද්දේය; (අපිශබ්දයෙන් පූර්වදර්ශිත අව්‍යපෙත

* ආඃ ඉතිඛෙදෙ මාලින්‍යපොසද්ශිති.

යමකයාගේ සමුච්චයයි); අව්‍යපෙතබ්‍යපෙතාතමා, අව්‍යපෙත ව්‍යපෙතයන් ආත්මකොටඇති; විකල්පඃඅපිඃ, යමකභෙදයෙක්ද; අසති, ඇත; තත්, එය; යථා, මෙසේයි.

34 සාලංසාලංබකාලිකා සාලංසාලංනවීක්‍ෂිතුං
නාලිනාලිනවකුලා නාලිනාලිකිනීරපි.

සා, ඒ; සාආලී, සඛශඛීතොමෝ; හෙවත් මාගේ යෙහෙලිය; සාලම්බකලිකා, ලම්බමානකලිකායෙන් හොබනාවූ; සාලම්, සාලවෘක්‍ෂය; වීක්‍ෂිතුම්, බලන්ට; නඅලම්, සමර්ථනොවේ; ආලිනවකුලාන්, වකුලවෘක්‍ෂයන්හි ආශක්තවූ; අලින්, භෘඞගයන්ද; (වීක්‍ෂිතුම්, බලන්ට); නඅලම්, සමර්ථනොවේ; අලිකිනීඃ, මිථ්‍යාවචන කියන්නාවූ යෙහෙලින්ද; (වීක්‍ෂිතුම්, බලන්ට) නඅලම්, අසමර්ථය; (මිථ්‍යාවචනනම් තිගේ වල්ලභයා වහාම එන්නේය යනාදියයි). මේ විදෙශස්ථවූ නායකයකු සඳහා ප්‍රෙරිතවූ දූතියකගේ නායිකාවස්ථාවර්‍ණනායි. මෙහි සියලු පදයන්හි මිශ්‍රාව්‍යවහිතආදි භාග යමකයි.

35 කාලංකාලමනාලක්‍ෂ්‍යතාරතාරකමීක්‍ෂිතම්
තාරතාරම්‍යරසිතංකාලංකාලමහාඝනම්:

අනාලක්‍ෂ්‍ය, අදෘශ්‍යවූ; තාර, මහත්වූ; තාරකම්, තාරකාඇති; තාරතා, අත්‍යුච්චත්වයෙන්; රම්‍ය, රම්‍යවූ; රසිතම්, මෙඝගර්ජනාඇති; කාලම්, කෘෂ්ණවර්‍ණවූ; කාලම්, (විරහින්ගේ ප්‍රාණනාශකත්වයෙන්) යමස්වරූපවූ; මහාඝනම්, මහත්වූ මෙඝඇති; කාලම්, කාලය; ඊක්‍ෂිතුම්, බලන්ට; කා, (විරහිණීවූ) කවරතැනැත්තියක්; අලම්, සමර්ථද? මෙහි සර්වපාදයන්හි මිශ්‍රව්‍යවහිත යමකද ප්‍රථම චතුර්ථයන්ගේද ද්විතීය තෘතීයයන්ගේද ව්‍යවහිත ආදිභාග යමකද වේ.

36 යාමයාමත්‍රයාධීනා යාමයාමරණම්නිශා
යාමයාමධියා සවත්‍යා යාමයාමපිනෛවසා.

යාමත්‍රයාධීනා, යාමත්‍රයප්‍රතිබඬවූ; ආයාමයා, දීර්ඝත්වයඇති; නිශා, රාත්‍රිය කරණකොටගෙන; මරණම්, මරණයට; යාම, යමු; වැලි එකෙක්ඇති; ධියා, මනසින්; යාම්, යම්සත්‍රියක් කරා; අයාම, ගියමෝද; අස්වත්‍යායා, ප්‍රාණපීඩාවට පැමිණි; සා, ඕතොමෝ; මයා, මා විසින්; මපිතා, මපිතයි. මෙහි සියලු පාදයන්හි මිශ්‍රවූ ව්‍යවහිත අව්‍යහිත ආදිභාග යමකයි.

37 ඉත්පාදදියමක විකල්පස්‍යෙදෘශීගතිඃ
එවමෙවවිකල්ප්‍යානි යමකානීතරාණ්‍යපි.

පාදදියමක විකල්පස්‍ය, පාදදියමක ප්‍රභෙදයසම්බන්ධවූ; ඉති, උක්තරූපවූ; ගතිඃ, ගතිය; ඊදෘශී, මෙබඳුවේ; එවමෙව, මෙපරිද්දෙන්ම; ඉතරාණිඅපියමකානි, අන්‍යවූත්යමකයන්; විකල්ප්‍යානි, භෙදකටයුත්තාහ.

38 නප්‍රපඤ්චභයාද්භෙදඃ කාත්සේන නාඛ්‍යාතුමිහිතාඃ
දුෂ්කරාභිමතාඑෂතු වර්‍ණ්‍යන්තෙතත්‍රකෙචන.

ප්‍රපඤ්චභයාත්, විස්තරභීතියෙන්; භේදාඃ, භේදයෝ; කාත්ස්න්‍යෙන, සාකල්‍යයෙන්; ආඛ්‍යාතුම්, කියන්ට; නර්හිතාඃ, උත්සාහනොකරණ ලදහ; යෙතුභේදාඃ, යම්භේදකෙනෙක්; දුෂ්කරාභිමතා, දුෂ්කරත්ව යෙන් අභිමතද; අත්‍ර, මෙහි; තෙකෙචන, ඒ කිසිකෙනෙක්; වර්ණ්‍ය න්තෙ, වර්ණනාකරණුලැබෙති.

39 ස්ථිරායතෙයතෙන්ද්‍රියො නහීයතෙයතෙර්භවාන්
අමායතෙයතෙප්‍යභූත් සුඛායතෙයතෙක්ෂයම්.

ස්ථිරායතෙ, ස්ථිරවූ භවිෂ්‍යත්කාලඇත්තා; භවාන්, පින්වත්තෙමේ; යතෙන්ද්‍රියඃ, දිනනලද ඉඳුරන් ඇත්තේය; යතෙඃ, සංයමයෙන්; නහීයතෙ, නොපිරිහේ; තෙ, තාගේ; අමායතා, අවඤ්චකභාවය; ඉය තෙ, එතන් ප්‍රමාණවූ; ක්ෂයම්, ක්ෂයට; අයතෙ, නොපැමිණෙන්නාවූ; සුඛායඅපි, සැපපිණිසද; අභූත්, වූයේය. මෙහි සියළු පාදයන්හි මිශ්‍ර ව්‍යවහිතා ව්‍යවහිතමධ්‍යභාග යමකයි.

40 සභාසුරාජන්නසුරාහතෛර්මුඛෛ
ර්මහීසුරාණාං වසුරාජිතෛඃස්තුතාඃ
නභාසුරාඃ යාන්ති සුරාන්නතෙගුණාඃ
ප්‍රජාසුරාගාත්මසුරාශිතාංගතාඃ.

රාජන්, මහරජ; මහීසුරාණාම්, බ්‍රාහ්මණයන්ගේ; අසුරාහතෛඃ, සුරාපානයෙන් නොනසනලද හෙවත් පවිත්‍රවූ; වසු, තෙජසින් නො හොත් භවත්හු විසින් දෙනලද ධනයෙන්; රාජිතෛඃ, බබලන්නාවූ මුඛෛඃ, මුඛයෙන්; ස්තුතාඃ, කීර්තිතවූ; භාසුරාඃ, බබලන්නාවූ; රාගා ත්මසු, අනුරාගපරවූ; ප්‍රජාසු, ප්‍රජාවන්කෙරෙහි; රාශිතාම්, සමූහබවට; ගතාඃ, ගියාවූ; තෙ, තාගේ; ගුණාඃ, ගුණයෝ; සුරාන්, දෙවියන්කරා න යාන්ති, නොයන්නාහු නොවෙති යත්මැයිසේයි. (සුරාන් දෙ වාන් නයාන්ති නප්‍රාප්නුවන්ති සුරාඅපි එතාදෘශගුණවන්තො නසන්තී තිභාවඃයි ජීවානන්ද විද්‍යාසාගරයන් විසින් ලියනලද ටීකාපාඨය භ්‍රමාශ්‍රිතයයි දතයුතුයි). මෙහි සියලු පාදයන්හි මිශ්‍රව්‍යපෙත මධ්‍ය භාග යමකයි.

41

තවප්‍රියාසච්චරිතප්‍රමත්තයා විභූෂණංධාර්‍ය්‍යමිහාංශුමත්තයා
රතොත්සවානන්ද විශෙෂමත්තයා ප්‍රයොජනංනාස්තිහිකාන්තිමත්තයා

අසච්චරිත, එම්බා ධූර්තීය; ප්‍රමත්ත, එම්බා ප්‍රමත්තය; තව, තාගේ යාප්‍රියා, යම්ප්‍රියාවක්වේද; ඉහ, මෙහි; රතොත්සව, සුරතොත්සව යෙන්වූ; ආනන්දවිශෙෂ, සන්තුෂ්ටිවිශෙෂයෙන්; මත්තයා, මත්වූ; තයා, ඈ විසින්; අංශුමත්, රශ්මිමත්වූ; විභූෂණම්, ආභරණය; ධා ර්‍ය්‍යම්, දැරියයුත්තේය; කාන්තිමත්තයා, ස්වාභාවික සෞන්දර්‍ය්‍යමත්හෙ යින්; ප්‍රයොජනම්, (විභූෂණධාරණයෙහි) ප්‍රයොජනයක්; නාස්තිහි, නැත්මැයි. මෙහි සියලු පාදයන්හි මිශ්‍රව්‍යවහිත අන්තභාග යමකයි.

42 භවාදෘශානාථ නජානතෙනතෙ
රසංවිරුද්ධෙඛලු සන්නතෙනතෙ
යඑවදීනාඃ ශිරසානතෙනතෙ
චරන්ත්‍යලංදෛන්‍යරසෙනතෙනතෙ.

නාථ, ස්වාමීනි! භවාදෘශාඃ, භවත් සදෘශයෝ; නතෙ, අවනතභාවයෙහි; රසම්, රසය; නජානතෙ, නොදනිති; (සන්නතෙනතෙ) සන්නතඉනතෙ, සම්‍යක්නතභාවය හා ප්‍රභුත්වය; ඛලු, ඒකාන්තයෙන්; විරුද්ධෙ, විරුද්ධයහ; යෙ, යම්කෙනෙක්; දීනාඃඑව, දිළිඳුමවූවාහුද; තෙ, ඔව්හු; තෙනදෛන්‍යරසෙන, ඒ දෛන්‍යරසය හෙතු කොටගෙණ; නතෙනශිරසා, නමනවූ හිසින්; තෙ, තා; අලම්, අත්‍යර්ථයෙන්; චරන්ති, හැසිරෙති; සේවාකරතියුසේයි. මෙහි තෙ යනු කර්මාර්ථයෙහිවූ ෂෂ්ඨියි. මෙහි සියලු පාදයන්හි මිශ්‍රඅව්‍යවහිත අන්තභාග යමකයි.

43 ලීලාස්මිතෙනශුචිනා මෘදුනොදිතෙන
ව්‍යාලොකිතෙනලඝුනා ගුරුණාගතෙන
ව්‍යාජෘම්භිතෙන ජඝනෙනචදර්ශිතෙන
සාහන්තිතෙනගලිතං මමජීවිතෙන.

සා, ඕතොමෝ; ශුචිනා, නිර්මලවූ; ලීලාස්මිතෙන, විලාසහසිතයෙන්ද; මෘදුනා, මෘදුවූ; උදිතෙන, වචනයෙන්ද ලඝුනා, ලඝුවූ; ව්‍යාලොකිතෙන, බැල්මෙන්ද; ගුරුණා, බරවූ; ගතෙන, ගමනින්ද; ව්‍යාජෘම්භිතෙන, ජෘම්භනයෙන්ද; දර්ශිතෙන, දක්වනලද; ජඝනෙනච, නිතම්බයෙන්ද; (මාම්, මා;); හන්ති, පෙළයි; තෙන, ඒ කරණ කොටගෙන; ජීවිතෙන, ජීවිතයෙන්; මම, මාගේ; ගලිතම්, ගිලිහිමයි. මෙහි සියලු පාදයන්හී මිශ්‍රව්‍යවහිත මධ්‍යාන්ත යමකයි.

44 ශ්‍රීමානමානමරවර්ත්මසමානමාන
මාත්මානමානතජගත් ප්‍රථමානමානම්
භූමානමානමතයඃ ස්ථිතිමානමාන
නාමානමානමතමප්‍රතිමානමානම්.

(පින්වත් භක්තජනයෙනි)

යඃ, යමෙක්තෙම; ශ්‍රීමාන්, ශ්‍රීමත්ද; අමාන්, අපරිමිතද; ස්ථිතිමාන්, (සච්චිදානන්ද රූපහෙයින් නිරන්තර) ස්ථිතිඇත්තේද; අමරවර්ත්ම, ආකාශයට; සමාන, සදෘශවූ; මානම්, ප්‍රමාණඇති; ආනත, අවනතවූ; ජගත්, ලෝවැස්සන් කෙරෙහි; ප්‍රථමාන, විස්තරබවට ගියාවූ; මානම්, සම්මානඇති; භූමානම්, පෘථිවි ප්‍රමාණවූ; අමාන නාමානම්, අප්‍රමාණවූ නම්ඇති; ආන, යොගීන් විසින්; මතම්, දත්නාලද; අප්‍රතිමානමානම්, අනුපමවූ ඥානඇති; නොහොත් ප්‍රමාණයෙන් නොදතහැක්කාවූ; ආත්මානම්, ඒ බ්‍රහ්ම සංඛ්‍යාත ආත්මය; ආනමත,වඳිව. මෙහි සියලු පාදයන්හි ව්‍යවහිත අව්‍යවහිත මිශ්‍ර මධ්‍යාන්ත යමකයි.

45 සාරයනතමුර සාරමයනතී
සාරභූත මුරු සාරධරාතම්
සාරසානු කෘත සාරසකාඩී
සාරසායනම සාරමවෙති.

උරු,සාරධරා, සමණිලඞ්කාරධරවූ; සාරස, විල්ලිහිණින් විසින්; අනුකෘත, අනුකෘතවූ; සාරස, ශබ්දසහිතවූ; කාඩී, මෙඛලාදම ඇති; සා, ඒ ස්ත්‍රීතොමෝ; සාරයනතම්, වැලඳගන්නාවූ; සාරභූතම්, සාරවූ තම්, ඒස්වාමියා; උරසා, වක්‍ෂස්තලයෙන්; රමයනතී, ප්‍රත්‍යාලිඞගන යෙන් රමනය කරන්නී; රසායනම්, අමෘතය; අසාරම්, අසාරයයි; අවෙති, අවබොධකරයි. මෙහි සියලු පාදයන්හි මිශ්‍රව්‍යවහිත ආදිමධ්‍යයමකයි.

46 නයා නයා ලොචනයා නයා නයා
නයා නයා ඞාන් විනයා නයා යතෙ,
නයා නයා සීජ්නයා නයා නයා
නයා නයාංස්තාන් ජනයා නයා ශ්‍රිතාන්.

අනයායතෙ, අපායරහිත භවිෂ්‍යත් කාලඇත්ත; නයා නයා ලොචනයා, නීතිදුර්නීති දෙකින් ආලොචනයෙන්; හෙවත් බැලී මෙන්; අනයාන්, නීතිරහිතවූ; අය ශුභාවහසංඛ්‍යාත අයයාගේ; ආනය, එලවීමෙහි; අඞාන්, අඞයන්; විනය, හික්මවනු මැනව; ජිනයානයාන්, ජිනොපදිෂ්ටමාර්ගයෙහි යන්නාවූ (එහෙයින්ම) යාන්, යම් ජනකෙනෙකුන්කරා නඅයාසීත්, නොගියේද; අනයාන්, අමාර්ග ගාමිවූ; අනයාශ්‍රිතාන්, අශුභයන් ඇසුරුකරන්නාවූ; තාන්, ඒ ජන යන්, අයාන්ජනය; විෂ්ණුකරායන්නවුන් කළමැනව. මෙහි ප්‍රථම තෘතීය පාදයන්හි මිශ්‍ර අව්‍යවහිත ආද්‍යන්තයමකයද ද්විතීය චතුර්ථපාද යන්හි අව්‍යවහිත මිශ්‍ර ආදි මධ්‍ය යමකයදවේ.

47 රවෙණහෞ මොධවජවතීහිවිරවෙ
රවෙජිසංයත්‍ය තුලාස්ත්‍රගෞරවෙ
රවෙරිවොග්‍රස්‍ය පුරොහරෙරවෙ
රවෙතතුල්‍යං රිපුමස්‍යහෙරවෙ.

හෞමඃ, භූමිපුත්‍රවූනරකාසුරතෙම; ධවජවතීති, විෂ්ණුහුගේ රථධවජයෙහි සිටින්නාවූ; වෙඃ. පක්‍ෂිහුගේ; හෙවත් ගරුඩයාගේ; රවෙණ, නාදයෙන්; අතුල, අනුපමවූ අස්ත්‍රගෞරවෙ, ආයුධගෞරව ඇති; හෙරවෙ, භයඞකරවූ; සංයති, යුඞයෙහිදී; අවෙජි, භයගත් වන ලද්දේය; රවෙඃඉව, සූය්‍යීයාගේමෙන්; උග්‍රස්‍ය, උග්‍රවූ; අස්‍යහ රෙඃ, මේවිෂ්ණුහුගේ; නොහොත් සිංහයාගේ; පුරඃ, ඉදිරියෙහි රිපුම් ශත්‍රුවූනරකයා; අවෙඃ, එළුවෙක්හට; තුල්‍යම්, සදෘශවූවහ, අවෙත, දනිව. මෙහි සියලු පාදයන්හි ම්ශ්‍රව්‍යවහිත ආද්‍යන්ත යමකයි.

48 මයා මයා ලම්බ්‍ය කලා මයා මයා
මයා මයා තව්‍යවිරා මයා මයා
මයා මයාතීතිං නිශයා මයා මයා
මයා මයාමුකරුණා මයා මයා.

අමය, මායානැත්ත; කරුණාමය, දයාමය නැනැත්ත; මයා මයාලම්බ්‍ය, අපචය උපචය දෙකින් ආශ්‍රයණීයවූ; කලාමය, චන්ද්‍රයා හෙතුකොටහටගත්; ආමයාමි, කාමපීඩාඇති; අමූමි, මැ; අමයා, කාමපීඩාඇති; මයා, මාහා; ආමය, යොදව; අමයා, අභිකුත්සිතවූ; අමයා, දීඝීවූ; නිශයා, රාත්‍රියගේ; අයාතව්‍යවිරාමයාමයා, නොගිය හැකි විරාමයෙන් යුක්තවූයාම ඇතිහෙයින්; ආභීතිම්, පීඩාවට; අයාමි, පැමිණියෙමි. මෙහි සියලුපාදයන්හි අව්‍යවහිතමිශ්‍ර ආද්‍යන්ත යමකයි.

49 මතාබ්ධු නානාරමතා මකාමතා
මතාපලබ්ධාග්‍රිමතානුලොමතා
මතාවයත්‍යුත්තමතා විලොමතා
මතාම්‍යතස්තෙ සමතාන වාමතා.

(හෙසාධො) අතාම්‍යතඃ, අකලිෂ්ටක්‍රියාඇති; තෙ, තාගේ; මතෞ මත්යෙහි; ආරමතාම්, යොගීන්ට; මතාම්, සම්මතවූ; අකාමතාම්, නිෂ්පෘහතාව; ධුනානා, කම්පාකරන්නාවූ; අනාපෙත, නොනැවුල් ලෙන් හෙවත් අකෙලෂයෙන් ලබ්ධ, ලබනලද; අග්‍රිමතා, ශ්‍රෙෂ්ඨභාවයට; අනුලොමතා, අනුලොම්බැව්ඇති, උත්තමතාවිලොමතාම්, ශ්‍රෙෂ්ඨතාවිලොමත්වයට; අයතී, නොයන්නාවූ; සමතා, අපක්ෂපාතීත්වය; (විද්‍යතෙ, විද්‍යමාන) වේ; වාමතා, ප්‍රතිකූලබවක්; න, නැත්තේය. මෙහි සියලු පාදයන්හි ව්‍යවහිතආදි මධ්‍යාන්ත යමකයි.

50 කාල කාල ගල කාල කාල මුඛ කාල කාල
කාල කාල ඝන කාල කාල පන කාල කාල
කාල කාල සිත කාල කාල ලනි කාල කාල
කාල කාල ගතු කාල කාල කලි කාල කාල.

කාල, සංහාරකවූ; කාලගල, නීලකණ්ඨය; කාල, යමය; කාල මුඛ, එනම් වානරවිශෙෂය යන මොවුන්ගේ; කාලකාල, කෘෂ්ණත්වය ගන්නා තැනැත්ත! කාල, ජලග්‍රහණයකරන්නාවූ; කාල, එහෙයින්ම කාලවර්‍ණවූ; ඝනකාලක, මෙඝකාලයෙහි ශබ්දකරන්නවුන්ගේ හෙවත් මයූරයන්ගේ; ආලපනකාල, ශබ්දයට බඳුවූ ශබ්දකරන්න! කාල කාල, යමසංහාරය කරන්නාවූ; කලි කාල කාල, කලියුගකාල; නිව ත්තකය! කාල, එම්බා කෘෂ්ණය! කාලකාලසිතක, කෘෂ්ණත්වයෙන් බබලන ශිඛීඇති; අලකා, චූර්ණකුන්තලඇති; අලකාල, චූර්ණකුන්තල භූෂණයකරන්නාවූ; කාලකා, මධුරභාෂිණීවූ; ලලනිකා, ලලනාතොමෝ හෙවත් රාධාතොමෝ; ලගතු, නට අනුකම්පාකෙරේවා. මෙහි සියලු පාදයන්හිම අව්‍යවහිත ආදිමධ්‍යාන්ත යමකයි.

51 සන්දෂ්ටයමකස්ථානමන්තාදි පාදයොර්ද්වයොඃ
උක්තාන්තගතමප්‍යෙතත් ස්වාතන්ත්‍ර්‍යණාත්‍රකථ්‍යතෙ.

පදයොඃද්වයොඃ, පාදද්වයාගේ; අන්තාදී, අන්තආදිදෙක; සන්දෂ්ට යමකස්ථානම්, සන්දෂ්ටයමකයාගේ ස්ථානයවේ; එතත්, මෙය; උක් තානන්තර්ගතම්අපි, කියනලද්දවුන් කෙරෙහි අන්තර්ගතවුවද; අත්‍ර, මෙහිදී; ස්වාතන්ත්‍ර්‍යණ, ස්වප්‍රධානභාවයෙන්; කථ්‍යතෙ, කියනුලැබේ.

52 උපොඪරාගාප්‍යබලාමදෙනසා
මදෙනසාමන්‍යුරසෙනයොජිතා
නයොජිතාත්මානමනඞ්ගතාපිතා
ඞ්ගතාපිතාපාය මමාසනෙයතෙ.

සා, ඒකාන්තානොමෝ; මදෙන, යෞවනමදයෙන්; උපොඪ, උද්‍රිකතවූ; රාගාඅපි, රාගඇත්තීද; මදෙනසා, මාගේ අපරාධයෙන්; මන්‍යුරසෙන, කොධාවෙගයෙන්; යොජිතා, යොදනලද්දී; හෙවත් කොධපරවශවූවා; යොජිතාත්මානම්, යොදනලද සිත්ඇති; අනඞ්ගතාපිතාම්, අනඞ්ගතාපිතවූයට; ගතාපි, ගියාද; මම, මට, ඊයතෙ, මෙ බඳුවූ; තාපාය, තාපය පිණිස; නආස, නුවූයේනොවෙයිවූයේමැයි සේයි. මෙහි පූර්වාර්ධයෙහි මදෙනසාමදෙනසා යනුද අපරාර්ධයෙහිඞ්ගතාපිතා ඞ්ගතාපිතා යනුද සන්දෂ්ටයමකයි.

53 අර්ධාභ්‍යාසඃ සමුද්ගඃ ස්‍යාදස්‍යභෙදාස්ත්‍රයොමතාඃ
පාදාභ්‍යාසොප්‍යනෙකාත්මා ව්‍යජ්‍යතෙචනිදර්ශනෛඃ.

අර්ධාභ්‍යාසඃ, අර්ධාභ්‍යාසය; සමුද්ගඃස්‍යාත්, සමුද්ගනම්වෙයි; අස්‍ය, මෙ සමුද්ගයාගේ; භෙදාඃ, භෙදයෝ; ත්‍රයඃ, තුනෙක්; මතාඃ, දන්නා ලද්දාහුය; පාදාභ්‍යාසඃ, පාදාභ්‍යාසයද; අනෙකාත්මා, අනෙකප්‍රකාර වේ; ච, හෙද; නිදර්ශනෛඃ, නිදර්ශනයෙන්; ව්‍යජ්‍යතෙ, ව්‍යක්ත කරනු ලැබේ.

54 නාසෙව්‍යඃ සත්වයාවර්ජ්‍යඃ පරමායතමානයා
නාසෙව්‍යඃ සත්වයාවර්ජ්‍යඃ පරමායතමානයා.

පරමායතමානයා, අතිශයින් දික්වූ මානයඇති; අසෙව්‍යඃසත්වයා අතිස්ථිරවූ සත්වය හෝ ස්වභාව හෝ උත්සාහඇති; සඃනා, ඒ පුරුෂ තෙම; නවර්ජ්‍යඃ, නොහළියුතුයි; පරම්, අත්‍යර්ථයෙන්; ආයතමානයා, මනාවයත්නකරන්නාවූ; ත්වයා, තී විසින්; ආසෙව්‍යඃ, ආදරකටයුතුයි හෙවත් ප්‍රෙමය ප්‍රකාශකිරීමෙන් තමහට අවනතකළ යුතුයි. මෙහි ප්‍රථම තෘතීය පාදයෝ දෙදෙනද ද්විතීය චතුර්ථපාදයෝ දෙදෙනද සම නුයි සමුද්ගභෙදයි.

55 නරාජිතාමානනයාසමෙත්‍ය
නරාජිතාමානනයාසමෙත්‍ය
විනාශිතාවෛභවතායනෙන
විනාශිතාවෛභවතායනෙන.

මේ යුද්ධවිජයීවූ රජක්හට ස්තුතියකි; මානනයා, සම්මානයෙන් යුක්තව; සමෙත්‍ය, පැමිණසිටිනාවූ; භවතා, භවත්හු විසින්; අයනෙන, සංග්‍රාමගමනයෙන්; ජිතාඃ, දිනනලද; නරාඃ, මනුෂ්‍යයෝ; මානනය, මානය නීතිය යන මොවුන්ගේ; ආසං, අභාවයට; එත්‍ය, පැමිණ; නරාජිතාඃ, නොබබලනලද්දාහුය; (මෙයින් පලායන්නාවූ සතුරන්ගේ ගතිය ප්‍රකාශිතයි). වෛභවතායනෙන, විභූත්වය පාලනයකරන්නාවූ; භවතා, භවත්හු විසින්; වෛ, ඒකාන්තයෙන්; විනාශිතා, විනාශකරණලද්දාවූ සතුරෝ; විනා, පක්ෂීහු විසින් හෙවත් ගිජුලිහිණියා විසින්; අසිතා, භක්ෂිතයහ. මෙහි ප්‍රථම ද්විතීය පාදයෝද තෘතීය චතුර්ථපාදයෝද තුල්‍යනුයි සමුද්ගභෙදය වෙ.

56 කලාපිනාංචාරුතයොපයාන්ති
වෘන්දානිලාපොඪඝනාගමානාම්
වෘන්දානිලාපොඪඝනාගමානාං
කලාපිනාංචාරුතයොපයාන්ති

ලාප, කෙකාධ්වනියෙන්; ඌඪ, සම්මානිතවූ; ඝනාගමානාම්, මේඝාගමඇති; කලාපිනාම්, මයූරයන්ගේ; වෘන්දානි, සමූහයෝ; චාරුතයා, චාරුත්වයෙන්; උපයාන්ති, පැමිණෙති; වෘන්දානිල, සමූහිතවාතයෙන්; ආපොඪ, හරණලද; ඝනාගමානාම්, ඝනනම් නෘත්‍යයාගේ ආගමනඇති; හෙවත් පහකරණලද ඝනනම් නෘත්‍යඇති; කලාපිනාම්, හංසයන්ගේ; ආරුතයශ්ච, මධුරස්වරයෝද; අපයාන්ති, පහවෙති. මෙහි ප්‍රථම චතුර්ථපාදද්වය ද්විතීය තෘතීය පාදද්වයද සමත්‍යුයි. සමුද්ගභෙදයි.

57 නමන්දයාවර්ජිතමානසාත්මයා
නමන්දයාවර්ජිතමානසාත්මයා
උරස්‍යුපාසන්නීර්ණපයොධරද්වයං
මයාසමාලිඞ්ගයතජීවිතෙශ්වරඃ.

මන්දයා, මූඪවූ; අවර්ජිත, නොහරණලද; මානසාත්මයා, මානයෙහි යත්නඇති; හෙවත් මානය රකින්නාවූ; දයාවර්ජිත, කරුණාවෙන් තොරවූ; මානසාත්මයා, චිත්තස්වභාවඇති; මයා, මා විසින්; නමන්, නමස්කාරකරණ; හෙවත් කෘතාපරාධත්වයෙන් පාදද්වයෙහි පතිතවන; ජීවිතෙශ්වරඃ, ප්‍රාණෙශ්වරතෙම; උරසි, වක්ෂස්ථලයෙහි; උපාසන්නීර්ණ, අර්පිතවූ; පයොධරද්වයම්, පයොධර යුග්මඇත්තිය; නසමාලිඞ්ගයත, ආලිඞ්ගනයනොකළේය. මෙහිප්‍රථම ද්විතීය පාදද්වය අභ්‍යස්තයි.

58 සභාසුරාණාමබලාවිභූෂිතා
ගුණෛස්තවාරොහිමෘණාලනිර්මලෛඃ
සභාසුරාණාමබලාවිභූෂිතා
විහාරයන්නිර්විශ සම්පදඃපුරම්.

(හෙරාජන්) තව, තාගේ; මෘණාලනිර්මලෛඃ, නෙලුඹුදලිසේ නිර්මලවූ; ගුණෛඃ, ගුණයන්විසින්; අබලා, බලාසුරවර්ජිතවූ; විභූෂිතා, (දෙවභොග්‍යවූ ද්‍රව්‍යජාතයෙන්) සැරසුනාවූ; සුරාණාම්සභා, දෙවසභාතොමෝ; ආරොහි, නගිනලද්දිය; ස (ත්වම්), ඒතා; විභූෂිතාඃ, විශෙෂයෙන් අලඞ්කෘතවූ; අබලාඃ, ස්ත්‍රීන් සම්බන්ධවූ; සම්පදඃ, සම්පත්තීනු; නිර්විශ, උපභොගකරව. මෙහි ප්‍රථම තෘතීයපාදයෝ අභ්‍යස්තවෙති.

59 කලඞ්කමුක්තාංතනුමධ්‍යනාමිකා
ස්තනද්වයීචත්වදෘතෙනහන්ත්‍යතඃ
නයාතිභූතංගණනෙහවන්මුඛෙ
කලඞ්කමුක්තාංතනුමද්ධ්‍යනාමිකා.

කලම්, මනොඥවූ; උක්තාම්, වචනයද; තනුමධ්‍යනාමිකා, කෘෂවූ මධ්‍යප්‍රදෙශය නමන්නාවූ; ස්තනද්වයීච, පයොධරද්වයද; ත්වත්

ඍතෙ, තාහැර; කම්, කවරක්හු; නහනති, නොපෙලාද; වැලිතා හැර හැමදෙනම පෙලයිසේයි. මෙසේහෙයින් භවන්මුඛෙ, භවත්හු ප්‍රධාන විෂයෙහි; ගණනෙ, ජිතෙන්ද්‍රියයන්ගේ ගණන්කිරීමෙහිලා; කලඞ්කමුක්තාම්, කැලලින් මිදුනාවූ; තනුමත්, ශරීරමත්වූ; අනාමිකා, අනාමිකාඞ්ගුලිතොමෝ; භූතම්, සත්‍යයකුකරා; නයාති, නොයේ. මෙහි ප්‍රථම චතුර්පාදයෝ අභ්‍යස්තවෙති.

60 යශශ්චතෙදික්ෂුරජශ්චසෛනිකා
විතන්වතෙජොපමදංශිතායුධා
විතන්වතෙජෝපමදංශිතායුධා
ද්විෂාමකුර්වන්ති කුලංතරස්විනඃ.

අජොපම, විෂ්ණුසදෘශය; නොහොත් අජරාජසදෘශය; දංශිතාඃ, සන්නාහවත්වූ; ශිතායුධාඃ, තීක්ෂණවූ ආයුධඇති; තරස්විනඃ, මහත්වූ බලඇති; තෙ, තාගේ; සෛනිකාඃ, සෙනාවෝ; යුධා, යුධයෙන්; දික්ෂු, දිශාවන්හි; යශශ්ච, කීර්තීයද; රජශ්ච, රජස්ද; විතන්වතෙ, පතුරුවති; ද්විෂාම්කුලඤ්ච, ශත්‍රුසමූහයාද; විතනු, ශරීරරහිතවූවා; අතෙජඃ, තෙජස්රහිතවූවා; අපමදම්, මදරහිතවූවා; කුර්වන්ති, කරති. මෙහිද්විතීය තෘතීය පාදද්වයඅභ්‍යස්තයි.

61 බිභර්තිභූමෙර්වලයංභුජෙනතෙ
භුජඞ්ගමොමා සමරතොමදඤ්චිතම්
ශෘණුක්තමෙකං ස්වමවෙත්‍යභූධරං
භුජඞ්ගමොමාසමර තොමදඤ්චිතම්.

(හෙරාජන්) භුජඞ්ගමඃ, වාසුකීනාගරජතෙම; තෙ, තාගේ; භුජෙනඅමා, භුජය හා එක්ව; හෙවත් බාහුව සහායකොටගෙණ; භූමෙර්වලයම්, පෘථිවිවලය; බිභර්ති, උසුලයි; සමරතඃ, පූර්වෘත්තාන්තය සිහිකරන්නාවූ; මත්, මා කෙරෙන්; අඤ්චිතම්, පූජිතවූ; එකම් උක්තම්, එකවචනයක්; ශෘණු, අසව; ස්වං, ස්වකීයවූ; භූධරම්, පෘථිවිය උසුලන්නාවූ; භුජම්, බාහුව; අවෙත්‍ය, දැන; රතඃ. ප්‍රීතිවූයේ; චිතම්, ප්‍රවෘත්තවූ; මදම්, ගර්වයට; මාසමගමඃ, නොයව. මෙහි ද්විතිය චතුර්පාදද්වය අභ්‍යස්තයි.

62 ස්මරානලොමානවිවර්ධිතොයඃ
සනිර්වෘතිංතෙ කිමපාකරොති
සමන්තතඃ තාමරසෙක්ෂණෙන
සමන්තතස්තාමරසෙක්ෂණෙන.

තාමරසෙක්ෂණෙන, රක්තපද්මයකටබඳු ඇස්ඇත්තා; අරසෙ, අරසිකය; මානා, මානයෙන්; විවර්ධිතඃ, වැඩීගියාවූ; යඃස්මරානලඃ, යම්කාමාග්නියක්වේද; සඃ, එය; තතඃ, පනලේ; ක්ෂණෙන, උත්සවයහා; සමම්, එක්ව; සමන්තතඃ, සර්වප්‍රකාරයෙන්; තාම්, ඒ පූර්වානුභූතවූ; නිර්වෘතිම්, නැවැත්මට; සුඛම්, සැපය; කිම්, කවරහෙයකින්; නඅපාකරෝති, පහනොකරයිද. මෙහි තෘතිය චතුර්පාදද්වය අභ්‍යස්තයි.

63 ප්‍රභාවතො නාමනවා සවස්‍ය
ප්‍රභාවතො නාමනවා සවස්‍ය
ප්‍රභාවතො නාමනවා සවස්‍ය
විවර්ජිතත්ති රාසින්නෙහවිෂ්ටපස්‍ය.

ප්‍රභාවතඃ, ස්වප්‍රභාවයෙන්; ප්‍රභාවතඃ, ප්‍රභාවත්වූ; වාසවස්‍ය, ශක්‍රයාගේ; නාමන, නැමීම කරන්න! අනාම, රොගනැත්න; ත්වයි, තා; විෂ්ටපස්‍ය, ලොකයට; ප්‍රභෞ, ස්වාමිවූකල්හි; අතඃ, මේකාරණයෙන් නාම, ප්‍රකාශ්‍යවූ: නවාසවස්‍ය, අභිනවසුරාවගේද; සවස්‍යවා, යාගයාගේද; විවර්ජිතත්විඃ, විච්ඡේදයක්; නආසිත්, නොවූයේය. මෙහි ප්‍රථම ද්විතීය තෘතීයපාදයන් සම්බන්ධවූ අභ්‍යස්තයි.

64 පරම්පරායාබලවා රණානාං
පරම්පරායාබලවා රණානාම්
ධූලිස්ථලී ව්‍යොමවිධායරුන්ධන්
පරම්පරායා බලවාරණානාම්.

පරාය, එම්බා පරමකල්‍යාණඇත්න! බලවාඃ, බලයෙන් සතුරන් වලක්වන්න; ත්වම්, තා; බලවාරණානාම්, බලවත් හස්තීන්ඇති; අබලවාරණානාම්, දුර්වලයන් වලක්වන්නාවූ; රණානාම්, යුද්ධයන්ගේ; පරම්පරායාඃ, පරම්පරාවට; ස්ථලීඃ, ස්ථලභූමිවූවන්; ධූලිවිධාය; ධූලිකොට; ව්‍යොම, ආකාශය; රුන්ධන්, වසමින්; පරම්, උතුම්වූ; පරම්, සතුරා; පරායාඃ, මැඩපැවැත්වූයෙහිය. මෙහි ප්‍රථම ද්විතීය චතුර්ථපාද අභ්‍යස්තයි.

65 නශ්‍රද්දධෙවාචම ලජ්ජමිථ්‍යා
භවවිධානාම් සමාහිතානාම්
භවවිධානාම සමාහිතානාං
භවවිධානාම සමාහිතානාම්.

අලජ්ජ, ලජ්ජානැත්න! අසමාහිතානාම්, සමාහිතනොවූ; අසමාහිතානාම්, අසදෘශවූ සතුරන් ඇති; භවවිධානාම්, භවත්සදෘශයන්ගේ; මිථ්‍යා, අසත්‍යයක්; අභූත්, වූයේය; විධානාම්, කාර්‍ය්‍යයන්හි අපරිණතවූ; අසම, විෂමවූ; අහි, නාගයාගේ; තානාම්, විස්තාරඇති; භව, භවයෙහි; විධා, දෙවැදෑරුම්වූ; ආනාම්, ප්‍රාණඇති; වාචම්, වචනය; නශ්‍රද්දධෙ, නොඅදහමි. මෙහි ද්විතීය තෘතීය චතුර්ථපාදයන්ගේ අභ්‍යස්තයි.

66 සන්නාහිතොමානම රාජසෙන
සන්නාහිතොමානම රාජසෙන
සන්නාහිතොමානම රාජසෙන
සන්නාහිතොමානම රාජසෙන.

සත්, සත්පුරුෂය; ආහිතොමානමරාජසෙන, ශෛවය.! (නනමන්තීති අනමාඃ, (අනම්නම් බ්‍රාහ්මණයි; අනමානාංරාජා, අනමරාජා; එනම් චන්ද්‍රයායි, චන්ද්‍රයා ද්විජරාජහෙයින් ද්විජශබ්දයාගේ බ්‍රාහ්මණවාචකත්වයගෙන මෙසේ කියත්; උමාවඅනමරාජාව උමානම

රාජෞ; ආහිතෞ උමානමරාජෞයෙනසඃ, ආහිතොමානම්රාජඃ, ඊශ්වරයායි තෙන සෙනඃ; යනු මෙහි වාක්‍යයි). අමානම්, අප්‍රමානවූ සම්පත් ඇත්ත; සභාහිතඃ, සභාබවූනා; නරාජසෙ, නොහොබ නෙහිය; රාජසෙන, රජෙගුණයෙන් නොනැමැන්න; (භවම්, තා) සභාහිතඃ, අපසාදයට ගියාවූ සතුරන් ඇත්තෙහිය අමාන ම් රාජ සෙන, සම්මානහා සම්පත් නැහි ප්‍රතිපක්‍ෂරාජසෙනා ඇත්ත! සභා, සත්පුරුෂය; හිතඃ, සියල්ලන්ට හිත ඇත්තේය. මෙහි සියලූ පාදම් අභ්‍යස්තයි

67 සකෘද්විත්‍රිශ්චයොභ්‍යාසඃ පාදස්‍යෛයංප්‍රදර්ශිතඃ
ශ්ලොකචයනතුයුක්තාපිං ශ්ලොකාභ්‍යාසඃසමෘතොයථා.

එවම්, මෙසේ: පාදස්‍ය, පදය සම්බන්ධවූ; සකෘත්, එක්වරය; විඃ, දෙවරය; ත්‍රිඃ, තුන්වරය යන; යඃ අභ්‍යාසඃ, යම් අභ්‍යාසයෙක්: ප්‍රදර් ශිතඃ, දක්වනලද්දේද; (මෙහි එක්වරක්වූ අභ්‍යාසය පාදවයක පිහිටි යේය, දෙවරක්වූ අභ්‍යාසය පාදත්‍රයෙහි පිහිටියේය, තුන්වරක්වූ අභ්‍යාසය චතුෂ්පාදයෙහිම වූයේය); යුක්තාපිම්, යුක්තවූ අපිඇති; ශ්ලොකචයනතු, ශ්ලොකචයවනාහි; ශ්ලොකාභ්‍යාසඃ, ශ්ලොකාභ්‍යාස යයි; සමෘතඃ, දන්නාලදී; යථා, ඊට උදාහරණ මෙසේයි.

68 විනායකෙනභවතා වෘත්තොපචිතබාහුනා
සවමිත්‍රොධාරිණාභිතා පෘථ්වියමතුලාශ්‍රිතා.

(මහරාජන්) විනායකෙන, දුර්ජනයන් හික්මවන්නාවූ; වෘත්ත, වටවූ; උපචිත, වැඩීගියාවූ; බාහුනා, බාහුඇති; සුඅමිත්‍ර, ශොභනවූ අමිත්‍රයන්; උධාරිණා, උඩරණශීලවූ; අතුලාශ්‍රිතා; අතුල්‍යබව ආශ්‍රිතවූ භවත්හු හෙතුකොටගෙන; ඉයම්පෘථිවී, මේ පෘථිවිතොමෝ; අභීතා, භයරහිතවූවාය.

69 විනායකෙනභවතා වෘත්තොපචිතබාහුනා
සවමිත්‍රොධාරිණාභීතා පෘථ්වියමතුලාශ්‍රිතා.

අභීතා, යුධපිණිස භවත්හු සමීපයට එන්නාවූ; (අභිපූර්වවූ ඉන් ගතෞ යන ධාතුකෙරෙන් පරව ක්විප්ප්‍රත්‍යයෙන් සිධවූ පදයෙන්වූ තෘතීයෙක වචනයි) විනායකෙනභවතා, නායකරහිතවූවාවූ; වෘත්ත උපචිතබාහුනා, ශමශානයට පැමිණිබාහුඇති; සවමිත්‍රොධා, සවබන්ධුන්හරණාවූ (සවමිත්‍රානිඋජ්ජහතිපරිත්‍යජතීති සවමිත්‍රොධාඃ, තෙන සවමිත්‍රොධා, උපූර්වවූඔහාකත්‍යාගෙ යන ධාතුහුකෙරෙන් ක්විප්ප්‍රත්‍ය යෙන් සිඩවූ පදයාගේ තෘතීයෙක වචනයි), අරිණා, නාගේ සතුරා හෙතුකොටගෙන; පෘථ්වී, පෘථ්වීතොමෝ; යමතුලාශ්‍රිතා, යමයාගේ තුලාව හෙවත් මානයනත්‍රය ආශයකරනු ලැබූවාය. මේ ශ්ලොකාභ්‍යාසයි.

70 එකාකාරචතුෂ්පාදං තංමහායමකාහවයම්
තත්‍රාපිදෘශ්‍යතෙභ්‍යාසඃ යාපරායමකක්‍රියා.

යත්‍ර, යම්පද්‍යයෙක්හි; එකාකාර, එකාකාරවූ; චතුෂ්පාදම්, සතර පාදය ඇත්තේද; තත්, එය; මහායමකාහවයම්, මහායමකනම්වේ; තත්‍රඅපි, එහිද; අභ්‍යාසඃ, අභ්‍යාසය හෙවත් පුනරාවෘත්තිය; දෘශ්‍යතෙ,

දක්නා ලැබේ; සා, ඕතොමෝ; පර, උත්කෘෂ්ටවූ; යමකක්‍රියා, යමකවිධියි. පාදචතුෂ්කාභ්‍යාසය ඇතිකලත් පාදඛණ්ඩයාගේත් අභ්‍යාසඇත්තේ මහායමකනමැයි දතයුතුයි.

71 සමානයා සමානයා සමානයා සමානයා
සමානයා සමානයා සමානයා සමානයා.

සමානයාස, (සකල කාර්‍ය්‍යයන්හි) තුල්‍යප්‍රයත්න ඇත්ත; සමාන, ප්‍රාණසමය; යා, යම්නායිකාවක්; සමානයා, ශ්‍රීභාතිනිසහිතද; අසමානයා, අසදෘශවූ; සමානයා, මානසහිතවූ; සමානයා. පූජාසහිතවූ; අනයා, මැහා; මා, අසමත්හු; සමානය, සඞ්ගතකරව. මෙහි පාදචතුෂ්ටාභ්‍යාසයෙහි පාදඛණ්ඩයාගේ අභ්‍යාසඇතිහෙයින් මේ මහායමකයට උදාහරණයි.

72 ධරාධරාකාරධරාධරාභුජං
භුජමහිංපාතුමහිනවික්‍රමාඃ
ක්‍රමාත්සහන්තෙ සහසාහතාරයො
රයොධුරාමානධුරාවලම්බිනඃ.

ධරාභුජම්, රජුන්ගේ; ධරාධරාකාරධරා, වාසුකිනාගරාජයාගේ ආකාර දරන්නාවූ; හෙවත් දිසීවූ; (වාසුකිනාරජ පෘථිවිය දරයි යන ප්‍රසිද්ධිහෙයින් ධරාධරයනු වාසුකිනාරජයි) අහිනවික්‍රමාඃ, අපරිහීනවූ වික්‍රමඇති; නොහොත් අනන්ත නාගරාජයාටබඳු වික්‍රමඇති; (අහිනාම්ඉනඃ අහිනඃ) සහසාහතාරයඃ, බලයෙන් නසනලද සතුරන්ඇති රයොධුරාඃ, වෙගයෙන් අධිකවූ; මානධුරාවලම්බිනඃ, මානධුරය එල්බෙනසුලුවූ; භුජඃ භුජයෝ; ක්‍රමාත්, පිළිවෙලින්; මහිම්, පෘථිවිය; පාතුම්, රක්නට; සහන්තෙ, සමර්ථවෙති. මෙහි ප්‍රථම පාදයෙහි අව්‍යවහිත ආදි මධ්‍යයමකයි, පාදසන්ධින්හි අව්‍යවහිතවූ අන්තාදියමකයද සන්දෂ්ටයමකයදවේ. තෘතීය පාදයෙහි එකවර්ණව්‍යවහිතවූ යමකයි සතරවෙනි පාදයෙහි වර්ණද්වයව්‍යවහිතවූ යමකයි, එහෙයින් මේ විජාතියයමක සංමිශ්‍රනයයි දතයුතුයි.

73 ආවෘත්තිඃප්‍රාතිලොම්‍යෙන පාදාර්ධශ්ලොකගොචරා
යමකංප්‍රතිලොමත්වාත් ප්‍රතිලොමමිතිස්මෘතම්.

ප්‍රාතිලොම්‍යෙන, ප්‍රතිලොමභාවයෙන්; පාදාර්ධශ්ලොකගොචරා පදය පදාර්ධයශ්ලොකය යන මොවුන් විෂයකොටඇති; ආවෘත්තිඃ, ආවෘත්තිය; ප්‍රතිලොමත්වාත්, ප්‍රතිලොමභාවය හෙතුකොටගෙන; ප්‍රතිලොමංයමකංඉති, ප්‍රතිලොමයමකයයි; ස්මෘතම්, දන්නාලදී.

74 යාමතාශ කෘතායාසා සායාතාකෘශතාමයා
රමණා රකතා තෙස්තු ස්තුතෙතාකරණාමර.

මතාශ, දන්නාලද ආශාඇත්ත; කෘතායාසා, කරණලද ආයාස ඇති; යාකෘශතා, යම්කෘශබවක්විද; සා, ඒ කෘශතාතොමෝ; මයා, මාවිසින්; ආයාතා, පැමිණෙනලද්දීය; ස්තුතෙත, ස්තුතියට පැමිණි; තැනැත්ත! අකරණාමර, නිර්ජිත ක්‍රියායෙහි දෙවියෙක් සමාන තැනැත්ත! රමණ, සිත් අලවන්න! තෙ, තාගේ; ආරකතාඃ, යාම; අස්තු, වේවා. මෙහි ප්‍රථම පාදයාගේ ප්‍රතිලොමාවර්තනයෙන් ද්විතීය

පාදයවේ. එසේම ද්විතීයපාදයාගේ, ප්‍රතිලෝමාවෘත්තියෙන් ප්‍රථම පාදයවේ, තෘතීයචතුර්ථපාදයන්හිද මෙසේමැයි, මේපාදනොවර ප්‍රතිලෝමයමකයට උදාහරණයි.

75 නාදිනොමදනාධීස්වා නමෙකාවනකාමිනා
නාමිකානවකාමෙන ස්වාධීනාදමනොදිනා.

නාදිනඃ, නාදරූපවූ බ්‍රහ්මයාඇති ;හෙවත් නාදබ්‍රහ්මයා අනුව ධ්‍යානකිරීමෙහි ඇලුනාවූ; මෙ, මට; මදනාධී, අනඞ්ගයාද තද්ජනිතවූ ආධිසංඛ්‍යාතචිත්තපීඩාද; ස්වා, ස්වකීයවූ; කාවනකාමිනා, කිසිකාමිනියකුදු; න, නැත්තේය; දමනොදිනා, ඉන්ද්‍රිය දමනය පහකරන්නාවූ; කාමෙන, අනඞ්ගයාවිසින්; ස්වාධිනා, තමහට අයත්කරණලද; නාමිකාව, ගිලන්බවද; න, නැත්තේය; මේ යොගීපුද්ගලයකුගේ වචනයි. මෙහි ප්‍රථම ශ්ලොකාර්ධයාගේ ප්‍රතිලෝමාවෘත්තියෙන් අපරාර්ධයවිය, මේ ශ්ලොකාර්ධවිෂයවූ ප්‍රතිලෝම යමකයට උදාහරණයි.

76 යානමානයමාරාවි කශොනානජනාසනා
යාමුදාරශතාධීනා මායාමායමනාදිසා.

(සඛෙ, එම්බා යහළුව) උදාරශතාධීනාම්, මහතුන් හෙවත් වස්තු ඇත්තන් සියගණනකට අයත්වූ; යාම්, යම් වෙශ්‍යාවක්හාරා; ආයාම්, මම ගියෙම්ද; මා රාවිකශා, අනඞ්ගනමැති එලුවාට කශයක් බඳුවූ; ඌනානජනාසනා, ධනහීනජනයන් පහකරන්නාවූ; (ඌනාඃ අනාඃප්‍රාණාඃයේෂාංතෙඌනානාඃ ධනහීනාඉත්‍යර්ථඃ ඌනානාශ්වතෙජනාශ්චෙති ඌනානජනාඃ තාන්අස්‍යතිනිරස්‍යතීති ඌනානජනාසනාඃ නිර්ධනාන්වහිස්කුර්වතීත්‍යර්ථඃ); සා, ඕතොමෝ; ආයාම්, ගමන; අනාදි, මා විසින් කියනු ලැබීම්; (එහෙයින්) යානාම්, යානාවක්; ආනය, ගෙනඑව.

77 සාදිනාමයමායාමා නාධීතාශරදාමුයා
නාසනාජනනාශොක විරාමායනමානයා.

සා, ඒ වෙශ්‍යාතොමෝ; අමුයාශරදා, මේශරත් කාලය හෙතුකොටගෙන; ආධීනා, චිත්තපීඩාවට පැමිණියාය; ශොකවිරාමා, (එහෙයින්ම) ශොකයාගේ විරාමඇත්තියක්; න, නොවෙයි; දිනාමයමායාමා, දහවල්හි රොගව්‍යාජයට පැමිණියාය; (දිනආමයමායාආමා යනු සමාසගතපදච්ඡේදය) නාසනාජනනා, උපවේශනක්‍රියා නැත්තීය; අයනමානයා (මාගේ) ගමන්දැනීමට පැමිණියාය; මාගේ ගමන් දැනිමට මාර්ගාවලොකනය කරමින් සිටින්නියයි). මෙහි ප්‍රථම ශ්ලොකයාගේ ප්‍රතිලොමාවෘත්තිනයෙන් අනික්ශ්ලොකයාගේ පහළවීමයි; මේ ශ්ලොකවිෂයවූ ප්‍රතිලොම යමකයි.

## සමක චක්‍රම්, සමක චක්‍රයයි

---

78 වර්ණනාමෙකරූපත්වං යද්‍යෙකාන්තරමර්ධයොඃ
ගොමූත්‍රිකෙති තත්ප්‍රාහු දුෂ්කරංතද්විදෙයථා.

අඞ්ගයොඃ, පූර්වාඞ්ගඋත්තරාඞ්ගදෙක්හි; එකාන්තරම්, එකාක්ෂරයකින් ව්‍යවහිතවූ; යත්, යම්; වර්ණානාම් එකරූපත්වම්, වර්ණයන්ගේ එකරූපබවක්වේද; තද්විදඃ, ඒ අලඞ්කාරදන්නෝ, දුෂ්කරම්, දුෂ්කරවූ; තත්, ඒ උක්තරූපඅලඞ්කාරය; ගොමූත්‍රිකාඉති, ගොමූත්‍රිකායයි; ප්‍රාහුඃ කියති; තත් යන තැන තම් කියාත් පාඨයි.

79 ම දනොම දි රක්ෂිණා මපාඞ්ගාසෙත්‍රාජයෙදයම්
\+ + + + + + + +
මදෙ නාය දිනත්ක්ෂිණ මනඞ්ගායාඤ්ජලිං දදෙ

අයංමදනඃ, මේ අනඞ්ගතෙම; මදිරාක්ෂිණාම්, මත්වූ කොරකුරු ලලන්ටබඳු ඇස් ඇත්තියන්ගේ; අපාඞ්ගාස්ත්‍රඃ, නෙත්‍රකොටිනිරීක්ෂණ නැමති ආයුධඇත්තේ; යදි, ඉදින්; ජයෙත්, මා දිනන්නේනම්; මදෙනඃ, මාගේ පාපය; ක්ෂීණම්, ක්ෂයවන්නේය; (මේ හෙතුකොට ගෙන) අනඞ්ගාය, අනඞ්ගයාහට; අඤ්ජලිංදදෙ, අඤ්ජලිදනයක රම් නමස්කාරකරමියිසේයි. ඉදින් කාමවසහවූ කාන්තාවන් විසින් කටාක්ෂනිරීක්ෂණයෙන් මා බලන්නේනම් මම සතුටුවෙමි යනු මෙහි නිෂ්කර්ෂයි.

**ගොමූත්‍රිකා, මේ ගොමූත්‍රිකායි.**

---

80 ප්‍රාහුරර්ධභ්‍රමංනාම ශ්ලොකාර්ධභ්‍රමණංයදි
තදිෂ්ටංසර්වතොභද්‍රං භ්‍රමණංයදිසර්වතඃ.

යදි, ඉදින්; ශ්ලොකාර්ධභ්‍රමණම්, ශ්ලොකයගේ අර්ධභ්‍රමණයක්වේද හෙවත් ශ්ලොකයාගේ පාදචතුෂ්ටය සම්බන්ධවූ අර්ධයක් ඉදින් අනුලොම මාර්ගයෙන් භ්‍රමණයවීමෙන් අනික් අර්ධය සම්පූර්ණවේද; (ඒ) අර්ධභ්‍රමම්, අර්ධභ්‍රමයයි; ප්‍රාහුඃ, කියති; යදි, ඉදින්; සර්වතඃ, සියලු පාදයන්හි; භ්‍රමණම්, භ්‍රමණයවේද; තත්, එය; සර්වතොභද්‍රම්, සර්වතොභද්‍රයයි; ඉෂ්ටම්, කැමතිවනලදී.

81

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ම | නො | හ | ව | න | වා | නී | කා |
| නො | ද | සා | ස | න | මා | නි | නී |
| හ | සා | ද | මෙ | සා | මා | මා | වා |
| ව | ස | මෙ | නො | ම | සා | න | හා |
| හා | න | සා | ම | නො | මෙ | ස | ව |
| වා | මා | මා | සා | මෙ | ද | සා | හ |
| නී | නි | මා | න | ස | සා | ද | නො |
| කා | නී | වා | න | ව | හ | නො | ම |

මනොභව, එම්බා අනඞ්ගය; ආනීකම්, සෙනාසවරුපවූ; මානිනී මේ මානිනිය; තව, තාගේ; තළදයායන, පහළනොවීම පිණිසනෙ, වෙ වැලි පහළවීම පිණිසමැයිසේයි. නත, නමස්කාර කරණ්‍ලබන් න්හ; වයම්, අපි; එනොමයාවා, අපරාධඇත්තාහු හෝ මාවා; අපරාධනැත්තාහුහෝ වෙත්වා; වැලින්, හයාත්, හයින්; අවෙයාමාඃ, අපරිමිතවූ පීඩාඇත්තාහුවම්හ.

82

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| සා | මා | යා | මා | මා | යා | මා | සා |
| මා | රා | නා | යා | යා | නා | රා | මා |
| යා | නා | වා | රා | රා | වා | නා | යා |
| මා | යා | රා | මා | මා | රා | යා | මා |
| මා | යා | රා | මා | මා | රා | යා | මා |
| යා | නා | වා | රා | රා | වා | නා | යා |
| මා | රා | නා | යා | යා | නා | රා | මා |
| සා | මා | යා | මා | මා | යා | මා | සා |

අමායාමාමායා, මායාරහිතවූ අපරිමිතකාම පීඩාවගේ ආගමන ඇති; මාරානායායානාරාමා, අනඞ්ගයාගේ ජලාගමනයෙහි ප්‍රීතිඇති; යානාවාරාරාවා (මාගේ විදෙශ) ගමන් වළකන්නාවූ වචනඇති; අනායා, නීතිවිරහිතවූ; මායා, අතිශයින් සෞන්දය්‍ය්‍යඇති; සාරාමා, ඒ ස්ත්‍රිනොමෙමෑ; මාසාඅමා, චන්ද්‍රයාහාඑක්ව; මාරාය, මාගේමර පිණිස වූවාය. ඒ ස්ත්‍රියගේ සමරණය හා චන්ද්‍රයාගේ උදවීම අතිශයින්ම දූන් මාගේ චිත්තය ව්‍යාකූලකෙරෙයි යනු භාවයි. මේසව්තොභද්‍රයට උදාහරණයි.

83 යඃ සවරස්ථානවර්ණාණාං නියමොදුෂ්කරෙෂ්වසෞ
ඉෂ්ටඃචතුඃප්‍රභෘත්‍යෙෂු දර්ශ්‍යතෙසුකරඃපරඃ.

දුෂ්කරෙෂු, දුෂ්කරබන්ධනයන් අතුරෙහි; සවරස්ථානවර්ණානාම්, සවරස්ථාන වර්ණයන්ගේ යඃනියමඃ, යම්නියමයක්; පුරාතනයන් විසින් කියනලදද; එෂු, මොවුන්අතුරරහි; ඉෂ්ටඃ, දුෂ්කරත්වයෙන්; අභිමතවූ; චතුඃප්‍රභෘති, සතරපටන් එක දක්වා; දර්ශ්‍යතෙ, දක්වනු ලැබේ;; පරඃ, අන්‍යවූයේ; සුකරඃ, සුකරයි.

84 ආම්නායානාමාහාන්ත්‍යාවා ගීතිරීතිඃප්‍රිතිර්භීතිඃ
භොගොරොගොමොදෙමොහො ධ්‍යෙයෙධෙවෙශ්දෙශෙක්ෂෙමෙ.

ආම්නායානාම්, වෙදයන්ගේ; අන්ත්‍යාවාක්, අන්තිමවචනවූ; උපනිෂත්, සංඛ්‍යාත; ගීතිඃ, ගායනා; ඊතිඃ, උපද්‍රවයයි; ආහ, කියයි;

ප්‍රීතිඃ, පුත්‍රදාරාදීන් කෙරෙහි ප්‍රෙම සංඛ්‍යාතවූ ප්‍රීතිය; භීතිඃ, භයයයි; අහ, කීයයි; භොගඃ, විෂයානුභවය; රොගඃ, රොගයයි; ආහ, කියයි; මොදඃ, හර්ෂය හෙයින් විෂයානුභවසන්තොෂය; මොහඃ, මුළාවයයි; ආහ, කියයි; ක්‍ෂෙමෙ, පවිත්‍රවූ; නොහොත් නිරුපද්‍රවූ; දෙශෙ, දෙශයෙක්හි; ධ්‍යෙයෙ, ධ්‍යානකටයුතුවූ බ්‍රහ්මයාකෙරෙහි; ධෙවෙඡ, චිත්ත සමාධාන ඉච්ඡාදෙක; (කටයුතුයි) මේ ස්වරසහරෙන්වූ බන්ධනයට උදාහරණයි. මේ විද්‍යුන්මාලානම් වෘත්තයි.

85 ක්‍ෂිතිවිජිතිස්ථිතිවිහිති ව්‍රතරතයඃ පරගතයඃ
උරුරුරුධුර්ගුරු දුධුවුර්යුධිකුරවඃ ස්වමරිකුලම්.

ක්‍ෂිතිවිජිති, පෘථිවිය දිනිමෙහිද; ස්ථිතිවිහිති, මර්‍යාදාවිධාන සංඛ්‍යාත; ව්‍රතරතයඃ, ව්‍රතයෙහි ඇල්මඇති; පරගතයඃ, උතුම්වූ අවස්ථාහෝ ඥානඇති; කුරවඃ, කුරුවංශිය නරෙන්ද්‍රයෝ; යුධි, යුධයෙහිලා; ස්වම්අරිකුලම්, ස්වකීයශත්‍රුකුලය; උරු, අධිකව; රුරුධුඃ; වැළැක්වූහු; ගුරු, අතිශයින්; දුධුවුඃ, කම්පාකළාහුය; මේ ස්වරත්‍රයෙන් පද්‍යබන්ධනයට උදාහරණයි මේ චරිතගතිනම් වෘත්තයයි.

86 ශ්‍රිදීපතීහ්‍රීකීර්තී ධීනීතීගීඃප්‍රීතී
එධෙතෙ වෙවෙතෙ යෙනෙමෙදෙවෙශෙ.

තෙ, තාගේ; ශ්‍රිදීපතී, ලක්‍ෂ්මීකාන්තිදෙකද; හ්‍රීකීර්තී, ලජ්ජාකීර්ති දෙකද; ධීනීති, ප්‍රඥානීතිදෙකද; ගීඃප්‍රීතී, මධුරවචන ප්‍රීතිදෙකදයි; වෙවෙ, දෙක දෙක; එධෙතෙ, වැඩෙති; ඉමෙ, මේදෙක දෙක; දෙවෙශෙ, දෙවෙන්ද්‍රයා කෙරෙහි; න, නැත්තේය. මෙහි ස්වරදෙකින් ප්‍රද්‍යබන්ධයයි මේ වාණීනම් වෘත්තයයි.

87 සාමායාමාමායාමාසා මාරානායායානාරාමා
යානාවාරා රාවානායා මායාරාමා මාරායාමා.

මෙය පූර්වයෙහි ව්‍යාඛ්‍යාතයි. මෙහි ආකාරස්වරයෙන් පද්‍යබන්ධයවිය

(සර්වතොභද්‍රය බලනු).

## ස්වරනියමඃ, ස්වරනියමයයි.

---

88 නයනානන්දජනනෙ නක්‍ෂත්‍රගණශාලිනි
අඝනෙගගනෙදෘෂ්ටි රඞ්ගනෙදියතාංසකෘත්.

නයනානන්දජනනෙ, නෙත්‍රානන්දජනකවූ; අඞ්ගනෙ, එම්බා කාන්තාව; අඝනෙ, මෙඝරහිතවූ; නක්‍ෂත්‍රගණශාලිනි, එහෙයින්ම තාරකාසමූහයෙන් යුක්තවූ; ගගනෙ, ආකාශයෙහි; සකෘත්, එක්වරක්; දෘෂ්ටිඃ, දෘෂ්ටිය; දියතාම්, දෙනු ලැබේවා, මෙහි දන්ත්‍යතාලව්‍ය කණ්ඨ්‍ය මූර්ධන්‍යවර්ණයන්ගෙන්ම පද්‍යබන්ධනයයි.

89 අලිනීලාලකලතං කංනහන්තිඝනස්තනි
ආනනංනලිනච්ඡාය නයනංශශිකාන්තිතෙ.

ඝනස්තනි, ඝනවූපයොධර ඇත්තිය! අලිභෘඞ්ගයන්ට බඳුවූ; නීල, නිලවණ්වූ; අලකලතම්, කියඹුවැල්ඇති; නලිනච්ඡායනයනම්, පද්මයන්ට බඳුවූ නෙත්‍රඇති; ශශිකාන්ති, චන්ද්‍රකාන්තියට බඳුවූ

කාන්තිඇති; තෙ, තීගේ; ආනනම්, මුහුණ; කම්, කවර පුරුෂයක්හු; නහන්ති, ආකුලනොකරයිද වැලි හැමම ආකුලකරයිසේයි. මෙහි කණ්ඨ්‍යතාලව්‍යදන්ත්‍ය වර්ණයන්ගෙන්ම පද්‍යබන්ධයයි.

90 අනඞ්ගලඞ්ඝනාලගනා නානාන්තඞ්කා සදඞ්ගනා
සදනස සදනන්ද නතාඞ්ගාසඞ්ගසඞ්ගතඃ.

සදනස !, හැමකල්හි පවිනැත්ත! සදනන්දනතාඞ්ග ! හැම් කල්හි සන්තොෂයෙන් අවනතාඞ්ගඇති තැනැත්ත ! සදඞ්ගනා, යහපත් ස්ත්‍රීතොමෝ; අසඞ්ගසඞ්ගතඃ, අසත්පුරුෂ සඞ්ගමයෙන් නොහොත් අසත්පුරුෂයන්ගේ ඇලීමෙන්; අනඞ්ගලඞ්ඝන, කාමපීඩාවෙන්; ආලගනා, හටගත්තාවූ; නානාන්තඞ්කා, නානාප්‍රකාරවූ ආතඞ්ක ඇත්තීවෙයි. මෙහි දන්ත්‍යකණ්ඨ්‍යයන්ගෙන්ම පද්‍යබන්ධනයයි.

91 අගාගාඞ්ගාඞ්ග කාකාක ගාහකාඝකකාකහා
අහාහාඞ්ග ඛගාඞ්කාගකඞ්කාගඛගකාකක.

ගාඞ්ගකාකාකගාහක, ගඞ්ගානදිය සම්බන්ධතරඞ්ගයන් ගාහනයකරණ තැනැත්ත! අහාහාඞ්ග, ඍහායන දිනතාසූචක ශබ්ද විශෙෂයට නොපැමිණි තැනැත්ත, හෙවත් බැගෑනුවූ තැනැත්ත! ඛගාඞ්කාගකඞ්ක, මහාමෙරුපර්වතයට පැමිණිතැනැත්ත! අගඛගකාකක, විනශ්වරවූ ඉන්ද්‍රියවිෂයවූ සුඛාභිලාෂනැත්ත! (ත්වම්, තා;) අඝකකාකහා, පාපනැමතිකවුඩන් නසන්නේ; ගාම්, පෘථිවිය මුලුල්ල; අගාඃ, ගියෙහිය. මෙහි කණ්ඨ්‍යවර්ණයෙන්ම පද්‍යරචනායි.

92 රෙරෙ රොරු රුරු රොරු ගාගොගොගාඞ්ගගොගඝ
කිංකෙකාකාකුකඃකාකො මාමා මාමම මා මම.

රෙරෙමාමම ! කොලකොල ලක්ෂ්මීවම්භවයඇත්ත; මාම්, මාකරා; මාමාඅම ! නොඑව නොඑව; කිං, කිමෙක්; කාකඃ, කාකතෙමේ; කෙකාකාකුකඃ, කෙකාධ්වනිහා කාකුධ්වනිකරන්නෙක්වේද කෙකාධ්වනිනම් මයූරධ්වනියි, කාකුධ්වනිනම්, මදකෘතවිකාරයි, කිමෙක්ද කවුඩාමයූරවෘත්ති ඇත්තෙක්වේදැයි යනු භාවයි, රොරුරුරු, නැවත නැවත රාවනගන්නාවූ රුරුනම් මෘගවිශෙෂයාගේ; උරඃ, ලයෙහි; රුක් (ශරවෙගජනිතවූ) පීඩාකිරීම් සංඛ්‍යාත; ආගොගඃ, අපරාධයට පැමිණියෙහිය; (එහෙයින් තා මට අයොග්‍යය යනු භාවයි); අගාඞ්ගගඃ, පර්වත එකදෙශයන්හි විසීම් ඇත්තේය; අගඝඃ, අසම්බන්ධනෙපුල් ඇත්තේය, මේහැම ආකාරයෙන්ම තා මා කරා ඊමට අයොග්‍යය යනු භාවයි, මේ කිසියම් වෙශ්‍යාවක් කැමතිවූ ව්‍යාධකුමාරයක් හට ඈ සම්බන්ධ ආසා වලක්වමින් ඈ කී වචනයි. ලක්ෂණකී ශ්ලොකයෙහි වර්ණයන පදයෙන් පද්‍යපූරකවර්ණයන්ගේම ගැණීමවේ, එහෙයින් මෙහි අඞ්ගයන තැන යෙදුනු ඞකාරය හෙතුකොටගෙණ චාතුර්වර්ණව්‍යාඝාතයනොවේ.

93 දෙවානාංනන්දනොදෙවො ෂනාදනොවෙදනින්දිතඃ
දිවංදුදුවනාදෙන දුනෙදූනාවනන්දිතඃ.

දෙවා නාම්, ඉන්ද්‍රාදිදෙවියන්ට; ආනන්දනඃ, ප්‍රීතිජනකවූ; වෙදනින්දිනඃ, වෙදයට නින්දාකරන්නන්; නොදනඃ, දුරුකරන්නාවූ; දෙවඃ, නෘසිංහරූපවූ විෂ්ණු; දානවනන්දිනඃ, අසුරයන් සතුටුකරන්නාවූ හිරණ්‍යකසිපුහුගේ; දනෙ, වක්ෂසවිදාරණයෙහි; නාදෙන, නාදයෙන් දිවම්, ආකාශය; දුදුව, තාපනයකෙළේය. මෙහි ද, ව, න, යන වර්ණත්‍රයෙන් පද්‍යයාගේ බන්ධනයයි.

94 සූරිඃසුරාසුරාසාරි සාරඃ සාරසසාරසාඃ
සසාරසරසීඃ සිරී සසූරුඃ සසුරාරසී.

සූරිඃ, පණ්ඩිතවූ; සුරාසුරාසාරිසාරඃ, දෙවාසුරයන් ආක්‍රමණය කරන්නාවූ බලඇත්; සසූරුඃ, ශොභනවූ කලවාසහිත; සුරාරසී, සුරා ස්වාදඇති; සඃසිරි, ඒ බලදෙවතෙමේ; සාරසසාරසාඃ, ශබ්දසහිතවූ විල්ලිහිණිඇති; සරසීඃ, තඩාගයන්කරා; සුසාර, ජලක්‍රීඩාපිණිස ගියේය. මෙහි සරයනවර්ණද්වයෙන් පද්‍යයාගේ බන්ධනයයි·

95 නූනංනුන්නානිනානෙන නානනෙනානනානිනඃ
නානෙනානනුන්නානූනෙ නෙනෙනෙනානා නිනොනිනීඃ.

අනෙන, මොහු විසින්; ආනනෙන, මුහුණින්; නඃ, අපගේ; ආනනානි, මුඛයන්; නූනම්, ඒකාන්තයෙන්; ननුන්නානින, පහනොකරණලද්දාහුනුවූහ; වැලි, පහකරණලද්දාහුමැයිසේයි. නනු, පින්වත්නි (ස්වබන්ධුන් සඳහා සෙනාවන්ගේ මේ සම්බොධනයි); අනූනෙන, ප්‍රබලවූ; ඒනෙන, මොහු හෙතුකොටගෙන; ඉනඃ, (අපගේ) ස්වාමිවූ; නා, පුරුෂතෙමේ; අනාන්, ප්‍රාණයන්; නිනීඃ, රක්නට කැමති වූයේය; නඅනෙනාඃ, නිෂ්පාපීවූයේ නොවෙයි. මේ බලවත් සතුරකු විසින් පරදවනලද රජෙකුගේ සෙනාවන් විසින් කියනලද බැගෑවචනයි.

## වර්ණනියමඃ, වර්ණනියමයි.

---

96 ඉතිදුෂ්කරමාර්ගේපි කශ්චිදාදර්ශිතඃක්‍රමඃ
ප්‍රහෙලිකාප්‍රකාරාණාම් පුනරුද්දිශ්‍යතෙගතිඃ.

ඉති, මෙසේ; දුෂ්කරමාර්ගේපි, දුෂ්කරමාර්ගයෙහිද; කශ්චිත්ක්‍රමඃ, කිසික්‍රමයක්; ආදර්ශිතඃ, දක්වනලදී; පුනඃ, නැවත; ප්‍රහෙලිකාප්‍රකාරාණාම්, ප්‍රහෙලිකා ප්‍රකාරයන්ගේ; ගතිඃ, නියමය; උද්දිශ්‍යතෙ, නිරූපණයකරනු ලැබේ.

97 ක්‍රීඩාගොෂ්ඨීවිනොදෙෂු තජ්ඥෛරාකීර්ණමන්ත්‍රණෙ
පරව්‍යාමොහනෙචාපි සොපයොගාඃ ප්‍රහෙලිකාඃ.

ක්‍රීඩාගොෂ්ඨීවිනොදෙෂු, ක්‍රීඩාපිණිස පවත්නා සභාවන්හි ප්‍රමොදවිෂයෙහිද; තජ්ඥෛඃ, ඒ ප්‍රහෙලිකාදන්නන් හා; ආකීර්ණමන්ත්‍රණෙ, ජනසම්බාධස්ථාන මන්ත්‍රණයෙහිද; පරව්‍යාමොහනෙ, අන්‍යයන් විශෙෂයෙන් මුළාකිරීමෙහිද; ප්‍රහෙලිකාඃ, ප්‍රහෙලිකාවෝ; සොපයොගාඃ, උපයොගසහිතවෙති හෙවත් සප්‍රයොජනවෙති.

98 අහුඃසමාගතාංනාම ,ගූඪාර්ථාංපදසන්ධිනා
වඤ්චිතාන්‍යත්‍රරූඪේනයත්‍ර ශබ්දේනවඤ්චනා.

පදසන්ධිනා, පදසම්බන්ධවූ සන්ධියෙන්; ගූඪාර්ථාම්, ගූඪවූ අර්ථඇත්තී; නාම, නාමයෙන්; සමාගතාංආහුඃ, සමාගතායයි කියත්! යත්‍රඅන්‍යත්‍ර, යම්අනික්තැනෙක්හි හෙවත් විවක්ෂිතාර්ථයන්ගේ භින්නස්ථලයෙහි; රූඪේන, ප්‍රසිද්ධවූ; ශබ්දේන, ශබ්දයෙන්; (යා, යම්බඳුවූ); වඤ්චනා, වඤ්චාකිරීමෙක්වන්නීද; (සා, ඕතොමෝ); වඤ්චිතා, වඤ්චිතා නම්වේ.

99 ව්‍යුත්ක්‍රාන්තාතිව්‍යවහිත ප්‍රයෝගාන්මෝහකාරිණී
සාස්‍යාත්ප්‍රමුෂිතායස්‍යාං දුර්බෝධාර්ථපදාවලී.

අතිව්‍යවහිතප්‍රයෝගාත්, අතිශයින් ව්‍යවහිතවූ හෙවත් අන්‍යාසන්නවූ; ප්‍රයෝගාත්, පදප්‍රයෝග ඇතිහෙයින්; මෝහකාරිණී, මෝහකාරීවූ; හෙවත් අර්ථාවබෝධය වළකන්නාවූ; (යා, යම්ප්‍රහේලිකාවක් වේද); සා, ඕතොමෝ; ව්‍යුත්ක්‍රාන්තා, ව්‍යුත්ක්‍රාන්තා නම; යස්‍යාම්, යම් ප්‍රහේලිකාවක්හී; පදාවලී, පදපඞ්ක්තිය; දුර්බෝධාර්ථා, දුර්බෝධවූ අර්ථ ඇත්තීද; සා, ඒ ප්‍රහේලිකාතොමෝ; ප්‍රමුෂිතා, ප්‍රමුෂිතා නම්වේ.

100 සමානරූපාගෞණාර්ථාරෝපිතෛර්ග්‍රථිතාපදෛඃ
පරුෂාලක්ෂණාස්තිත්ව මාත්‍රව්‍යුත්පාදිතශ්‍රුතිඃ.

ගෞණාර්ථ, අමුඛ්‍යාර්ථයෙහි; ආරෝපිතෛඃ, ආරෝපණයකළාවූ; පදෛඃ, පදයෙන්; ග්‍රථිතා, විරචිතවූවා; සමානරූපා, සමානරූපා නම් වේ; ලක්ෂණාස්තිත්වමාත්‍ර, සූත්‍රයාගේ අස්තිත්වමාත්‍රයෙන් හෙවත් සූත්‍රානුසාරයෙන්; ව්‍යුත්පාදිත ශ්‍රුතිඃ, ව්‍යුත්පාදිතවූශ්‍රුතිය; පරුෂා, පරුෂා නම්වේ.

101 සංඛ්‍යාතානාමසංඛ්‍යානං යත්‍රව්‍යාමෝහකාරණම්
අන්‍යථාභාසතෙයත්‍ර වාක්‍යාර්ථඃසාප්‍රකල්පිතා.

යත්‍ර, යම්රචනාවෙක්හි; සංඛ්‍යානම්, ගණන; ව්‍යාමෝහකාරණම් අවිවැළහීමට කාරණාවේද (එය) සංඛ්‍යාතානාම, සංඛ්‍යාතනම; යත්‍ර; යම් ප්‍රහේලිකාවට; වාක්‍යාර්ථඃ, වාක්‍යාර්ථය; අන්‍යථා, අන් පරිද්දකින්; භාසතෙ, ප්‍රකාශවේද; සා, ඕතොමෝ; ප්‍රකල්පිතා, ප්‍රකල්පිතා නම.

102 සානාමාන්තරිතායස්‍යාං නාම්නිනානාර්ථකල්පනා
නිභෘතානිභෘතාන්‍යාර්ථා තුල්‍යධර්මස්පෘශාගිරා

යස්‍යාම්, යම්ප්‍රහේලිකාවෙක්හී; නාම්නි, නාමයෙහිලා; නානාර්ථකල්පනා, නානාර්ථකල්පනාඇත්තීද; සා, ඕතොමෝ; නාමාන්තරිතා, නාමාන්තරිතානම; යස්‍යාම්, යම්ප්‍රහේලිකාවෙක්හි; තුල්‍යධර්මස්පෘශා, ප්‍රස්තුතයන් හා අප්‍රස්තුතයන්ට සාධාරණ ධර්මස්පර්ශකරන්නාවූ; ගිරා, වාක්තොමෝ; නිභෘතා, සඟවනලද්දීද; (සා, ඕතොමෝ) නිභෘතා, නිභෘතානම.

103 සමානශබ්දෝපන්‍යස්තශබ්දපර්‍ය්‍යායසාධිතා
සංමූඪානාමයා සාක්ෂාන්නිර්දිෂ්ටාර්ථාපිමූඪයෙ.

උපන්‍යස්ත, උපන්‍යාසකරණලද හෙවත් දක්වනලද; ශබ්ද, ශබ්දයන්ට; පර්‍ය්‍යාය, පර්‍ය්‍යායවූ නාමාන්තරයකින්; සාධිතා, රචනාකරණ

ලද්දී; සමානශබ්ද, සමානශබ්දනම්; යා, යම්ප්‍රහෙලිකාවක්; සාක්‍ෂාත්, ප්‍රත්‍යක්‍ෂව; නිර්දිෂ්ටාපිඅපි, නිර්දිෂ්ටවූ අපිඇත්තීද; මූඪයෙ, අපිවැලිහිමට සම්පිවේද; සා, ඕතොමෝ; සංමූඪානාම, සංමූඪානම්වේ.

104 යොගමාලාත්මිකානාම යාස්‍යාත්සාපරිහාරිකා
එකච්ඡන්නාශ්‍රිතං ව්‍යක්තං යස්‍යාමාශ්‍රයගොපනම්.

යා, යම් ප්‍රහෙලිකාවක්තොමෝ; යොගමාලාත්මිකාස්‍යාත්, ඈඹිවූපද සමූහයක් ආත්මකොට ඇත්තීද; සා, ඕතොමෝ; පරිහාරිකා නාම, පරිහාරිකානම; යස්‍යාම්, යම්ප්‍රහෙලිකාවෙක්හි; ආශ්‍රිතම්, ආධෙයය; ව්‍යක්තම්, සපුටද; ආශ්‍රයගොපනම්, ආධාරයාගේ සැඟවීම වේද; සා, ඕතොමෝ; එකච්ඡන්නා, එකච්ඡන්නානම.

105 සාභවෙදුභයච්ඡන්නා යස්‍යාමුභයගොපනම්
සංකීර්ණානාමසායස්‍යාං නානාලක්‍ෂණශඞ්කරඃ.

යස්‍යාම්, යම් ප්‍රහෙලිකාවෙක්හි; උභයගොපනම්, ආධාර ආධෙයදෙදෙනාගේ සැඟවීමවේද; සා, ඕතොමෝ උභයච්ඡන්නාභවෙත්, උභයච්ඡන්නා නම්වේ. යස්‍යාම්, යමක; නානාලක්‍ෂණ සඞ්කරඃ, නානාලක්‍ෂණයන්ගේ ශඞ්කරයවේද; සා, ඕතොමෝ; සංකීර්ණානාම්, සඞ්කීර්ණ නම්වේ.

106 එතාඃෂොඩශනිර්දිෂ්ටාඃ පූර්වාචාර්‍ය්‍යෛඃප්‍රහෙලිකාඃ
දුෂ්ටප්‍රහෙලිකාශ්චාන්‍යා තෛරධීතාශ්චතුර්දශ.

එතාඃ, මේ (සාමාගතාදි) ෂොඩශප්‍රහෙලිකාඃ, සොලොස් ප්‍රහෙලිකාවෝ; පූර්වාචාර්‍ය්‍යෛඃ, පූර්වාචාර්‍ය්‍යයන් විසින්; ¡නිර්දිෂ්ටාඃ, දක්වන ලද්දහ; තෛඃ, ඔවුන් විසින්; අන්‍යාඃ, (මෙයින්) අන්‍යවූ; දුෂ්ටප්‍රහෙලිකාඃ, දුෂ්ටප්‍රහෙලිකාවෝ; චතුර්දශ, තුදුසක්, අධීතා, හඳුරණලදහ.

107 දොෂානපරිසඞ්ඛ්‍යෙයාන් මන්‍යමානාවයංපුනඃ
සාධ්වීරෙවාභිධාස්‍යාමස්තාදුෂ්ටායාස්ත්වලක්‍ෂණාඃ.

වයම්, අපි; පුනඃ, නැවත; අපරිසඞ්ඛ්‍යෙයාන්, ගණන්නොකළ හැකිවූ; හෙවත් බොහෝවූ; දොෂාන්, දොෂයන්; මන්‍යමානාඃ, දන්නාහු; සාධ්වීරෙව, නිර්දොෂවූප්‍රහෙලිකාවන්ම; අභිධාස්‍යාමඃ, කියන්නෙමු; යාඃතු, යම්ප්‍රහෙලිකාකෙනෙක්; අලක්‍ෂණාඃ, පූර්වයෙහිවූ ලක්‍ෂණරහිතයෝද; තාඃ, ඒ ප්‍රහෙලිකාවෝ; දුෂ්ටාඃ, දුෂ්ටයහ; එහෙයින් ඔවුන් සඳහා උදාහරණ දැක්වීමට මගේ ප්‍රයාසයක් නැත යනුභාවයි. (කියනලද ෂොඩශවිධ ප්‍රහෙලිකාවන්ට ක්‍රමයෙන් උදාහරණ කියත්)

108 නමයාගොරසාභිඥං චෙතඃ කස්මාත් ප්‍රකුප්‍යසි
අස්ථානරුදිතෛරෙභිරලමාලොහිතෙක්‍ෂණෙ.

ආලොහිතෙක්‍ෂණෙ, ආරක්තවූනෙත්‍ර ඇත්තීය; මයා, මාගේ (මයාසතුෂ්ණ්‍යාපියෙහිතාත්යායි) චෙතඃ, සිත; ගොරසාභිඥම්, දුඃඛාදිගොරසඃන්නේ; න, නොවෙයි; කස්මාත්, කවරහෙයකින්; ප්‍රකුප්‍යසි, අත්‍යර්ථයෙන් කිපෙන්නෙහිද; එභිඃ අස්ථානරුදිතෛඃ, මේ අස්ථානරොදනයෙන්; අලම්, අප්‍රයොජනයි; මේ ප්‍රකටවූ අර්ථය චකනෘහට අභිමතනොවේ; මෙ, මාගේ චෙතඃ, සිත; ආගොරස,

(නායිකාන්තර සඞ්ගතරූපවූ) අපරාධරසය; අභිඥාන, දන්නේ නොවෙයි; මේවකතෘහට අභිමතවූඅර්ථයි. මේ ආගොරසාභිඥම්යි පද බිඳතුබූතන්හි එකාරයාහට අයාදෙශවීමෙන් මයාගොරසාභිඥම්යි සිද්ධවිය; මෙයින් ප්‍රකෘතාර්ථය මුවහවිය. මේකිසියම් ගොපිකාඞ්ගනාවක් සඳහා ජනසඞ්ගමයකදී ශ්‍රීකෘෂ්ණවචනයයිකියත්. මේ සමාගතානම් ප්‍රහෙලිකාවට උදාහරණයි

109 කුබ්ජමාසෙවමානස්‍ය යථාතෙවර්ධතෙරතිඃ
නෛවංනිර්විශතොනාරී රමරස්ත්‍රීවිඩම්බිනීඃ.

කුබ්ජම්, කුදියක්; ආසෙවමානස්‍ය, සෙවයකරන්නාවූ; තෙ, තට යථා, යම්සේ; රතිඃ, රතිය; වර්ධතෙ, වැඩේද; අමරස්ත්‍රීවිඩම්බිනීඃ, දිව්‍ය ස්ත්‍රීන් සදෘශවූ; නාරීඃ, ස්ත්‍රීන්; නිර්විශතඃ, උපභොගකරන්නාහට; එවම්, මෙසේ; රතිඃනවර්ධතෙ, රතියනොවැඩේ; මේසහජාර්ථයි; ගූඪාර්ථනම්, කුබ්ජාම්, කාන්‍යකුබ්ජනගරියහෝ එහි උපන් ස්ත්‍රියක්යනුයි. මෙහි කුබ්ජාශබ්දය කුදුවූස්ත්‍රිය කෙරෙහිම ප්‍රසිද්ධය අනිකක්කෙරෙහි අප්‍රසිද්ධය එහෙයින් මේ අප්‍රසිද්ධාර්ථප්‍රතිපාදනයි. කාන්‍යකුබ්ජ පුරියෙහිහෝ තත්‍රත්‍ය ස්ත්‍රියක් කෙරෙහි අනුරක්තවූ කිසියම් පුරුෂයක් හුගේ වචනයකි මේවනිතා උදාහරණයි.

110 දණ්ඩචුම්බති පද්මින්‍යා හංසඃ කර්කශකණ්ටකෙ
මුඛංවල්ගුරවංකූජංස්තුණ්ඩනාඞ්ගානිඝට්ටයන්

හංසඃ, හංසතෙම; කර්කශකණ්ටකෙ, කර්කශවූකටුඇති; පද්මින්‍යඃ දණ්ඩ, පද්මිනියගේදණ්ඩහි; අඞ්ගානි, අවයවයන්; ඝට්ටයන්, ගටමින්; වල්ගුරවම්, මනොඥවූනාදය; කූජන්,කරමින්;(පද්මින්‍යාඃ, පද්මිනියගේ;)මුඛම්, මුහුණ; තුණ්ඩන, තුඩින්; චුම්බති, සිඹී. මෙහි පදසම්බන්ධසඞ්ඛ්‍යාතවූ බන්ධයාගේ ආසත්තිව්‍යතික්‍රමයයි. සම්බන්ධ කටයුතු පදයන්ගේ ආසන්නතා නැතැයිසේයි.

මුඛංචුම්බති පද්මින්‍යා දණ්ඩකර්කශකණ්ටකෙ
හංසඃවල්ගුරවං කූජන්යි, අන්වයපදසමීපයෙහි යෙදුවමනා වුවද එසේ නොයෙදූ හෙයින් මේ ව්‍යුත්ක්‍රාන්තානම් ප්‍රහෙලිකාවට උදාහරණයි.

111 බානයඃ කති කාලෙනෙ සර්ථානයඃ සර්ථාතීවල්ගවඃ
වනේ‍රසාක්ෂාත් භවන්ත්‍යත්‍ර වායවොමමධාරිණඃ.

කනි, එම්බාකුමරිය; තෙ තීගේ; කාලෙ, පාදයෙහි; බානයඃ, නූපුරාදි අලඞ්කාරයෝ; සර්ථානයඃ, බොහෝවෙති; සර්ථානීා, බොහෝවූ වල්ගවඃ, වලිතධ්වනි ඇත්තාහ; වනේ‍ර, ආහලාදජනකවූ; අත්‍ර, මේ පාදයෙහි; සාක්ෂාත්, ප්‍රත්‍යක්ෂයෙන්; මම, මාගේ; වායවඃ, ප්‍රාණවාතයෝ; ධාරිණඃභවන්ති, දරණ සුල්ලෝවෙති. මෙහි අප්‍රසිද්ධාර්ථවූ බොහෝ පදවලින් ශ්‍රොතෲන් මුළාකරණහෙයින් ප්‍රමුෂිතානම් ප්‍රහෙලිකාවට මේ උදාහරණයි.

112 අත්‍රොද්‍යානෙ මයා දෘෂ්ටා වල්ලරී පඤ්චපල්ලවා
පල්ලවෙ පල්ලවෙ තාම්‍රා යස්‍යාං කුසුම මඤ්ජරී.

අත්‍ර උද්‍යානෙ, මේ උයනෙහි; පඤ්චපල්ලවා, පත්‍රපසක් ඇති; වල්ලරී වැලක්; මයා, මාවිසින්; දෘෂ්ටා, දක්නාලද්දීය; යස්‍යාම්, යම් ලතාවෙක්හි; පල්ලවෙ පල්ලවෙ, පත්‍රයක්පාසා, තාම්‍රා, රක්තවර්ණවූ; කුසුමමඤ්ජරී, පුෂ්පස්තවක ඇත්තීද. මෙහි කිසියම් නායිකාවක් උද්‍යානත්වයෙන් අධ්‍යාරොපිතයි. ඇගේ අත් ලතාත්වයෙන්ද ඇඟිලි පත්‍රත්වයෙන්ද නියකුසුම මඤ්ජරීත්වයෙන්ද අධ්‍යාරොපිතයි. මෙහි පදයන්ගේ අමුඛ්‍යාර්ථයෙහි ආරොපිතත්වයහෙතුකොටගෙණ මේ සමානරූපානම් ප්‍රහෙලිකායි.

113 සුරාඃ සුරාලයෙ ස්වෛරං භ්‍රමන්තිදශනාර්චිෂා
මජ්ජන්ත ඉවමත්තාස්තෙ සෞරෙසරසි සම්ප්‍රති.

තෙසුරාඃ, ඒ සෞණ්ඩිකයෝ නොහොත් සුස්වරගායකයෝ; දශනාර්චිෂා, (හාස්‍යයෙන් විවෘත මුඛ ඇති හෙයින්) දන්තප්‍රභායෙන් යුක්තවූවාහු; සෞරෙ, සුරාමයවූ; සරසි, විලෙක; මජ්ජන්තඃ ඉව, ගැලෙන් නවුන්මෙන්; සුරාලයෙ, මද්‍යගෘහයෙහි; ස්වෛරම්, කැමති පරිද්දෙන්; භ්‍රමන්ති, හැසිරෙති. මෙහිසුරාඃ යන පදය දෙවතාවාචකමැයි. ශබ්දානුශාසනා බලයෙන් සෞණ්ඩිකයන් කෙරෙහි හෝ සුස්වරගායකයන් කෙරෙහි යොදන ලද්දේය මෝතොමෝ කවිහුගේ පාරුෂ්‍ය ප්‍රකාශකහෙයින් පරුෂානම් ප්‍රහෙලිකාවට උදාහරණයි

114 නාසික්‍ය මධ්‍යාපරිතශ්චතුර්වර්ණවිභූෂිතා
අස්තිකාචිත්පුරීයස්‍යා මෂ්ටවර්ණාහ්වයානෘපාඃ.

නාසික්‍යමධ්‍යා, නාසික්‍යාක්ෂරයක් මධ්‍යයෙහිවූ; පරිතඃ, දෑලයෙන්; චතුර්වර්ණ, වර්ණචතුෂ්කයකින්; විභූෂිතා, අලඞ්කෘතවූ; යස්‍යාං යම් නගරයෙක්හි; අෂ්ටවර්ණහ්වයාඃ, අෂ්ටවර්ණයකින් යුක්තනම් ඇත්තාවූ නෘපාඃ, නරෙන්ද්‍රයෝ ඇද්ද; එබඳුවූ; කාචිත්පුරී, කිසිපුරියක් තොමෝ; අස්ති, ඇති; මෙයින් කාඤ්චීපුරයකියනලදී. මෙහි මධ්‍යයෙහි සිටි නාසික්‍යාක්ෂරය නම් ඤකාරයයි දෑලයෙහි සිටි වර්ණචතුෂ්කයනම් ක්, ආ, ච්, ඊ, යන සතරයි. අෂ්ටවර්ණයකින් යුක්තනම් ඇති නරෙන්ද්‍රයෝනම් පුණ්ඩ්‍රකනාම් නරෙශ්වරයෝයි. ප්, උ, ණ්, ඩ්, ර්, අ, ක්, අ, යන අකුරු අට ගැළපූකල පුණ්ඩ්‍රක කියාවෙ. මේ සඞ්ඛ්‍යාතානම් ප්‍රහෙලිකාවට උදාහරණයි.

115 ගිරාස්ඛලන්ත්‍යානම්‍රෙණ ශිරසාදීනයාදෘශා
තිෂ්ඨන්තමපි සොත්කණ්ඨං වෘද්ධෙමාං නානුකම්පසෙ.

වෘද්ධෙ, එම්බාවෘද්ධස්ත්‍රිය ස්ඛලන්ත්‍යා, පැකිලෙන්නාවූ; ගිරා, වචනයෙන්ද; නම්‍රෙණ, නැමුනාවූ; ශිරසා, හිසින්ද; දීනයා, බැගෑවූ; දෘශා, චක්ෂුසින්ද යුක්තවුනී; සොත්කණ්ඨම්, උත්කණ්ඨාසහිතව; තිෂ්ඨන්තම්, සිටින්නාවූ; මාම්, මට, නානුකම්පසෙ, අනුකම්පානොකරන්නෙහිය. මේ සහජාර්ථයි. ගූඪාර්ථනම්, වෘද්ධෙයනු එම්බාලක්ෂ්මිය යන අර්ථයි. සෘද්ධිඃ සිද්ධි ලක්ෂ්ම්‍යෞවෘද්ධෙරම්‍යාහ්වයා ඉමෙ යනු අමර කොෂ හෙයිනි. මේ ප්‍රකල්පිතානම් ප්‍රහෙලිකාවට උදාහරණයි.

116 ආදෞරාජෙත්‍යධීරාක්ෂි පාර්ථිවඃ කොපිගීයතෙ
සනාතනශ්චනෛවාසෞ රාජානාපිසනාතනඃ.

අධීරාක්ෂි, චපලවූනෙත්‍ර ඇත්තිය; පාර්ථිවඃ, පාර්ථිවශබ්දවාච්‍යවූ; කඃ අපි, කවරෙක්නමුත්; ආදෞ, පළමුව; රාජාඉති, රාජායයි; ගීයතෙ, කියනුලැබේ; සනාතනශ්ච, සනාතනද (නිත්‍යද) වේ; මේ උචිතනො නොවූ අර්ථයි; උචිතනාවූ අර්ථය ප්‍රකාශකරමින් කියත්. අසෞ මේ පාර්ථිවශබ්දවාච්‍යතෙමේ; නෛවරාජා, රජෙක් නොවේ; නාපිසනාතනඃ, සනාතනද (නිත්‍යද) නොවේ; එහෙයින් මේ කව රෙක්දැයි කියනු ලැබේවා යන ප්‍රශ්නය ගම්‍යයි. මෙහි වැලහිය යුතුවූ අර්ථයනම් කොපිපාර්ථිවඃ, කිසිවෘක්ෂ විශෙෂයක්; ආදෞ, ප්‍රථමභාගයෙහි; රාජෙති, රජායයි ගීයතෙ, කියනුලැබේ; තත්වාචක නාමයාගේ ප්‍රථම භාගයෙහි රාජයන්න පවත්නේයයනු භාවයි. සඃ, ඒ; නාතනඃ, තනයන්නෙන් ශූන්‍යනොවේ තනයන්න සහිතය යනඅර්ථයි. මෙසේකල රාජාතනයනවෘක්ෂනාමය ලැබේ. මෙහි රා ජාතනයන නාමය කිවම්නාකල නානාවිකල්පනාහෙයින් මේ නාමා න්තරිතා ප්‍රහෙලිකාවට උදාහරණයි.

117 හෘතද්‍රව්‍යං නරං ත්‍යක්ත්වා ධනවන්තං ව්‍රජන්තිකාඃ
නානාභඞ්ගිසමාකෘෂ්ට ලොකාවෙශ්‍යානදුර්ධරාඃ.

නානාභඞ්ගී, නානාවිධවිලාසක්‍රියායෙන්; සමාකෘෂ්ට, මොනවට අදනාලද; ලොකාඃ, ලොවැස්සන්ඇති, දුර්ධරාඃ, දුර්ධරවූ; හෙවත් වසහකළ නොහැකි; කාඃ, කවරක්හු; හෘතද්‍රව්‍යම්, නිර්ධනපුරුෂයා; ත්‍යක්ත්වා, හැර; ධනවන්තම්, ධනවතා කරා; ව්‍රජන්ති, යත්ද? වෙශ්‍යාන, මාගේ ප්‍රශ්නවිෂයකොට ඇත්තී වෙශ්‍යාවක් නොවේ; මේ සහජාර්ථයි. වැලහියයුතුවූ අර්ථයනම් නානාභඞ්ගි, නානාප්‍රකාරතර ඞ්ගඇති හෙයින් නානාභඞ්ගිනම්වූ ජලයෙන්; සමාකෘෂ්ටලොකාඃ, ආකර්ෂණය කරණලද ලෝවැස්සන් ඇති; දුර්ධරාඃ (පර්වතයෙන් දුක සේ නික්මතවූ; කාඃ, කවරක්හු; හෘතද්‍රව්‍යම්, විධ්වංසිතවූ වෘක්ෂාදි ද්‍රව්‍යඇති; නරම් සඳශබ්දයෙන් කල්පිතවූ ආශ්‍රය භූමිය; ත්‍යක්ත්වා, හැර; ධනවන්තම්, රත්නාකරය කරා, ව්‍රජන්ති, පැමිණෙත්ද? මෙහි විශෙෂණයන්ගේ සාධාරණත්වයෙන් එක්තරා අර්ථයක්හු නිෂෙධයෙ හිලා අන්‍යතරාර්ථප්‍රතීතිය යුක්තනුයි ගඞ්ගාවෝය යනු ප්‍රශ්නවිෂයවූ අර්ථයයි. මෙහිතුල්‍ය විශෙෂණ ප්‍රතීතියෙහිලා වාචකශබ්දයන්ගේ අනුපාදනහෙයින් නිභෘතත්වය විද්‍යමානනුයි මේ නිභෘතනාම් ප්‍රහෙ ලිකාවට උදාහරණයි.

118 ජිතප්‍රකෘෂ්ටකෙශාඛ්‍යො යස්තායාභූමිසාහ්වයඃ
ස මාමද්‍යප්‍රභුතොපාකං කරොතිකලභාෂිණී.

කලභාෂිණි, මනොඥවචන ඇත්තිය; තව, තාගේ; ජිතප්‍රකෘෂ්ට කොශාබ්‍යඃ, ප්‍රකෘෂ්ටකොශයන්ගේ නාමය ඇතිදේ දිනූ; අභූමිසාහව යඃ, අභූමිසමාන නාමයඇති; සඃ, එය; අද්‍ය, අද; මාම්, මා; ප්‍රභූතොත් කම්, අතිශයින් උකටලිවූවක්හු; කරොති, කෙරේ. (මෙහි ප්‍රකෘෂ්ට කොශනාමය නම් ප්‍රවාලශබ්දයයි. එයින් ජිතප්‍රකෘෂ්ටකොශාබ්‍යඃ යන පදයෙන් දිනූ ප්‍රවාලඇති යන අර්ථයලැබේ. භූමියට ධරායනු නම්හෙයින් අභූමිසමාන නම් ඇත්තාවූ යන මෙයින් අධරයයන අර්ථය ලැබේ. එහෙයින් දිනනලද ප්‍රවාලඇති තීගේ ඔෂ්ඨය යනු මෙහි නිෂ්කර්ෂයි). අද්‍ය, අද; මාම්, මා; ප්‍රභූතොත්කම්, අතිශය උත්සාහ ඇත්තක්හු; කරොති, කෙරේ. මෙහි ප්‍රකෘෂ්ටකොශාබ්‍ය අභූමිශබ්ද ප්‍රවාලඅධරාර්ථයන් ප්‍රකාශකරණහෙයින් ප්‍රකෘතයා සම්බන්ධ සමානාර්ථ ශබ්දයෙන් අර්ථොපස්ථිති ඇත්තුයි. මේ සමාන ශබ්ද නම්ප්‍රහෙලිකායි.

119 ශයනීයෙපරාවෘත්‍ය ශයිතෞකාමිනෞකෘධා
තථෛවශයිතෞ රාගාත් ස්වෛරංමුඛමචුම්බතාම්.

කාමිනෞ, කාමීන් දෙන්නා; කෘධා, කොපයෙන්; ශයනීයෙ, ශය්‍යාවෙහි; පරාවෘත්‍ය, පෙරලී; ශයිතෞ, ශයනකලාහුය; රාගාත්, රාගයෙන්; තථෛව, එසේම; ශයිතෞ (සනෞතෞ), ශයනයකළාහු; ස්වෛරම්, කැමති පරිද්දෙන්; මුඛම්, මුහුණ; අචුම්බතාම්, සිඹගත්තාහුය. මෙහි කොපහෙතුවෙන් පරාවර්තිතව සයනකළවුන්ගේ මුඛ චුම්බනය දුෂ්කරහෙයින් මුළාව හටගණී. එසේ නමුදු අවසානයෙහි තථෛවශයිතෞ යන පදයන්ගෙන් පරාවර්තනයට පූර්වයෙන් සයන සකළ පරිද්දෙන්ම ශයනයකළාහු යන අර්ථයත් ප්‍රතීයමානහෙයින් එසේකල මුඛචුම්බනය සුඝටමය මෙබඳුවූවා සම්මූඪා නම් ප්‍රහෙලිකායි

120 විජිතාත්ම භවද්වෙෂිගුරුපාදහතොජනඃ
හිමාපහාමිත්‍රධරෛරෙ ව්‍යාප්තංව්‍යොමාභිනන්දති.

විජිතාත්මභවද්වෙෂිගුරුපාදහතඃ, සූර්‍ය්‍යරශ්මියෙන් සන්තාපනවූ ජනඃ, ජනතෙම; හිමාපහා මිත්‍රධරෛඃ, මෙඝයන් විසින්; ව්‍යාප්තම්, ව්‍යාප්තවූ; ව්‍යොම, ආකාශයට; අභිනන්දති, සතුටුවේ විජිතාත්මභව ද්වෙෂිගුරුපාදහතඃ, විනාපක්ෂිණාගරුඩෙනජිතඃ, විජිතඃ, ශක්‍රයායන අර්ථයි; විජිතස්‍ය ආත්මභවඃ, විජිතාත්මභවඃ, (එනම්) අර්ජුනයායි. විජිතාත්මභවස්‍යද්වෙෂී, විජිතාත්මභවද්වෙෂී (එනම්) කර්ණයායි; විජිතාත්මභවද්වෙෂිනඃ ගුරුඃ, විජිතාත්මභවද්වෙෂිගුරුඃ (එනම්) සූර්‍ය්‍ය යායි. තස්‍යපාදෛඃ (කිරණෛඃ) හතඃ. හිමං අපහන්තිති හිමාපහඃ, ගින්නයි, තස්‍යඅමිත්‍රඃ, හිමාපහාමිත්‍රඃ, (එනම්) ජලයයි, තෙෂාංධරාඃ තාන්ධරන්තීවා හිමාපහාමිත්‍රධරාඃ, මෙඝයෝයි මෙසේ යෞගික බලයෙන් අර්ථ පරිහරණය කළහැකිවේනුයි මෙබඳුවූවා පරිහාරිකා නම් ප්‍රහෙලිකායි.

121 නාසංගතාන්‍යායුධංජාතු නසත්‍රීණාං ස්තනමණ්ඩලම්
අමනුෂ්‍යස්‍යකස්‍යාපි හස්තොයං නකිලාඵලඃ.

අමනුෂ්‍යස්‍ය, අමනුෂ්‍යවූ; කස්‍යඅපි, කවරෙකුගේ නමුත්, හස්තඃ, අත, ජාතු, කිසිකලෙකත්; ආයුධම්, ආයුධය; නසපෘශති, සපර්ශනො කෙරේ; සත්‍රීණාම්, සත්‍රීන්ගේ; ස්තනමණ්ඩලම්, පයොධරමණ්ඩලයද නසපෘශති, සපර්ශනොකෙරේ; (එසේවූවද) අයම්, මේ අත; නඅඵලඃ කිල, ඵලරහිතවූයේනොවෙයි වැලි සඵලමැයි. මෙහි ආයුධ හා පයොධරසපර්ශ නොකිරීමෙන් මේ තෙමේ වීරයෙක්හෝ ශෘඞ්ගාරික යෙක් හෝ නොවේ කෙසේ සඵලවේදැයි විරොධයෙන් බාධා ඇති වන හෙයින් අමනුෂ්‍ය ශබ්දයෙන් ගන්ධර්වයාගන්නා ලැබේ. ඔහුගේ අතගන්ධර්වහස්ත නම්වේ. එසේගත් කලපදසමුදායෙන් එරඬුවෘක්ෂය යන අර්ථප්‍රතිපාදනයවෙයි, අමරකොෂපඤ්චාඞ්ගුල වර්ධමාන ගන්ධර්වහස්ත සත්‍රිපුටීඵලශාවයතු හාරාවලිකොෂයි. එරඬුරුකට ඵල ඇත්තේයයි වෘක්ෂාශ්‍රිතඵලම මෙහිදී ව්‍යක්තවේ, ආශ්‍රයව්‍යනාගි ජ්‍යනාතුයි මේ එකවර්ජ්‍යනානම් ප්‍රහෙලිකායි.

122 කෙනකඃ සහසම්භූය සර්වකායෙෂ්ඨු සනාතිධිම්
ලබ්ධාභොජනකාලෙතු යදිදෘෂ්ටානිරස්‍යතෙ.

කඃ, කවර පදාර්ථයක්; කෙනසහ, කවරපදාර්ථයක්හා; සම්භූය, එක්ව; සර්වකායෙෂ්ඨු, සියලු කාර්‍ය්‍යයන්හි; සනාතිධිම්, සනාතිධිය හෙවත් ලංවීම්; ලබ්ධා, ලැබ; භොජනකාලෙතු, භොජනකාලයෙහි; යදි ඉදින්; දෘෂ්ටඃ, දක්නාලද්දේ; නිරස්‍යතෙ, දුරුකරනු ලැබේද මේ උවමනානුවූ අර්ථයි; අභිමතවූ අර්ථනම් කඃ, කෙහෙ; කෙන, තිස හා; සම්භූය, එක්ව; සර්වකායෙෂ්ඨු සනාතිධිංලබ්ධා, භොජනකාලෙතු යදිදෘෂ්ටඃනිරස්‍යතෙ යනුයි. මෙහි ආශ්‍රය ආශ්‍රිත යන උභය පදාර්ථම් ජ්‍යනානුයි. උභයවර්ජ්‍යනානම් ප්‍රහෙලිකායි.

123 සභයාසගජාසෙනා සභටෙයං නචෙජ්ජීතා
අමාත්‍රිකොයංමූර්ඛඃස්‍යා දක්ෂරඥශවනඃ සුතඃ.

සභයා, අසුන් සහිතවූ; සගජා, ඇතුන්සහිතවූ; සභටා, භටයන් සහිතවූ; ඉයංසෙනා, මේ සෙනාතොමෝ; චෙත්, ඉදින්; නජිතා, නොදිනනලද්දීනම්; (එකල්හි) නඃ, අපගේ; අයංසුතඃ, මේපුත්‍රතෙම; අක්ෂරඥශව, බ්‍රහ්මඥවූයේද; මූර්ඛඃස්‍යාත්, මෝඩයෙක්වේ; අමාත්‍රිකඃ, යම්හෙයකින් මේතෙමේ අමාත්‍රිකවූයේද එහෙයිනි. අමාත්‍රිකනම් වෛෂයික බුද්ධිවිරහිත තැනැත්තේයි. මේ ප්‍රකාශාර්ථයයි වැලහිය යුතු අර්ථය සභයා, හකාර යකාර සහිතවූ; සගජා, ගකාරජකාර සහි තවූ; සභටා, භකාර ටකාර සහිතවූ; සෙනා, සාධිෂ්ඨාතෘකවූ නො හොත් සබ්‍රහ්මකවූ; ඉයම්, මේ වර්ණමාලාතොමෝ; චෙත්, ඉදින්; න ජිතා, අභ්‍යාස නොකරණලද්දීද; අමාත්‍රිකඃ, වර්ණයන්ගේ උච්චාරණ කාලසඞ්ඛ්‍යාත මාත්‍රානොදන්නේද; අයංනඃසුතඃ, අක්ෂරඥශව, වේ දඥවූයේද; මූර්ඛඃ ස්‍යාත්.

124 සා නාමාන්තරිතාමිශ්‍රා වඤ්චිතාරූපයෝගිනී
එවමෙවෙතරාසාම ප්‍යුන්නෙයඃසඞ්කරක්‍රමඃ.

සා, ඕතොමෝ; නාමාන්තරිතාමිශ්‍රා, නාමාන්තරිතා නම් ප්‍රහෙලිකාවෙන් මිශ්‍රවූවාය; හයාදිශබ්දයන්ගේ නානාර්ථකල්පනා ඇතිහෙයිනි, වඤ්චිතා, වඤ්චිතාවගේ; රූපයෝගිනී, රූපයොගඇත්තීය. චමූරූපාර්ථවූ ප්‍රසිද්ධසෙනා ශබ්දයාගේ වචනයහෙයිනි; එවමෙව, මෙසේම; ඉතරාසාම්අපි, අනික් ප්‍රහෙලිකාවන්ගේද; සඞ්කරක්‍රමඃ, සඞ්කරක්‍රමය; උන්නෙයඃ, දතයුතුයි.

**ප්‍රහෙලිකාචක්‍රම්, ප්‍රහෙලිකාචක්‍රයයි.**

ශබ්දාලඞ්කාරාඃ, ශබ්දාලඞ්කාරයෝ ඉති, මෙසේයි..

---

125 අපාර්ථංව්‍යර්ථමෙකාර්ථං සසංශයමපක්‍රමං
ශබ්දහීනං යතිභ්‍රෂ්ටංභින්නවෘත්තං විසන්ධිකම්.

126 දෙශකාලකලාලොක න්‍යායාගමවිරොධිච
ඉතිදොෂා දශෛවෙතෙවර්ජ්‍යාඃ කාව්‍යෙෂුසූරිභිඃ.

අපාර්ථම්, නිරර්ථකය; ව්‍යර්ථම්, ව්‍යර්ථය (විරුද්ධාර්ථය); එකාර්ථම්, ඒකාර්ථය (අභින්නාර්ථය); සසංශයම්, සසංශය; අපක්‍රමම්, අපක්‍රමය (යථාක්‍රම රහිතය;) ශබ්දහීනම්, ශබ්දහීනය; යතිභ්‍රෂ්ටම්, යතිභ්‍රෂ්ටය; භින්නවෘත්තම්, භින්නවෘත්තය; විසන්ධිකම්, විසන්ධිකය; දෙශකාලකලා ලොකන්‍යායාගමවිරොධිච, දෙශවිරොධිය, කාලවිරොධිය, ලොකවිරොධිය, න්‍යායවිරොධිය, ආගමවිරොධිය; ඉති, මෙබඳුවූ; එතෙදශඑව දොෂාඃ, මේ දශදෝෂයෝම; සූරිභිඃ, පණ්ඩිතයන් විසින්; කාව්‍යෙෂු, කාව්‍යයන්හිලා; වර්ජ්‍යාඃ, හළයුත්තාහ. මෙහි දශෛවයන තැන යෙදූ එවශබ්දය මදක් විරසබව උපදනා ශ්‍රැතිකටුත්වාදි දොෂයන්ගේ ව්‍යවච්ඡෙදය පිණිසයි.

127 ප්‍රතිඥාහෙතු දෘෂ්ටාන්ත හානිර්දොෂො නවෙත්‍යසෞ
විචාරඃ කර්කශඃ ප්‍රායසෙනාලීඪෙනකිම්ඵලම්.

ප්‍රතිඥාහෙතු දෘෂ්ටාන්තහානිඃ, ප්‍රතිඥාය හෙතුය දෘෂ්ටාන්තය යනමොවුන්ගේ හානිය; (මෙහි ප්‍රතිඥා නම් සාධ්‍යනිර්දේශයි හෙතුනම්, සාධ්‍යසාධනයයි, දෘෂ්ටාන්ත නම් ප්‍රසිද්ධවූ උදාහරණ වින්‍යාසයයි); දොෂඃ නවා, දොෂයෙක්හෝ නොවෙද්‍යෙහෝයි යන; විචාරඃ, විචාරණය; ප්‍රායඃ, බොහෝසෙයින්; කර්කශඃ, කඨිනහෝ නීරසවූ; තෙනා ලීඪෙන, ඒ විචාරණයෙන්; කිංඵලම්, කවරඵලයක්ද; නිෂ්ඵලයිසේයි.

128 සමුදායාර්ථසූන්‍යංයත් තදපාර්ථමිතීෂ්‍යතෙ
උන්මත්තමත්තබාලානාමුක්තෙරන්‍යත්‍රදුෂ්‍යති.

සමුදායාර්ථසූන්‍යම්, සමුදායාර්ථසූන්‍යවූ; යත්, යම් කාව්‍යයක්වේද; තත්, එය; අපාර්ථම්, අපාර්ථයයි; ඉෂ්‍යතෙ, කැමතිවනුලැබේ; උන්මත්තා,

පිස්සෝය; මත්තා, සුරාපානයෙන් විකෘතවූ බුද්ධිඇත්තෝය; බාලා නාම්, බාලයෝය යන මොවුන්ගේ; උක්තං, වචනයෙන්; අන්‍යත්‍ර, සෙසු තැන්හි; දුෂ්‍යති, දුෂ්‍යවේ.

129 සමුද්‍රඃපීයතෙ දෙවෛ රහමස්මි ජරාතුරඃ
අමී ගර්ජන්ති ජීමූතා හරෙරෛරාවණඃප්‍රියඃ.

දෙවෛඃ, දෙවියන් විසින්; සමුද්‍රඃ, සමුද්‍රය; පීයතෙ, බොනුලැබේ අහම්, මම; ජරාතුරඃ අස්මි, ජරාවෙන් පිඩිතවූයේවෙමි; අමීජීමූතාඃ, මේ මේඝයෝ; ගර්ජන්ති, ගර්ජනාකෙරෙති; හරෙඃ, ශක්‍රයාහට; ඓරාවණඃ, ඓරාවණ හස්තිතෙමේ; ප්‍රියඃ, ප්‍රියයි. මෙහි පාදචතුෂ්ටය අන්‍යොන්‍යාකාංක්ෂත්වයක් නැතිහෙයින් අවයව අවයවීභාවයෙන් එක වාක්‍යත්වයක් නැත. එහෙයින් සමුදායාර්ථශූන්‍යනුයි. මේ අපාර්ථයට උදාහරණයි.

130 ඉදමස්වස්ථචිත්තානා මභිධානමනින්දිතම්
ඉතරත්‍රකවිඃකොවා ප්‍රයුඤ්ජීතෛවමාදිකම්.

අස්වස්ථචිත්තානාම්, ස්වස්ථසිත් නැත්තන්ගේ හෙවත් එහෙයින්ම උමතුබැව් ආදිය ඇත්තන්ගේ; ඉදම්අභිධානම්, මේ වචනය; අනින්දිතම්, අනින්දිතයි; ඉතරත්‍ර, අන්‍යයන් අතුරෙන්; කඃවාකවිඃ, කවර පණ්ඩිතයෙක්; එවමාදිකම්, මේ ආදිය; හෙවත් සමුද්‍රඃපීයතෙ යනාදිය; ප්‍රයුඤ්ජීත, යොදන්නේද?

131 එකවාක්‍යෙ ප්‍රබන්ධෙවා පූර්වාපරපරාහතම්
විරුද්ධාර්ථතයාව්‍යර්ථ මිතිදෝෂෙෂුපඨ්‍යතෙ.

එකවාක්‍යෙවා, එකවාක්‍යයෙක්හි හෝ ප්‍රබන්ධෙවා, මහාවාක්‍ය රූපවූ ප්‍රබන්ධයෙක්හි හෝ; විරුද්ධාර්ථතයා, විරුද්ධාර්ථ භාවයෙන්; පූර්වාපර, ආද්‍යන්තභාගයන්ගේ; පරාහතම්, සඞ්ගතිරහිතවූයේ; ව්‍යර්ථමිති, ව්‍යර්ථයයි; දෝෂෙෂු, දෝෂයන් විෂයෙහිලා; පඨ්‍යතෙ, කියනු ලැබේ; දන්නා ලැබේ.

132 ජහිශත්‍රුබලංකෘත්ස්නං ජය විශ්වම්භරාමිමාම්
නචතෙකොපිවිද්වෙෂ්ටා සර්වභූතානුකම්පිනඃ.

කෘත්ස්නම්, සියලු; ශත්‍රුබලම්, වෛරීබලය; ජහි, විනාශකරව; ඉමාංවිශ්වම්භරාම්, මේ පෘථිවිය; ජය, දිනව; සර්වභූතානුකම්පිනඃ, සියලු සත්වයන් කෙරෙහි අනුකම්පාඇති; තව, තට; එකොපිවිද්වෙෂ්ටා, එකසතුරෙකුදු; නෛව, නැත්මැයි. මෙහි සතුරන් නැත්තහු ගේ සකල ශත්‍රුවිනාශයද සර්වභූතානුකම්පිහුගේ පාපිජයද විරුද්ධත්වයෙන් හැනේනුයි. මේ ව්‍යර්ථොදාහරණයි.

133 අස්තිකාචිදවස්ථාසා සාභිෂඞ්ගස්‍යචෙතසඃ
යස්‍යාංභවෙදභිමතා විරුද්ධාර්ථාපිභාරතී.

අභිෂඞ්ගස්‍ය, පරාභවයට පැමිණියාවූ හෙවත් වියොගාදියෙන් අභිභූතවූ; චෙතසඃ, සිත සම්බන්ධවූ; කාචිත්අවස්ථා, කිසි අවස්ථාවක්;

අසති, වේද: සස්‍යාම්, ඒ අවස්ථාවෙහිලා; විරුඬාපි, විරුඬාපිවූද; භාරතී, භාරතිය; අභිමතාභවෙත්, අභිමතවේ. වියොගාදියෙන් අභිභූතවූ කිසි අවස්ථාවෙක්හිලා ව්‍යර්ථවාක්‍යද අභිමතබැව් මෙයින් කීහු.

134 පරදාරාභිලාෂොමෙ කථමාර්‍ය්‍යස්‍යයුජ්‍යතෙ
පිබාමිතරලංතස්‍යාඃ කදානුදශනච්ඡදම්.

ආර්‍ය්‍යස්‍ය, ආර්‍ය්‍යවූ; මෙ, මාගේ; පරදාරාභිලාෂඃ, අන්‍යදාරාභිලාෂය; කථම්, කෙසේ; යුජ්‍යතෙ, යෙදේද; තස්‍යාඃ, ඈගේ; තරලම්, චඤ්චලවූ; දශනච්ඡදම්, අධරය; කදානුපිබාමි, කවර දවසක පානයක රම්දෝ. මෙහි පූර්වාර්ධයෙහි සත්පුරුෂබවද අපරාර්ධයෙහි පරදාරාවින් කෙරෙහි උත්සුකබවද විරුඬවූයේ නමුත් ප්‍රයෙක්තෘහුගේ වියොගාභිභූතතා හෙතුකොටගෙන ගුණත්වයෙන් කල්පිතයි.

135 අවිශෙෂෙණ පූර්වොක්තං යදිභූයොපිකීර්ත්‍යතෙ
අර්ථතඃශබ්දතොවාපි තදෙකාර්ථංමතංයථා.

යදි, ඉදින්; පූර්වොක්තම්, පළමුකොට කියනලද්ද; අර්ථතඃ, අර්ථවශයෙන් හෝ; ශබ්දතඃවාපි, ශබ්දවශයෙන් හෝ; අවිශෙෂෙණ, අවිශෙෂයෙන්; හෙවත් අභින්නතායෙන්; භූයොපි, නැවතත්; කීර්ත්‍යතෙ, ප්‍රකාශකරනුලැබේද; තත්, එය; එකාර්ථම්, එකාර්ථයයි; මතම්, දන්නාලදී; යථා, ඊට උදාහරණමෙසේයි.

136 උත්කාමුන්මනයන්ත්‍යෙතෙ බාලාංතදලකත්විෂඃ
අම්භොධරාස්තඩිත්වන්තො ගම්භීරාස්තනයිත්නවඃ.

තත්, ඒ බාලාවගේ; අලකත්විෂඃ, කියඹුශොභා ඇති; ස්තනයිත්නවඃ, ගර්ජනගිලිවූ; තඩිත්වන්තඃ, විද්‍යුල්ලතාඇති; ගම්භීරාඃ, ගම්භීරවූ; එතෙඅම්භොධරාඃ, මේ මේඝයෝ; උත්කාම්, (පතිවිරහයෙන්) උත්කලිවූ; බාලාම්, බාලාව; උන්මනයන්ති, උත්කලිකරත්. මෙහි උත්කාඋන්මන ශබ්දයාන්ගේද අම්භොධරතඩිත්වත් ස්තනයිත්නුශබ්දයන්ගේද ස්වරූපභෙදය ඇතද එකපර්‍ය්‍යායබැවින් එකාර්ථප්‍රකාශනයෙහි සම්බන්ධහෙයින් මේ අර්ථයාගේ පුනරුක්තියට උදාහරණයි.

137 අනුකම්පාද්‍යතිශයො යදිකශ්චිද්විවක්ෂ්‍යතෙ
නදොෂඃපුනරුක්තොපි ප්‍රත්‍යුතෙයමලංක්‍රියා.

යදි, ඉදින්; කශ්චිත්, කිසි; අනුකම්පාද්‍යතිශයඃ (ප්‍රස්තුතයා සම්බන්ධවූ) අනුකම්පාදිවූ අතිශයක්; විවක්ෂ්‍යතෙ, කියනු කැමැත්තේද; තදා, එකල්හි; පුනරුක්තඃඅපි, පුනරුක්තයද; නදොෂඃ, දෝෂ නොවේ; ප්‍රත්‍යුත, තවද; ඉයම්, මෝතොමෝ; අලංක්‍රියා, අලංකාරයි

138 හන්‍යතෙසාවරාරොහා ස්මරෙණාකාණ්ඩවෛරිණා
හන්‍යතෙචාරුසර්වාඞ්ගී හන්‍යතෙමඤ්ජුභාෂිණී.

සාවරාරොහා, ඒ උතුම්වූ ආරොහඇති ස්ත්‍රිය; අකාණ්ඩවෛරිණා, අකාණ්ඩවෛරීවූ; ස්මරෙණ, අනඞ්ගයා විසින්; හන්‍යතෙ, පෙළනු ලැබේ; චාරුසර්වාඞ්ගී, මනොඥවූ සියලු අවයවඇති ඒ ස්ත්‍රිය; හන්‍යතෙ, පෙළනුලැබේ; මඤ්ජුභාෂිණී, මනොඥවූ වචන ඇති ඒ ස්ත්‍රිය; හන්‍යතෙ, පෙළනුලැබේ. මෙහි හන්‍යතෙ යන පදය නැවත නැවත යොදනලද්දේද එය ප්‍රස්තුතවූ නායිකාවගේ අනුකම්පනීයත්වය ප්‍රකාශකරණහෙයින් වෛචිත්‍ර්‍යජනකවේමය. පුනරුක්තදොෂ නොවේ.

139 නිර්ණයාර්ථං ප්‍රයුක්තානි සංශයං ජනයන්තිචෙත්
වචාංසිදොෂඑවාසෞ සසංශය ඉතිස්මෘතඃ.

නිර්ණයාර්ථම්, නිශ්චය පිණිස; ප්‍රයුක්තානි, යොදනලද්දවූ; වචාංසි, වචනයෝ; චෙත්, ඉදින්; සංශයම්, සන්දෙහය; ජනයන්ති, උපදවද්ද; අසෞඑවදොෂඃ, මේ දොෂයම්; සසංශයඃඉති, සසංශය දොෂයයි; ස්මෘතඃ, දන්නාලදී.

140 මනොරථප්‍රියාලොක රසලොලෙක්ෂණෙසඛි
ආරාද්වෘත්තිරසෞමාතා නක්ෂමාදුෂ්ටුමිදෘශම්.

මනොරථප්‍රියාලොකරසලොලෙක්ෂණෙ, වාඤ්ඡිතප්‍රෙමික දර්ශනයෙහි රසයෙන් චචලවූ නෙත්‍රඇති; සඛි, යෙහෙලිය; අසෞ, මේ; මාතා, තීගේමව; ඊදෘශම්, මෙබඳුවූ ව්‍යවහාරය; දුෂ්ටුම්, දක්නට; අක්ෂමා, අසමර්ථවූවා; ආරාත්වෘත්තිඃ, දුරවූ පැවතුම් ඇත්තිය නොහොත් ආරාත්වෘත්තිඃ, සමීපවූ පැවතුම් ඇත්තීය. මෙහි ප්‍රථමාර්ථ පක්ෂයෙහි තී කැමති පරිද්දෙන් හැසිරෙව යන අර්ථයහැඟේ දෙවෙනි පක්ෂයෙහි හෙමත් සමීපවන්නීනීය යන පක්ෂයෙහි මේ කාලයෙහි මෙබන්දක්නොකරව යන අර්ථය ප්‍රකාශවේ. මේ අර්ථවයෙන් අභිමතවූ අර්ථය කෝකදැයි නිශ්චයට නොපැමිණිය හැකිබැවින් මේ සංශයට උදාහරණයි.

141 ඊදෘශංසංශයායෛවයදිවාතු ප්‍රයුජ්‍යතෙ
ස්‍යාදලඞ්කාර එවාසෞනදොෂස්තත්‍රතද්‍යථා.

යදිවා, ඉදින්ද; ඊදෘශම්, මෙබඳු සංශයවාක්‍යය; සංශයාය එව, සංශය පිණිසම හෙවත් සංශය ප්‍රතිපාදනය පිණිසම; ප්‍රයුජ්‍යතෙ, යොදනුලැබේද; අසෞ, මේ සංශය; අලඞ්කාරඃ එවස්‍යාත්, අලඞ්කාරයම වන්නේය; තත්‍ර, එහි; නදොෂඃ, දොෂනොවෙයි; යම් තැනකදී සංශයම විවක්ෂිතනම්; එහි දොෂනොවෙයි. සංශය අවිවක්ෂිතතන්හි දොෂමැයිසේයි. යථා, ඊට උදාහරණ මෙසේයි.

142 පශ්‍යාම්‍යනඞ්ගජාතඞ්ක ලඞ්ඝිතාං තාමනින්දිතාම්
කාලෙනෛවකඨොරෙණ ග්‍රස්තාංකිංනස්සඛිදෘශා

අනඞ්ගජ, කාමයෙන් හටගත්තාවූ; ආතඞ්ක, පීඩායෙන්; ලඞ්ඝිතාම්, ආක්‍රාන්තවූ; අනින්දිතාම්, අනින්දිතවූ; තාම්, ඒ තාගේ කාන්තාව; කඨොරෙණ, දයාරහිතවූ; කාලෙන, මාරයාවිසින්; ග්‍රස්තාම්,

ග්‍රස්තවූවා; පශ්‍යාමි, දකිමි; ත්වදාශයා, තාගේ ආශායෙනි; නඃ, අපට, කිම්, කිම; නොහොත් අනඞ්ගජනඞ්කලඞ්කිතාම්, ශරීර පීඩායෙන් ආක්‍රාන්තතුවූ; අනින්දිතාම්, අනින්දිතවූ; තාම්, ඈ; කඨෝරෙණ, කර්කශවූ; කාලෙන, එව ග්‍රීෂ්මයෙන්ම; ග්‍රස්තාම්, ග්‍රස්තවූවා, පශ්‍යාමි, දකිමි; ත්වදාශයා, තාගේ ආශාවෙනි; නඃ. අපට; කිම් කිම; දෙවෙනි අර්ථපක්ෂයෙහිලා: ඈටශරීරපීඩාවෙක් නැත හුදෙක් තාගේ නොපැමිණීමෙන් හටගත් සිතිවිලි ආදියෙන්වූ ඇතුළත ග්‍රීෂ්මාධික්‍යයෙන් පීඩා විඳී යන අභිප්‍රායි. මේ ද්වන්‍යභිහිත හෙයින් කොයි අර්ථයදැයි සැක උපදී; එසේ නමුදු මේ ගුණ යුක්තමැයි සංශය විවක්ෂිතහෙයිනි.

143 කාමාර්තා ඝර්මතප්තාවෙ ත්‍යනිශ්චය කරං වචඃ
යුවානමාකුලීකුර්‍ය්‍යාමිති දූත්‍යාහ නර්මණා.

කාමාර්තා, කාමයෙන් පීඩිතවූවාහෝ; ඝර්මතප්තාවා, ග්‍රීෂ්මයෙන් තවනලද්දීදෝයි; ඉති, මෙසේ; අනිශ්චයකරම්, සන්දේහකරවූ; වචඃ, වචනය; යුවානම්, තරුණයා; ආකුලීකුර්‍ය්‍යාම්, ආකුලකරන්ට; දූති, දූතිතොමෝ; ඉති. පූර්වෝක්තක්‍රමයෙන්; නර්මණා, ව්‍යාජයෙන්; ආහ, කීය.

144 උද්දේශානුගුණෝර්ථානාමනුද්දේශෝනචේත්කෘතඃ
අපක්‍රමාභිධානං තං දෝෂමාචක්ෂතෙ බුධාඃ.

අර්ථානාම්, අර්ථයන් සම්බන්ධවූ; උද්දේශානුගුණඃ, ප්‍රතිඥානුකූලවූ; අනූද්දේශඃ, පශ්චාදුද්දේශය; හෙවත් පසුවකරනුලබන උපන්‍යාසය; චෙත්, ඉදින්; නකෘතඃ, නොකරණලද්දේද; තම්, එය; අපක්‍රමාභිධානම් දෝෂම්, අපක්‍රමනම් දෝෂයයි බුධාඃ, පණ්ඩිතයෝ; ආචක්ෂතෙ, කියති.

145 ස්ථිතිනිර්මාණසංහාර හෙතවොජගතාමමී
ශම්භුනාරායණාම්භොජයොනයඃ පාලයන්තුවඃ.

ජගතාම්, ලොවැස්සන්ගේ; ස්ථිති, පාලනය; නිර්මාණ, මැවීමය; සංහාර, විනාශය යන මොවුන්ට; හෙතවඃ, කර්තෘවූ; අමී, මේ; ශම්භු ඊශ්වරය; නාරායන, විෂ්ණුය, අම්භොජයොනයඃ, බ්‍රහ්මය යන මොව්හු; වඃ, අප; පාලයන්තු, රකිත්වා. මෙහි ප්‍රථමොද්දිෂ්ට ක්‍රමයෙන් ස්ථිතිනිර්මාණ සංහාර යන මොවුන්හා, පිළිවෙළින් දෙවනාමයන් සම්බන්ධ කටයුතුකල්හි නාරායන, අම්භොජයොනි, ශම්භුයන මේ ක්‍රමයට යෙදුව මනාවේ. එසේ උවමනාවූයේ නමුදු ශ්ලොකයෙහි විපරීතව යෙදිතිබේ. එහෙයින් මේ අපක්‍රම දෝෂයට උදාහරණයි.

146 යත්නඃසම්බන්ධ විඥානහෙතුකොපිකෘතොයදි
ක්‍රමලඞ්ඝනමප්‍යාහුඃ සූරයොනෛවදූෂණම්.

* යදි, ඉදින්; සම්බන්ධවිඥත, සම්බන්ධයාගේ දැනීමට; හෙතුකඃ, හෙතුවූ; යත්නඃ, උත්සාහයක්; කෘතඃ, අපි, කරණලද්දේනම්, ක්‍රමල
නම් අපි, ක්‍රමොල්ලඞ්ඝනයද සූරයඃ, පණ්ඩිතයෝ; නෛවදූෂණම්, දෙෂාවහනොවෙමයයි; ආහුඃ, කියති.

147 බන්ධුත්‍යාගඃතනුත්‍යාගො දෙශත්‍යාග ඉතිත්‍රිෂු
ආද්‍යන්තාවායතා ක්ලෙශෞ මධ්‍යමඃ ක්ෂණිකජ්වරඃ.

බන්ධුත්‍යාගඃ, බන්ධුත්‍යාගය; තනුත්‍යාගඃ, තනුත්‍යාගය; දෙශත්‍යාගඃඉති, දෙශත්‍යාගය යන; ත්‍රිෂු, තුනඅතුරෙන්; ආද්‍යන්තෞ, ආදි අන්තදෙදෙන; ආයතක්ලෙශෞ, දික්වූ දුක්ඇත්තාහ; මධ්‍යමඃ; මධ්‍යයෙහිවූ තනුත්‍යාගය; ක්ෂණිකජ්වරඃ, ක්ෂණයක් පවත්නා දුක් ඇත්තේය.

148 ශබ්දහීනමනාලක්ෂ්‍ය ලක්ෂ්‍යලක්ෂණපණ්ඩිතෛඃ
පදප්‍රයොගොශිෂ්ටෙෂ්ටඃ ශිෂ්ටෙෂ්ටස්තුනදුෂ්‍යති.

අනාලක්ෂ්‍ය, අදෘශ්‍යවූ; ලක්ෂ්‍යලක්ෂණපණ්ඩිතෛඃ, ලක්ෂ්‍යලක්ෂණ මාර් ඇති; හෙවත් අනුශාසනයෙන් තොරවූ; අශිෂ්ටානාංපදප්‍රයොගඃ, අශිෂ්ටයන්ගේ (අනුශාශනා නොලැබූවන්ගේ) පදප්‍රයොගය; ශබ්දහීනම්, ශබ්ද හීනනම්වේ; ශබ්දානුශාසනයෙන් හීනයිසේයි. මෙහි ශබ්ද යනු ශබ්දශාස්ත්‍රයයි. ශිෂ්ටෙෂ්ටස්තු, ශිෂ්ටයන්ට ඉෂ්ටවූ පදප්‍රයොගය වනාහි; නදුෂ්‍යති, දෙස්නොවේ. ශබ්දහීනම් යන්නට ජීවානන්ද විද්‍යාසාගරයන් විසින් ලියූ උභාදිනාප්‍රයුක්තඃ යන අර්ථය අසඞ්ගතයි දත යුතුයි.

149 අවතෙභවතොබාහු මහීමර්ණවශනකාරිම්
මහාරාජ ප්‍රජාජිඥසා නාස්තිත්‍යාසාංගිරාංරසඃ.

මහාරාජන්, මහරජ; භවතෙ, භවත්හුගේ; බාහුඃ, බාහුව; අර්ණව ශනකාරිම්, සමුද්‍රය මෙඛලාකොටඇති; මහීම්, පෘථිවිය; අවතෙ, රකී; අජිඥසා, මෙහි දිනනුකැමති බවෙක් නැත; ආසාංගිරාම්, මේ වචන යන්ගේ; රසඃ, රසයෙක්; නාස්ති, නැති. මෙහි අවතෙ යන ආත්මනෙ පදයද ෂෂ්ඨ්‍යස්ථානයෙහි යෙදූ භවතෙ යන චතුර්ථියද මහාරාජන් යන පදයද ශබ්දශාස්ත්‍ර විරුඬය එහෙයින් මේ ශබ්දහීනතාවට උදාහරණයි.

150 දක්ෂිණාද්‍රෙරුපසරන් මාරුතශ්චූතපාදපාන්
කුරුතෙ ලලිතාධූතප්‍රබාලාඞ්කුරශොභිනඃ.

---

* හෙතුඃ, හෙතුවූ; කඃඅපියත්නඃ, කවරනම්හුත් යත්නයක්; කෘතඃ, කරණලද්දේනම්යි අර්ථගත්තේනම් රම්‍යයි. එසේනමුදු ටීකානුගතව සන්නය ලිමු.

දක්ෂිණාද්‍රෙඃ, මලයපර්වතයකරා; උපසරන්, යන්නාවූ; මාරුතඃ මාරුතය; චූතපාදපාන්, අඹුවෘක්ෂයන්; ලලිතාධූත ප්‍රබාලාඞ්කුරශොභිනඃ, ලලිත, ලිලොපෙතවූ; ආධූත, කම්පිතවූ; ප්‍රබාලාඞ්කුර, ප්‍රවාලාඞ්කුරයෙන්; ශොභිනඃ, හොබනාවුන්; කුරුතෙ, කරයි.

151 ඉත්‍යාදි ශාස්ත්‍රමාහාත්ම්‍ය දර්ශනාලසචෙතසාම්
අපභාෂණවද්භාති නවසෞභාග්‍යමුජ්ඣති.

ඉත්‍යාදි, මේ ආදිය; ශාස්ත්‍රමාහාත්ම්‍යදර්ශන, ශාස්ත්‍රයාගේ මාහාත්ම්‍යදර්ශනයෙහි; අලසචෙතසාම්, අලසවූසිත් ඇත්තන්ට; අපභාෂණවත්, අපශබ්දමෙන්; භාති, වැටගේ; එසේවුවද සෞභාග්‍යම්, සුභගබව; නවඋජ්ඣති, නොහරී; කර්ණිච්චිතීයා යන සූත්‍රබලයෙන් දක්ෂිණාද්‍රෙඃ යන තැන චිතීයා විභක්තිවිය යුතුය. එතකුදුවුවත් සම්බන්ධ විවක්ෂායෙන් ෂෂ්ඨිප්‍රයොගයද දොෂනොවේ. මේ දක්ෂිණාද්‍රෙඃ යනාදි ශ්ලොකය අදූෂිතවූ ශබ්දහීනතාවට උදාහරණයි.

152 ශ්ලොකෙෂුනියතස්ථානං පදච්ඡෙදං යතිංවිදුඃ
තදපෙතංයතිභ්‍රෂ්ටං ශ්‍රවණොද්වෙජනංයථා.

ශ්ලොකෙෂු, ශ්ලොකයන්හි; නියතස්ථානම්, නියතවූස්ථානඇති පදච්ඡෙදං, පදච්ඡෙදය හෙවත් පදයන් සම්බන්ධවූ විරාමය; යතිම්, යතියයි; විදුඃ, දනිති; දිවට ඉෂ්ටවූ විශ්‍රාමස්ථානය යතියයිසේයි. තදපෙතම්, එයින් පහවූ; ශ්‍රවණොද්වෙජනම්, කර්ණයට උද්වෙගකරවූ විරාමය; යතිභ්‍රෂ්ටම්, යතිභ්‍රෂ්ටනම්වේ.

153 ස්ත්‍රීණාං සඞ්ගීතවිධිමයමාදිත්‍යවංශ්‍යො නරෙන්ද්‍රඃ
පශ්‍යත්‍යකලිෂ්ටරසමිහශිෂ්ටෛරමෙත්‍යාදිදුෂ්ටම්
කාර්‍ය්‍යාකාර්‍ය්‍යාණ්‍යසමවිකලා න්‍යාගමෙනෛවපශ්‍යන්
වශ්‍යාමුර්වීංවහතිනෘපඉත්‍ය ස්තිවෛවංප්‍රයොගඃ.

අයම්, මේ; ආදිත්‍යවංශඃ, සූර්‍ය්‍යවංශියවූ; නරෙන්ද්‍රඃ, නරෙන්ද්‍ර තෙම; ශිෂ්ටෛඃඅමා, ශිෂ්ටයන් හා එක්ව; අකලිෂ්ටරසම්, නොකිලිටිවූ රසඇති, ස්ත්‍රීණාංසඞ්ගීතවිධිම්, ස්ත්‍රීන්ගේ සඞ්ගීත විධානය; පශ්‍යති, බලා; ඉත්‍යාදි, මේ ආදිය; දුෂ්ටම්, දුෂ්ටයි (යතිභ්‍රෂ්ට දොෂයෙන් දූෂිතයයිසේයි. මේ මන්දක්‍රාන්තාවෘත්ත ශ්ලොකපදයන්හි සතර වෙනි සවෙනි සත්වෙනි ස්ථානවල යතිතැබිය යුතුවේ. මෙහි චතුර්ථාදි වර්ණයන්ගේ පදාන්තගතවීම කර්ණොද්වෙගකරවේ. මෙහි නිර්දොෂශ්ලාවයද ඉතිරි පාදචයෙන් දක්වති.) අයං නෘපඃ, මේ රජ තෙම; ආගමෙනෛව, නීතිශාස්ත්‍රයෙන්ම; කාර්‍ය්‍යාකාර්‍ය්‍යාණි, කර්තව්‍යාකර්තව්‍යයන්; අවිකලානි, අව්‍යාහතවූවන් හෙවත් සම්පූර්ණවූවන්; පශ්‍යන්, බලමින්; වශ්‍යාම්, වසගවූ; උර්වීම්, පෘථිවිය; වහති, උසුලා;

ඉති, මෙබඳු; ප්‍රයොගශ්ච, ප්‍රයොගයද; අසති, කවිසමයෙහි ඇති. පද මධ්‍යයෙහි ස්වරසන්ධි ආශ්‍රයස්ථානයෙහි යතිභ්‍රංශය අදොෂබැව් මෙයින් කීහු.

154 ලුප්තෙපදාන්තෙශිෂ්ටස්‍ය පදත්වංනිශ්චිතංයථා
තථාසන්ධිවිකාරාන්තං පදමෙවෙතිවර්‍ණ්‍යතෙ.

පදාන්තෙ, පදාන්තය; ලුප්තෙ, ලොප්කළකල්හි; ශිෂ්ටස්‍ය, ඉතිරි භාගයාගේ; පදත්වම්, පදබව; යථා, යම්සේ; නිශ්චිතම්, නිශ්චිතද හෙවත් විවාදරහිතව හැමදෙනා විසින්ම පිළිගන්නාලද්දේද; තථා, එසේම; සන්ධිවිකාරාන්තම්, සන්ධියෙන්වූ විකෘතිය අන්තකොටඇත්තේ; පදම්එවඉති, පදයමැයි; වර්‍ණ්‍යතෙ, කියනුලැබේ. පදමධ්‍යවුවද පදාන්තසැටියට කල්පනාකරනු ලැබෙයි යනු භාවයි.

155 තථාපිකටුවර්‍ණානාං කවයොනප්‍රයුඤ්ජතෙ
ධ්වජිනී තස්‍යරාඥඃකෙතූදස්තජලදෙත්‍යදඃ.

තථාපි, එසේ ස්වරසන්ධිවිෂයෙහි යතිභ්‍රංශය නිදෝෂවුවද; කටුවර්‍ණානාම්, ශ්‍රැතිකටුකවර්‍ණයන් සම්බන්ධවූ; තස්‍යරාඥඃ, ඒ රජහුගේ කෙතූදස්ත, ධ්වජයෙන් උත්ක්ෂිප්තවූ; ජලද, මෙඝඇති; ධ්වජිනී, සෙනාවය යන; අදඃ, මෙය; කවයඃ, කවීහු; නප්‍රයුඤ්ජතෙ, නොයොදති. මෙහි රාඥඃ කෙතූදස්ත යන තන්හි ස්වරසන්ධිඇතද ශ්‍රැති කටුකතා ඇතිහෙයින් දොෂමැයි.

156 වර්‍ණානාංන්‍යූනතාධික්‍යෙ ගුරුලඝුවයථාස්ථිතිඃ
තත්‍රතද්භින්නවෘත්තංස්‍යා දොෂදොෂඃසුනින්දිතඃ.

(යත්‍ර, යම්පද්‍යයෙක්හි) වර්‍ණානාම්, වර්‍ණයන් සම්බන්ධවූ; න්‍යූනතාධික්‍යෙ, අඩුබව වැඩිබව යන දෙකය; ගුරුලඝුවයථාස්ථිතිඃ, ගුරු ලඝූන්ගේ අයථාස්ථිතිය හෙවත් අනියමින් සිටීමද යන; යත්, යමක් ඇද්ද; තත්‍ර, එහි; තත්, එය; භින්නවෘත්තංස්‍යාත්, භින්නවෘත්තය වේ; ඡන්දොභඞ්ගයයිසේයි. එෂඃ දොෂඃ, මේ භින්නවෘත්ත දොෂය; සුනින්දිතඃ, අතිශයින් නින්දිතයි.

157 ඉන්දුපාදඃශිශිරාඃ ස්පෘශන්තීන්‍යූනවර්‍ණිතා
සහකාරස්‍යකිසලයා න්‍යාර්ද්‍රාණ්‍යත්‍යධිකාක්ෂරම්.

ශිශිරාඃ, ශීතලවූ; ඉන්දුපාදඃ, චන්ද්‍රකිරණයෝ; ස්පෘශන්ති, ස්පර්ශ කරති; ඉති, මේ; ඌනවර්‍ණිතා, ඌනවර්‍ණබවයි.. අෂ්ටාක්ෂරයකින් බැන්දයුතුවූ මේ පද්‍යයෙහි ප්‍රථම පාදය සප්තාක්ෂරයකින් බද්ධහෙයින් මේ වර්‍ණඌනතායි; සහකාරස්‍ය, ආම්‍රවෘක්ෂයාගේ; කිසලයානි, බාල පලලව; ආර්ද්‍රාණි, තෙත්හ; ඉති, මේ; අධිකාක්ෂරම්, අධිකාක්ෂර බවයි. අෂ්ටාක්ෂරයකින් බැන්දයුතුවූ තෘතීයපාදය අක්ෂරනවයකින් බද්ධහෙයින් මේ අධික වර්‍ණබවයි.

158 කාමේනවාණා නිශිතාවිමුක්තා
මෘගෙක්ෂණා සචිත්‍ය සථාගුරුත්වම්
සමරස්‍යවාණා නිශිතාඃපතන්ති
වාමේක්ෂණා සචිත්‍යසථාලඝුත්වම්.

කාමෙන, අනඞ්ගයා විසින්; මෘගෙක්ෂණාසු, මෘගාක්ෂීන් කෙරෙහි; නිශිතාඃ, තියුණුවූ; වාණාඃ, ශරයෝ; විමුක්තාඃ, හරණලද්දහ; ඉති, මේ; අයථාගුරුත්වම්, අයථාගුරුත්වයයි; මෙහි පූර්වාර්ධයෙහි උපෙන්ද්‍රවජ්‍රාවෘත්තයයි "උපෙන්ද්‍රවජ්‍රාජතජාස්තතොගෞ" යනු ඊට ලක්ෂණ හෙයින් ජගනය පළමුකොට නිවෙශනයකළ යුතුවේ එසේ නමුදු කායනගුරුවර්ණය නිවෙශිතයි; ජගනය වනාහි ගුරුමධ්‍යගතවේ. වාමෙක්ෂණාසු, සත්‍රීන්කෙරෙහි; සමරස්‍ය, අනඞ්ගයාගේ; නිශිතාඃ, තියුණුවූ; වාණාඃ, ශරයෝ; පතන්ති, හෙති; ඉති මේ අයථාලඝුත්වම්, අයථාලඝුත්වයයි මේ අපරාර්ධයෙහි ඉන්ද්‍රවජ්‍රාවෘත්තයයි. "ස්‍යාදින්ද්‍රවජ්‍රාතතජාස්තතොගෞ" යනු ලක්ෂණහෙයින් තගණය පළමුකොට තැබියයුතුයි. එසේනොකොට සමර කියා පළමුකොට ලඝුවක් තබනලද්දේය. තගණයනම් අන්තයෙහි ලඝුවක් ඇත්තේවෙයි. එබැවින් මේ අර්ධ දෙක්හිම ආදියෙහි ගුරුලඝුන්ගේ අයථාස්ථිතියයි දතයුතුයි. මෙහි ප්‍රථම තෘතීය පාදයන්හි ඉන්ද්‍රවජ්‍රාවෘත්තය ද්විතීය චතුර්ථපාදයන්හි උපෙන්ද්‍රවජ්‍රාවෘත්තයයි ගත්කළ දූෂ්‍ය නොවේමය. එසේවුවද අයථාගුරුලඝුත්වයට උදහරණ කළහෙයින් අනික් ප්‍රකාරයෙන් සලකනලද්දයි දතයුතුයි. නොහොත් මෙසේ ඉන්ද්‍රවජ්‍රා උපෙන්ද්‍රවජ්‍රා වෘත්තයන්ගේ සම්මිශ්‍රනය දණ්ඩ්‍යාචාය්‍ර්‍යයන්ට අනභිමතදැයි පරීක්ෂා කටයුතුවේ.

159 නසංහිතාං විවක්ෂාමි ත්‍යසන්ධානංපදෙෂුයත්
තද්විසන්ධිතිනිර්දිෂ්ටං නප්‍රගෘහ්‍යාදිහෙතුකම්.

සංහිතාම්, සන්ධිය; නවිවක්ෂාමි, කියනුකැමති නොවෙමියි (අභිප්‍රායකොට); නප්‍රගෘහ්‍යාදි හෙතුකම්, ප්‍රගෘහ්‍යාදි හෙතුවක් නැතිව; පදෙෂු, පදයන්හි; යත්අසන්ධානම්, යම් සන්ධිනොකිරීමක් ඇද්ද; තත්, එය; විසන්ධිති; විසන්ධියයි; නිර්දිෂ්ටම්, දක්වනලදී.

160 මන්දානිලෙනචලතා අඞ්ගනාගණ්ඩමණ්ඩලෙ
ලුප්තමුද්භෙදිඝර්මාම්භො නභස්‍යස්මද්වපුෂ්‍යපි.

නභසි, ආකාශයෙහි; චලතා, කම්පිතවූ; මන්දානිලෙන, මන්දමාරුතය කරණකොටගෙන; අඞ්ගනාගණ්ඩමණ්ඩලෙ, අඞ්ගනාවගේ කපොල මණ්ඩලයෙහිද; අස්මද්වපුෂිඅපි, අපගේ ශරීරයෙහිද; උද්භෙදි, හැගෙන්නාවූ; ඝර්මාම්භඃ, ඝර්මජලය; ලුප්තම්, පහවූයේය. මෙහි චලතා යන පදයෙහි අන්ත්‍යආකාරය අඞ්ගනා යන පදයාගේ ආදි අකාරය හා සූත්‍රනියායෙන් එකාදෙශ ස්වරූප දීර්ඝත්වයට පමුණුවා සන්ධිනොකළ හෙයින් මේ විසන්ධිදොෂයට උදහරණයි.

161 මානෙර්ෂ්‍යෙඉහශීර්‍යෙතෙ ස්ත්‍රීණාං හිමර්තෞප්‍රියෙ
ආසුරාත්‍රිෂ්විතිප්‍රාඥෛ රාම්නාතං ව්‍යස්තමීදෘශම්.

ප්‍රියෙ, සොඳුර; හිමර්තෞ, හිමර්තුයෙහි; ආසුරාත්‍රිෂු, හෙව නතරාත්‍රින්හි; ස්ත්‍රීණාම්, ස්ත්‍රීන්ගේ; මානෙර්ෂ්‍යෙ, මානඊර්ෂ්‍යා දෙක; ශීර්‍යේතෙ, විනාශවෙති; ඉති, මෙසේ; ඊදෘශම්ව්‍යස්තම්, මෙබඳුවූ විස න්ධිය; ප්‍රාඥෛඃ, ප්‍රාඥයන් විසින්; අම්නාතම්, කියනලදී. මෙහි මා නෙර්ෂ්‍ය යන තන්හි ද්විවචනනිෂ්පන්නවූ එකාරයා සම්බන්ධවූ සන්ධික්‍රි රීම සූත්‍රකාරයන් විසින්ම නිෂිද්ධයි. එසේමහිමර්තෞ යන තන්හි ඍකාරයා පරකල්හි අකාරයා සම්බන්ධ සන්ධියද විකල්පයෙන් නිෂි ද්ධයි. මේ ප්‍රගෘහ්‍යාදියට උදාහරණයි.

162 දෙශොද්‍රිවනරාෂ්ට්‍රාදිඃ කාලොරාත්‍රින්දිවර්තවඃ
නෘත්‍යගීතප්‍රභෘතයඃ කලාකාමාර්ථසංශ්‍රයාඃ.

අද්‍රිවනරාෂ්ට්‍රාදිඃ, පර්වතවනරාෂ්ට්‍රාදිය; දෙශඃ, දෙශනම; රාත්‍රින්දි වර්තවඃ, රාත්‍රිය දහවල්ය ඍතුය යන මේ; කාලඃ, කාලනම. මෙහි බහුවචන නිර්දේශයෙන් මාසසංවත්සරාදීන්ගේ ග්‍රහණයි. කාමාර්ථසං ශ්‍රයාඃ, කාමාර්ථාශ්‍රයවූ; නෘත්‍යගීතප්‍රභෘතයඃ; නෘත්‍යගීතාදීහු; කලා, කලායි.

163 චරාචරාණාංභූතානාං ප්‍රවෘත්තිර්ලෝකසංඥිතා
හෙතුවිද්‍යාත්මකොන්‍යායඃ සස්මෘතිඃශ්‍රුතිරාගමඃ.

චරාචරාණාම්, ජඞ්ගමස්ථාවරවූ; භූතානාම්, භූතයන්ගේ; ප්‍රවෘ ත්තිඃ, ප්‍රවෘත්තිය; ලොකසංඥිතා, ලොකනම්වේ; හෙතුවිද්‍යාත්මකඃ, හෙතුවිද්‍යාව ආත්මකොට ඇත්තේ; හෙවත් යුක්තිමූලකවිද්‍යාව; න්‍යායඃ, න්‍යායනම්වේ; සස්මෘතිඃ, ස්මෘතිශාස්ත්‍ර සහිතවූ; ශ්‍රුතිඃ, වේ දය; ආගමඃ, ආගමනම්වේ.

164 තෙෂුතෙෂ්වයථාරූඪං යදිකිඤ්චිත්ප්‍රවර්තතෙ
කවෙඃප්‍රමාදාද්දෙශාදි විරොධීත්‍යෙතදුච්‍යතෙ.

තෙෂුතෙෂු, ඒ ඒ උක්තප්‍රකාරවූ දෙශාදීන් කෙරෙහි; අයථාරූ ඪම්, අයථාරූඪවූ හෙවත් අප්‍රසිද්ධවූ; කිඤ්චිත්, කිසිවක්; යදි, ඉදින්; කවෙඃ, කවිහුගේ; ප්‍රමාදාත්, ප්‍රමාදයෙන්; ප්‍රවර්තතෙ, පවතීද; (තදා, එකල්හි) තත්, එය; දෙශාදිවිරොධීඉති, දෙශාදිවිරොධියයි; උච්‍ය තෙ, කියනුලැබේ.

165 කර්පූරපාදපාමර්ශී සුරභිර්මලයානිලඃ
කලිඞ්ගවනසම්භූතා මෘගප්‍රායාමතඞ්ගජාඃ.

මලයානිලඃ, මලයමාරුතය; කර්පූරපාදප, කර්පූර වෘක්ෂයන් ගේ; ආමර්ශී, සම්පර්කයෙන්; සුරභි, සුගන්ධවූයේය; කලිඞ්ගවන සම්භූ තාඃ, කලිඞ්ගුවෙනෙහි උපන්නාවූ; මතඞ්ගජාඃ, හස්තිහු; මෘගප්‍රායාඃ,

මෘගයන්මෙනි. මලයපර්වතයෙහි කර්පූරවෘක්ෂ නැතිහෙයිත්ද කලිඟු වෙනෙහි හස්තීන්ගේ අසම්භවය ප්‍රසිද්ධහෙයින්ද මේ පර්වතවන රූපවූ දෙශවිරොධියි.

166 චොලාඃකාලාගුරුශ්‍යාමකාවෙරීතීරභූමයඃ.
ඉතිදෙශවිරොධින්‍යා වාචඃප්‍රස්ථානමීදෘශම්.

චොලාඃ, චෝලදෙශයෝ; කාලාගුරු, එනම් වෘක්ෂයෙන්; ශ්‍යාම, නීලවර්ණවූ; කාවේරී, එනම් නදියගේ; තීරභූමයඃ, තීරභූමිඇත්තාහ (කාවේරිනදී තීරයෙහි කාලාගුරු වෘක්ෂයන්ගේ අභාවයෙන්); ඉති, මෙසේ; දෙශවිරොධින්‍යාඃ, දෙශවිරොධය සම්බන්ධවූ; වාචඃප්‍රස්ථා නම්, භාරතිප්‍රස්ථානය; ඊදෘශම්, මෙබඳුයි. මේ රාෂ්ට්‍රරූපවූ දෙශවි රොධියට උදාහරණයි.

167 පද්මින්‍යනක්තමුන්නිද්‍රා ස්ඵුටත්‍යහ්නිකුමුද්වතී
මධුරුත්ඵුල්ලනිචුලො නිදාඝොමෙඝදුර්දිනඃ.

පද්මිනි, පියුම්විල; නක්තම්, රාත්‍රියෙහි; උන්නිද්‍රා, විකසිතවූවාය (පද්මිනිවිකාසය දහවල්හිමවෙයි යන ප්‍රසිද්ධිහෙයින් රාත්‍රියෙහි යනු කාලවිරොධයි) කුමුද්වතී, කුමුදුවිල; අහනි, දහවල්හි; ස්ඵුටති, පිපේ (රාත්‍රියෙහිම කුමුදිනී විකාසයවෙයි යනු ප්‍රසිද්ධහෙයින් දහවල්හි යනු කාලවිරොධයි) මධුඃ, වසන්තකාලය; උත්ඵුල්ලනිචුලඃ, පිපිගියාවූ නිචුලවෘක්ෂඇත්තේය; (ප්‍රාවෘට්කාලයෙහිම නිචුලයන්ගේ විකාශය ප්‍රසිද්ධනුයි මධුඃ යනු කාලවිරොධයි); නිදාඝඃ, ග්‍රීෂ්මකාලය; මෙඝදුර්දිනඃ, මෙඝයෙන් දුර්දිනවිය; වර්ෂාකාලයෙහි දුර්දිනත්වය ප්‍රසිද්ධහෙයින් නිදාඝයනු කාලවිරොධයි. නිදාඝකාලයෙහිද දුර්දිනඇති වෙත්මය; ඒ අකාලදුර්දිනත්වයෙන් කවිහු වර්ණනාකෙරෙති. මෙහිදී මේ විශෙෂයද සිතියයුතුවේ.

168 ශ්‍රව්‍යහංසගිරොවර්ෂාඃ ශරදොමත්තබර්හිණඃ
හෙමන්තොනිර්මලාදිත්‍යඃ ශිශිරඃශ්ලාඝ්‍යචන්දනඃ.

වර්ෂාඃ, වර්ෂාකාලයෝ; ශ්‍රව්‍යහංසගිරඃ, ශ්‍රව්‍යවූහංසනාද ඇත්තාහ; (ශරත්කාලයෙහිම හංසයන්ගේ මධුරනාද ප්‍රසිද්ධහෙයින් මේ කාලවි රොධයි) ශරදඃ, ශරත්කාලයෝ; මත්තබර්හිණඃ, මත්වූ මයූරයන් ඇත්තාහ; වර්ෂාකාලයෙහිම මයූරයන්ගේ මත්තභාව ප්‍රසිද්ධහෙයින් ශරදඃ යනු කාලවිරොධයි; හෙමන්තඃ, හෙමන්තය; නිර්මලාදිත්‍යඃ, නිර්මලසූර්‍ය්‍යා ඇත්තේය; හෙමන්තයෙහි සූර්‍ය්‍යා හිමාවෘතහෙයින් මෙසේ කීමද කාලවිරොධයි; ශිශිරඃ, ශිශිරඍතුව; ශ්ලාඝ්‍යචන්දනඃ, අදරකටයුතුවූ සඳුන්කලක ඇත්තේය. ශිශිරඍතුයෙහි සත්ත්වයන්ගේ චන්දනකල්කාලෙපය අප්‍රසිද්ධහෙයින් ශිශිරඃ යනු කාලවිරොධයි.

169 ඉතිකාලවිරොධස්‍ය දර්ශිතාගතිරීදෘශී
මාර්ගඃ කලාවිරොධස්‍ය මනාගුද්දිශ්‍යතෙයථා.

ඉති, මෙසේ; කාලවිරොධස්‍ය, කාලවිරොධය සම්බන්‍ධවූ; ඊදෘශී ගතිඃ, මෙබඳුවූ ගතිය; දර්ශිතා, දක්වනලද; කලාවිරොධස්‍ය, කලාවිරොධය සම්බන්‍ධවූ; මාර්ගඃ, රීතිය; මනාක්, මනාව; උද්දිශ්‍යතෙ, දක්වනු ලැබේ; යථා, ඒ මෙසේයි.

170 වීරශෘඞ්ගාරයොර්භාවෞ ස්ථායිනෞක්‍රොධවිස්මයෞ
පූර්ණසප්තස්වරඃසොයං භින්නමාර්ගඃ ප්‍රවර්තතෙ.

වීරශෘඞ්ගාරයොඃ, වීරරසශෘඞ්ගාරරස දෙදෙනා කෙරෙහි ස්ථායිනෞභාවෞ, ස්ථායිභාවවූවාහු; ක්‍රොධවිස්මයෞ, ක්‍රොධය විස්මය යන දෙකද; විරුද්ධවෙති; පූර්ණසප්තස්වරඃ, සම්පූර්ණවූ සප්තස්වර ඇති; සඃ අයම්, ඒ මේ සඞ්ගීතවිධිය; භින්නමාර්ගඃ, භින්නවූමාර්ග ඇත්තේ; ප්‍රවර්තතෙ, පවතී.

171 ඉත්‍ථංකලාචතුඃෂෂ්ටි විරොධඃ සාධුනියතාම්
තස්‍යාඃකලාපරිච්ඡෙදෙ රූපමාවිර්භවිෂ්‍යති.

ඉත්‍ථම්, මෙසේ; කලාචතුඃෂෂ්ටිවිරොධඃ, චතුඃෂෂ්ටිකලාවන් සම්බන්‍ධවූ විරොධය; සාධු, මොනවට; නියතාම්, දන්නාලැබේවා; කලාපරිච්ඡෙදෙ, කලාපරිච්ඡෙදනම් ග්‍රන්‍ථයෙහි; තස්‍යාඃ, ඒ කලාව සම්බන්‍ධවූ; රූපම්, රූපය; ආවිර්භවිෂ්‍යති, පහළවන්නේය. මට අනතුරුව කලාපරිච්ඡෙදනම් ග්‍රන්‍ථයක් කරන්නෙමි එහිලාකලාරූප දතයුත්තේය යනු භාවයි.

172 ආධූතකෙශරොහස්තී තීක්‍ෂ්ණශෘඞ්ගඃ තුරඞ්ගමඃ
ගුරුසාරොයමෙරණ්ඩො නිඃසාරඃඛදිරද්‍රුමඃ.

අයංහස්තී, මේ ඇත්තෙමේ; ආධූතකෙශරඃ, කම්පාවන්නාවූ කෙශර ඇත්තේය; තුරඞ්ගමඃ, අශ්වතෙම; තීක්‍ෂ්ණශෘඞ්ගඃ, තියුණුවූ අං ඇත්තේය; එරණ්ඩඃ, එරණ්ඩ වෘක්‍ෂය; ගුරුසාරඃ, බරවූහර ඇත්තේය; ඛදිරද්‍රුමඃ, කිහිරිගස; නිඃසාරඃ, හර නැත්තේය. හස්තිහුගේ සකෙශරත්වයද අශ්වයාගේ සශෘඞ්ගත්වයද එරඬවෘක්‍ෂයාගේ සාරත්වයද ඛදිරවෘක්‍ෂයාගේ නිඃසාරත්වයද ලොකවිරුද්ධය, එහෙයින් මේ ලොකවිරොධි උදාහරණයි.

173 ඉතිලෞකිකඑවායං විරොධඃසර්වගර්හිතඃ.
විරොධොහෙතුවිද්‍යාසුන්‍යායාඛ්‍යාසුනිදර්ශ්‍යතෙ.

ඉති, උක්තප්‍රකාරවූ; ලෞකිකඃඑව, ලොකප්‍රසිද්ධවූම; විරොධඃ, විරොධය; සර්වගර්හිතඃ, සියලු පණ්ඩිතයන් විසින්ම ගර්හිතයි. න්‍යායාඛ්‍යාසු, න්‍යායනම්වූ; හෙතුවිද්‍යාසු, හෙතුවිද්‍යාවන්හි; විරොධඃ, විරොධය; නිදර්ශ්‍යතෙ, දක්වනු ලැබේ.

174 සත්‍යමෙවාහසුගතඃ සංස්කාරානවිනශ්වරාන්
තථාහිසාචකොරාක්‍ෂී ස්ථිතෛවාද්‍යාපිමෙහෘදි.

සුගතඃ, සර්වඥතෙම; සංස්කාරාන්, සංස්කාරයන්; අවිනශ්වරාන්, නොනස්නාසුලුලන්යයි; සත්‍යම්එව, සැබවක්ම; ආහ, කියේය; තථාහි, එසේමය; සාවකොරාඞ්ක්ෂි, එවකොරාඞ්ක්ෂිය; අද්‍යාපි, අද දක් වාත්; මෙහෘදි, මාගේ හෘදයෙහි; ස්ථිතාඑව, ස්ථිතාවූවාමය. සියලු සංස්කාර සම්බන්ධ අනිත්‍යවාදී සර්වඥයන්වහන්සේගේ මතය හා මෙය විරුද්ධහෙයින් මේ සෞගතදර්ශනරූප න්‍යාය විරොධියි.

175 කාපිලෛරසදුද්භූතිඃ ස්ථානඑවොපවර්ණ්‍යතෙ
අසතාමෙවදෘශ්‍යතෙන යස්මාදස්මාභිරුද්භවාඃ.

කාපිලෛඃ, කපිල මතානුගතයන් විසින්; අසත්, අසත්වස්තූන් ගේ; නොහොත් අසත්, දුෂ්ටයන්ගේ; උද්භූතිඃ, පහළවීම; ස්ථානඃ එව, යුක්තමැයි; උපවර්ණ්‍යතෙ, වර්ණනාකරනු ලැබේ; යස්මාත්, යම් හෙයකින්; අස්මාභිඃ, අප විසින්; අසතාම්එව, අසත් වස්තූන්ගේම; නොහොත් අසත්පුරුෂයන්ගේම; උද්භවාඃ, පහළවීම්; දෘශ්‍යතෙන, දක්නාලැබෙති. මෙහි අසත්ශබ්දය අනුශිෂ්ටහෙයින් හෙතු හෙතු මත් භාවයවේ, ඇත්නාමවූ දෙයක් උපදී නැති දෙයක් නූපදනේය යනු සාඞ්ඛ්‍යශාස්ත්‍ර හදරන්නන්ගේ මතයි. එහෙයින් මේ සාඞ්ඛ්‍යශාස්ත්‍ර විරුද්ධය, එහෙයින් මෙය සාංඛ්‍යදර්ශන රූපන්‍යාය විරොධියි.

176 ගතිර්න්‍යායවිරොධස්‍ය සෛෂාසර්වත්‍රදෘශ්‍යතෙ
අථාගමවිරොධස්‍ය ප්‍රස්ථානමුපදිශ්‍යතෙ.

න්‍යාය විරොධස්‍ය, න්‍යාය විරොධය සම්බන්ධවූ; සාඑෂාගතිඃ, ඒ මේ රීතිය; සර්වත්‍ර, වෛශෙෂිකාදි සියලු දර්ශනයන්හිම; දෘශ්‍යතෙ, දක්නාලැබේ; අථ, ඉක්බිති; ආගමවිරොධස්‍ය, ආගමවිරොධය සම්බන්ධවූ; ප්‍රස්ථානම්, ප්‍රස්ථානය හෙවත් රීතිය; උපදිශ්‍යතෙ, උපදෙශ කරනු ලැබේ.

177 අනාහිතාග්නයොප්‍යෙතෙ ජාතපුත්‍රාවිතන්වතෙ.
විප්‍රාවෛශ්වානරීමිෂ්ට මකලිෂ්ටාචාරභූෂණාඃ.

අනාහිතාග්නයඃඅපි, නොකරණලද අග්න්‍යාධාන ඇත්තාවූද; ජාතපුත්‍රාඃ, ජාතපුත්‍රවූ; අකලිෂ්ටාචාරභූෂණාඃ, නොකිලිටිවූ ආචාර යෙන් සමන්විතවූ; එතෙවිප්‍රාඃ, මේ බ්‍රාහ්මණයෝ; වෛශ්වානරීම්, වහ්නිසම්බන්ධවූ; ඉෂ්ටිම්, යාගය; විතන්වතෙ, කරති. වෙදයෙහි කරණලද අග්න්‍යාධානාදිය ඇත්තන්ගේම වෛශ්වානරයාගාධිකාර ප්‍රතිපාදනය හෙයින් මේ වෙදවිරුද්ධයි.

178 අසාවනුපනීතොපි වෙදානධිජගෙගුරොඃ
ස්වභාවශුද්ධඃස්ඵටිකො නසංස්කාරමපෙක්ෂතෙ.

අසෞ, මේතෙමේ; අනුපනීතඃඅපි, උපනයන නොකරනු ලැබූයේද; ගුරොඃ, ආචාර්‍ය්‍යවරයා කෙරෙන්; වෙදාන්, වෙදයන්; අධිජගෙ,

අධ්‍යයනයකෙළේය; ස්වභාවශුද්ධඃ, ස්වභාවයෙන් ශුද්ධවූ; ස්ඵටිකඃ, ස්ඵටිකමාණික්‍යය; සංස්කාරම්, සංස්කරණය; නඅපෙක්‍ෂතෙ, අපෙක්‍ෂානොකෙරේ. අනුපනීතයාගේ වෙදාධ්‍යයනය ස්මෘති විරුද්ධනුයි මේද ආගම විරුද්ධයි.

179 විරොධඃසකලොප්‍යෂ කදාචිත්කවිකෞශලාත්
උත්ක්‍රම්‍යදෙෂගණනාං ගුණවීථිං විගාහතෙ.

එෂඃ, මේ; සකලඃ, සියලු; විරොධඃඅපි, විරොධයද; කදාචිත්, කිසිකලෙක්හී; කවිකෞශලාත්, කවිහුගේ දක්‍ෂබව හෙතුකොට ගෙන; දෙෂගණනාත්, දෙෂ සමූහයන්; උත්ක්‍රම්‍ය, පහකොට; ගුණ විථිම්, ගුණවිථියට; විගාහතෙ, බසී.

180 තස්‍යරාඥඃ ප්‍රභාවෙණ තදුද්‍යානානි ජඥිරෙ
ආර්ද්‍රංශුකප්‍රබාලානා මාස්පදංසුරශාඛිනාම්.

තස්‍යරාඥඃ, ඒ රජහුගේ; ප්‍රභාවෙණ, මහිමය කරණකොට ගෙන; තදුද්‍යානානි, ඒ රජහුගේ උයන්; ආර්ද්‍ර, අලුත්වූ; අංශුකප්‍රබාලානාම්, වස්ත්‍රනැමති ලපලුඇති; සුරශාඛිනාම්, දිව්‍යවෘක්‍ෂයන්ගේ; ආස්පදම්, ස්ථානයයි; ජඥිරෙ, දනිති. මෙහි මනුෂ්‍යයන්ගේ උයන් හිලා දෙවවෘක්‍ෂවර්ණනායෙන් ඒ රජහුගේ ප්‍රභාවාතිශය ප්‍රකාශවේ නුයි දෙශවිරොධත්‍වය දෙෂ නොවේ.

181 රාඥංවිනාශපිශුනශ්චචාරබරමාරුතඃ
ධුන්වන්කදම්බරජසා සහසප්තච්ඡදෙද්ගමාන්.

රාඥම්, ශත්‍රුරාජයන්ගේ; විනාශපිශුනඃ, විනාශ සූචකවූ; බර මාරුතඃ, ප්‍රචණ්ඩවාතය; සප්තච්ඡදෙද්ගමාන්, රුක්අත්තනවෘක්‍ෂයන් ගේ මල්කැකුළු; ධුන්වන්, කම්පාකරමින්; කදම්බරජසාසහ, කොලොම්මල් රේණූන් හා එක්ව; චචාර, හැසිරුණේය. මෙහි යුද්ධප්‍රයාණය හා රුක් අත්තන මල් හටගැණීමද සරත්කාලයෙහිම වේ. වර්ෂාකාලයෙහි හටගන්නා කොලොම්මල් ශරත් කාලයෙහි ඇතිබැව් කීම කාලවිරොධයි. එසේවුවද දිනනුකැමතිවූ රජුගේ උත්සාහීතාදීපකත්වයෙන් ගුණමැයි දෙෂනොවේ.

182 දෙලාභිප්‍රෙරණත්‍රස්ත බධූජනමුඛොද්ගතම්
කාමිනාං ලයවෛෂම්‍යං ගෙයං රාගමවර්ධයත්.

දෙලා, උන්සිලලාවගේ; අභිප්‍රෙරණ, ඇතමැත යැවීමෙන්; ත්‍රස්ත, භයවූ; බධූජන, වධූජනයාගේ; මුඛ, මුඛයෙන්; උද්ගතම්, නැංගාවූ; ලයවෛෂම්‍යම්, ලයවිෂමතාඇති; ගෙයම්, ගායනය; කාමිනාම්, කාමීන්ගේ; රාගම්, රාගය; අවර්ධයත්, වැඩූයේය; ගායනය සම්බන්ධවූ ලය ශුද්ධියම් රාගවර්ධනය කරන්නීය යනු කලාශාස්ත්‍රයෙහි

නියමයවේ. මෙහි ලය වෛෂම්‍යහෙයින් නත් විපරීතතා ඇත්තුයි කලාවිරොධයි. එසේවුවද ස්ත්‍රීන්කෙරෙහි කාමීන්ගේ අත්‍යනුරාගය මෙහි ප්‍රකාශවනහෙයින් මේ ගුණමැයි.

183 චෛන්ද්‍රවාදර්චිෂඃකාමී ශිශිරංහව්‍යවාහනම්
අබලාවිරහක්ලෙශ විහ්වලොගණයත්‍යයම්.

අයංකාමී, මේ කාමිපුරුෂතෙම; අබලා, අබලාවගේ; විරහ, විරහයෙන්වූ ක්ලෙශ, දුකින්; විහ්වලඃ, ව්‍යාකුලවූයේ; හව්‍යවාහනම්, වහ්නිය; චෛන්ද්‍රවාන්, චන්ද්‍රයා සම්බන්ධවූ; අර්චිෂඃ, රශ්මියට වඩා; ශිශිරම්, ශීතයයි; ගණයති, සිතා. මෙහි ගින්නගේ ශීතත්වය ලොකවිරුද්ධය. එසේ නමුදු විරහීන්ට චන්ද්‍රරශ්මිය කාම සන්තාපජනක හෙයින් මෙසේ කීම ගුණමැයි, මේ ලොකවිරොධයාගේද නිර්දොෂත්වයට උදාහරණයි.

184 ප්‍රමෙයොප්‍යප්‍රමෙයොසි සඵලොප්‍යසි නිෂ්ඵලම්
එකස්ත්වමප්‍යනෙකොසි නමස්තෙවිශ්වමූර්තයෙ.

ප්‍රමෙයඃ, ප්‍රමාණජන්‍යඥාන විෂයවූයේද; අප්‍රමෙයොසි, අප්‍රමෙයවූයෙහිය; සඵලොපි, සඵලවූයේද හෙවත් විශ්වරූපවූයේද; නිෂ්ඵලඃඅසි, නිෂ්ඵලවූයෙහිය; ත්වම්, නුඹවහන්සේ; එකඃඅපි, අද්විතීයවූයේද; අනෙකඃඅසි, අනෙකරූපවූයෙහිය; විශ්වමූර්තයෙ, විශ්වමූර්තිවූ; තෙ, නුඹවහන්සේට; නමඃ, නමස්කාරවේවා. මෙහි ප්‍රමෙයත්ව අප්‍රමෙයත්වාදිය පරස්පරවිරුද්ධය, එසේවුවද පරමාත්මයාගේ අචින්ත්‍යවෘත්තිත්වය ප්‍රකාශවනහෙයින් මේද ගුණයුක්තමැයි.

185 පඤ්චානාම් පාණ්ඩුපුත්‍රාණාං පත්නීපාඤ්චාලපුත්‍රිකා
සතීනාමග්‍රණීශ්චාසීද්දෛවොහිවිධිරීදෘශඃ.

පඤ්චානාං පාණ්ඩුපුත්‍රාණාම්, පාණ්ඩු පුත්‍රයන් පස්දෙනාගේ; පත්නී, භාර්‍ය්‍යාවූ; පාඤ්චාලපුත්‍රිකා, ද්‍රෞපදීතොමෝ; සතීනාම්, පතිව්‍රතාවන් අතුරෙන්; අග්‍රණීශ්ච, අග්‍රවූවාද; ආසීත්, වූයේය; දෛවොහිවිධිඃ, දෛවවිධිය; ඊදෘශී, මෙබඳුයි; ආගමාධීන නොවෙයිසේයි. ඔවුන්ගේද ඇගේද දෙවාංශත්වය ශාස්ත්‍රොක්ත හෙයිනි. එකියක්හුගේ බහුපතිත්වයද සතීත්වයද ආගම විරුද්ධය, එසේවුවද මෙහි දෛවාධීනතාහෙයින් දොෂනැති ගුණමැයි.

186 ශබ්දාර්ථාලඞ්ක්‍රියාශ්චිත්‍රමාර්ගාඃ සුකරදුෂ්කරාඃ
ගුණාදොෂාශ්චකාව්‍යානාමිහසංක්ෂිප්‍ය දර්ශිතාඃ.

ඉහ, මේ කාව්‍යාදර්ශනම් ග්‍රන්ථයෙහි; ශබ්දාලඞ්කාරාශ්ච, ශබ්දාලඞ්කාරයෝද; සුකරදුෂ්කරාඃ, සුකරදුෂ්කරවූ කාව්‍යබන්ධයෝද; චිත්‍රමාර්ගාශ්ච, චිත්‍රමාර්ගයෝද; කාව්‍යානාම්, කාව්‍යයන්ගේ; ගුණාශ්ච, ගුණයෝද; දොෂාශ්ච, දොෂයෝද; සංක්ෂිප්‍ය, සංක්ෂෙපකොට; දර්ශිතාඃ, දක්වනලද්දුහ.

187 ව්‍යුත්පන්නබුද්ධිරමුනා විධිදර්ශිතෙන
මාර්ගේණ දොෂගුණයොර් වශවර්තිනීභිඃ
වාග්භිඃ කෘතාභිසරණො මදිරෙක්ෂණාභි
ර්ධන්‍යොයුවෙව රමතෙලභතෙචකීර්තිම්.

ව්‍යුත්පන්නබුද්ධිඃ, ව්‍යුත්පත්තිමත් බුද්ධිඇත්තේ; විධිදර්ශිතෙන, විධිවූ පරිද්දෙන් දක්වනලද නොහොත් ලක්ෂණ සංඛ්‍යාත විධියෙන් යුක්තකොට දක්වනලද; අමුනාමාර්ගේණ, මේ මාර්ගයෙන්; දොෂගුණ යොඃ, දොෂගුණ සම්බන්ධවූ; වශවර්තිනීභිඃ, වශයෙහි පවත්නාවූ; වාග්භිඃ වචනයෙන්; කෘතාභිසරණඃ, කරණලද මාර්ගඇත්තෝ; මදි රෙක්ෂණාභිඃ, මදයෙන් කළිපිනවූ නෙත්‍ර ඇත්තියන් කරණකොට ගෙන; ධන්‍යඃ, ධන්‍යවූ; යුවාඉව, තරුණයකුමෙන්; රමතෙ, ඇලේ; කිර්තිඤ්ච, කීර්තියද; ලභතෙ, ලබයි.

**ආචාර්ය ධර්මසෙනයන් විසින් ලියූ**
**කාව්‍යාදර්ශ ව්‍යාඛ්‍යානය නිමි.**

PRINTED AT THE "LANKABHINAWA VISSRUTA PRESS," PETTAH, COLOMBO.



